තුදුස් වසරක සහන් එළියක්

A Moon light of 14 years

කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක

තුදුස් වසරක සහන් එළියක්
A Moon light of 14 years

MRS : K. SEETHA N. GOONETILLEKE
DIRECTOR
Parents Memorial Scholarship Foundation
392/2, Perera Mawatha,
Kotuwegoda - Rajagiriya.
Tel: 0112877950

කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක
මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම
392/2, කොටුවේගොඩ, රාජගිරිය,
(0112877950)

© අයිතිය සම්පාදක සතුයි.

ISBN 978-955-50082-4-2

තුදුස් වසරක සහන් එළියක්
A Moon light of 14 years

ප්‍රථම මුද්‍රණය - 2012
බුද්ධ වර්ෂ - 2556

2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය වෙනුවෙන් විවෘත වූ පිළිවෙත් මගෙහි නවතම පියවරකි....
(සම්බුද්ධත්වයෙන් පසු 2601 වසර සැමරීම පිණිසයි)

කතුවරියගේ වෙනත් ප්‍රකාශන

මා පිය ගුණ සමර - මුද්‍රණය 2006 (බුද්ධ වර්ෂ 2550 - සම්බුද්ධ ජයන්තිය වෙනුවෙනි)
සාධු දැක්ම (The Excellent View) - මුද්‍රණය 2007 (බුද්ධ වර්ෂ 2551 - වෙසක් පුර පසළොස්වක නිමිත්තෙනි)
දරිද්‍රතාව හඹායයි - මුද්‍රණය 2009 (බුද්ධ වර්ෂ 2553 - වෙසක් පුර පසළොස්වක නිමිත්තෙනි)
සුවදායක මාවතක (A Blissful Path) - මුද්‍රණය 2010 (බුද්ධ වර්ෂ 2554 - වෙසක් පුර පසළොස්වක නිමිත්තෙනි)
ප්‍රීතිමත් ජීවිතයකට මග - මුද්‍රණය 2011 (බුද්ධ වර්ෂ 2555 - වෙසක් පුර පසළොස්වක නිමිත්තෙනි)

මුද්‍රණය හා පරිගණක අක්ෂර සංයෝජනය
දර්ශන මාර්කටින් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
107, කඩුවෙල පාර,
බත්තරමුල්ල.

බැති සිතින් උත්තම පූජා

සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පුරා පාරමී දම් පුරමින්, නියත විවරණ ලබා ගනිමින්,
බුද්ධ රාජ්‍යයේ කිරුළු පැළඳීමේ ඒකායන අධිෂ්ඨානයෙන් යුතුව, සියළු රජ සැප සම්පත් අත හැරදා වනගතව,
පුරා සය වසරක් අත්තකිලමතානු යෝගයෙන් වීර්යය වඩවා ගනිමින් ආර්ය පර්යේෂණයක නිරත වූ
සිද්ධාර්ථ ගෞතම බෝසතාණෝ මැදුම් පිළිවෙතට පිවිස,
ස්ව ශක්තියෙන් පහළ කොටගත් මහා ප්‍රඥාවෙන් යුතුව,
මීට වසර 2600 කට පෙරදී දඹදිව් තලයේ බුද්ධගයාවේ දී
උත්තරීතර සම්මා සම්බුදු පදවියට පත් වීමෙන් අනතුරුව......

සංසාර සාගරයේ අතරමංවී දුක් විඳිනා ලෝ සතුන් කෙරෙහි පතළ වූ මහා කාරුණාවෙන් යුතුව,
තමන් වහන්සේ විසින් අවබෝධ කරගත්, පරම රමණීය අමෘත මහා නිර්වාණ සුවය සාක්‍ෂාත් කරන්නා වූ
නිර්මල ශ්‍රී සද්ධර්මය ඉතාමත් පැහැදිලිව දේශනා කර වදාරා ....

එම ශ්‍රී සද්ධර්මයේ චිරස්ථිතිය පිණිස සැරියුත්, මුගලන් හිමියන් ප්‍රමුඛ මහා සංඝ රත්නය බිහි කළ
තුන් ලෝකාග්‍ර වූ අසම සම වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ ශ්‍රී නාමයට
මාගේ මෙම වෑයම පුෂ්පෝපහාරයක්ම වේවා !!!
ඔබ වහන්සේ නොවන්නට අදත් අපි භව අඳුරේ ගමන් කරන්නෝ වෙමු.
බුද්ධ රත්නය
ධම්ම රත්නය
සංඝ රත්නය
නම් වූ අති උතුම් රත්නත්‍රය හැර උපන් සත්වයාට අන් සරණක් නැත්තේම ය.
මාගේ ස්වාමි වූ, ත්‍රෛ ලෝක නාථ, ලොව්තුරු ගෞතම බුදු පියාණෙනි !
ගෞරව භක්ත්‍යාදරය පෙරදැරිව, ශීර්ෂප්‍රණාමයෙන් යුතුව,
බුද්ධාලම්භන ප්‍රීතියෙන්
ඔබ වහන්සේට මෙම පොත පුදමි.

පූජා වේවා!

පසුපිට ඡායාරූපය

ඉන්දියාවේ දඹදිව බුද්ධගයා විහාරය තුළ වූ වජ්‍රාසනය මත
නිර්මිත
පුරා වසර 2600 ක් මුළුල්ලේ
සකල ලෝ සතුන්ගේ උතුම් පූජනීයත්වයට පාත්‍රවන,
මාගේ ස්වාමි වූ සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ
භූමි ස්පර්ශ මුද්‍රාවෙන් යුතු බුදුපිළිම වහන්සේ....

කතුවරිය සිය සදහම් ග්‍රන්ථ පූජා කිරීමෙන් අනතුරුව... සිය කැමරාවට හසුකරගත් අයුරු

(2009-02-12 දින)

ප්‍රණාමය

මෙවන් උත්තුංග සමාජ මෙහෙවරකට නිබඳ අනුශාසකත්වය ලබා දෙන පූජනීය ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේට......

මානව ප්‍රජාවේ උන්නතිය වෙනුවෙන් කැප වන සමාජ යුග මෙහෙවරට සුභාසිංශන ලබා දෙමින් දිරිමත් කළ, නැදිමාල බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ පූජනීය කිරම විමලජෝති නායක හිමිපාණන් ට......

මෙම මෙහෙවරෙහි චිරස්ථිය පිණිස මාහැඟි සහයෝගයක් නිරතුරුව ලබා දෙමින් මෙම කෘතියට සුභාසිංශන ද එක් කළ ඩී.එස්. සේනානායක විදුහලේ ධර්ම ආචාර්ය ශාස්ත්‍රපති ආචාර්ය තල්පත්වැව සද්ධාතිස්ස ස්වාමීන් වහන්සේට සහ ඩී.එස්. සේනානායක විදුහලේ වත්මන් විදුහල්පති ඩී.එම්.ඩී. දිසානායක මැතිතුමාට......

තුදුස් වසරක් පුරා මෙම සමාජ මෙහෙවරට අනවරත ශක්තිය ලබා දෙමින් සුපැතුම් එක් කළ අනුග්‍රාහක සුපින්වත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එන්.ඊ. දිසානායක මැතිතුමාට සහ එම මැතිණියට......

මෙම යුග මෙහෙවරෙහි උන්නතිය වෙනුවෙන් ඉමහත් සහයෝගයක් ලබාදෙමින් සුපැතුම් එක් කළ තරුණ කටයුතු අමාත්‍යාංශයේ හිටපු ලේකම් නීතිඥ එස්. විරිතමුල්ල මැතිතුමාට......

ජපානයේ සිට වාර්ෂිකව මෙම ශිෂ්‍යත්ව සඳහා යාව ජීව අනුග්‍රාහකත්වය ලබාදෙන සියළුම ශ්‍රී ලාංකික දූ පුතුන්ට සහ මෙම කෘතියට ජපානයෙන් සුභාශිංසන එක් කළ පරිගණක ඉංජිනේරු ආචාර්ය සදේව ගුණතිලක පුතණුවන්ට......

මෙම කෘතිය වඩාත් ඔප් නැංවීම සඳහා ශ්‍රී සද්ධර්මය පදනම් කරගත් සාරගර්භ ලිපි එවූ කල්‍යාණ මිත්‍ර අනුග්‍රාහක සුපින්වතුන්ට......

මෙම මෙහෙවරෙහි ඵලදායීතාව නුවණින් දකිමින් වදනින් නිරතුරු අගයන සත්පුරුෂ බුද්ධිමතුන්ට......

ලැබුවා වූ ආර්ථික සහ මානසික සහන පිළිබඳවත්, අධ්‍යාත්මික පරිපෝෂණය පිළිබඳවත් කෘතඥතාව පළ කරමින් ලිපි යොමු කළ ශිෂ්‍යත්වලාභී දරු දැරියන්ට......

මෙම ග්‍රන්ථයේ සංස්කරණ කටයුතු සඳහා නිබඳ සහයෝගයක් ලබාදුන් අධ්‍යක්ෂ මණ්ඩලයට......

මෙවන් සත්ක්‍රියාවක් අගයමින්, මෙම මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම්පත් යොමුකිරීමේ අවස්ථාවේ සිට මහ ජනතාව දැනුවත් කරන බෞද්ධයා නාලිකාවට, සියළුම පුවත්පත් කලාවේදීන්ට සහ විද්‍යුත් මාධ්‍ය වේදීන්ට......

"සැදැහැති සටහන්" නම් වූ විශේෂ වැඩ සටහනක් ඔස්සේ අප විසින් සම්පාදිත සදහම් ග්‍රන්ථ ලොවට හඳුන්වා දෙමින්, ගුණ දහමින් සපිරි සාධු සමාජයක් බිහිකිරීමට දරන්නා වූ මෙම වෑයමට සවිබල ලබා දුන් පූජ්‍යපාද ශාස්ත්‍රපති දරණාගම කුසලධම්ම හිමිපාණන් ට සහ වැඩසටහන් සම්පාදක නීතිඥ ශෂික ජයතිලක මැතිතුමා ඇතුළු සම්බෝධි විහාරස්ථාන කාර්යය මණ්ඩලයට......

දිවියෙන් සමුගත් මව් පිය ඥාතීන් ඵලදායී ලෙසින් වාර්ෂිකව සිහිපත් කරමින්, දරිද්‍රතාවෙන් පීඩිත දක්ෂ සිසු දරුවෙකු ගුණ දහමින් පරිපෝෂිත වූ පුරවැසියෙකු ලෙසින් මවිබිමට දයාද කිරීමේ උදාර පුණ්‍ය කර්මයට දායක වෙමින්, මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම සමග අත්වැල් බැඳගත් සියළුම සත්පුරුෂ කල්‍යාණ මිත්‍ර අනුග්‍රාහක සුපින්වතුන්ට......

මෙම ග්‍රන්ථය සම්පාදනය කිරීමෙන් සහ මුද්‍රණය කරවා බෙදා හැරීමෙන් පහළවන උතුම් ධර්ම දානමය කුසලය තුළින් රැස්කර ගන්නා වූ සියළුම පින් ඔබ සැමට අනුමෝදන් කරමි. අනුමෝදන් වේවා !

සාධු... සාධු.... සාධු.... !!!

පෙරවදන

මහණෙනි, ධර්ම තුනකින් සමන්වාගත ව්‍යක්ත සත්පුරුෂ වූ නුවණ ඇති තෙම, පළුදු නොවූ ගුණ ඇති, පීඩා නොවූ ගුණ ඇති ජීවිතය පරිහරණය කරයි. නිදොස් වුයේද, නුවණ ඇත්තන් විසින් උපවාද නොකොට යුත්තේද වෙයි. බොහෝ කුසල් ද රැස්කරයි.



ලොව සත්පුරුෂයෝ දුර්ලභය

තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතෝ පණ්ඩිතෝ ව්‍යක්තෝ සප්පුරිසෝ අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති, අනවජ්ජෝ හෝති, අනනුවජ්ජෝ විඤ්ඤූනං, බහුඤ්ච පුඤ්ඤං පසවති, කතමෙහි තීහිඃ කායසුචරිතේන, වචී සුචරිතේන, මනො සුචරිතේන, ඉමෙහි බො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො ව්‍යක්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති, අනවජ්ජෝච හෝති, අනනුවජ්ජෝ, විඤ්ඤූනං බහුඤ්ච පුඤ්ඤං පසවතීති,

මහණෙනි, ධර්ම තුනකින් සමන්වාගත ව්‍යක්ත සත්පුරුෂ වූ නුවණ ඇති තෙම, පළුදු නොවූ ගුණ ඇති පීඩා නොවූ ගුණ ඇති ජීවිතය පරිහරණය කරයි. නිදොස් වුයේද, නුවණ ඇත්තන් විසින් උපවාද නොකොට යුත්තේද වෙයි. බොහෝ කුසල් ද රැස් කරයි. ඒ කවර ගුණ තුනකින්ද ? කාය සුචරිතයෙනි, වාග් සුචරිතයෙනි, මනෝ සුචරිතයෙනි, මහණෙනි, මේ ධර්ම තුනෙන් සමන්වාගත සත්පුරුෂ වූ නුවණ ඇති තැනැත්තා පළුදු නොවූ හා පීඩා නොවූ ගුණ ඇතිව ජීවිතය පරිහරණය කරයි. නිදොස් වූයේ නුවණ ඇත්තන් විසින් උපවාද නොකොට යුතු වෙයි. බොහෝ කුසල් ද රැස් කෙරෙයි.

තුදුස් වසරක ආගමික, සාමාජික හා පරෝපකාරී විශිෂ්ඨ සේවාවක් සමරන, කොළඹ ඩී.එස්. සේනානායක විද්‍යාලයේ හිටපු ඉංග්‍රීසි භාෂා ආචාර්යවරියක් වූ සීතා නන්දනී කිරිවත්තුඩුව මහත්මිය ද සත්පුරුෂයන් විසින් ද නුවණ ඇත්තන් විසින් ද ප්‍රශංසා කළ යුතු ජීවන චරිතයකි.

1998 වර්ෂයේදී අප විසින් ආරම්භ කරනු ලැබූ ශ්‍රී ලංකා කැනඩා ශිෂ්‍යත්ව පදනමෙහි ආරම්භක ශ්‍රී ලංකා සම්බන්ධීකාරිකාවන් ලෙස පත් කරනු ලැබුවේ සීතා නන්දනී කිරිවත්තුඩුව මැතිණියයි. එතැන් පටන් පුරා අවුරුදු දහයක් අඛණ්ඩව මහඟු සේවාවක් සිදුකරනු ලැබුවාය. ශ්‍රී ලංකාව පුර විසිරී සිටින අධ්‍යාපනයෙහි ඉතාමත් දක්ෂ, එනමුත් ආර්ථික අපහසුකම් ඇති, උසස් පෙළ පන්ති සඳහා සුදුසුකම් ලැබූ දරුවන් තෝරා මාසිකව මුදල්මය ආධාර පිරිනැමීම එම ශිෂ්‍යත්ව පදනමෙහි මූලික අභිලාෂය විය. මෙම ශිෂ්‍යත්ව සඳහා ඉහළම සුදුසුකම් ඇති දරුවන් කිසිදු භේදයකින් තොරව, සතර අගතියට හසුනොවී තෝරා ගැනීම ඉතාමත් භාරදූර කාර්යයකි. මෙතුමිය දින, සති, මාස ගණන්, දිවා රාත්‍රී වෙහෙසමින් එම කාර්යය ඉතාමත් සත්භාවයෙන් යුතුව ඉටු කළාය. ශිෂ්‍යත්ව පිරි නැමීමෙන් අනතුරුව, එම දරුවන් උනන්දු කරවමින්, බොහෝ විට අමතර හිඟ පාඩුකම් ද සපුරා දෙමින් වරෙක අම්මා කෙනෙකු වූවාය. තවත් වරෙක ඉතාමත් ශ්‍රේෂ්ඨ ගුරුතුමියක් වූවාය. එමෙන්ම කළණ මිතුරියක් ද වූවාය. ඒ බව ශිෂ්‍යත්ව ලැබූ දරුවන්ගේ හදවත්වලින් හටගත්, මුවෙන් පිට වූ වදන්වලින් හා තෙලිතුඩින් නිමවූ නිර්මාණාත්මක රචනාවලින් මනාව පැහැදිලිය. එම ශිෂ්‍යත්ව ලැබූ දරුවෝ වර්තමානයෙහි වෛද්‍ය, ඉංජිනේරු, නීතිඥ ගුරු, හෙද, පරිඝණක, ගණකාධිකාරී ආදී විවිධ වෘත්තීන් හි නිරතව සිටිති. ඒ හැම මෙතුමියගේ ආශිර්වාද ලද්දෝය.

මින් අනතුරුව එතුමියගේ මූලිකත්වයෙන් පිහිටවනු ලැබූ **"මා පිය ගුණ සමරු අනුස්මරණ ශිෂ්‍යත්ව වැඩපිළිවෙල"** කෘතවේදීත්වයේ නිසල කැඩපතක් බඳුය. දරුවන් මෙලොවට බිහිකොට, සුජාත දරුවන් ලෙස ලොවට ඉදිරිපත් කළ දෙමාපියන්ගේ ගුණ සමරා සිදුකෙරෙන මෙම ශිෂ්‍යත්ව, හැම දරුවෙකුටම තම

දෙමාපිය උපස්ථානය වෙනුවෙන් පිදිය හැකි යහපත්වූ ම දයකත්වයකි. මෙම ශිෂ්‍යත්වය යටතේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබන, සෑම පීඨයකින්ම තෝරාගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් මාසික මූල්‍යමය ආධාරයකට හිමිකම් ලබාගනු ලැබේ. මූල්‍යමය ආධාරයකට වඩා මනුෂ්‍යත්වයේ උදාර බව දරුවන්ගේ හදවත්වලට දැනෙන්ට සැලැස්වීම මෙවැනි සත්ක්‍රියාවන්හි ඇති විශිෂ්ඨ ලක්‍ෂණයෝය. මේ සියල්ල සාර්ථක වූ සංයෝජනයක් බවට පත්වන්නේ, සීතා නන්දනී කිරිවත්තුඩුව මැතිණියගේ ඉතා පළපුරුදු සංවිධායකත්වය සහ කෘතහස්ත දිරිය කාන්තාවකගේ ඇති පරාර්ථචර්යා සිතුවිලි සමුදාය නිසාමය.

මෙම අනගි වූ සමාජ මෙහෙවරෙහි යෙදෙන අතරම, එතුමිය අනෙක් වූ ද සේවාවකට පිවිසියාය. ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් ලෝ සත සුව පිණිස වදාළ ශ්‍රී සද්ධර්මය ඇසුරු කරගෙන ග්‍රන්ථ රචනා කිරීමය. ඒ ධර්ම ග්‍රන්ථ අතර **"මා පිය ගුණ සමර," "සාධු දැක්ම","දරිද්‍රතාව හඹා යයි"**. නම් වූ කෘතීන් ප්‍රධාන තැනක් ගනී. එම ග්‍රන්ථයන් වෙතින් දෙන පණිවිඩය වන්නේ ද මනුෂ්‍යත්වයේ ගුණ සුවඳ හදවත්වලට දැනිය යුත්තේ දනය (පරිත්‍යාගය) මුල්කරගත් දසපාරමී දම් ගුණ ඔස්සේ ම බවය. මෙතුමිය එම අදහස තව තවත් මතුකොට දක්වන පෙළගැස්මක් ලෙස මෙම **"තුදුස් වසරක සහන් එළියක්"** දැක්විය හැකිය.

මෙම කෘතිය බොහෝ අයෙක් ධර්ම මාර්ගයට සහ පරාර්ථ චරියාවට යොමු කිරීමට ද මනුෂ්‍යත්වයේ ගුණ සුවඳ හඳුනාගැනීමට ද මහත් සේ උපකාරීවන ග්‍රන්ථයක් බවට පත්වනවා ඇත. තුණුරුවන් සතු අනන්ත ගුණ බෙලෙන් එතුමියටත්, එතුමියගේ ස්වාමි පුරුෂයාටත්, දරුවන්ටත්, ඔබ සියළු දෙනාටත් හැම සැනසිල්ලක්ම වේවා! යි මහත් වූ කරුණාවෙන් අධිෂ්ඨාන කරමි.

උතුම් තෙරුවන් සරණයි.

ආචාර්ය පූජනීය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ
සිරි සුදස්සනාරාම සදහම් සෙනසුන
බත්තරමුල්ල.

යථා සංකාරධානස්මිං	-	**උජ්ඣිතස්මිං මහාපථෙ**
පදුමං තත්ථ ජායෙථ	-	**සුචිගන්ධං මනොරමං**
එවං සංකාර භූතෙස	-	**අන්ධභූතෙ පුථුජ්ජනෙ**
අතිරොචති පඤ්ඤාය	-	**සම්මා සම්බුද්ධ සාවකො**

A beautiful lotus with pleasing fragrance may grow even upon a heap of rubbish thrown on the high way. Like wise a disciple of the Fully Enlightened Buddha may out-shine in wisdom amongst all other ordinary worldings.

මහ පාරේ දැමූ කසළ ගොඩකත් හොඳ සුවඳ ඇති මනහර වූ නෙළුම් මලක් පිපෙන්නේ හෙවත් පිපී බබළන්නේ යම් සේද? ....
එසේම
කසල ගොඩවල් වැනි අන්ධබාල පෘතග්ජන මිනිසුන් අතර බුද්ධ ශ්‍රාවකයා ප්‍රඥාවෙන් බබළයි.

හැඳින්වීම

ශාන්ති නායක බුදු පියාණන් වහන්සේ සකල ලෝසතුන් වෙත පතල මහා කරුණාවෙන් යුතුව දේශනා කොට වදාළ අති උතුම් ධර්මස්කන්ධයෙන් බිඳක් අප ලැබුවා වූ මිනිසත් බව හරවත් කරගැනීම සඳහා ජීවිතය තුළ ප්‍රායෝගිකරණය කිරීම, ප්‍රඥාවන්ත ජන සමාජය තුළින් දැකීමට හෝ ඇසීමට හෝ ලැබෙන්නේ නම් එයද මහත් වූ භාග්‍යයකි.

ප්‍රතිපත්ති පූජාව උතුම් කොට සලකමින් අසරණ ජනතාවගේ සුබ විහරණය වෙනුවෙන් අධිෂ්ඨාන පූර්වකව ඉමහත් කැපවීමකින් යුතුව සම්බාධක අභිබවමින් **තුදුස් වසරක්** අඛණ්ඩව ඉදිරියට ගෙන ආ සමාජ සත්කාරයක යථා දැක්ම, මෙම**"තුදුස් වසරක සහන් එළියක්"** තුළින් නිරාමිස ප්‍රීතියෙන් යුතුව එළි දැක්වෙයි. පරාර්ථ සේවයෙන් ලැබෙන්නා වූ වටිනාම ප්‍රතිලාභය එවන් වූ සතුටයි.

දරිද්‍රතාවෙන් පීඩිත එහෙත් ඉගෙනීමෙහි දක්ෂ ශ්‍රී ලාංකික දරුවන්ගේ උසස් අධ්‍යාපනය සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් 1998 දී, අග්ග මහා පණ්ඩිත අති පූජනීය මඩිහේ පඤ්ඤාසීහ මහා නායක හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් සහ ගිහි පැවිදි දෙස් විදෙස් ප්‍රභූ පිරිසකගේ සහභාගීත්වයෙන් කොළඹ 7, ඩී.එස්. සේනානායක විද්‍යාලයීය ශාලාවේ දී ඇරඹි මෙම සමාජ සත්කාරය ගත වූ වසර 14 තුළ, අදියර තුනක් ඔස්සේ විවිධ ව්‍යාපෘති ක්‍රියාවට නංවමින් මේ යන්නා වූ ගමන් මඟ සැබවින්ම විශ්මය ජනකය. **කිසිම රජයකින් හෝ ආයතනයකින් කිසිදු ආකාරයේ ආධාර නොලබින්** කල්‍යාණ මිත්‍ර ඇසුර මතින් ආරම්භ කරනු ලැබූ මෙම උත්තුංග සමාජ සත්කාරය අවංකබව, අධිෂ්ඨානය, වීර්යය සහ කැපවීමෙන් යුතුව කල්‍යාණ මිත්‍ර ඇසුර මතම දළුළමින් ගුණ ගරුක සමාජයක් බිහිකිරීමට මහත් වූ දයකත්වයක් සපයයි.

ආරම්භයේදී අ.පො.ස. උසස් පෙළ සිසු දරුවන් තිස් හත් දෙනෙකු වෙනුවෙන් වසර දෙකක කාල සීමාවක් සඳහා මාසිකව රු. 500/- බැගින් ශිෂ්‍යාධාර ලබාදුන් අතර ගත වූ වසර 14 තුළ **" ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව ", "විජයසේන කිරිවත්තුඩුව අනුස්මරණ ශිෂ්‍යත්ව "** සහ **"මා-පිය අනුස්මරණ ශිෂ්‍යත්ව "** ආදී සංකේත නාමයන් ඔස්සේ බිහි වූ සම්පූර්ණ ශිෂ්‍යත්වලාභීන් ගේ සංඛ්‍යාව **630** කි. ඍජු නායකත්වයක් ඔස්සේ මනා සැලසුම්කරණයකින් යුතුව තුදුස් වසරක් පුරා සපයනු ලැබූ මෙම ශිෂ්‍යත්ව ව්‍යාපෘති තුළින් ප්‍රතිලාභ ලැබූ අ.පො.ස. උසස් පෙළ සිසුන් සංඛ්‍යාව **409** ක් වන අතර විශ්ව විද්‍යාලයන්හි ඉංජිනේරු, කලා, නීති, කළමණාකරණ සහ වෛද්‍ය පීඨයන්හි සිසුන් සංඛ්‍යාව **221** කි. මාසික ශිෂ්‍යාධාර මුදල **රුපියල් 1500/-** දක්වා වර්ධනය වී ඇති අතර උසස් අධ්‍යාපනය සඳහා වන මෙම ශිෂ්‍යත්ව සහ අනිකුත් ව්‍යාපෘති සඳහා රුපියල් **මිලියන 12.25** කට වැඩි මුදලක් ආයෝජනය කර තිබීම අනුග්‍රාහක භවතුන්ගේ නිරාමිස ප්‍රීතිය වඩාත් ඔප් නැංවීමට හේතු වී ඇත. පරිත්‍යාගශීලී අනුග්‍රාහක භවතුන් තම සන්තකයෙන් වාණිජමය රුපියල් සත මුදාහරිද්දී ඔවුන් වෙත උරුම වී ඇති අධ්‍යාත්මික ශක්තිය සහ මානසික සන්තුෂ්ඨිය ඔවුන් විසින්ම සපයා ඇති ලිපි තුළින් පාඨක ඔබට ද විද්‍යාමාන වනු ඇත.

මුදල් අග-හිඟකම් ඇති වෛද්‍ය සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා වෛද්‍ය උපකරණ (Stethescope) පරිත්‍යාග කිරීම, සිසු දරුවන් හට සාරධර්ම පරිපෝෂණයක් ලබාදීමේ අරමුණෙන් ඉංග්‍රීසි - සිංහල ද්විභාෂා අනුසාරයෙන් සදහම් ග්‍රන්ථ සම්පාදනය කරමින් තිළිණ කිරීම, තරුණ සිසු දරුවන් සඳහා දීප ව්‍යාප්ත රචනා තරඟ පැවැත්වීම, දුෂ්කර පළාත්වල ගැමි ජනතාව වෙත සහනාධාර බෙදාදීම, දුෂ්කර පාසැල්වලට පරිගණක පරිත්‍යාග කිරීම, අවම සම්පත් සහිත පාසැල්වලට පුස්තකාල පොත්, අභ්‍යාස පොත්, පෑන්, පැන්සල් සහ ලිපි ද්‍රව්‍ය පරිත්‍යාග කිරීම, ශිෂ්‍යත්වලාභීන් නොවන සිසු දරුවන්ගේ ද සාධාරණ ඉල්ලීම වෙනුවෙන් මුදල් පරිත්‍යාග කිරීම. දුෂ්කර ප්‍රදේශයන්හි විහාරස්ථාන පුස්තකාල සඳහා, සදහම් ග්‍රන්ථ ලබාදීම, ආබාධිත අසරණ ජනතාව වෙනුවෙන් ආධාරක සහ රෝදපුටු සැපයීම ආදී විවිධ ව්‍යාපෘතීන් සැලසුම් කිරීම, සම්බාධක අභිබවා ක්‍රියාත්මක කිරීම සහ ඵලදායීතාව පිළිබඳව පරිච්ඡේද ගණනාවක්**"තුදුස් වසරක සහන් එළියක්"** තුළ අන්තර්ගත ය.

ආදර්ශයෙන් ම මඟ පෙන්වන ශිෂ්‍යත්ව පදනමකින් ලද හැකි බොහෝ වූ සාරධර්ම ශිෂ්‍යත්වලාභී දරුවන් අද තම ජීවිත ජයග්‍රහණය සඳහා උකහාගෙන ඇත. ඔවුන් විසින් එවා ඇති ලිපි නිර්මාණ, සහ කාටූන් තුළින් පාඨක ඔබේ හදවත් ද සසල වනු ඇත. අසරණයින්ට පිහිටවීම, අර්ථාන්විතව මව්පියන් නමැදීම, වැඩිහිටියනට ගරු සැලකිලි දැක්වීම, කළ ගුණ සැලකීම, අප්‍රමාදී බව, නොපසුබස්නා වීර්යය, අධිෂ්ඨානශීලී බව, කාර්යයන්හි ක්‍රමානුකූලත්වය, මනා සැලසුම්කරණය ආදී ගුණාංග රැසක් තම ජීවිතයට එක් කරගනිමින් එය අනාගත පරම්පරාවට දායාද කිරීමේ වගකීම ද ඔවුන් විසින් භාරගෙන ඇත.

මෙම සමාජ සත්කාරයන්හි නිමවුවාණන් වූ කොළඹ ඩී.එස්. සේනානායක විදුහලේ ධර්ම ආචාර්ය වහන්සේ නමක් ලෙස කලක් සේවය කළ, බත්තරමුල්ල සිරි සුදස්සනාරාම සදහම් සෙනසුනෙහි ප්‍රධාන අනුශාසක ධුරංදර, කැනඩාවේ වැංකූවර්හි සරේ බෞද්ධ විහාරවාසී අති පූජනීය ආචාර්ය මිරිස්සේ ධම්මික හිමිපාණන්ගේ ශ්‍රේෂ්ඨ චින්තනය මල්ඵල ගැන්වෙමින් අද මුළු මහත් ලොවම සිසාරා ගුණ සුවඳ විහිදුවයි.

අසරණ ජනතාවට පිහිට වීමට සිතක් පහළවීමට ද පෙර පිනක් තිබිය යුතුමයි. ඒ සඳහා අත හිත දීමට ද ශක්තිමත් ස්ථාවරයක් තිබිය යුතුමයි. ඒ සියල්ල තිබුණ ද පැහැදිලි මඟක් සහ මඟ පෙන්වන්නෙක් නොවන්නේ නම් මෙවන් මාවතකට ප්‍රවිශ්ඨ වීම උගහටය.

දරිද්‍රතාවෙන් පීඩිත දක්ෂ සිසු දරුවන් දහසකට ආසන්න පිරිසක් සෑම වසරකම අප වෙත ඉල්ලුම්පත් යොමු කළ ද ශිෂ්‍යත්ව සංඛ්‍යාව අනුග්‍රාහක සංඛ්‍යාව මත රඳා පවතින හෙයින් වාර්ෂික ශිෂ්‍යත්ව සංඛ්‍යාව සීමා කිරීමට සිදු වී ඇත.

මෙවන් ක්‍රියාදාමයකට අවතීර්ණ වීමෙන් ලද හැකි සැනසුම අප්‍රමාණය. ජීවිත කාලය පුරාම අපමණ දුක් ගැහැට විඳිමින් ජීවිතය පවත්වා ගැනීම සඳහා මහත්වූ අරගලයක යෙදෙන මිනිස් ප්‍රජාව දෙසත්, විශේෂයෙන්ම කායික වශයෙන් ආබාධිත දක්ෂ සිදු දරුවන් දෙසත්, සානුකම්පිතව නෙත් සිත් යොමා, ඔවුන්ට ද ජීවිතය වින්දනය කිරීමට සුළු හෝ මොහොතක් උදාකර දිය හැකිනම්, එවැනි මොහොතකදී ඔවුන්ගේ සංවේදී හදවත් තුළින් පැන නැගී දෙනෙතින් රූරා හැළෙන කඳුළු බිඳුවක ඇති අධ්‍යාත්මික ශක්තිය මගින් පරිත්‍යාග ශීලීන්ගේ ජීවිත බබලවයි. මෙය දිට්ඨ ධම්ම වේදනීය වශයෙන් පසු පස හඹා එද්දී මතුපිටින් දකින්නන් මවිත වුවද යථාර්ථවාදි සත්‍යය එයම බව පාඨක ඔබට ද අවබෝධවනු ඇත.

සැමට සම්මා සම්බුදු සරණයි !!!

කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක

011-2877950

පිය කර සතර බඹ විහරණ සිවු පෙදෙනි
වැර සැර නැණ යුවළ දළ දිලි දන් සොඬිනි
පුව තර තුමුල මත වරණඳුට නැගෙමිනි
මන හර සෙත් පුරට පැමිණෙවු සව් සතුනි

සියලු සත්වයිනි, සතර බ්‍රහ්ම විහරණ නමැති පා සතරින් පියකරු වූ වීරගුණයත්, ඥානය නමැති දළ දෙකත් ඇති, දන්දීම නමැති සොඬවැලින් යුත්,බලවත් මහත් ඇත් රජු පිටට නැගෙමින් සිත්කලු නිවන් පුරයට පැමිණෙවු
.... (සුභාෂිතය)

මේ වගත් .. .. ..

ආචාර්ය පූජනීය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්ස ..

- අති පූජනීය මහා නායක මඩිහේ පඤ්ඤාසීහ නාහිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් කොළඹ 7, ඩී.එස්. සේනානායක විද්‍යාලයේ දී
1998 දී ආරම්භ කරනු ලැබූ ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව සඳහා පුරෝගාමී වූයේ ඔබ වහන්සේ ය.. .. .. ..

- 1996 දී උසස් අධ්‍යාපනය සඳහා කැනඩාවේ සයිමන් ෆ්‍රේෂර් විශ්වවිද්‍යාලයට ඇතුළු වූ ඔබ වහන්සේ දෙසට පරිත්‍යාගශීලීන්ගේ පින්බර දෑත් දිගු කළ මොහොතේ දී, ඉගෙනීමට දස්කම් පෙන්වන, දරිද්‍රතාවෙන් පීඩිත
ශ්‍රී ලාංකික දූ පුතුන් සිහිපත් වූයේ ඔබ වහන්සේට ය.. .. .. ..

- තම සුඛ විහරණය ගැන නොතකා ශ්‍රී ලංකා දූ පුතුන් ගුණ-නැණ බෙලෙන් යුත් පුරවැසියන් බවට පත්කරවීමේ උදාර චේතනාව පෙරදැරි කරගෙන, අග හිඟකම් ඇති අ.පො.ස. උසස් පෙළ සිසු දරුවන්ගේ සරසවි සිහිනය සැබෑ කරවනු වස්, උසස් පෙළ සිසුන් සඳහා
ප්‍රථම වරට ශිෂ්‍යත්ව ක්‍රමයක් හඳුන්වා දුන්නේ ඔබ වහන්සේ ය.. .. ..

- සුදුසුකම් ඇති සිසු දරුවන් තෝරාගැනීමේ පටන් මාසිකව අධීක්ෂණයකින් යුතුව ශිෂ්‍යාධාර ලබාදීමේ කාර්යභාර්ය සාර්ථක ලෙස ක්‍රියාවට නැංවීම සඳහා අන්තර්ජාතික සබඳතාවයේ ඇති අවශ්‍යතාව ද අවධානයට ගනිමින්, ඒ සඳහා සුදුසු
සම්බන්ධීකරණයක අවශ්‍යතාව සපුරනු ලැබුවේ ඔබවහන්සේ ය.. .. ..

- සිසු හදවත් තුළ ආකල්පමය සංවර්ධනයක් ඇති කිරීම, මුදල් පරිත්‍යාග කිරීමෙන් පමණක් කළ නොහැකි බව පෙන්වා දෙමින් ඔවුන් වෙත තිළිණ කිරීම සඳහා සාරධර්ම සම්පිණ්ඩිත,
සදහම් ග්‍රන්ථ සම්පාදනය කිරීමේ අවශ්‍යතාව ආදර්ශයෙන් පෙන්වා දුන්නේ ඔබ වහන්සේ ය.. ..

- ශිෂ්‍යත්ව ක්‍රමය ප්‍රමුඛස්ථානයේ තබා අපේක්ෂිත සමාජ මෙහෙවර
විවිධ ව්‍යාපෘතීන් ඔස්සේ දියත් කිරීමට මඟ පෙන්වූයේ ඔබ වහන්සේ ය.. .. ..

- අභියෝග හමුවේ නොසැලී සම්බාධක ජයගනිමින් පුරා වසර 14 ක්, මව් බිමෙහි ජනතාවගේ ශුභ සිද්ධිය වෙනුවෙන් ඉදිරියටම පා නැගූ උතුම් සමාජ මෙහෙවරක සාර්ථකත්වය වෙනුවෙන්,
නිබඳ අනුශාසකත්වය සහ උතුම් ආශිර්වාදය ලබාදුන්නේ ඔබ වහන්සේය.

- දෙලොවටම හිත සුව පිණිස වූ මෙවන් උත්තුංග සමාජ මෙහෙවරකට අවතීර්ණව, ලැබුවා වූ මිනිස් භවය තුළ පාරමී දම් පිරීමට මං පෙත් විවර කර දෙමින්, කළ්‍යාණ මිත්‍ර ඇසුර දෛනික ජීවිතයේ සාර්ථකත්වයට ඉවහල් වන ආකාරය
සියළුම අනුග්‍රාහක භවතුන්ට අවබෝධ කරගැනීමට අවස්ථාව සලසා දුන්නේ ද ඔබ වහන්සේ ය....

- අප්‍රතිහත උත්සාහයකින් සහ දැඩි කැපවීමකින් යුතුව ඉටුකරනු ලැබූ, වසර 14 ක මාහැඟි සමාජ මෙහෙවරක ඵලදායීතාව නිරාමිස ප්‍රීතියෙන් යුතුව එළිදක්වෙන මෙම මොහොතේ මෙම "**තුදුස් වසරක සහන් එළියක්**" කෘතිය ගෞරව සම්ප්‍රයුක්තව, පාදාභිවන්දනීය කෘතඥතාව සමගින්
බැති සිතින් පිළිගැන්වීමට සුදුසු වන්නේ ද ඔබ වහන්සේම ය.

පූජා කරමි...... පූජා වේවා !!!

සම්පාදිකා

පටුන

1 වන කොටස **වෙහෙස නිවාලන ආසිරි මල්වැසි** 01

- පූජනීය කිරම විමලජෝති හිමිපාණන්ගේ ශුභාශිංසන 02
- පූජනීය තල්පත්වැව සද්ධාතිස්ස හිමිපාණන්ගේ ශුභාශිංසන 03
- ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු නිමල් දිසානායක මැතිතුමාගේ ශුභාශිංසන 05
- ජපානයෙන් ශුභාශිංසන 07
- අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම්තුමිය ගේ ශුභාශිංසන 09
- නීතිඥ එස්. විරිතමුල්ල මැතිතුමාගේ ශුභාශිංසන 10
- ඩී.එස්. සේනානායක විද්‍යාලයේ විදුහල්පති තුමාගේ ශුභාශිංසන 11
- කළුතර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ ශුභාශිංසන 12

2 වන කොටස **මිගදා පින් බිමෙන් බැසයන හිරු** 13

- අවවාදයට වඩා ආදර්ශය උතුම්ය. 14
- Mother's Love 15
- Golden guidance for a pleasant life 16

3 වන කොටස **මාධ්‍යවේදීන් සමග සම්මුඛ සාකච්ඡාවක්** 17

- A lesson for all teachers 23
- Grateful Appreciation 23
- ප්‍රසිද්ධ ජනමාධ්‍ය සහාය 24
- A wonderful teacher 25

4 වන කොටස **ගණඳුර බිඳලන සහන් එළිය** 26

- ශිෂ්‍යත්ව පදනමක ආරම්භය (ඡායාරූපය) 28
- ආබාධිත සිසුන් ශිෂ්‍යත්ව ලබයි 29
- උසස් අධ්‍යාපනයට ආර්ථිකය අභියෝගයක් වූ දරුවෝ 30
- සිසු දරුවන් 630 ක් ප්‍රස්ථාර ගතව 33
- සිසු දරුවන්ගේ උදාර සංකල්පනා 35
- ශිෂ්‍යත්ව ලාභීන්ගේ යථා තතු අධ්‍යක්ෂ මණ්ඩලයේ පියවි ඇසින් 37
- තුති පැසසුම් 38
- මා ජීවිතයේ කවිය ඔබම විය 39

5 වන කොටස **කලණ මිතුදමක ස්වර්ණමය පුරුක්** 40

- Stable links of friendship 42
- Appreciation 46
- මෙත් සිතින් ප්‍රාර්ථනා 48
- Birds of feather flock together 49
- නිතින් මේ දිය බිඳක් පමණකි 50

6 වන කොටස **සියලු දානයන් දිනන උතුම් ධර්මදානය** 51

- සම්පාදිත ග්‍රන්ථ ජම්බුද්වීපයේ දී උතුම් පුදසුනට 52
- සම්පාදිත ග්‍රන්ථ ජ්‍යෙෂ්ඨ පුරවැසියනට 53
- ග්‍රන්ථ එළිදැක්වීමට සහ ශිෂ්‍යත්වලාභීන්ට තිළිණ කිරීම 53
- Glimpse of Awarding ceremonies 54

7 වන කොටස **උත්තුංග මෙහෙවර සත්පුරුෂ ඇසින්** 56

- පුණ්‍යානුමෝදනාවක් 56
- උපහාර පූජා 57
- නැණැස පෑදීමේ පුණ්‍යකර්මයට දායකවීමේ ආනිසංස 58
- චිරං ජයතු 59
- මහද තැන්පත් වූ නොමියෙන සිහිවටනයක් 60
- බුද්ධියට රජ කිරුළු... 61
- සියක් වසරකට සරිලන... තුදුස් වසරක මෙහෙය 62
- දිරිය දරුවන්ගේ නැණ පහන.... 64
- අගයමු නොනිමි මෙහෙවර 66
- වාලුකාවට දිය බිඳක් 67
- තිළිණ ග්‍රන්ථයන්හි ඵලදායීතාව පාඨක ඇසින් 68
- හැරී බැලිම් ආ මඟ..... 71

8 වන කොටස **අනුග්‍රාහක භවතුන්ගේ දෘෂ්ටි කෝණයට අනුව** 72

- ලෞකික ජීවිත හා බැඳෙන සැපය 72
- මෛත්‍රිය 74
- බෞද්ධ දර්ශනය හා යුතුකම් 76

9 වන කොටස **විකාශිත විශේෂ ව්‍යාපෘති** 79

- සතුටු කඳුළින් ගමක් තෙත් වෙයි. 79
- දුෂ්කර පාසල්වලට නවෝදයක් 82
- අබාධිත සරණ සේවය 86
- මානව දයාවෙන් පිරි සතුට 90
- දිවියට අත්වැලක් 93

10 වන කොටස **ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරි** 94

- නියත වූ මරණය 96
- අනුපමේය කර්තව්‍යයකින් අප ලද ප්‍රතිලාභ 100
  (Acquried advantages of the supreme task)
- ප්‍රාර්ථනා (ASPIRATIONS)

වෙහෙස නිවාලන ආසිරි මල් වැසි



බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ කිරම විමලජෝති හිමිපාණන්ගේ සුභාශිංසන

මේ සමාජය තුළ රෝපණය කරන ආධ්‍යාත්මික ගුණයන් හෙට දවසේදී මහා වෘක්ෂලතා මෙන් මේ ලෝකය ආධ්‍යාත්මයෙන් ගුණයෙන් සහ ප්‍රඥාවෙන් බබලවන විට එහි ගෞරවය හිමිවන්නේ කඨාහි මුඛ ප්‍රාප්ත මාපිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමටයි.

ලෝකයේ ජීවත්වන සත්වයින් අතර ශ්‍රේෂ්ඨතම සත්වයා මිනිසා වන්නේ ඔහු සිතන, පතන ක්‍රියාකරන ආකාරය මෙන්ම ඔහුගේ සියළු ක්‍රියාකාරකම් සිය නුවණ නිසි ලෙස භාවිතා කොට මිනිසාට කටයුතු කළ හැකි හෙයිනි. සනරාමර ලෝක සිවඬකර ශාක්‍යසිංහ සම්මා සම්බුදු පියාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වය කරා එළඹියේ මානව ප්‍රඥාවේ උත්කෘෂ්ඨතවයේ තරම ලොවට හෙළි කරමින්යි. එසේ සම්බුදු බව ප්‍රත්‍යක්ෂ කිරීමෙන් අනතුරුව බුදුන් වහන්සේ වදාළේ නුවණැති මිනිසුන්ගේ ජීවන ක්‍රියාදාමයන් ප්‍රයෝජනවත් වන්නේ තමා ජීවත්වන සමාජයට බවයි. එය උන්වහන්සේගේ ජීවිතයේ දක්නා පරාර්ථ සාධු චර්යාවෙන් ද මොනවට පිළිඹිබු වන්නේය.

ලොව්තුරු සම්බුදු පියාණන්, මහා රහතුන් වහන්සේලා තරමටම දෙමාපියන් ද සමාජයේ පිදිය යුත්තන් බවත්, නිවසේ දරුවන්ට දෙමාපියන්, බුදුවරුන් යැයි ද මෙලොව එළිය දක්නා සෑම මිනිසෙක්ම තම මව්පියන් බ්‍රහ්මත්වයෙන් පිදිය යුතු බවත් වදාළේ මාපියන් සමාජ ගෞරවයට සුදුස්සන් වන බැවිනි.

උදාර මාපියන් අනුස්මරණය කරන්නට පිහිටුවාගත් උක්ත **"මාපිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම"** මේ වන විට සිය ගමන් මඟ අනාගතයට දිසානතිව අවුරුදු දහහතරක් ගමන් කොට තිබේ. නැණවතුන් කිසිවිටක බාධක හමුවේ සැලෙන්නේ නැත. සමාජ මෙහෙවරෙහි ද ප්‍රශංසාව මෙන්ම බාධක පැමිණීම ස්වභාවිකය. එහෙත් මේ සමාජය තුළ රෝපණය කරන ආධ්‍යාත්මික ගුණයන් හෙට දවසේදී මහා වෘක්ෂලතා මෙන් මේ ලෝකය ආධ්‍යාත්මයෙන් ගුණයෙන් සහ ප්‍රඥාවෙන් බබලන විට එහි ගෞරවය හිමිවන්නේ කඨාහි මුඛ ප්‍රාප්ත **මාපිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමටයි.**

තවද නිසි අධ්‍යාපනයක් ලබන්නට හැකියාව, දක්ෂතාව ඇතත් ආර්ථික අපහසුතා හේතුවෙන් ඈත පිටිසර ගම් දනව්වල අහිංසක දරුවන් අධ්‍යාපනයෙන් ඉවත්වන හා පාසැල් වැසීයන අවස්ථා අප රටේ කොපමණාවත් ඇත. එවැනි දේට අභියෝග කරමින් දුෂ්කර ගම්මාන, විහාරස්ථාන හා පාසැල් සංවර්ධනය කිරීමට දරන්නා වූ ප්‍රයත්නය අතිශය ප්‍රශංසනීයයි. සසර පින නිසා සියළු සම්පත් ලබන්නන් ඒ සම්පත් නැවතත් සමාජ මෙහෙවරට යොමු කිරීම උපනුපන් භවවල සම්පත් ලැබීමටත් ලැබූ ධනධාන්‍යාදිය සසරේදී සැප ලබන්නට නිවැරදිව තැන්පත් කිරීමක් ලෙසත්, අංගුත්තර නිකායේ එන ආදිත්ත සූත්‍රයේදී පෙන්වා දී ඇත. ඒ නිසා මෙම පදනම සිදුකරගෙන යන උගතුන්, නැණවතුන්, ගුණවතුන් සහ බුද්ධිමතුන් ඒකරාශී කරමින් නව ආධ්‍යාත්මික සමාජ වටපිටාවක් නිර්මාණය කරමින්, දේශයේ උපන් මිනිසුන් උපන් දේශයට ණය නැත්තන් කරමින් සිදුකරන්නා වූ මේ මහා සමාජ මෙහෙවර කෙත්වත් සරුසාර කරමින් ගලායන මහා ගංගාවක් පරිද්දෙන්, ජාති කුලමල දේශපාලන භේද නොසලකා මේ මිහිමත වෙසෙන මානව ප්‍රජාවේ යහපත උදෙසා කැප වෙමින්, තෙරුවන්ගේ අනන්ත ගුණ බෙලෙන් ලෝක සමාජ යුග මෙහෙවරෙහි යෙදමින් බැබළේවා !!!

තෙරුවන් සරණයි,

කිරම විමලජෝති ස්ථවිර
අධ්‍යක්ෂ, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

කොළඹ-7 ඩී.එස්. සේනානායක විද්‍යාලයේ ආචාර්ය ශාස්ත්‍රපති තල්පත්වැවේ සද්ධාතිස්ස හිමිපාණන්ගේ සුභාශිංසන

අස්ථිර මිනිස් සිරුරකින් කොපමණ වැඩ කොටසක් කළ හැකිද යන්නට හොඳම නිදසුන අපේ බුදු රාජණන් වහන්සේය. උන් වහන්සේගේ වැදගත්ම සේවය පරාර්ථ සේවයයි. මිනිසාට ඥාන වර්ධනයට උදව් කිරීමයි. ඥාන වර්ධනයට උදව් කිරීම බුදුරදුන් අනුමත කළ මහා පින්කමකි. එම කාර්යය මෙම ශිෂ්‍යත්ව පදනමෙන් ඉතා මැනවින් සිදුකෙරෙයි.



අගයමු නොනිමි මෙහෙවර

මිනිස් ජීවිතයක් ලැබීම කණා කැස්බෑවා විය සිදුරෙන් අහස බලන්නාක් මෙන් ඉතාමත්ම දුලබ සිදුවීමක් හා සමාන බව බුදුදහම කියයි. එහෙත් එසේ අපහසුවෙන් ලබාගත් එම මිනිස් ජීවිතය නිසි පරිදි පවත්වාගෙන යාම ඉතාමත් අපහසු කාර්යයක් බව බුදු දහම පෙන්වා දෙයි. ලොව ඇති ශ්‍රේෂ්ඨතම ජීවන දර්ශනයක් වන බුදු දහමේ පරාර්ථ සේවයට, පරිත්‍යාගශීලීත්වයට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි. බෝසත් පාරමී පිරීමේ පටන් බුද්ධත්වය දක්වාත් බුද්ධත්වයට පත් වීමෙන් පසුවත් එකී පරාර්ථ චර්යාව ලොව කිසිවකුට සිදුකළ නොහැකි අයුරින් දවසේ වැඩිම කාලයක් මිනිසුන්ට ධර්මදානය දීමේ ක්‍රියාවලියට ඇප කැප වූ අසහාය අසිරිමත් පුද්ගලයා බුදු රජාණන් වහන්සේය.

මේ සියල්ල උන් වහන්සේට කළ හැකි වූයේ තමා උත්සාහයෙන් ලබාගත් උත්තරීතර ප්‍රඥාව නිසාය. තමා ලබාගත් ප්‍රඥාව ගම් නියම් ගම්වල දුප්පත් පොහොසත් සැමට එකලෙස බෙදා හැරියේ දිවා රාත්‍රී නොබලමිනි. මේ නිසාම උන් වහන්සේ විසින්ම දේශනා කළේ **"සබ්බ දානං ධම්ම දානං ජිනාති"** යනුවෙනි. සියළුම දානයන්ට වඩා ධර්මදානය උත්තම වන බවයි.

මේ අනුව බලන විට ධර්මදානය යනු ප්‍රඥාව දානයයි. ඥානය යනු බුද්ධියයි. බුදු දහමට අනුව චතුරාර්ය සත්‍ය අවබෝධය ඥානයේ උපරිම ඵලයයි. එහෙත් සාමාන්‍ය ජනයාට මූලික වශයෙන්ම මෙලොව පරලොව දියුණුව අත්‍යවශ්‍යයි, යහපත් අධ්‍යාපනය රටක දියුණුවේ රන් දොරටුවයි. ටැන්සානියානු ජනාධිපති ජූනියස් නියරේරේ ලොව පහළ වූ අධ්‍යාපනඥයෙකි. ඔහු උසස් අධ්‍යාපනඥයෙකු වූ නිසාම එම රට දියුණු කිරීමේ පදනම ලෙස යොදා ගත්තේ අධ්‍යාපනයයි. මෙය ලොව කාහටත් වැදගත් ආදර්ශයක් වී හමාරය.

බුදු රාජාණන් වහන්සේ කෙනෙකුගේ කාර්යය මිනිසුන් යහමඟට ගැනීමයි, මිනිසුන්ගේ බුද්ධිය විකසිත කිරීමයි. ලොව ඇති අනිත් ආගම්වල නායකයන්ද උගන්වා ඇත්තේ මිනිසුන් අධ්‍යාපනික වීම රටකට අත්‍යවශ්‍ය බවයි.

යම් රටක වටිනා ම අංශය වන්නේ අධ්‍යාපනයයි. අධ්‍යාපනය යනු කුමක්ද යන්නට නිර්වචන ඉතා සුලභයි. ලොව සියළුම රටවල පොදු සියළුම ආගම්වල පොදු වූ අධ්‍යාපනය ගැන අපගේ සිංහල සාහිත්‍යයේ ප්‍රකට උපදේශ ග්‍රන්ථයක් වන සුභාෂිත පද්‍ය සංග්‍රහයේ ඇති **"ගුණ නැණ බෙලෙන්...."** යන යෙදුම තුළ සමස්ථ අධ්‍යාපන ක්‍රියාවලියම කෙටිකර ඇතුළත් කර ඇත. **"දෙමාපිය සිහිවටන ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය"** අඛණ්ඩව වසර දාහතරක් පුරා රටේ වටිනාම ආර්ථික අපහසුතා සහිත ජව සම්පන්න තරුණ තරුණියන්ගේ ගුණ නැණ වර්ධනයට කරනු ලබන මෙහෙය අති විශිෂ්ඨ කාර්යයකි. රටක ජනතාව සහමුලින්ම අධ්‍යාපනික කරවීමේ වගකීම පැවරෙන්නේ රජයකටයි. තමන්ගේ දරුවන්ගේ කටයුතු දෙමාපියන් කෙසේ හෝ ඉටු කළ යුතුයි. එහෙත් රජයටත් දෙමව්පියන්ටත් කළ නොහැකි කටයුත්තක් මෙම ආයතනය මගින් ඉටු කිරීම උදාර ජාතික මෙහෙවරකි. මෙය ප්‍රජා සත්කාරයකි. පරාර්ථ සේවයකි. සමාජයේ බොහෝ තැන්වල මෙබඳු පදනම් හතු පිපෙන්නාක් මෙන් බිහිවෙයි. එහෙත් කෙටි කලක් යන විට ඒවායේ නමක් ගැනවත් අසන්නට නැත. මෙයට බලපාන හේතු රාශියකි. ප්‍රධානතම හේතුව ලෙස අවංක කාර්යශූර පරිපාලන මණ්ඩලයක් නැතිවීම දැක්විය හැක. මෙම ආයතනය වසරින් වසර දියුණු වන්නේ පරිපාලන ව්‍යුහයක් තුළ මෙය ක්‍රියාත්මක වන නිසා බව කිව යුතුමය.

අස්ථිර මිනිස් සිරුරකින් කොපමණ වැඩ කොටසක් කළ හැකිද යන්නට හොඳම නිදසුන අපේ බුදු රජාණන් වහන්සේය. උන් වහන්සේගේ වැදගත්ම සේවය පරාර්ථ සේවයයි. මිනිසාට ඥාන වර්ධනයට උදව් කිරීමයි. ඥාන වර්ධනයට උදව් කිරීම බුදුරදුන් අනුමත කළ මහා පින්කමකි. එම කාර්යය මෙම ශිෂ්‍යත්ව පදනමෙන් ඉතා මැනවින් සිදුකෙරෙයි. අපේ රටට දැනට ප්‍රමාණවත් බුද්ධිමතුන් නැත. රටේ උසස් අධ්‍යාපනයේ යෙදෙන දරුවන්ට උදව් කිරීම යනු රට වෙනුවෙන් කරන දිගු කාලීන ආයෝජනයකි. මෙම ශිෂ්‍යත්ව පදනම තව දුරටත් දියුණු කළහොත් සුවිශාල මෙහෙවරක් සිදු කළ හැකිය. **තෙරේසා මව්තුමිය, මාර් මියුසියස් හිගිනිස් මැතිනිය** ආදී චරිත අදටත් ජනතාවගේ මතකයේ රැඳී ඇත්තේ ඔවුන් සිදු කළ අසීමිත පරාර්ථ සේවය නිසාය.

තවද මෙහිදී මෙම ශිෂ්‍යත්ව පදනමේ ශිෂ්‍යත්වලාභීන්ට ද කිසියම් උපදෙසක් දිය යුතු යැයි සිතමි. ඔබ ඉතා වාසනාවන්තයි. අපේ සමහර දුප්පත් දරුවන් ආර්ථික දරිද්‍රතාව නිසා ගම්වලින් පැමිණ උසස් අධ්‍යාපනය හැදෑරීමට වියදමට මුදල් නැති නිසා රෑ එළිවනතුරු රැකියාවල නිරත වන අතර මේ අතරින් මුරකාර සේවය ප්‍රධාන තැනක් ගෙන ඇත. ඔවුන් සමඟ කථා කළ විට අපට දැනගත හැක්කේ ගෙදරින් උදව් කිරීමට බැරි නිසා තමා අවශ්‍ය මුදල් උපයා ගැනීමට මෙසේ සේවාකම් කරන බවයි. මෙය එක් අතකින් හොඳ වුවත් සාර්ථක ලෙස ඉගෙනීමේ ක්‍රියාවලියේ නිරතවීමට හැකියාවක් නොවන නිසා වැදගත් මානව සම්පත් බිහි නොවන බව කිව යුතුය.

ඔබගේ දෙමාපියන් නොකා නොබී ඉඩ කඩම් උගසට තබා දහසක් අපහසුතා මැද උසස් අධ්‍යාපනයට වරම් ලබන තෙක් අතිශය කටුක ගමනක් පැමිණ ඇත. දැන් ඔබේ වාරයයි. ඔබේ දෙමව්පියන්ට ඔබට සහාය දීමට මෙම ශිෂ්‍යත්ව පදනම ඔබ සමඟ අත්වැල් බැඳගැනීම ඔබේ වාසනාවකි. එයින් උපරිම ප්‍රතිඵල නෙළා ගැනීම ඔබේ වගකීමයි.

මෙවැනි ශිෂ්‍යත්ව පදනමක් ආරම්භ කොට දැයේ දරුවන් වෙනුවෙන් ගත් තීරණය ඉතා උසස්ය. කාලෝචිතය. රටට ප්‍රයෝජනවත් මානව සම්පතක් නිර්මාණය කිරීමේ කාර්යයට උරදුන් **මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමේ නිර්මාතෘවරිය** වන කොළඹ ඩී.එස්. සේනානායක විද්‍යාලයේ අවසන් වරට සේවය කොට විශ්‍රාමලත් ප්‍රවීණ ඉංග්‍රීසි ආචාරිනී කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක මැතිනියට මාගේ අවංක සුභ පැතුම් ද පිරිනමන්නෙමි.

කොළඹ ඩී.එස්. සේනානායක විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ ධර්මාචාර්ය
ශාස්ත්‍රපති පූජ්‍ය තල්පත්වැවේ සද්ධාතිස්ස හිමි

අන්ධභූතො අයං ලොකො - තනුකෙත්ථ විපස්සති
සකුන්තො ජාලමුත්තොව - අප්පෝ සග්ගාය ගච්ඡති
(ධම්ම පදය - ලෝක වග්ග)

මේ ලෝකය අන්ධය, මෙහි ටික දෙනෙක් පමණක් පඤ්චස්කන්ධය අනිත්‍යාදී වශයෙන් නිවැරදිව දකී. දැලෙන් මිදුන කුරුල්ලන් මෙන් ටික දෙනෙක් පමණක් ස්වර්ගයට යයි.

The world is engrossed in darkness, only a few see things cleary. Like birds escaping from a net, only a few would go to the blissful state, after death.

Message from Justice N E Dissanayake Rtd . Supreme Court Judge

What struck me most was the fact that students are selected for scholarships only taking into consideration their needs irrespective of their caste, creed, or religion. Even differently abled children are among them

It gives me great pleasure to send this message on the occasion of the publication of the maiden journal of Mrs Seetha N. Goonetilleke called "**තුදුස් වසරක සඳහන් එළියක් - A Moon Light of 14 Years** "

I first came to know Mrs Seetha Goonetilleke as the English Teacher at D.S.senanayaka Vidyalaya, Colombo-7, when my eldest son Prageeth Dissanayake too had entered D.S.Senanayaka Vidyalaya from St. Thomas Prep School, Colpety, to read for his G.C.E. (Advanced Level) study course.

It so happened that Mrs Seetha Goonetilleke too lives in the same neighbourhood in Rajagiriya where we are resident.

In 1998 I came to know that Mrs Seetha Goonetilleke had inaugurated a scheme of scholarships for the needy "A" Level Students sponsored by an organization called the Sri lanka- Canada Scholarships & social development society of which she was the Sri lanka Co-ordinating secretary under the guidance and advice of Venerable Dr Mirisse Dhammika Thero. Initially 36 scholarships for 'A' Level students and two scholarships to university undergraduate students, one reading for Medicine and the other reading for Management were given.

From 1998 to the year 2011 a total of 630 students have been beneficiaries of these scholarships annually. Out of this number 409 were 'A' Level students and 221 were University undergraduates. The said 221 University students belonged to Medicine, Engineering, Management and Arts disciples. What struck me most was the fact that students are selected for scholarships only taking into consideration their needs irrespective of their caste, creed, or religion. Even differently abled children are among them.

Initially the grant of the monthly scholarship per student was Rs 500/= up to a period of 24 months which is valued at Rs 12000/=

From the year 2007 the scholarships had been granted only to undergraduate students.

Up to this year a total of Rs 12,255,976/- had been collected on behalf of this scholarship fund and disbursed. **It is unique that not a single cent had been sought from State for this fund.** This fund constituted solely on voluntary contributions made by benevolent donors. This is a unique milestone for a busy retired school teacher to achieve

during her life time.

Despite the fact that this scholarship fund being started in the name of " **Sri Lanka-Canada scholarships**", with the elapse of time the said fund was dedicatedly enriched to Mrs Seetha Goonetilleke's late father the late Wijayasena Kiriwattuduwa and it was known as the " **Wijayasena Kiriwattuduwa Memorial Scholarship**". Subsequently the name was changed once again to the " **Parents Memorial Scholarships** " and is dedicated to the parents of donors. This is planned to achieve merits to the parents of the donors. Presently it is known as the **" Parents Memorial Scholarships"**.

The granting of the above scholarships is only one aspect of the social service activities of Mrs Seetha Goonetilleke. Her cherished career is the teaching profession . She has engaged in her teaching profession for the last 39 years. Even after retirement from State service she continues to conduct private tuition classes in the English Language which are well attended by students. She has a very large present and past student population. Some of them are holding very responsible positions in Sri Lanka & abroad.

She also had authored several books on religious moral and social aspects of leading good life which are of immense value to young and all for the purpose of leading a good life. If I may take the opportunity to name some of them :-

මා පිය ගුණ සමර, සාධු දැක්ම The Excellent View", "**දරිද්‍රතාව හඹායයි**", "**සුවදායක මාවතක**- A Blissful Path", "**ප්‍රීතිමත් ජීවිතයකට මග**"

I am aware that Mrs Seetha Goonetilleke leads a hectic life with busy time schedules. Primarily she is busy in conducting her English Classes at least thrice a week. She has to prepare teaching schedules for the said classes in advance. She has to correct the work of home assignments given to students.

Then she works with the correspondence relating to the scholarship fund. Working in her computer late into the night. She has no clerks or accountants to handle the accounts and the correspondence. She does all this work by herself. She uses her residence as her office. She uses her private computer and the private telephone for her said work. She has set apart time from 9 p.m to 12 p.m to answer various telephone calles of students who seek her advice on various matters. Sometimes pertaining to the scholarships and sometimes seeking her advice on various problems that they face in their day to day life.

In between these heavy schedules she had found the time to author the several books mentioned above. In the meanwhile she had found time to compile this educative magazine " **තුදුස් වසරක සඳහන් එළියක්**" which is her maiden effort at compiling a magazine.

I wish her the best wishes in all her said assignments and other activities and wish her courage and a long life to carry on with her good work for many years to come.

4th October 2011
Justice N. E. Dissanayake
392/3,Kotuwegoda
Rajagiriya

Justice N.E.Dissanayake
Rtd. Supreme Court Judge
Chairman ,Administrative
Appeals Tribunal

ජපානයෙන් සුභාශිංසන

අන්‍යෝන්‍ය වශයෙන් උදව් උපකාර කර ගැනීමේ ඇති යහපත් ප්‍රතිඵල පිළිබඳව උදාහරණ රැසක්, ජපානයෙන් අපට සොයා ගත හැකිය. ජපානයේ නිදහස් අධ්‍යාපනය ලැබෙන්නේ 9 වන ශ්‍රේණිය දක්වා පමණි. එබැවින් උසස් අධ්‍යාපනය ලැබීමට ආර්ථික අතින් අපහසුතා ඇති දූ දරුවන්ට රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මගින් විවිධ ශිෂ්‍යත්ව ක්‍රම සම්පාදනය කර තිබේ.

ශ්‍රී ලාංකික දක්ෂ දූ පුතුන්ගේ උසස් අධ්‍යාපනය වෙනුවෙන් වාර්ෂිකව ශිෂ්‍යත්ව ප්‍රදානය කෙරෙන මා **පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම** මගින් සම්පාදනය කරනු ලබන ''**තුදුස් වසරක සහන් එළියක්**'' නම් වූ වාර්තාමය සඟරාව සඳහා සුභ පැතුම් පණිවිඩයක් නිකුත් කිරීමට අවස්ථාවක් ලැබීම පිළිබඳව මම බෙහෙවින් සතුටට පත් වෙමි.

පළමු වසරේ පටන් උසස් පෙළ දක්වා ශ්‍රී ලංකාවේ දී අධ්‍යාපනය ලැබූ මම, ආචාර්ය උපාධිය දක්වා ජපානයේ ඕසාකා විශ්වවිද්‍යාලයේ දී අධ්‍යාපනය ලැබුවෙමි. ශ්‍රී ලාංකික දූ දරුවන්ට විශ්වවිද්‍යාල මට්ටම දක්වා සම්පූර්ණයෙන්ම නොමිලේ අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව ලබාදුන්, නිදහස් අධ්‍යාපනයේ පියාණන් වන සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමාත්, වාර්ෂිකව ලොව පුරා වෙසෙන ඉතාමත් දක්ෂ තරුණ දරුවන්ට ජපානයේ විශ්වවිද්‍යාලවල නොමිලේ උසස් අධ්‍යාපනය ලබාගැනීමට අවස්ථාව ලබාදෙන ජපන් රජයත්, මම මෙහිලා කෘතඥතා පූර්වකව සිහිපත් කරමි.

අපට හය හතර ඉගැන් වූ අපගේ මව් බිම වෙනුවෙන් කී සියම් ප්‍රත්‍යුපකාරයක් කිරීමට, අපට පළමුවෙන්ම අවස්ථාවක් ලබාදුන්නේ, අතිපූජ්‍ය ගෞරවාර්හ මිරිස්සේ ධම්මික ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් ආරම්භ කරන්නට යෙදුන **ශ්‍රී ලංකා කැනඩා ශිෂ්‍යත්ව පදනමයි**. ඉන්පසු, එවකට යථෝක්ත පදනමේ ලේඛකාධිකාරිතුමිය හැටියට ක්‍රියා කළ අප මෑණියන් විසින්, අප මුත්තණුවන්ට පින් පිණිස ආරම්භ කරන්නට යෙදුන **විජයසේන කිරිවත්තුඩුව ශිෂ්‍යත්ව ක්‍රමය** හා **මාපිය අනුස්මරණ ශිෂ්‍යත්ව ක්‍රමය** මගින් ශ්‍රී ලාංකික දූ දරුවන්ට අපට හැකි පමණින් ආධාර උපකාර කිරීමට අවස්ථාවක් ලැබුණි. මෙම ශිෂ්‍යත්ව ක්‍රියාදාමයට ජපානයේ වෙසෙන මා මිතුරන් කිහිප දෙනෙකු ද සමඟ, මේ දක්වා ශිෂ්‍යත්ව 39 කට දායක වීමු.

අන්‍යෝන්‍ය වශයෙන් උදව් උපකාර කර ගැනීමේ ඇති යහපත් ප්‍රතිඵල පිළිබඳව උදාහරණ රැසක්, ජපානයෙන් අපට සොයා ගත හැකිය. ජපානයේ නිදහස් අධ්‍යාපනය ලැබෙන්නේ 9 වන ශ්‍රේණිය දක්වා පමණි. එබැවින් උසස් අධ්‍යාපනය ලැබීමට ආර්ථික අතින් අපහසුතා ඇති දූ දරුවන්ට රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මගින් විවිධ ශිෂ්‍යත්ව ක්‍රම සම්පාදනය කර තිබේ. උදාහරණ වශයෙන්, දෙමාපියන් නොමැති දරුවන්ට විශේෂ වූ ශිෂ්‍යත්ව, විදේශික ශිෂ්‍යයන්ට විශේෂිත වූ ශිෂ්‍යත්ව, ආදිය හඳුන්වා දිය හැකිය.

එමෙන්ම 2011 වසරේ විශාල භූමිකම්පාවක් ඇති වූ අවස්ථාවේ. ජපානයේ විවිධ ප්‍රදේශවලින් ද්‍රව්‍යමය ආධාර පමණක් නොව, අනතුරට පත්වූ අයට උදව් කිරීමට විශාල පිරිසක්, එම අනතුරට පත්වූ ප්‍රදේශ වලට එක්රොක් වූහ. මේ ආකාරයෙන් අන්‍යෝන්‍ය වශයෙන් උදව් උපකාර කරගැනීම තුළින්, දෙවන ලෝක සංග්‍රාමයෙන් පසුවත් ජපානය ලෝකයේ ඉහළම තැනකට එන්නට සමත් විය.

මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව ක්‍රමය, හා ජපානය ආදී රටවල කෙරෙන සමාජ සේවා වැඩ කටයුතු ආදර්ශයට ගනිමින්, ලංකාවේ විවිධ ආයතන මගින්, ලංකාවේ අනාගතය භාර ගැනීමට සිටින දූදරුවන් වෙනුවෙන් මෙවැනි ශිෂ්‍යත්ව ක්‍රම දියත් කෙරේනම්. විවිධ සමාජ සේවා කටයුතු ආරම්භ කෙරේ නම්, එය අප

ශ්‍රී ලංකාවේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් මහත් පිටිවහලක් වනු ඇත.

මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව ක්‍රමය ඉදිරියටත් පවත්වා ගෙන යෑමට එහි නිර්මාතෘවරිය වූ මගේ මෑණියන්ටත්, එමෙන්ම සියලුම දයක පින්වතුන්ටත් ධෛර්ය ශක්තිය ලැබේවා ! එමෙන්ම ශිෂ්‍යත්ව ලාභී දූ දරුවන්ටත් යහපත් වාසනාවන්ත අනාගතයකට මෙම ශිෂ්‍යත්ව ක්‍රමය පිටිවහලක් වේවා ! තවද මේ පින් අනුමෝදන් වීමෙන් අප නමින් මිය පරලොව ගිය සියලුම ඥාතිමිත්‍රාදීහු සගමොක් සැප සාක්ෂාත් කර ගනිත්වා !

ආචාර්ය සඳේව ගුණතිලක
(පරිගණක ඉංජිනේරු - ජපානයේ ටෝකියෝ නගරයේ සිට)

පින් මඳ පුතුන් සියයක් ලදුවත් — නිසරු
ගුණ නැණ බෙලෙන් යුතු පුතුමය ඉතා — ගරු
එක පුන් සඳින් දුරුවෙයි ලොව ගණ — අඳුරු
නෙක තරු රැසින් එලෙසට නොම වේය — දුරු

පින් මඳ පුතුන් සියයක් ලැබුනත් පලක් නැත. ඉතා උතුම් වන්නේ ගුණයෙන් ද නුවණින් ද බලයෙන් ද යුත් පුතුමය. එක පුන් සඳින් ලොව ගණ අඳුර දුරුවන්නාක් මෙන් ඔහු සිය ගුණ නැණ බලයෙන් ලොව බබළවයි.(සුභාෂිතය)

අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම් තුමියගේ සුභාශිංසන

සුභපැතුම්..... හදපිරි තුටින්....

සමාජයට යහපත් ආදර්ශයක් සපයන සමාජ සේවිකාවක් ලෙස හා සුවහසක් සිසුන්ගේ නැණස පෑදූ ගුරු මාතාවක් ලෙස සීතා නන්දනී ගුණතිලක ගුරු මෑණියන් විසින් සිදු කරනු ලබන සමාජ මෙහෙවර පිළිබඳව හොඳින් දන්නා අයෙකු ලෙස ඇය විසින් සම්පාදනය කරන "**තුදුස් වසරක සහන් එළියක්**" කෘතිය වෙනුවෙන් සුභ පැතුම් එක් කරන්නේ හදපිරි සතුටිනි.

රුපියල් ශත සොයා යන සමාජයක කිසිදු ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරමින් ඇය විසින් පවත්වාගෙන යනු ලබන මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම මගින් උසස් අධ්‍යාපනය ලබන දිළිඳු දරුවන්ට ලැබෙන අත්වැල අතිමහත්ය. මෙකී සත්කාරය මගින් රටේ අනාගතය භාර ගැනීමට සිටින තරුණ සිසු පරපුරට ලැබෙන ශක්තිය හරහා මේ රටේ අනාගතය වෙනුවෙන් යහපත් අඩිතාලමක් වැටෙනු ඇත.

සාරධර්ම අගයන සමාජයක් බිහිවීම උදෙසා ඇය විසින් සිංහල සහ ඉංග්‍රීසි යන මාධ්‍ය දෙකෙන්ම රචිත සාරගර්භ පොත් හා සඟරා මගින් මහඟු පිටිවහලක් සපයයි.

මෙකී නිර්මාණ තුළින් ඇය සතු නිසඟ කුසලතාව පිළිඹිබු වනවා මෙන්ම සමාජයට යහපත් ආදර්ශයක් ලබාදීමට ගන්නා වූ උත්සාහය තුළින් ඇය සතු මානව හිතවාදී ගුණය මනාව විදහා දැක්වේ.

හරවත් දෙයට ජනතාව නැඹුරු කරවීම අධ්‍යාපන සමාජයේ බලවත් අවශ්‍යතාවකි. ඒ අනුව සීතා නන්දනී ගුණතිලක මැතිනිය විසින් සිදුකරන සමාජ මෙහෙවර ඉතා ඉහළින් අගය කළ යුතුව ඇත.

එමෙන්ම එකී කටයුතු මෙහෙයවීම සඳහා ඇය සතු නොපසුබස්නා වීර්යය පිළිබඳව වෙසෙසින් සිහිපත් කළ යුතුය. ඇයගේ මෙම සමාජ මෙහෙවරට සිය ස්වාමියාගෙන් සහ දරුවන්ගෙන් ලැබෙන සහාය ද මා හැඟිය.

සීතා නන්දනී ගුණතිලක මැතිනියගේ චරිතය මේ රටේ කාන්තාවන්ට මහඟු ආදර්ශයක් සපයන අතර ඇයගේ භූමිකාව පිළිබඳව සිහිපත් කිරීමේදී අභියෝග හමුවේ ඉන්ද්‍රඛීලයක් සේ නොසැලී කටයුතු කිරීමේ ගුණයත්, කිසිදු ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන පරිත්‍යාගශීලි ගුණයත්, සමාජය පිළිබඳ යහපත් චේතනාවෙන් ඉස්මතු වූ සමාජ උන්නතිය උදෙසා කැපවීමේ ගුණයත් ප්‍රශංසනීය වේ.

ප්‍රියංගා එච්. හඳුන්හේවා
සහකාර ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

තරුණ කටයුතු අමාත්‍යාංශයේ හිටපු ලේකම් නීතිඥ එස්. විරිතමුල්ල මැතිතුමාගේ සුභාශිංසන

ගුණගරුක උසස් දරු ප්‍රජාවක් රටට දායාද කිරීම, දෙමාපියන්ගේ ආශිර්වාදයේ බල මහිමය සිත් සතන්තුළ ජනිත කරවීම මෙන්ම අධිෂ්ඨානය ඇතිනම් අධ්‍යාපනය ලබන්නට අගහිඟකම් බාධාවක් නොවන බව ඉස්මතු කරදීම මෙම සංවිධානයේ ගැඹුරු අරමුණු අතර වේ.

අප ලබන මිනිසත් බව අර්ථවත් වන්නේ අප කෙතරම් ප්‍රයෝජනවත් මනුෂ්‍යයන් වන්නේ ද යන කාරණය මත ය. තමා ජීවත් වන සමාජයටත් මනුෂ්‍ය සංහතියටත් සුභ සිද්ධියක් සලසන්නට හැකි වේ නම් මිස එම කිසියම් පුද්ගලයෙකු ගැන කියන්නට යමක් ඉතිරි වන්නේ නැත. අධ්‍යාපනයෙන්, ආර්ථික ශක්තියෙන්, සමාජීය ප්‍රබලතාවන්ගෙන් සමාජය තුළ හිස ඔසවන කෙනෙකු තමාට වඩා ශක්තියෙන් අඩු පිරිසකට උපකාරයක් කරතොත් ලබන ආත්ම තෘප්තිය අපමණ ය.

මීට වසර හතකට පමණ පෙර ඇරඹි දෙමාපිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම සමාජයේ උදව්වක් අවශ්‍ය පිරිසකට අත දීමට ඉදිරිපත් වීමෙන් ඉටුකරන මා හැඟි සේවාව මිල කළ නොහැකි ය. ගත වූ කාලය තුළ, රජයෙන් හෝ වෙනත් කිසි ම ආයතනයකින් උපකාරයක් නොමැතිව රුපියල් මිලියන 12 කට අධික මුදලක් මෙම කුඩා සංවිධානය විසින් ශිෂ්‍යත්ව සත් කාර්යයේ ලා ආයෝජනය කිරීම විශ්මය ජනක ය. එහි නිර්මාතෘ සීතා ගුණතිලක මහත්මිය දහස් ගණන් දරුවන්ගේ දෑස් පාදා, තම විශ්‍රාම දිවිය කැප කර තිබෙන්නේ අත දිය යුතු පිරිසකට පිළිසරණ වීමට ය. උසස් අධ්‍යාපනයක් ලබන්නට තරම් දක්ෂතාවක් ඇතත් තම දෙමාපියන් අහිමිවීම වැනි හේතූන් නිසා උද්ගත වූ අගහිඟකම් වලින් පෙලෙන දරු දැරියන් විශාල සංඛ්‍යාවකට සීතා ගුණතිලක මහත්මිය මවක් මෙන් පිහිට වෙයි. ගුණගරුක උගත් දරු ප්‍රජාවක් රටට දායාද කිරීම, දෙමාපියන්ගේ ආශිර්වාදයේ බල මහිමය සිත් සතන් තුළ ජනිත කරවීම මෙන් ම අධිෂ්ඨානය ඇතිනම් අධ්‍යාපනය ලබන්නට අගහිඟකම් බාධාවක් නොවන බව ඉස්මතු කර දීම මෙම සංවිධානයේ ගැඹුරු අරමුණු අතර වේ.

සුදුස්සන් බවට ඉතා පරෙස්සමෙන් තෝරා ගනු ලබන ප්‍රතිලාභී සිසු දරු දැරියන්ට ලබා දෙන ශිෂ්‍යත්වයේ අගය කියා දී, ශිෂ්‍යත්ව කටයුතු මනා ලෙස අධීක්ෂණය කොට කළමණාකරණය කිරීමට ගුණතිලක මාතාව දරන වෙහෙස මහන්සිය හැම දෙනාගේ ම පැසසුමට ලක් වේ.

තම දෙමාපියන් සිහිපත් කොට ඔවුන්ට පින් පැමිණවීමේ අරමුණෙන් දරුවන්ට ශිෂ්‍යත්ව ලබාදීමට ඉදිරිපත් වී සිටින පින්වතුන්ට මම ගෞරව කරමි. දෙමාපිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමේ කටයුතු දිනෙන් දින සඵල වී මෙරට උසස් අධ්‍යාපනය ලබන්නට වරම් ඇති එහෙත් අගහිඟකම් වලින් පෙළෙන දරු දැරියන්ට අඛණ්ඩ ව සේවය කිරීමට ඉඩ කඩ සැලසීමට වාසනාව ලැබේවායි ඉත සිතින් පතමි.

නීතිඥ එස්. විරිතමුල්ල
තරුණ කටයුතු අමාත්‍යාංශයේ හිටපු ලේකම්

කොළඹ-7 ඩී.එස්. සේනානායක විද්‍යාලයේ විදුහල්පතිතුමාගේ සුභාශිංසන

අපේ රටේ විශ්ව විද්‍යාලවල උසස් අධ්‍යාපනයට ගම්බද දුප්පත් දරු දැරියන් විශාල පිරිසකට මෙම ඉඩ කඩ ලැබී ඇත්තේ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය නිසාය. එහෙත් වර්තමාන ආර්ථික රටාව තුළ ඔවුනට තම අවශ්‍යතා සඳහා වියදම් කිරීමේ හැකියාවක් දෙමාපියන්ට නැත. එබඳු දරුවන් වෙනුවෙන් වසර 14 ක් පුරා නොකඩවා ශිෂ්‍යත්ව අරමුදලක් පිහිටුවා උසස් අධ්‍යාපන ක්‍රියාවලියට දිරි දීම උත්තරීතර සමාජ මෙහෙයක් මෙන්ම ජාතික වශයෙන් කරනු ලබන මහඟු සේවාවක් ලෙස හැඳින්විය හැකිය.

රටක වැදගත්ම සම්පත වන්නේ මානව සම්පතයි. මානව සම්පත සංවර්ධනයකින් තොරව රටක් නිවැරදිව සංවර්ධනයක් කරා ගෙන යා නොහැක. භෞතික සම්පත් නිර්මාණයටත් ඒවා නිවැරදිව ප්‍රයෝජනයට ගැනීමටත් කුසලතා පූර්ණ මානව සම්පතක් රටකට තිබිය යුතුමය. මෙම සම්පතේ එක් වැදගත් සංඝටකයකි. උසස් අධ්‍යාපනය සඳහා සුදුසුකම් ලැබීම.

වර්තමාන ලෝකයේ ජීවත්වන සියළු දෙනාටම අධ්‍යාපනයේ සම අවස්ථා ලබාගත නොහැකි වුවත් ආර්ථිකමය හැකියාවක් තිබෙන අය එම අවස්ථා මග හැරිය යුතු යැයි අපට නිව නොහැක. එසේ කරගැනීමට හැකි කමක් ඇති අයට අධ්‍යාපනය ලැබීමට තිබෙන ඉඩකඩ අසුරා තැබීම සාධාරණත්වය සඳහා ශිෂ්ඨාචාරය කැපකිරීමක් ලෙස ද සමහරු හඳුන්වති. මෙයින් ගම්‍යමාන වන්නේ ඉදිරියේ දී අප විසින් බිහිකිරීමට බලාපොරොත්තු වන අධ්‍යාපන ප්‍රතිපත්තිය සෑම දරුවකුට හා දැරියකටම එම ක්‍රමයෙන් ලබාගත හැකි උසස්ම ප්‍රතිඵල ලබාගැනීමට අවස්ථාවක් සලසා දෙන ක්‍රමයක් විය යුතු බවයි.

අපේ රටේ විශ්ව විද්‍යාලවල උසස් අධ්‍යාපනයට ගම්බද දුප්පත් දරු දැරියන් විශාල පිරිසකට මෙම ඉඩකඩ ලැබී ඇත්තේ නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය නිසාය. එහෙත් වර්තමාන ආර්ථික රටාව තුළ ඔවුනට තම අවශ්‍යතා සඳහා වියදම් කිරීමේ හැකියාවක් දෙමාපියන්ට නැත. එබඳු දරුවන් වෙනුවෙන් වසර 14 ක් පුරා නොකඩවා ශිෂ්‍යත්ව අරමුදලක් පිහිටුවා උසස් අධ්‍යාපන ක්‍රියාවලියට දිරි දීම උත්තරීතර සමාජ මෙහෙයක් මෙන්ම ජාතික වශයෙන් කරනු ලබන මහඟු සේවාවක් ලෙස හැඳින්විය හැකිය. **Parents Memorial Scholarship Foundation** වසර දාහතරක් පුරා අඛණ්ඩව මේ වන විට ඉතා සාර්ථකව සිසුන් 630 කගේ උසස් අධ්‍යාපනයට මැනවින් දායක වී ඇත. ජාති ආගම් කුල භේද වලින් තොරව මෙබඳු ආයතනයක් පිහිටුවා සුබ පතන්නන්ගේ සහයෝගයෙන් පමණක් සිදුකරන සේවය මුළු මහත් සමාජයටම උතුම් ආදර්ශයක් වේවා!යි පතන අතර මෙම පදනමට තවත් දහස් ගණනක් සිසුන්ගේ නැණ පහන් දැල්වීමට වාසනා ශක්තිය ලැබේවා!යි ද පතමි.

ඩී.එම්.ඩී. දිසානායක
විදුහල්පති
ඩී.එස්. සේනානායක විද්‍යාලය
ග්‍රෙගරි පාර, කොළඹ 07.

කළුතර - අතිරේක කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ සුභාශිංසන

සම්මුති සැපත, පරමත්ථ සැපත අභිභවා යන ලෝකෝත්තර සැපතක් කරා අප සැම යොමු කරවන ගෞරවනීය අනුශාසක ස්වාමීන් වහන්සේ ඇතුළු අධ්‍යක්‍ෂ මණ්ඩලයට චිරං ජයතු !!!

ජීවන ගමන යාමේදී අප අඳුරේ යා යුතු නැත. විශ්ව ශක්තියේ බල මහිමය විදහා දක්වන ප්‍රදීපස්ථම්භ දහයකි. දානය, නෛෂ්ක්‍රම්‍ය, ප්‍රඥාව, වීර්යය, ක්‍ෂාන්ති, සත්‍යය, අධිෂ්ඨානය, මෛත්‍රිය, උපේක්ෂාව යන එම ආලෝක කදම්භ පැහැදිලි මාවතක් ඔස්සේ වැටී ඇත. එහි ගමන් ගැනීමට ප්‍රඥාව විකසිත වූයේ නම් පැහැදිලි වූ ගමන් මාවතක් ඔස්සේ පිය නැගිය හැක.

පුද්ගලයෙකුගේ අනන්‍යතාවය නිර්ණය කිරීමේදී නිරතුරුවම ඔහුගේ වෘත්තියට කිසියම් වටිනාකමක් ලැබෙයි. එය සමාජීය මිනුම් දණ්ඩ පමණි. නිස්සරණ අධ්‍යාශයෙන් යුතුව තම සේවය උපරිම කැපවීමකින් යුතුව දානය කරමින් (අනුන් වෙත ලබා දෙමින්) සීලාදී ගුණදම් හි නිරත වෙමින්, ලාභ අපේක්‍ෂාවෙන් තොරව නෛෂ්ක්‍රම්‍යයෙන් ක්‍රියා කරන ප්‍රඥාවන්ත පිරිස් ඒකරාශී වීමෙන් ඔවුනොවුන් අතර ඇති වන්නේ බොහෝ විට නිවැරදි අනන්‍යතාවකි.

එසේ හඳුනාගෙන අන් අයගේ යහපත වෙනුවෙන් සාමූහිකව ක්‍රියා කිරීමට එක්වන්නෝ එම අභිමතාර්ථය ඉටුකර ගැනීමට වීර්යය වඩයි. පැන නගින්නා වූ බාධක, අභියෝග හමුවේ නොසැලී ඒ සියල්ලක් ආශිර්වාද සේ සලකමින්, සත්‍ය ගරුකව, අධිෂ්ඨාන පූර්වකව තම ගමන් මග ඔස්සේ පා නගයි. මෛත්‍රිය යේ උල්පතක් බඳු වූ අප අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව, මාසිකව, දෛනිකව, නොව සෑම මොහොතක් පාසාම ඉටු කරනු ලබන කාර්යය භාරය අති විශාලය. ඒ සියල්ල උපේක්ෂා සහගතව විඳ දරාගනිමින්, අප සමගින් මේ යන්නා වූ ගමන් මග සැබවින්ම දස ආකාර ප්‍රදීපස්ථම්භයන්ගෙන් ආලෝකවත් වූ ඍජු මාවතකි.

මෙම නිර්මල මාවතේ මාර්ගෝපදේශකයාණන් අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේමය. උන්වහන්සේ විසින් දේශනා කරන ලද ශ්‍රී සද්ධර්මය ඔස්සේ අපට මග පෙන්වන්නෝ අති උතුම් සංඝ රත්නයමය, සම්මුති සැපත, පරමත්ථ සැපත අභිබවා යන ලෝකෝත්තර සැපතක් කරා අප සැම යොමු කරවන ගෞරවනීය අනුශාසක ස්වාමීන් වහන්සේ ඇතුළු අධ්‍යක්‍ෂ මණ්ඩලයට **චිරං ජයතු !!!**

ගරු ප්‍රධාන අනුශාසක	-	පූජනීය ආචාර්ය මිරිස්සේ ධම්මික හිමි
ගරු අනුශාසක	-	පූජනීය තල්පත්වැව සද්ධාතිස්ස හිමි
ගරු සභාපති	-	කේ. සීතා එන්. ගුණතිලක මිය
ගරු උප සභාපති	-	සුනේත්‍රා හෙට්ටිආරච්චි මිය
ගරු සම ලේකම්	-	හේමාංගනී සමරක්කොඩි මිය
ගරු සම ලේකම්	-	නීතිඥ නයනි දයාරත්න මෙනවිය
ගරු භාණ්ඩාගාරික	-	එම්.ඩී. නිමල් ගුණතිලක මයා
උප ලේකම්	-	චම්පා රත්නසේකර මිය
කාරක සභිකයින්	-	ආර්. දොළුවීර මයා
		චිත්‍රානි නානයක්කාර මිය
		ඒ.පී. ද සිල්වා මිය
		එස්. දිසානායක මිය
		සුජාතා කරුණාරත්න මිය
		එස්. නිරිඇල්ල මිය

අනුග්‍රාහක ආර්. තිස්ස පෙරේරා
නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂ - කළුතර

ඉසිපතන මිගදා පින් බිමෙන් බැස යන හිරු



උගත් නූගත් වුවත් සැම වෙත බේදයක් නැත එළිය දෙන්නේ
එහෙත් දිනකර නිරන්තරයෙන් සැඳෑ සමයේ බැසී යන්නේ
තවත් මොනදේ උදාවන මුත් ලොවේ කිසිවක් නැත රැඳෙන්නේ
පිනත්, කළ කී දෙයත්, පමණකි අපිත් යනවිට අරන් යන්නේ

අවවාදයට වඩා ආදර්ශය උතුම්ය.

මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම් පරිශ්‍රය තුළ විධිමත් අයුරින් සිය දෙමාපියන් අනුස්මරණය කෙරෙන වගයි.

යහපත් වූ ආර්ථික හා සමාජීය තලයක අද යම් සත්පුරුෂයෙකු වේ නම් ඒ තම දයාබර මෑණියන්ගේ සහ පියාණන්ගේ අප්‍රමාණ සෙනෙහස, දයාව, කරුණාව, සහ දැඩි කැපවීම නිසා ම බව ඔවුනට අවබෝධවනු ඇත. එවන් වූ සුවිශාල මෙහෙවරක් තම දරුවන් වෙනුවෙන් ඉටුකර තබා අද මෙලොවින් සමුගෙන ඇති ගුණබර දෙමාපියන් හට ඔබ අප කවුරුත් සදා ණයගැත්තෝ වෙමු. සම්බුදු දහමේ පෙන්වා දෙන අන්දමට උතුම් සැපතක් කරා පෘතග්ජන අයගේ ආධ්‍යාත්මය මෙහෙයවීමට නම් මව්පිය ගුණ හදවතින්ම දැකිය යුතුමය. දෙමාපියන්ට සලකන, මව්පිය ගුණ අගයන සාර ධර්ම සුරකින උගත් පුරවැසියන් පිරිසක් සමාජයට දායාද කිරීමට **මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම** ක්‍රියා කරනුයේ අවවාදයෙන් නොව ආදර්ශයෙන්මය.

අභිවාදන සීලිස්ස - නිච්චං වද්ධා පචායිනෙ
චත්තාරෝ ධම්මා වඩ්ඪන්ති - ආයු වණ්ණො සුඛං බලං

One who contantly respect, worship & venerate the elders (elders of age, elders of knowledge & the elders of morally characterized with moral virtuous, is blessed with Long life, pleasant look, happiness and discriminate strength due to the improving intellect.

යමෙකු නිරතුරුවම, දෙමාපියන් වැනි වයසින් වැඩි, ගුරුවරුන් වැනි දැනුමෙන් වැඩි, පැවිදි උතුමන් වැනි සීලාදි ගුණයන්ගෙන් වැඩි අයට ගරු සැලකිලි දක්වන්නේ නම් සහ ඔවුන් සමඟ පිළිසඳරෙහි යෙදෙමින් සුව දුක් විචාරා බලන්නේ නම් එවැන්නකු තුළ ආයුෂ, වර්ණ, සැප, බල නමැති ධර්මතා 4 ක් වැඩෙයි.

MOTHER'S LOVE

A mother to a child is – worthy friend so frank
Debt can't be settled – for the milk you drank

Forgiving us mothers – help & guide
Make our foot steps – far & wide

In health or sickness - trouble or pain
Nine months carries us – without complain

Then dawns the day – her babe she holds
Her happiness in words – can not be told

From infancy - great care she takes
Through out the Night – she often awakes

Fond and nursing – both all right
Bestow her love – with all her might

Hand clasp tightly – when he walks
Walks he to school – with no other pose

When at the doorstep – that he has to part
A great cry that – comes from heart

Happy school life – pass rapidly away
Thanks to mother – who toiled night & day

To give of her best to – her child in every way
Nothing to lack for him – to make him happy & gay

Then to the prime – of youth he steps
Happy the mother – who fulfils her test

With what great hopes – she longed for the day
To see him grown up – properly day by day

Busy are the children – of the world today
Aged mothers can't be – looked after they say

Home for elders – their mother they send
And care not for them – up to the end

In many other ways – mothers do suffer
Grown up children – no help them offer

Abusing, Threatening – against them rise
The return a mother gets; Oh what a surprise?

Silently she bears – her ups & downs
The LOVE for children – she never frowns

Amids her suffering – she wishes them well
Happiness & prosperity such words foretell.

K.S.N. Goonetilleke

GOLDEN GUIDENCE FOR A PLEASANT LIFE

- Come - As a respectable, worthy person to the society
- Sit - on a suitable seat without disturbing others
- Eat - Setting apart at least a small portion to some one else
- Drink - Anything which does not cause heedlessness
- Write - Something useful to the society.
- Say - Only essential things after thinking twice
- Smile - Not sarcastically but to please others
- Talk - About anything without gossips & harsh words
- Listen - Well, paying very good attention
- Look - At far before put into action what you think
- Live - Without disturbing to the anyone else
- Do - the duties honestly in time
- Manage - The time methodically
- Avoid - Criticism about others
- Deal - With what gain without getting into debt
- Wear - Suitable dress for the place you visit
- Learn - Something always
- Welcome - Visitors respectfully according to the culture
- Drive - Carefully & alertly complying with the road rules
- Guard - your words while talking - not to hurt others
- Be Silent - If you can't involve in peaceful & moral talk
- Think - There's nothing that can not be achieved
- Clean - Your mind with Metta always
- Save - Little by little what you earn -- for the future
- Worship - The feet of the parents at least once a day
- Achieve - The great blessings of the parents to fulfill goals
- Be courage - Thinking the power of blessings is supreme
- Take - The best use of 'Time"
- Sleep - Only to have a break
- Awake - Pleasantly
- Help - The poor & needy very often
- Go - For 3 refugees Buddha,Dhamma & Sanga daily
- Observe - Five precepts daily
- Be polite - to all in the society as well as to parents & Teachers
- Face - With Challenges bravely
- Take Care - of parents in their dotage
- Appreciate - The talents of others without being jealousy
- Make - A worthy person to the society
- Develop - honest thoughts in your heart
- Purify - the heart with moral virtues
- Look - Happily at what you have done in the past
- Relieve - Memorizing your creditable past
- Die - As a patriot without owing to the motherland.

මාධ්‍යවේදීන් සමග සම්මුඛ සාකච්ඡාවක ....



ශිෂ්‍යත්වලාභී දරුවන් වෙත තිළිණ කිරීම සඳහා අධ්‍යක්ෂතුමිය විසින්ම සම්පාදිත ග්‍රන්ථ පිළිබඳව මාධ්‍යවේදීන්ට කරුණු පැහැදිලි කරමින් ....

වසර 14 ක් පුරා සිදුකරනු ලබන මෙවන් සමාජ මෙහෙවරකට මූලික වශයෙන්ම පසුබිම සකස් වූ ආකාරය පිළිබඳව යමක් ප්‍රකාශ කරන්න පුළුවන් ද?

ඇත්ත වශයෙන්ම එය කල්‍යාණ මිත්‍ර ඇසුර කීවොත් නිවැරදියි. බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් උතුම් මංගල කරුණු සියල්ලම ජීවිතයක සාර්ථක්වයට ඉවහල් වන බව මා අත්දැක්කා. බාලයන් ඇසුරු නොකොට පණ්ඩිතයන් ඇසුරු කිරීමේදී සෑම මොහොතකදීම මිනිසා යහපතටම යොමුවෙනවා. සාමූහික ජීවිත ගතකරන පෘතග්ජනයා වටා ප්‍රඥාවන්තයින් මෙන්ම අන්ධබාලයින් සිටිනවා. ඉතාමත් සුක්ෂමව අන්ධබාල සේවනය ඈත් කරමින් කල්‍යාණ මිත්‍ර ඇසුර ලබන විට තම ජීවිත මෙන්ම අන් අයගේ ජීවිත ද ආලෝකවත් කිරීමට අවස්ථා උදාවෙනවා. අපගේ කල්‍යාණ මිත්‍රයා බුදුරජාණන් වහන්සේ බව ප්‍රඥාවෙන් දකින්න පුළුවන් නම් ඒ ශ්‍රී සද්ධර්මය ඔස්සේ අප සංසරත්නයට සමීප වෙනවා. මෙම සමාජ සත්කාරයට මූලික වුනේ අපගේ අනුශාසක ගෞරවණීය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේගේ මග පෙන්වීමයි.

උන්වහන්සේ ඔබතුමියට හමු වූ ආකාරය පිළිබඳව සිහිපත් කළොත්.. .. ..

මම කොළඹ ඩී.එස්. සේනානායක විද්‍යාලයේ ඉංග්‍රීසි ආචාර්යවරියක් ලෙසින් 1984 සිට විශ්‍රාම ගන්නා තුරුම සේවය කළා. එවකට අප හා සමගින් ආචාර්ය මණ්ඩලයේ සේවය කරමින් සිටි උන්වහන්සේ 1995 දී කැනඩාව බලා වැඩම කළා. එහි සිටි පරිත්‍යාගශීලීන් පිරිසක් ඒකරාශි කරගෙන ශ්‍රී ලංකාවේ අ.පො.ස (උසස් පෙළ) ඉගෙනුම ලබන අඩු ආදායම්ලාභී පවුල්වල සිසු දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ක්‍රමයක් ආරම්භ කළා. 1998 දී ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනම නමින් බිහි වූ එම ශිෂ්‍යත්ව පදනමෙහි ශ්‍රී ලංකා සම්බන්ධීකරණ ලේකම් ධූරයෙන්, එවකට රජයේ සේවයෙන් විශ්‍රාම ලබා සිටි මා පිදුම් ලැබුවා. ඒ තමයි මූලික පසුබිම. මෙම සමාජ මෙහෙවර ස්වේච්ඡා පදනමක් මත ගොඩනැගුන නිසා වැටුප් ලබන තනතුරු කිසිවක් එහි තිබුණේ නැහැ. ශ්‍රී ලාංකික දුගී දුප්පත් දිරිය දරුවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් කැපවීමට මා ලද භාග්‍යයක් ලෙසටයි මා එම අවස්ථාව දැක්කේ.

අන්තර්ජාතික ශිෂ්‍යත්ව පදනමක ලේඛකාධිකාරිතුමිය ලෙසට ඔබතුමිය සතුව පැවති කාර්යභාරය ..?

සැබවින්ම එය අති වශාල සංකීර්ණ කාර්යභාරයක් වුනා. වාර්ෂිකව ප්‍රසිද්ධ මාධ්‍ය ඔස්සේ විවෘතව ඉල්ලුම්පත් කැඳවීමේ පටන් විශාල කාර්යභාරයක් පවතිනවා. දහසකට ආසන්න ඉල්ලුම්පත් සංඛ්‍යාවක් අතුරෙන් අනුමත ක්‍රමවේදයක් මත ශිෂ්‍යත්වලාභීන් තෝරාගැනීම, තෝරාගත් සිසුන්ගේ නාම ලේඛන ප්‍රසිද්ධියට පත්කිරීම, එම සිසුන් වෙත පෞද්ගලිකව දැනුම් දීම, සෑම අදියරක්ම කැනඩාවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම්දීම, ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා උත්සවයක් සූදානම් කිරීම, එහි සාර්ථකත්වය සඳහා ගෞරවණීය ස්වාමීන් වහන්සේලා වැඩම කරවීම, ව්‍යක්ත දේශකයින්ගේ හරවත් දේශනවලට සවන්දීමේ අවස්ථාව සිසු දරුවන් වෙත ලබා දීම, දිවයිනේ නන් දෙසින් පැමිණෙන ශිෂ්‍යත්වලාභී දරුවන් සහ දෙමාපියන් වෙත කෑම බීම, ඉඳුම් හිටුම් සහ මග වියදම ආදී සියලු පහසුකම් සලසා දීම, ඔවුන් වෙත ප්‍රදානය කෙරෙන සහතික පත්‍ර, ලිපි ද්‍රව්‍ය ආදියෙන් සමන්විත තෑගි පාර්සල්, සාරධර්ම සම්පිණ්ඩිත මුද්‍රිත ග්‍රන්ථ ආදිය සකස් කිරීම, වසර 2 ක් පුරා මාසිකව චෙක්පත් මගින් ශිෂ්‍යාධාර ලබාදීම, ශිෂ්‍යත්වය බලපවත්වන කාල සීමාව තුළ මාසිකව කරනු ලබන අධීක්ෂණය සහ ශිෂ්‍යාධාර

සඳහා මාසිකව ලැබෙන්නා වූ මුදල් පිළිබඳව වාර්තා සැකසීම ආදී අති විශාල කාර්ය භාරයක් තමයි මා සතුව පැවතුනේ.

මෙවන් කාර්යභාරයක් සඳහා ඔබතුමිය ලද ශ්‍රම දායකත්වය කෙබඳුද ?

ඇතැම් අවස්ථාවලදී පවුලේ සාමාජිකයින්ගේ ශ්‍රම දායකත්වය ලැබුණා. සුළු වශයෙන් හෝ අසල්වැසි මාගේ ශිෂ්‍ය දියණියන්ගේ සහයෝගයත් මා වෙත ලැබුණා. අධ්‍යක්‍ෂ මණ්ඩලයේ මා හැර අනිකුත් සැම දෙනාම පදිංචි වී සිටියේ කැනඩාවේ. ඒත් ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය නම් අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් නියෝජනය කළා. ශ්‍රම දායකත්වයක් ලබාදීමට හැකි පසුබිමක් ඔවුන් සතුව තිබුණේ නැහැ. **කාර්යාල කාර්ය සහායකගේ පටන් අධ්‍යක්‍ෂ දක්වා වූ සියලුම භූමිකාවන් සඳහා 2007 දක්වාම දැඩි ආයාසයකින් යුතුව තනිවම උර දෙන්න සිදුවුණා.** ඇතැම් අවස්ථාවලදී දරාගත නොහැකි ආතතියක් දැනුනා. එහෙත් මේ රටේ සිටින දුගී දුප්පත් දිරිය දරුවන්ගේ සුභ සිද්ධිය වෙනුවෙන් පැවත එන මෙම සමාජ සත්කාරය අතරමඟ නවතා දමන්න මගේ සිත මට ඉඩ දුන්නේ නැහැ. අධික ලෙස වෙහෙස දැනුන අවස්ථාවල මදකට හෝ වෙහෙස නිවාලීමට සමත් වුණේ, ශිෂත්වලාභීන් මාසිකව ශිෂ්‍යාධාර ලැබීමෙන් පසුව එවන ලිපි පමණයි. ශිෂ්‍යාධාර මුදල මහමෙරක් සේ දැනුන, ඒ දරිද්‍රතාවෙන් පීඩිත දිරිය දරුවන්ගේ හදවතින් පැන නැගෙන අව්‍යාජ සිතුවිලිවල සංවේදී බව පමණයි මගේ වෙහෙස නිවාලන්න සමත් වුණේ, ඉතාමත් හැඟුම් බරයි. කුසගිනි නිවාලන බත් ඇටයක් ඇටයක් පාසා මෙම ශිෂ්‍යත්ව පදනමට පින් දෙන දරුවෝ, රාත්‍රී අඳුර නිවාලන පහනට භූමිතෙල් ටික මෙම මුදලින් අරගන්න දරුවොත් ඒ අතර හිටියා. ඒ ලිපි වලින් ධ්වනිතාර්ථ වූ දරිද්‍රතාවේ සෝ සුසුම් මගේ විඩාබර මනසට ඉසින සිසිල් පැන් වගේ මට දැනෙන්න පටන් ගත්තා.

පසුකාලීනව එම අධි කාර්යභාරය අවම කරගැනීමට ඔබතුමිය කිසියම් ක්‍රියාමාර්යක් ගත්තාද ?

සැබවින්ම .. ඒ සඳහා විශාල වෑයමක යෙදුණා. කිහිප වතාවක්ම විද්‍යුත් හා ලිඛිත මාධ්‍යයන් ඔස්සේ අධක්‍ෂ මණ්ඩලය දැනුවත් කළා. ඒත් ප්‍රායෝගිකව සාර්ථක ප්‍රතිචාරයක් ලැබුණේ නැහැ. අවසානයේ දී අධ්‍යක්‍ෂ මණ්ඩලය හමුවීමට මම අදහස් කළා. අප පුතණුවන් දැකීමට, ජපානය බලා යන ගුවන් ගමනක දී අපි 2003 දී කැනඩාවට ගියා. අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමක් කැඳවා තිබුණා. එහිදී මා කරුණු පැහැදිලි කළා. ශ්‍රී ලංකාව තුළ සිදුකෙරෙන කාර්යභාර්ය සඳහා අනු කමිටුවක ඇති අවශ්‍යතාව පිළිබඳව, එහෙත් මාසිකව යැවුන චෙක්පත ත්‍රයිමාසිකව ශිෂ්‍යත්වලාභීන් වෙත යැවීමට තීරණය කිරීම විනා වෙනත් සහනයක් මා වෙත ලැබුණේ නැහැ.

එසේ වුවත් මෙය යහපත්. ගුණගරුක පුරවැසියන් පිරිසක් සමාජයට දායාද කිරීමේ සුපසන් අරමුණෙන් ක්‍රියාත්මක කරනු ලබන සමාජ මෙහෙවරක් නිසා ඉතාමත් සතුටින් මම මේ කාර්යභාර්ය දිගටම කරගෙන ගියා. යහපත් දේ ක්‍රියාවට නැංවීම පහසු නොවන බව මා මොහොතක් පාසා අත්දුටුවා. එහෙත් ඉදිරියට එන සම්බාධක අභියෝග සියල්ල ආශීර්වාදයක් සේ සලකමින්. මෙම ක්‍රියාදාමයේ චිරස්ථිථිය පිණිස ප්‍රබල ආත්ම ශක්තියකින් යුතුව මම කටයුතු කළා. එහි ප්‍රතිඵලයක් ලෙසින් වසර 10 ක් ඉක්මවන විට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කළයුතු ශිෂ්‍යත්ව පිළිබඳව මම හොඳ පන්නරයක් ලැබුවා.

දැනට පවතින මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමේ ආරම්භය ගැන සඳහනක් කළොත්......

සැබවින්ම එය ආරම්භ කලේ 2006 දී මාගේ ම පුරෝගාමීත්වයෙන්, අපගේ පියාණන් 2005 දී දිවියෙන් සමුගත්තේ අපගේ මෑණියන් මෙන්ම ආදර්ශමත් විදුහල්පති ධුරයක් දරලා.. .. සමාජයට විශාල මෙහෙවරක් කරලා. මට හිතුනා වාර්ෂිකව එතුමා අනුස්මරණය කිරීම පිණිස ඵලදායී ක්‍රියාමාර්ගයට අවතීර්ණ වෙන්න ඕනෑ කියලා. දැඩි ආර්ථික අපහසුතා මධ්‍යයේ සරසවි වරම ලැබීමට සුදුසුකම් ලබන ශ්‍රී ලංකාවේ දුෂ්කර ජීවිත ගකරන අසරණ දිරිය දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ක්‍රමයක් අරඹලා විශ්වවිද්‍යාල පළමු වසර තුළදී මසකට රුපියල් 1500/- බැගින් ශිෂ්‍යාධාර ලබාදීමේ අදහසින්, පවත්නා ශිෂ්‍යත්ව ක්‍රමයට සමගාමීව **විජයසේන කිරිවත්තුඩුව අනුස්මරණ ශිෂ්‍යත්ව ක්‍රමය** ආරම්භ කළා. අප පවුලේ සාමාජිකයින් විසින් ශිෂ්‍යත්ව 5 ක් ප්‍රදානය කිරීමටයි සැලසුම් කර තිබුණේ. ඒත් අප වටා සිටි සත්පුරුෂ සුපින්වත් කල්‍යාණ මිත්‍රයින් 12 දෙනෙකු එම අනුස්මරණ ශිෂ්‍යත්ව අගය කරමින් තම තමාගේ දෙමාපියන් අනුස්මරණය කිරීමට එක්වුණා. සාමාජික සංඛ්‍යාව වැඩිවන්නට වුන නිසා මෙම ශිෂ්‍යත්ව ක්‍රමය සැමට විවෘතව තබමින් 2006 දී **මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම** නමින් ස්ථාපිත කළා.

මෙම සුවිශේෂී මෙහෙවර සඳහා රජයෙන් ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කෙරෙනවාද ?

මෙයට කිසිම රජයකින් හෝ වෙනත් කිසිම සංවිධානයකින් හෝ ප්‍රතිපාදන ලැබෙන්නේ නැහැ. කල්‍යාණ මිත්‍ර සත්පුරුෂ සුපින්වතුන්ගේ දායකත්වය මත තමයි මේ දක්වා වෛද්‍ය, ඉංජිනේරු, කළමනාකරණ, නීති, කලා ආදී සියලුම පීඨයන්හි විශ්වවිද්‍යාල සිසුන් 221 දෙනෙකුටත්, අ.පො.ස. උසස් පෙළ සිසුන් 409 දෙනෙකුටත් මෙම ශිෂ්‍යත්ව ප්‍රතිලාභ හිමිවුනේ. මේ ශිෂ්‍යත්වලාභීන් 630 අතර **සිංහල, දමිල, මුස්ලිම් සිසුන් ද, බෞද්ධ, කතෝලික, ඉස්ලාම් භක්තිකයින් ද ශ්‍රව්‍ය, දෘෂ්‍ය ආබාධිත මෙන්ම කායික අශක්නුතාවෙන් යුත් සිසුන් ද** සිටිනවා.

මෙය අධිෂ්ඨානය, කැපවීම, පරිත්‍යාගය සහ කල්‍යාණ මිත්‍රත්වය මත ඉදිරියටම යන ස්වේච්ඡා සංවිධානයක්. අසරණ සරණ සේවයක්. මෙය තුළින් අප ලබන එකම ප්‍රතිලාභය මානසික සතුටයි. ඒ නිරාමිස සුව තුළින් ලබන්නේ මුදලින් තක්සේරු කළ නොහැකි පුදුම සැනසීමක්, සියලුම අනුග්‍රාහක භවතුන් මේ සතුට භුක්තිවිඳිනවා.

මෙම මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමෙහි ඇති අනෙකුත් විශේෂත්වයන් මොනවාද ?

ඉතාම හොඳ ප්‍රශ්ණයකටයි පැමිණියේ. .. මෙය රුපියල් 1500/- මාසික ශිෂ්‍යාධාරය ලබා දීලා නිහඬවන ශිෂ්‍යත්ව පදනමක් නෙමෙයි. ශිෂ්‍යත්වලාභීන් තුළ සදාචාරාත්මක ගුණ දම් පෝෂණයක් ඇතිකරවීමට විශාල වෑයමක් දරනවා. මව්, පිය, ගුරුවරු, වැඩිහිටි ආදීන්ට ගරු බුහුමන් දැක්වීම, කළගුණ සැලකීම වැනි උඩු සුළඟට ගසාගෙන යන සාර්ධර්ම සුරැකීමට ආදර්ශයෙන් ම මග පෙන්වනවා. එවිට ඒවා ඉදිරි පරම්පරාවට දායාද කිරීමේ වගකීමත් ඔවුන්ම භාරගන්නවා. තමා අධ්‍යාපනය ලද පාසැලට, ගමේ පූජනීය ස්ථානයට පවා කෘතගුණ සැලකීමට ශිෂ්‍යත්වලාභී දරුවන්ව අපි යොමු කරවනවා. ඒ ස්ථානයන්හි පුස්තකාල සඳහා ඒ දරුවන් අතින්ම පරිත්‍යාග කරවීමට අප විසින්ම සම්පාදිත සාර ඝර්භ සදහම් ග්‍රන්ථ ශිෂ්‍යත්වලාභී දරුවන් වෙතට අපි ලබාදෙනවා. මාසිකව ශිෂ්‍යත්වලාභීන්ගේ අධ්‍යාපනික මෙන්ම ආධ්‍යාත්මික ගුණ වගාව සූක්ෂම ක්‍රම වේදයන් ඔස්සේ අධීක්ෂණය කෙරෙනවා. කලට වේලාවට කටයුතු කිරීමට ශිෂ්‍යත්වලාභීන් මනා පෙර හුරුවක් ලබනවා.

මෙම කාර්යාලය රාත්‍රී 2.00 දක්වා විවෘත බව දැනගන්න ලැබුණා. එහි කිසියම් සත්‍යතාවක් තිබෙනවාද ?

සැබැවින්ම, මෙම කාර්යාලය තුළ මා අනිවාර්යයෙන්ම ගතකරන කාලය තමයි රාත්‍රී 9.00 සිට පසුදින අළුයම 2.00 දක්වා. ශිෂ්‍යත්වලාභී දරුවනට මා ඇමතීම සඳහා අවස්ථාව ලබා දී තිබෙන්නෙත් රාත්‍රී 9.00 සිට 12.00 දක්වා. ග්‍රන්ථකරණයෙහි යෙදීමටත් සුදුසුම වේලාව හැටියට මා දකින්නේ රාත්‍රී කාලය, අවට පරිසරයේ නිහඬතාවය මම බෙහෙවින්ම ප්‍රිය කරනවා. ඉංග්‍රීසි සහ සිංහල කවි සංකල්පනාවන් ගලා ඒමටත් විශාල බලපෑමක් ඇතිකරවන අවස්ථාවක් හැටියටයි මම රාත්‍රී කාලය දකින්නේ. පවුලේ අනිකුත් කටයුතුවලට කිසිම බාධාවක් නොවන අවස්ථාවක් නිසා ඒ කාල සීමාව තුළ මා කිසිම බාධාවකින් තොරව උපරිම ප්‍රයෝජන ලබනවා. එම කාල කළමණාකරණය මට සාපේක්ෂව සාර්ථක බවයි මට හැඟී යන්නේ.

ඔබතුමිය වෘත්තියෙන් ඉංග්‍රීසි ආචාර්ය වරියක් .... සිංහල බෞද්ධ සදහම් ග්‍රන්ථ සම්පාදනයට පෙළඹුණ ආකාරය පිළිබඳව සඳහනක් කළොත් ... ?

ඇත්ත වශයෙන්ම මමවත් දැන සිටියේ නැහැ එවන් කුසලතාවක් මා සතුව පැවතුණා ද කියලා. මීට වසර 17ක ට පමණ පෙර ඩී.එස්. සේනානායක විද්‍යාලයේ අප හා සමග ආචාර්ය මණ්ඩලයේ සේවය කරමින් සිටි අප සැමගේ කල්‍යාණ මිත්‍ර අපගේ අනුශාසක ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේ දිනක් මට පාසැලේදී කිව්වා .. ග්‍රන්ථ රචනා කරන්න කියලා. එහෙම කීවේ ඇයි කියලාවත් මා දැන සිටියේ නැහැ. කෙසේ වෙතත්. කුමන තේමාවක් උඩ ග්‍රන්ථ රචනා කරන්නද කියන ප්‍රශ්ණයත් මා ස්වාමීන් වහන්සේගෙන්ම ඇහුවා මට මතකයි. එවිට කියා සිටියා පියවරුන් පිළිබඳ ලියවෙන ග්‍රන්ථ සමාජයේ දුර්ලභ හෙයින් පියවරු පිළිබඳ ග්‍රන්ථ රචනා කරනවානම් එලදායී බව.

ඒ මොහොතේ සිට මා කල්පනා කළා ග්‍රන්ථාරූඪ කරන්න තරම් සුදුසු පීතෘ චරිතයක් පිළිබඳව. ඒ සඳහා කාලය වෙන්කර ගැනීමත් තරමක අභියෝගයක් වුනා. කෙසේ වෙතත් 2005 දී මාගේ දයාබර පියාණන් අභාවප්‍රාප්ත වූ විට එතුමා ගේ චරිතය ග්‍රන්ථාරූඩ කර යහගුණ කැමති සමාජයකට තිළිණ කිරීමට මා ඉටා ගත්තා. ඒ සඳහා මට දෛවය විසින් අවස්ථාව ලබා දුන්නා. නිවස පිරිසිදු කරමින් සිටියදී දිනක් මා ලිස්සා වැටීම නිසා පයේ අස්ථි බිඳීමකට පාත්‍ර වුණා. මාස තුනකට අධික කාලයක් රෝද පුටුවක් මත තමයි මට කාලය ගත කරන්න සිද්ධ වුණේ. අභියෝගය ආශිර්වාදයක් සේ සලකමින් එම කාල සීමාව තුල මා උපරිම ප්‍රයෝජන ලැබුවා."**මා පිය ගුණ සමර**"නමින් මාගේ පියාගේ ශ්‍රේෂ්ඨ චරිතාපදානය මම ග්‍රන්ථාරූඪ කළා. ඒ අනුවයි මම ග්‍රන්ථකරණයට පිවිසුණේ. 2006 දී සියළුම ශිෂ්‍යත්වලාභී දරුවනට සහ අනුග්‍රාහක භවතුන්ට එම ග්‍රන්ථය තිළිණ කළා. ඒ සඳහා ලැබුණා වූ ප්‍රතිචාර තමයි ග්‍රන්ථ සම්පාදනයට මා වඩ වඩාත් යොමු කරවනු ලැබුවේ.

ඔබතුමිය විසින් රචිත ග්‍රන්ථ කිහිපයක්ම මේ කාර්යාලය තුල ප්‍රදර්ශනය වෙනවා.. බුදුරජාණන් වහන්සේගේ නිර්මල බුදුරුවට පහතින් ... ඒවායේ තේමාවන් ගැන කෙටි හැඳින්වීමක් කරන්න පුළුවන්ද?

උතුම් ශ්‍රී සද්ධර්මය පදනම් කරගෙන යි මම ග්‍රන්ථ රචනා කරන්නේ. වත්මන් පරපුර "**සාධු**" යන වචනයේවත් අදහස නොදැනයි උච්ඡාරණය කරන්නේ. මවට පියාට වඳින්නෙත් ඒ ශ්‍රේෂ්ඨ ගාථාවන්හි අර්ථය දැනගෙන නෙමෙයි. මාගේ "**සාධු දැක්ම - The Excellent View**" නම් වූ දෙවන ග්‍රන්ථයෙන් මා උත්සාහ කළා දෛනිකව භාවිතා කරන පාලි ගාථා කීපයක අර්ථය තරුණ හදවත් තුලට දැනෙන පරිද්දෙන් සරලව සිංහල සහ ඉංග්‍රීසි භාෂා දෙකින්ම ඉදිරිපත් කරන්න. ඉංග්‍රීසි භාෂාව ඉගෙනීමට අද තරුණ දරුවන් විශේෂ රුචිකත්වයක් දක්වන හෙයින් මගේ උත්සාහය බොහෝ දුරට සාර්ථක වෙලා තියෙනවා.

"දරිද්‍රතාව හඹා යයි" යන ග්‍රන්ථයෙහි දරිද්‍රතාව යනු ජයගත නොහැකි අභියෝගයක් **නොවන** බව පෙන්වා දී තිබෙන්නෙත් ධම්ම පදයේ ගාථා අනුසාරයෙන්. මව් පිය ගුරුවරු වැඩිහිටියනට සහ සිල්වතුනට නිසි පරිදි ගරු බුහුමන් දක්වන විට, ආයු වර්ණ සැප බල නමැති ධර්මතාවන් වර්ධනය වන ආකාරය ඉංග්‍රීසි සහ සිංහල භාෂා දෙකම භාවිතයෙන් ඉදිරිපත් කර තිබෙනවා. එදිනෙදා ජීවිතයේ අත්දකින්න පුළුවන් ආකාර සමගින් උදාහරණ සහිතව පෙන්වා දී තිබෙනවා. **"සුවදායක මාවතක් - A Blissful Path"** නම් වූ ග්‍රන්ථයෙන් පෙන්නුම් කරන්නේ මෙත්තානිංස සූත්‍රයේ පෙන්වා දෙන මෙත් වැඩීමේ ආනිසංස එකොළහ. දෛනික ජීවිතයේ පුරුදු පුහුණු කරගැනීමෙන් ඵල ලැබිය හැකි ආකාර, පාලි පාඨ සහ ගාථාවන් කටපාඩමින් කියන්න දන්නා බොහෝ දරුවන් අද ඒවා උච්ඡාරණය කරන්නේ ඒවායේ ශ්‍රේෂ්ඨ අරුත් හදවතින් දකිමින් කිසියම් අභිමානයකින් යුතුව, ඒ බව ශිෂ්‍යත්වලාභී දරුවන් ග්‍රන්ථ පරිශීලනයෙන් පසුව අප වෙත එවන ලිපිවලින් පෙනී යනවා.

මේසා විශාල කාර්යභාරයක් ඉටු කිරීම සඳහා ඔබතුමිය ලද සම්පත් පිළිබඳව යමක් ප්‍රකාශ කරන්න පුළුවන් ද ?

1998 දී මෙම සමාජ සත්කාරය ආරම්භ කරන විට මානව, භෞතික හෝ මූල්‍යමය සම්පත් කිසිවක් මෙම කාර්යභාරය වෙනුවෙන් මට ලැබුණේ නැහැ. අද මෙන් එදා තාක්ෂණ පහසුකම් කිසිවක් තිබුණෙත් නැහැ. කාර්යාලය පවත්වාගෙන යන්නේ අපගේ මෙම පෞද්ගලික නිවස තුළමයි. තාක්ෂණික උපකරණ ගැන කිනවානම් පරිගණකයක් තබා යතුරු ලියනයක්වත් එම අදියරේදී මා සතුව තිබුණේ නැහැ. ශිෂ්‍යත්වලාභීනට මාසික චෙක්පත් සියල්ලම අතින්ම ලිව්වා. පොදු ලිපිය කාබන් කොළ තබමින් ලිව්වා. ආරම්භක වසර 3 තුළ ඉතාමත් අපහසුවෙන් තමයි කාර්යභාරය ඉදිරියට ගෙනාවේ.

පසුකාලීනව කාර්යාලයීය කටයුතුවල පහසුව තකා තාක්ෂණික උපකරණ පෞද්ගලිකවම මා සපයා ගත්තා. අපගේ පුතණුවන් ඇතැම් තාක්ෂණ උපකරණ මට ජපානයෙන් එව්වා. ඒ අතර මා පෞද්ගලිකවම ස්ව උත්සාහයෙන් ම පරිගණක දැනුම සහ තාක්ෂණ ශිල්පී ක්‍රම දියුණු කරගත්තා. උපරිම ලෙසින් කාලයත් ශ්‍රමයත් ධනයත් කැප කරමින්, ඇතැම් අවස්ථාවලදී මාගේ විශ්‍රාම වැටුපත් මෙහි අවශ්‍යතා සඳහා කැප කරමිනුයි මම ඉතා සතුටින් මෙම කාර්යභාරයට උරදුන්නේ. ශිෂ්‍යත්වලාභී දරුවන්ට මාසිකව යැවෙන මුදලට අමතරව කාර්යාලයීය උපකරණ සඳහා වෙන්වූ ප්‍රතිපාදන කිසිවක් මෙම ශිෂ්‍යත්ව පදනම සතුව නැහැ.

අනුග්‍රාහක භවතුන් ශිෂ්‍යත්ව සඳහා පරිත්‍යාග කරන මුදල්වලින් එක සතයක්වත් මෙම කාර්යාලය තුළ තිබෙන අල්පෙනෙත්තකටවත් වැය කරලා නැහැ. ඒ බව අභිමානයකින් යුතුව ප්‍රකාශ කරන්න තරම් සුපසන් මෙහෙවරක් අද මෙම ආයතනය මගින් සිදු කෙරෙන්නේ.

මානව සම්පත් පිළිබඳව මා අද සතුටු වෙනවා. ස්වේච්ඡාවෙන්ම මෙම කාර්යභාරයට උදව් දෙන අධ්‍යක්ෂ මණ්ඩලයක් අද අප වටා සිටිනවා. සියලුම අනුග්‍රාහක භවතුන් ද හැකි සෑම අවස්ථාවකදීම උපරිම සහාය ලබා දෙනවා.

වාර්ෂිකව පැවැත්වෙන ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය පිළිබඳව සඳහනක් කරන්න පුළුවන් ද?

ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා සිසුන් ඒකරාශි කිරීමේ ප්‍රධාන අරමුණු දෙකක් තියෙනවා. එයින් ප්‍රධාන වන්නේ අප ගෞරවනීය අනුශාසක ස්වාමීන් වහන්සේගේ දේශණයයි. වත්මන් තරුණ පරපුරට ගෝචර වන පරිද්දෙන්, ඔවුන්ගේ හදවත් තුළට කිඳාබසින වාග් විලාසයකින් දේශනා කරනු ලබන සුමධුර දේශනයට සවන් දීමේ අවස්ථාව සිසු දරුවන්ට ලබාදෙන්නේ මුළු ජීවිතයම යහ මඟට හරවන්න පුළුවන් පුදුමාකාර ශක්තියක් එතුළින් ගම්‍ය වන නිසයි.

අනුග්‍රාහක භවතුන් අතින්ම ශිෂ්‍යත්වලාභී දරුවන්හට ශිෂ්‍යත්වය ප්‍රදානය කිරීමේ අවස්ථාව ලබාදීම දෙවන අරමුණයි. ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය පවා විධිමත් ලෙසින් ආදර්ශවත් ආකාරයට පැවැත්වීම ඉමහත් කැපවීමකින් කළ යුතු සංවිධානාත්මක කාර්යභාරයක්. සියලුම ශිෂ්‍යත්වලාභී දරුවනට රුපිල් 18000/- ක වටිනාකමකින් යුත් ශිෂ්‍යත්වය හිමි බවට අදාළ සහතිකය සමගින් සාර ගර්භ මුද්‍රිත ග්‍රන්ථ, ලිපිද්‍රව්‍ය, මග වියදම්, දිවා ආහාරය, තේ පැන් ආදී සියල්ලක් සපයනු ලබනවා. විශ්වවිද්‍යාලයට ඇතුළු වීමත් සමග මෙම ශිෂ්‍යත්ව ක්‍රියාත්මක කෙරෙනවා. පළමු වසර තුළදී අඛණ්ඩව මාසිකව රුපියල් 1500/- බැගින් මූල්‍යමය ආධාර ලබා දෙනවා.

විශ්වවිද්‍යාල සිසුන්ගේ මෙම අදියර ශිෂ්‍යත්ව සඳහා තෝරා ගැනීමට විශේෂ වූ හේතුවක් තිබෙනවාද ?

සැබැවින්ම.. .. .. අ.පො.ස. උසස් පෙළ ජයග්‍රහණය කරන්න සිසු දරුවන් විශාල වෙහෙසක් දරනවා. ඇතැම් දෙමාපියන් කණ කර ආභරණ ගේ දොර පවා උගස් තියලා. කුසට නිසි අහරක්වත් නොමැතිවයි ඒ අදියරේ දී දරුවන්ට උගන්වන්නේ. සරසවි වරම් ලැබීම ජයග්‍රහණයක් වුවත් ආර්ථිකයට සාපේක්ෂව ඔවුන්

කබලෙන් ලිපට වැටෙන අදියරක්, ඇතැම් දක්ෂ සිසුන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය අතහැරලා රැකියාවක් සොයාගන්නවා. විශ්වවිද්‍යාල අධ්‍යාපනය ආරම්භ වනවාත් සමගම ක්‍රියාත්මක වන මෙම ශිෂ්‍යාධාර ලබන දරුවෝ මූල්‍යමය වශයෙන් අසීමිත සැනසීමකින් යුතුව විශ්වවිද්‍යාලය තුළ ඉගෙනීම් කටයුතුවල නිරතවෙනවා. දෙමාපියන්ටද විශාල සැනසීමක්, ඔවුන් ද නිරතුරුවම මෙම ශිෂ්‍යත්ව පදනමට පින් දෙමින් ලිපි එවනවා.

මේවන විට මෙම ශිෂ්‍යත්ව ඔස්සේ ඵල ලබා ඇති සිසු දරුවන් පිළිබඳව සිහිපත් කළොත් .. .. ..

සැබවින්ම නෙතට සතුටු කඳුළු උණන මොහොතක්, දරිද්‍රතාවෙන් උපරිම පීඩා විඳිමින් උසස් අධ්‍යාපනය ලැබීමට වෙර දරන ඉගෙනීමෙහි දස්කම් ඇති, දරු පිරිසක් තමයි, අපි වාර්ෂිකව තෝරා ගන්නේ. උදේට කහට කොප්පයක්වත් නොමැති ජීවිතට හවිහරණක් නැති, හිසට වහලක් නැති, මඤ්ඤොක්කා අලයකින් වේල පිරිමහගන්නා, මව් පිය සෙනෙහස අහිමි දරුවෝ, ආබාධිත දරුවෝ අපට බොහෝ විට හමුවෙනවා. ජාති ආගම් වශයෙන් වර්ගීකරණයකින් තොරව මේ වන විට සිසු දරුවන් 630 ක් මෙම ශිෂ්‍යත්ව ක්‍රියාදාමය තුළින් ඵල ලබා තිබෙනවා. ශිෂ්‍යාධාර ආරම්භ කළේ මසකට රු. 500/- බැගින් .. ඒත් ක්‍රමයෙන් වැඩි වෙලා අද රු. 1500/- බැගින් ශිෂ්‍යාධාර මේ දරුවන්ට ලබා දෙනවා. **වෛද්‍ය, ඉංජිනේරු, කළමනාකරණ, කලා, නීති වැනි පීඨයන්හි ඉගෙනුම ලැබූ ඇතැම් දරුවන් අද වෘත්තීමය ක්ෂේත්‍රයට පිවිසිලා සමාජයට විශාල සේවයක් කරනවා. ඒ දරුවන්ට මුල අමතක වෙලා නැහැ. සැබෑ තතු අප වෙත වාර්තා කරලා තිබෙනවා. රැකියාවන්හි නිරත ඇතැම් දරුවෝ මෙම ශිෂ්‍යත්ව සඳහා අනුග්‍රාහකත්වය දැරීමට සූදානමින් ඉන්නව. තවත් දරු පිරිසක් විශ්වවිද්‍යාලයන්හි අවසන් වසර පසු කරමින් සිටිනවා. අනිකුත් දරුවන් ද සාර්ථක ලෙස සරසවි අධ්‍යාපනය හදාරමින් ඉන්නවා. මාසික අධීක්ෂණයන් තුළින් මේ සියලු තොරතුරු වාර්තාගත කෙරෙනවා.**

මෙම අධ්‍යාපනික ශිෂ්‍යත්ව ක්‍රියාදාමයට අමතරව සමාජ සුභ සාධනය පිණිස වෙනත් ව්‍යාපෘති ක්‍රියාත්මක වෙනවාද ?

සැබවින්ම .. .. විවිධ ව්‍යාපෘති ඔස්සේ මෙම සමාජ මෙහෙවර ව්‍යාප්තව පවතිනවා. ඈත දුෂ්කර ගම්මානවලට වියළි ආහාර - ඇඳුම් පැළඳුම් ආදිය විටින් විට පරිත්‍යාග කරනවා. සිසු දරුවන්ගේ ආකල්පමය සංවර්ධනය ඇති කිරීමේ අරමුණෙන් දීප ව්‍යාප්ත රචනා තරග පවත්වනවා. පුස්තකාල නොමැති දුෂ්කර පාසල්වලට පුස්තකාල පොත්, පරිගණක ආදිය පරිත්‍යාග කෙරෙනවා. ඉතාමත් අයහපත් ආර්ථික පසුබිමක සිටින දක්ෂ සිසුදරුවන් වෙනුවෙන් ස්ථාවර තැන්පත් අරඹනවා. සාරධර්ම සම්පිණ්ඩිත සදහම් ග්‍රන්ථ සම්පාදනය කරමින් ශිෂ්‍යත්වලාභී දරුවන්ට තිළිණ කෙරෙනවා. අසරණ ආබාධිත ජනතාව වෙනුවෙන් රෝද පුටු කිහිළිකරු වැනි දේවල් පරිතාග කෙරෙනවා.

මේසා විශාල සමාජ සේවයක ඉතාමත් සාර්ථක ලෙස යෙදී සිටින ඔබතුමියට සමාජයට දිය හැකි පණිවිඩය කුමක්ද ?

වත්මන් මිනිසාගේ ජීවිත කාලය උපරිම වශයෙන් බැලුවත් වසර හැත්තෑවකට පමණ සීමා කරන්න වෙනවා. ඒ නිසා ජීවිතය ඉතා හොඳින් සැලසුම් කරන්න ඕනෑ. ඒ ඒ අදියරේදී කළයුතු කාර්යයන්ට මුල් තැන දෙමින් අප්‍රමාදීව කටයුතු කරන්න ඕනෑ. සත්‍යගරුක භාවයට මුල්තැන දෙමින් උත්සාහයෙන් සහ ඉවසීමෙන් ඉලක්ක අනුව අධිෂ්ඨාන පූර්වකව තම දෛනික කාර්යයන්හි නිරත වෙන්න ඕනෑ. ඕනෑම දෙයක සාර්ථකත්වය සඳහා කැපවීම අත්‍යාවශ්‍යයි. එය පුද්ගල අපේක්ෂාවන්ගෙන් තොරවීම ඉතා වැදගත්.

සමාජයේ කුමන තරාතිරමක රැකියාවක නිරත වුවත් ප්‍රඥාසම්පන්න මිනිසෙකුට ඵලදායී ලෙස තම ජීවිතය කළමනාකරණය කරගන්න පුළුවන්. හොබවන නිලතල බලතල පිළිබඳ පසුකාලීනව සතුටින් සිහිපත් කරන්න පුළුවන්නම් එය ජීවිත ජයග්‍රහණයක්.

සම්බුදු දහමේ පෙන්වාදෙන අන්දමට ආරම්භ ධාතු, නික්ඛම ධාතු. පරක්ඛම ධාතු යන ධර්මතා මත ඕනෑම කාර්යයක සාර්ථකත්වය දකින්න පුළුවන්. ඉදිරියට පැමිණෙන අභියෝග, සම්බාධක වෙස්වළාගෙන එන ආශිර්වාද හැටියට හිතලා තමාටත් අනුන්ටත් යහපත පිණිස කෙරෙන සත්කාර්යයන්හි දීර්ඝකාලීනව නිරත විය යුතුයි.

එසේ කළ හැකි නම් ලැබුවා වූ මිනිස් භවයේ සාර්ථකත්වය ප්‍රඥාව තුළින් දකින්න පුළුවන්. හෘද සාක්ෂියට එකඟව ධර්මානුකූල ජීවිතයක් ගතකරන්නාට මොන විදියේ බලවේගයක් එරෙහිව ආවත් ජය ලැබීමේ පුදුමාකාර ශක්තියක් ඔහු වටා පවුරක් සේ ගොඩ නැගී තිබෙනවා. තම තමාගේ ප්‍රඥාවට සාපේක්ෂව මෙය ඕනෑම කෙනෙකුට අත්දකින්න පුළුවන්.

ඒත් මේ අදියරේදී ඊර්ෂ්‍යා, ක්‍රෝධ, වෛරයෙන් පිරී ගුණමකු අන්ධබාල මාරසේනාවක් ද තමා වටා සිටින බව අමතක කරන්න හොඳ නැහැ. අද සමාජයේත් ඉන්නවා. බුදුරජාණන් වහන්සේ ජීවමාන කාලයේත් හිටියා. ඉතාමත් උපේක්ෂාවෙන් ඒ අයටත් මෛත්‍රී වඩන්න ඕනෑ. සම්මා දිට්ඨිය පහළ වේවා ! යි ප්‍රාර්ථනා කරන්න ඕනෑ. ක්ෂාන්ති පාරමිතාව වැඩීමට එවැනි අවස්ථාද උපයෝගී කර ගනිමින්, අටලෝ දහමින් කම්පා නොවී ජීවිතය සාර්ථකත්වය කරා යොමු කරගැනීමට වීර්ය වඩවන්න කියන එක තමයි මට දිය හැකි පණිවිඩය.

අවසාන වශයෙන් ඔබතුමියගේ පෞද්ගලික ජීවිතය පිළිබඳව කරුණු ටිකක් දැනගන්න පුළුවන්ද ?

සැබවින්ම.. .. මම ඉපදුනේ වව්නියාවේ දී.. 1951 දී. ඒ කාලයේ දී මාගේ දෙමාපියන් ඒ දුෂ්කර පළාත්හි ගුරු සේවයේ යෙදී සිටි නිසා. ඒත් මම අධ්‍යාපනය ලැබුවේ කොළඹ දිස්ත්‍රික්කයේ. 1972 දී මම අම්පාර දිස්ත්‍රික්කයේ රජයේ පාසලකට ගුරු පත්වීමක් ලැබුවා ඉංග්‍රීසි ආචාරිණියක් ලෙස. පසුව රත්නපුර, කළුතර වැනි දිස්ත්‍රික්කවල සේවය කළා. 1976 දී මම විවාහ වුණා. අපට පුතුන් දෙදෙනෙකු සිටිනවා. 1984 දී කොළඹ දිස්ත්‍රික්කයට ස්ථාන මාරුවීමක් ලබාගත්තා. කොළඹ ඩී.එස්. සේනානායක විදුහලේ තමයි මම වැඩිම කාලයක් සේවය කළේ. ඒ කාලය තුළ පුතුන් දෙදෙනාගේ අධ්‍යාපන කටයුතු පිළිබඳවත් රැකවරණය පිළිබඳවත් පූර්ණ කාලීනව අවධානය යොමු කරන්න පුළුවන් වුණා. එහි ප්‍රතිඵලයක් ලෙසින් අද ඔවුන් ඵලදායී රැකියා ක්ෂෙත්‍රවල නිරතව මානව හිතවාදී පුරවැසියන් ලෙසින් සමාජගතව සිටිනවා.

මෙහිදී මා විශේෂයෙන් සඳහන් කළ යුතු දෙයක් තිබෙනවා. දිට්ඨ ධම්ම වේදනීය වශයෙන් අප විසින් සිදු කරනු ලබන කර්ම අප කරා එන බව. දරිද්‍රතාවෙන් පීඩිත නැණවත් දරු පිරිසක් සාරධර්ම මත ගුණ දහමින් පරිපෝෂණය කර සමාජයට දායාද කිරීමේ උදාර අරමුණෙන්, මෙම ශිෂ්‍යත්ව ක්‍රියාදාමයට සුපසන් චේතනාවෙන් මා මැදිහත් වුණේ 1998 දී, වසරක් ගතවීමටත් පෙර එනම් 1999 දී අපගේ වැඩිමහල් පුතුට ජපන් රජය ශිෂ්‍යත්වයක් ප්‍රදානය කළා. ඒ ඇරඹු ගමන් මඟ ආචාර්ය උපාධියෙන් අවසන් කරලා අද මුළු ලොවටම ඵලදායී සේවයක නිරතව සිටිනවා. අද අපගේ පුතුන් දෙදෙනාම දරු සුරතල් බලන පියවරු. ඒ දක්වාම සියලු යුතුකම් ඉටුකරනු ලැබුවේ මවක් ලෙසට සුපිරි ජීවිත ගතකරමින් සුරංගන ලොවක ඉඳගෙන නම් නෙමෙයි. අටලෝ දහම මගේ ජීවිතයටත් තදින්ම බලපෑම් කළා. ඒත් නොසැලෙන මානසිකත්වයක් ගොඩ නගා ගෙන ජීවිතයේ බොහෝ අවස්ථාවල මම ඉවසීම, මෛත්‍රීය ප්‍රගුණ කළා.

අද මම ගුණ නැණ බෙලෙන් පිරි ශිෂ්‍යත්වලාභී දරුවන් දහස් ගණනකගේ මවක්, හෙට දිනයේ ඔවුන් ලොව බබලවන්නේ මව් පිය ගුණ සුවඳ හඳුනන, කළ ගුණ දත්, මුල අමතක නොවුන පුරවැසියන් ලෙසින්, එම සාරධර්ම ඉදිරි පරම්පරාවටත් දායාද කරමින්, මාගේ පුද්ගලික ජීවිතය තුළ මා ලද ලොකුම ආධ්‍යාත්මික සැනසීම තමයි **සමාජ සංශෝධනයක් සඳහා ස්ථිරසාර ආයෝජනයක් කිරීමට හැකිවීම**. ඒ තමයි මගේ ජීවිත ඉලක්කය.

ඒ සඳහා මට මූලිකවම සියලු ශක්තිය ලබා දුන් මාගේ සදාදරණීය දෙමාපියන්ටත්, නිසි අධ්‍යාපනයක් ලබා දී ඵලදායී වෘත්තීමය ක්ෂෙත්‍රයකට මඟ හෙළිකර දුන් දයාබර ගුරු දෙමාපියන්ටත්, ඒවාගේම සමාජයීය වශයෙන් ඵලදායී මෙහෙවරකට මඟපෙන් වූ අප ගෞරවණීය අනුශාසක ස්වාමීන් වහන්සේටත් මා දෙපා නමැද භක්ති පූර්වකව කෘතඥතාව පුදකරනවා. මා විසින් රැස් කරගනු ලබන සියලුම පින්, නිරන්තරයෙන්ම ඒ සැම දෙනාට ම අනුමෝදන් කරලා ඒ තුළිනුත් මම විශාල සතුටක් ලබනවා.

ඒවාගේම මාගේ ස්වාමි පුරුෂයා, දරුවන් සහ සියලුම ඥාතී මිත්‍රාදීන් ආදී සැවොම අඩු වැඩි වශයෙන් ඔවුනට හැකි පමණින් ඔවුන්ගේ ප්‍රඥාවට සාපේක්ෂව නොයෙකුත් අන්දමින් මා වෙත දායකත්වය ලබා දී තිබෙනවා, මාගේ මෙම ජීවිත ඉලක්කය සපුරා ගැනීමට. එය ඔවුන් විසින් රැස්කරගත් මහා කුසලයක්. ඔවුන්ගේ පින් සිතුවිලි වර්ධනය කරගැනීමට එම කුසලය ම හේතුවේවා කියා මා මෛත්‍රී සහගතව ප්‍රාර්ථනා කරනවා.

සංස්කරණය

නීතිඥ නයනි දයාරත්න
අධ්‍යක්ෂිකා ඒ.පී.ද සිල්වා
(විශ්‍රාමික- ජන ලේඛන සහ සංගණන දෙපාර්තමේන්තුව)

A lesson for all teachers

Daily Mirror Wednesday September 29, 2010 Feature A13

SEETHA: A LESSON FOR ALL TEACHERS

A woman dedicated to education is rare and a woman dedicating her life to education is even rarer.

University students who received the Parents Scholarships

Interestingly a student who was awarded the 'Canada-Sri Lanka Scholarship' for his Advanced Level once again won the 'Parents Scholarship' too and Mrs. Gunathilaka said it was the most rewarding moment of her life – second to when her son won a scholarship to Japan.



ප්‍රසිද්ධ ජනමාධ්‍ය සහාය

COMMUNITY | 41

AUGUST 14, 2011 | SUNDAY OBSERVER

The sixth scholarship – awards ceremony of the Parents' Memorial Foundation for the economically disadvantaged to enter universities was held recently at the headquarters of the foundation at Kotuwegoda, Rajagiriya. Fifty-seven students received scholarships. Here the D.G of the Foundation Mrs. Seetha Gunathilake, presents a parcel of stationery and the scholarship letter to a vision-impaired student from the Ruhunu University.

Pic: Wehella Piyathilake, Maharagama Spl. Cor.

ඉල්ලුම්පත් කැඳවීමේ පටන් ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය දක්වා සියළුම අදියරයන් පිළිබඳව ප්‍රසිද්ධ ජන මාධ්‍යන් ඔස්සේ මහජනතාව දැනුවත් කෙරෙන වගයි.

බුදු සරණ | 2012 ජනවාරි 22 වනදා ඉරිදා | 15

මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම 2012 ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම්පත් කැඳවයි

2011 අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලැබීමට සුදුසුකම් ලබා ඇති අඩු ආදායම් ලාභී පවුල් වල සිසු දරුවන්ගෙන් ජනවාරි මස 31 දින දක්වා මෙවර ඉල්ලුම්පත් කැඳවා ඇතැයි කියති. මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම, වඩාත් පුළුල් වූ සාර්ථක වූ මෙහෙවරකට පා තබමින් මෙවර ද ප්‍රදානය කෙරෙන ශිෂ්‍යත්ව සංඛ්‍යාව විවිධ විෂය ක්ෂේත්‍රයන් ඔස්සේ ව්‍යාප්ත කර ඇත. වෛද්‍ය, ඉංජිනේරු, කළමනාකරණ, නීති පීඨ සහ (විද්‍යා, ගණිත, කලා) ක්ෂේත්‍රයන් ඔස්සේ ද සුදුසුකම් ලබා ඇති අඩු ආදායම් ලාභී පවුල් වල සිසුනට මෙම වසරේ ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් කළ හැකි බවද කියයි. මෙවර තෝරාගනු ලබන ශිෂ්‍යත්ව ලාභීන් වෙත, විශ්ව විද්‍යාල අධ්‍යාපනයේ පළමු වසර තුළදී මසකට රුපියල් 1500/- බැගින් මාසිකව වාරික 12 ක් අඛණ්ඩව ශිෂ්‍යාධාර පිරිනමනු ලැබේ.

ඉල්ලුම් පත් අයදුම්කරුවන් විසින්ම තම අත්අකුරෙන්ම සකස් කරගත යුතුයි. එහි සම්පූර්ණ නම, ලිපිනය, උපන්දිනය, ජාතික හැඳුනුම් පත් අංකය, සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකයන් (නිවස/ ජංගම / ඇති /අසල්වැසි නිවසෙකුගේ) සහ පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව, ඔවුන් නිරත කාර්යයන් පිළිබඳව පැහැදිලි විස්තරයක් ද ඇතුලත් විය යුතු අතර, තම අත්සන යොදා පහත සඳහන් ලිපි ලේඛන සමඟින් ඉදිරිපත් කළ යුතු බවද කියයි.

1. අ.පො.ස. (උසස් පෙළ) 2011 විභාග ප්‍රතිඵල ලේඛනයේ, විදුහල්පති මඟින් සහතික කරනු ලැබූ ඡායාපිටපතක් සහ අ.පො.ස. (සා.පෙ.) ප්‍රතිඵල ලේඛනයේ ඡායාපිටපතක්

2. පවුලේ සාමාජික සංඛ්‍යාව, මාසික ආදායම, සහ ලබන වෙනත් දීමනා පිළිබඳව ග්‍රාම සේවක නිලධාරි මඟින් සහතික කරනු ලැබූ ලිපියක්

3. අයදුම්කරු ස්ථිර පදිංචිය ලබා ඇති ග්‍රාමයේ [illegible] ලබා ඇති [illegible] ප්‍රධාන උතුමාණන්ගෙන් ලබාගත් චරිත සහතිකයක්.

4. මෙම ශිෂ්‍යත්වය ඉල්ලුම්කිරීමට අවශ්‍ය හේතු මුහුණ පා ඇති ආර්ථික ගැටළු ආදිය සඳහන් කරමින් විස්තරාත්මකව තම අත් අකුරෙන්ම ලියනු ලැබූ ලිපියක්. (විශ්වවිද්‍යාලයක ලියා පදිංචිය ලද විගස ඒ බව සනාථ කරමින්, විශ්ව විද්‍යාලය මඟින් ලබාගත් ලිපියක් ද පසු කාලයේ දී ඉදිරිපත් කළයුතුව ඇත)

තමා විසින් සකස් කරගනු ලැබූ ඉල්ලුම්පත්‍රය, ඉහත අංක (1-4) හි සඳහන් ලිපි ලේඛන සමඟින් 2012 ජනවාරි මස 31 දිනට පෙර පහත සඳහන් ලිපිනයට යොමුකළ යුතුය. වැඩිවිස්තර සඳහා දුරකථන අංක 0112877950 විමසිය හැක.

අධ්‍යක්ෂිකා සීතා ගුණතිලක මහත්මිය,
"මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම"
392/2, පෙරේරා මාවත
කොටුවේගොඩ, රාජගිරිය

A wonderful Teacher

S Like a **star** in the sky that twinkles all the night
E for **eyes** with love & care shines
E for **examples** that can be lured by all
T for **truth** that always speaks
H with a **heart** of pure gold
A giving her **ardent** love for students

G **great** smile but not to please the chief
O **opting** values of Buddha's Teaching
O **organizing** duties of her own
N a **noble** person that the world mostly needs
E **encouragement** that makes upon the child
T well **trained** to teach; not merely her subject
I when the **iron** hot getting the best use
L being a **loyal** servant to the entire society
L **lovely** way of talking that everyone please
E paying **especially** …… attention for work
K **kind deeds** she involves in , for the sake of needy
E **Everlasting** in the hearts & memory of needy student

Put all the qualities together & see the greatness of the name you see

Newspaper Extract

ගණඳුර බිඳලන සහන් එළිය

පෙරදිග ලෝකයේ බැබලෙන මුතු ඇටය ලෙසින් විරුදාවලිය ලත් මෙම කුඩා පිං බිම තුළ දසත විහිදී යන්නේ සත්පුරුෂ සුගන්ධයයි. උතුම් මානුෂික ගුණ හදවත් තුළ උත්පාදනය වන ශ්‍රී ලාංකික ජනතාව ආගන්තුක සත්කාරය, පරෝපකාරය වැනි ශ්‍රේෂ්ඨ ගුණ දම් රකිමින් පරම්පරාවෙන් පරම්පරාවට උරුම කරමින් ඉදිරියට ආ ප්‍රෞඪ ජාතියකි. එහෙත් මෑත යුගයේ සිට ගුණ දහම් සීඝ්‍රයෙන් වැළලී යන ජන සමාජයක ඔබ අප කවුරුත් සාමාජිකයෝ වී ඇත්තේ නිරන්තරයෙනි.

ක්ෂණික පිළියම් සෙවිය යුතු පැනයකට අද ඇතැමුන් වගකිවයුත්තෝ සොයමින් සිටියි. එහෙත් ආකල්පමය සංවර්ධනයකින් හෙබි දරු පිරිසක් අනාගත ලොවට දායාද කිරීමේ කාර්යාභාරය වෙනුවෙන් අද ප්‍රඥාවන්ත පිරිස් ඒකරාශී වෙමින් අප්‍රමාදීව කටයුතු කරයි. මෙය දීර්ඝ සංසාර ගමනක නැවතුම් පොළකි. මෙම භවයේ ලද සම්පතක් වේ නම් ඒ පෙර භවයන්හිදී පුරුදු පුහුණු කරනු ලැබූ දාන පාරමිතාවෙහි ආනිශංසයි. සම්බුදු දහම බුද්ධිමතුන් සඳහාම බව බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. එය අවබෝධශ්‍රද්ධානයට හසු වූවෝ පරිත්‍යාගශීලීත්වය වඩ වඩාත් ප්‍රගුණ කරමින් සසර දුකින් මිදීම පිණිස අප්‍රමාදීව පාරමී දම් පුරති.

ඉගෙනීමට දස්කම් ඇතත් දරිද්‍රතාවේ සෝ සුසුම් මැදින් ජීවන ගමනට ආලෝකයක් සොයන අපේම දරු පිරිසට අත දීමට සුදානම් සත්පුරුෂ මිනිසුන් මේ කුඩා දිවයින තුළ අද බහුලව නැතත්, සිටින්නාවූ පිරිස ඒකරාශී කරගැනීමට ද ක්‍රමවේදයක් තිබිය යුතුයි. ඒ සඳහා ඍජු නායකත්වයත්, කල්‍යාණ මිත්‍ර ඇසුරත් මාහැඟි භූමිකාවක් නිර්මාණය කරදෙයි.

ඇතැමුන් පරෝපකාරය යහපත් සේ දුටුවේ වුවද ඔවුන් සතුව පරිත්‍යාගය සඳහා සම්පත් නැත. තවත් පිරිසකට සම්පත් ඇතත් එය අසරණ දරුවන් වෙතට යොමු කරවීම පිණිස විශ්වාසනීය මාර්ගයක් නැත. තවත් පිරිසක් සම්පත්වලින් ආඪ්‍ය වුවද පරිත්‍යාග චේතනාවක් සන්තානය තුළ නොඉපදීමේ හේතුවෙන් තව තවත් රැස්කරයි. පෙර පින් ඇත්තෝ කෙසේ හෝ පරිත්‍යාගයක් කළ යුතුය යන හැඟීමෙන් ඒ සඳහා ඍජු මාර්ග නොවන්නේ නම් විකල්ප මාර්ග ඔස්සේ හෝ වෙර දරයි.

1998 නොවැම්බර් මස 7 වන දින එවන් පරිත්‍යාගශීලීන් වෙනුවෙන් කොළඹ 7 ඩී.එස්. සේනානායක විද්‍යාලයීය ශාලාවේදී **අමරපුර සංඝ රක්ෂිත මහා නිකායේ අග්ග මහා පණ්ඩිත මඩිහේ පඤ්ඤාසීහ මහා නායක ස්වාමීන් වහන්සේගේ** ප්‍රධානත්වයෙන් සහ එවකට කැනඩාවේ සරේ බෞද්ධ විහාරවාසීව සිටි **පූජ්‍යපාද ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේගේ** පුරෝගාමීත්වයෙන් මෙන්ම අනුශාසකත්වයෙන්, යථෝක්ත විද්‍යාලයීය විදුහල්පතිවරුන්ගේ සහ ගිහි පැවිදි ප්‍රඥා සම්පන්න විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයක සමාරම්භක උළෙල පැවැත්විණි.

අඩු ආදායම්ලාභී පවුල්වල සිසු සිසුවියන් 37 දෙනෙකු මෙම ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් ලබා තිබුණෙන් ඔවුන් වෙත සහතික පත් හා රුපියල් 500/- බැගින් වූ ආරම්භක මුදල් චෙක්පත් ප්‍රදානය කිරීම එහිදී සිදුකරන ලදී. එතැන් සිට අ.පො.ස. උසස් පෙළ විභාගය දක්වා, පුරා වසර 2 ක් සෑම අධ්‍යයන මසකටම චෙක්පත් කිතුත් කිරීම සිදුකරනු ලැබූ අතර, ඔවුන්ගේ විෂය ප්‍රගතිය ඇගයීමටත්, සාර්ධර්ම ප්‍රගුණ කිරීමටත් සුවිශේෂ වූ ක්‍රමවේදයන් ද අනුගමනය කෙරිණි. අනතුරුව විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා ද ශිෂ්‍යත්ව ක්‍රියාදාමය ව්‍යාප්ත කරමින් ඔවුන් වෙත පිරිනැමෙන මුදල මසකට රුපියල් 1500/- දක්වා නැංවීමට ද අප අනුග්‍රාහක සුපින්වතුන්ගේ පරිත්‍යාගශීලීත්වය තීව්‍ර වන්නට විය.

ස්ථිර අධිෂ්ඨානයකින් සහ දැඩි කැපවීමකින් යුතුව වසර 14 ක් පුරා සාර්ථක ලෙස ඉදිරියට ගෙන ආ මෙම ශිෂ්‍යත්ව ක්‍රියාදාමය තුළින් ඵල ලැබීමට භාග්‍ය සම්පන්න වූ ශ්‍රී ලාංකික අසරණ සිසුන් සංඛ්‍යාව 630 කි. **ඒ අතර කතෝලික සිසු දරුවන් සඳහා ශිෂ්‍යත්ව 7 ක් ද ඉස්ලාම් භක්තිකයින් සඳහා ශිෂ්‍යත්ව 2 ක් ද, දමිළ සහ මුස්ලිම් ජාතිකයින් සඳහා ශිෂ්‍යත්ව 4 ක් ද, දෘෂ්‍යාබාධිත, ශ්‍රවණාබාධිත සහ කායික අශක්නුතාවෙන් යුත් සිසු දරුවන් සඳහා ශිෂ්‍යත්ව 3 ක් ද ප්‍රදානය කිරීමට ලැබීම මෙම ශිෂ්‍යත්ව වැඩපිළිවෙළෙහි සුවිශේෂී** සන්ධිස්ථානයන් බවට පත්ව ඇත.

දෛවයේ සරදමට ලක් වූ සිසු දරුවන්ගේ හදවත් තුළ ජනිතව තෙළි තුඩින් එළි දැක්වූ සත්‍යය පිළිබඳව නිගමන ගැනීම පරිගණකයට භාර නොකොට, මාංශමය දෙනෙත් ඔවුන් වෙතට යොමු කරවමින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සංවේදී හදවත් තුළින්ම තුලනය කොට ගත්තා වූ තීරණ මගින් **මනුෂ්‍යත්වයේ ශ්‍රේෂ්ඨත්වය** සිසු හදවත් තුළ ගම්‍ය කරවීමු. එතුළින් ඔවුන් අද ප්‍රබල වූ මානසික ශක්තියකට හිමිකම් කියනු ඇත.

දරිද්‍රතාව හමුවේ පීඩිතව අකර්මණ්‍යව අනාගත ලෝකය පිළිබඳව සිහින මැවූ විශාල සිසු පිරිසක් අද යහපත් පුරවැසියන් ලෙසින් වෛද්‍ය ඉංජිනේරු ගුරු හෙද ආදී සමාජයේ විවිධ තලයන්හි නිල තල හොබවමින්, මුළු මහත් සමාජයම සුවඳවත් කරනු ඇත. එම ගුණ සුවඳ මෙවැනි ශිෂ්‍යත්ව ක්‍රමයකට අවතීර්ණව මාහැඟි කැපවීමකින් සේවය කරන අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අනුග්‍රාහක භවතුන්ගේ අධ්‍යාත්මික සතුටට ලබා දී ඇත්තේ ඉමහත් දායකත්වයකි. මෙවැනි සත්කාර්යයන් තුළින් ලබන්නා වූ නිරාමිස ප්‍රීතිය අත් විඳීමට මඟ පාදා දුන් බෞද්ධ නායකත්වයට සමස්ථ සමාජයේම ගෞරවය හිමිවිය යුතුමය.

Growing from a muddy puddle
A lotus flower blossoms
Fragrance and pure.....

Out of the human rabble
Can arise an Arahanth
Whose life is virtuous and pure.....

ශිෂ්‍යත්ව පදනමක ආරම්භය



අමරපුර මහා සංඝ සභාවේ උත්තරීතර මහානායක අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ නාහිමියන්ගේ පින්බර දෝතින් ප්‍රථම ශිෂ්‍යත්වය ප්‍රදානය කරනු ලැබූ මොහොත. ශිෂ්‍යත්ව ලාභී දියණිය දෙපා නමදිමින්....... 1998.11.7 ඩී. එස්. සේනානායක විද්‍යාලයීය ශාලාවේදී

2006 දී විශ්ව විද්‍යාල අධ්‍යාපනය සඳහා මා පිය අනුස්මරණ ශිෂ්‍යත්වය ද ලබාගත්ල අද වෛද්‍ය වෘත්තියට පිවිස සිටින ජයග්‍රාහී සිසුවෙක් 2002 දී අපොස (උසස් පෙළ) සඳහා ශිෂ්‍යත්වය හිමිකරගත් අයුරු (242/M/WK/665)

ජාති ආගම් ආදී කිසිදු භේදයකින් තොරව තෝරාගනු ලබන සරසවි වරම් ලද ශිෂ්‍යත්වලාභී දරු දැරියන් තිළිණ කරනු ලැබූ ග්‍රන්ථ ද අතැතිව.......

ආබාධිත සිසුන් ශිෂ්‍යත්ව ලබයි

සරසවි වරම් ලද පූර්ණ ශ්‍රවණාබාධිත ශිෂ්‍යා-වක් ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්-සේ අතින් මා පිය අනුස්මරණ ශිෂ්‍යත්වය ලබා ගනිමින්.. .. (A/WK/1114)



සරසවි වරම් ලද කායික අශක්නුතාවෙන් යුත් ශිෂ්‍යත්වලාභී දරුවෙකු මා පිය අනුස්මරණ ශිෂ්‍යත්වය ලබාගැනීම සඳහා ඉදිරියට ගෙන එනු ලැබූ අයුරු.. .. (A/LH/1008)

2010-09-19 ශිෂ්‍යත්ව පදනම් පරිශ්‍රයේ දී, පදනමේ නිර්මාතෘ සහ අධ්‍යක්ෂිකා සීතා ගුණතිලක මැතිනිය අතින් අදාළ සහතික පත්‍රය සහ තිළිණ ග්‍රන්ථ ලබා ගනිමින්.. .. ..

පූර්ණ දෘශ්‍යාබාධිත විශ්ව විද්‍යාල සිසුවෙක් අදාළ සහතික පත්‍රය සහ තිළිණ ග්‍රන්ථ ලබමින්.. .. .. .. (A/LH/1115)

උසස් අධ්‍යාපනයට ආර්ථිකය අභියෝගයක් වූ ජයග්‍රාහී ශිෂ්‍යත්වලාභී දරු දැරියෝ

1998 - 2001 දක්වා වූ ආරම්භක වසර 4 තුළදී ප්‍රතිලාභ ලැබූ ශිෂ්‍යත්වලාභී දරුවන් 132 කි.

2002 වසර ශිෂ්‍යත්වලාභීන්.. අනුශාසක පූජනීය ආචාර්ය මිරිස්සේ ධම්මික හිමි, භාණ්ඩාගාරික සිසිර හේවාබන්ධුල මහතා සහ සම්බන්ධීකරණ ලේකම් සීතා ගුණතිලක මැතිනිය සමග

2003 වසර ශිෂ්‍යත්වලාභීන්.. අනුශාසක ස්වාමීන් වහන්සේ, ඉන්දිරා කස්තුරිරත්න සහ සීතා ගුණතිලක මහත්මීන් සමග..

2004 වසර ශිෂ්‍යත්වලාභීන්.. අනුශාසක ආචාර්ය මිරිස්සේ ධම්මික හිමි, ලේකම් බන්දුල අබේසුන්දර මහතා සහ සම්බන්ධීකරණ ලේකම් සීතා ගුණතිලක මැතිනිය ..

2005 වසර ශිෂ්‍යත්වලාභීන්.. අනුශාසක ස්වාමීන් වහන්සේ, ලක්ෂමන් පෙරේරා මහතා සහ සීතා ගුණතිලක මහත්මිය සමග

2006 වසර අ.පො.ස. (උ. පෙ) ශිෂ්‍යත්වලාභීන් අනුශාසක ස්වාමීන් වහන්සේ, සීතා ගුණතිලක සහ ඉන්දිරා කස්තුරිරත්න මහත්මීන් සමග..

2006 වසර - සරසවි වරම් ලද, මා පිය අනුස්මරණ ශිෂ්‍යත්වලාභී වෛද්‍ය සිසුන් ..

2007 වසර - සරසවි වරම් ලද, මා පිය අනුස්මරණ ශිෂ්‍යත්වලාභී වෛද්‍ය සිසුන් -

රට තුළ පැවති බිහිසුණු ත්‍රස්තවාදී ව්‍යවසන හමුවේ ශිෂ්‍යත්වලාභීන් ඒකරාශී කිරීමේ අවදානම භාර නොගත් මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම 2007 සහ 2008 වසරවල දී ජයග්‍රාහී ශිෂ්‍යත්වලාභීන් වෙත අදාළ සහතික පත්‍ර සහ තිළිණ ග්‍රන්ථ තැපැල් මගින් යවමින් ශිෂ්‍යත්ව ක්‍රියාදාමය අඛණ්ඩව පවත්වාගත් වගයි.

2008 වසර - මා පිය අනුස්මරණ ශිෂ්‍යත්වලාභී, සරසවි වරම් ලද, වෛද්‍ය සහ ඉංජිනේරු සිසුන්..

2009 වසර - මා පිය අනුස්මරණ ශිෂ්‍යත්වලාභී, සරසවි වරම් ලද, වෛද්‍ය ඉංජිනේරු සහ කළමනාකරණ සිසුන්..

2010 වසර - මා පිය අනුස්මරණ ශිෂ්‍යත්වලාභී, සරසවි වරම් ලද, වෛද්‍ය, ඉංජිනේරු, කළමනාකරණ සහ කලා පීඨයන්හි සිසුන්..

2011 වසර - මා පිය අනුස්මරණ ශිෂ්‍යත්වලාභී, සරසවි වරම් ලද, වෛද්‍ය, ඉංජිනේරු, කළමනාකරණ සහ කලා පීඨයන්හි සිසුන්..

සිසු දරුවන් 630 ක් ප්‍රස්ථාර ගතව



වාර්ෂික ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයේදී, ශිෂ්‍යත්වලාභීන් වෙත අදාළ සහතික පත්‍රය සමග ප්‍රදානය කෙරෙන සාරගර්භ ග්‍රන්ථ සහ ලිපිද්‍රව්‍ය

1998 සිට 2011 දක්වා වසර 14 ක් තුළ බිහිකරනු ලැබූ ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව **630** කි. දිවයිනේ අති දුෂ්කර ප්‍රදේශ පවා නියෝජනය වන පරිද්දෙන් දීප ව්‍යාප්තව තෝරා, දරිද්‍රතාවෙන් පරතෙරටම ගිය එම සිසු පිරිසට ආර්ථික මෙන්ම අධ්‍යාත්මික වශයෙන් ද පරිපෝෂණයක් ලබා දී ආකල්පමය සංවර්ධනයකින් යුතු ගුණ ගරුක සිසු පරපුරක් ලෙසින් සමාජයට දායාද කිරීමේ දැවැන්ත ක්‍රියාදාමයට අප හා සමග අත්වැල් බැඳගත් කල්‍යාණ මිත්‍ර සුපින්වතුන් සංඛ්‍යාව **260** කි. ඔවුන්ගේ සියලු යහපත් බලාපොරොත්තු ඉෂ්ඨ සිද්ධ වීමටත් ඉගෙනුම ලබන ඔවුන්ගේ දරු මුණුපුරු මිනිපිරියන්ගේ අධ්‍යාපන කටයුතු සඵල වී චිරජීවනය සැලසීම පිණිසත් ප්‍රගුණ කරනු ලබන මෙම දාන පාරමිතාව මහත් සේ ඉවහල්වනු නොඅනුමානය.

දදං පියො හොති දදන්ති නං බහූ
කිත්තිඤ්ච පප්පොති යසොභි වඩ්ඪති
අමංකු භූතො පරිසං විගාහති
විසාරදො හොති නරො අමච්ඡරී

One who makes offering being free from evil mind is sought by many good people. Also he is blessed with increaning recognition and spreading fame. Amidst the people he is brave and seems to be a philosophic scholar.

දෙන තැනැත්තා බොහෝ දෙනාට ප්‍රිය වේ. කීර්තිය පැතිරේ. යසස වැඩේ. පිරිසක් අතරට යන කල්හි නොබියව යයි. විශාරදව යයි.



සිසු දරුවන්ගේ උදාර සංකල්පනා

කුප්පි ලාම්පුවේ පහන් සිළුවයි -
කහට උගුරයි පමණි මාහට
දිවා රෑ නිදිවරා ලැබුවෙමි....
A 3 ක් .. .. ඒ නමුත් කුමකට ?

කුසට අහරක්, හිසට වහලක්.. ..
ගතට සවියක්.. නොමැත අප හට..
නෙතට කඳුලක් පමණි ඇත්තේ
වරම් සරසවි රැකේවිද .. .. මට.... ?

(ශිෂ්‍යත්ව අංක - 648)



දරිද්‍රතාවෙන් පීඩිත ශිෂ්‍යත්වලාභී සිසු දරුවෝ තිළිණ කරනු ලබන ග්‍රන්ථ තුලින් සාරධර්ම පරිපෝෂණයක් ද ලබා එළදායී පුරවැසියන් ලෙසින් සමාජගත වන අයුරු - (ශිෂ්‍යත්ව අංක 657 න්)

ශිෂ්‍යත්ව අංක 641

මනුෂ්‍යත්වය අබියස
නොමිනිස්කම වැජඹෙන

අවංකත්වය හමුවේ
අධම ගති කිරුළු ලන

සැහැසිකම් අබියස
සාරධර්ම වැලපෙන

සත්‍යය අබියස
මුසාව රජයන

නිල බල ඔස්සේ
වියරුව නලියන

වත්මන් විශ්වයක

මනුෂ්‍යත්වයේ නාමයෙන්
ගුණ සුවඳ විහිදුවන
මලක් පිපී ඇත

මව්පියන් සිහිකර
අප හටද දිරිය දෙන
ගුණවතුන් එක්ව ඇත

සරසවිය අබියස
සුසම් ලන සිසු හදට
සිසිල් දිය උල්පතකි

දයා කරුණා ගුණය
නිරතුරුව ගලා එන

මාපිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම

A/DR/1111

ශිෂ්‍යත්වලාභීන්ගේ යථා තතු අධ්‍යක්ෂ මණ්ඩලයේ පියවි ඇසින්

ශිෂ්‍යත්වලාභී වෛද්‍ය සිසුවියක් සහ මව - සිය නිවස ඉදිරිපිට

පළමු වසර කලා අංශයේ සිසුවියක් තම නිවස ඉදිරිපිට

වෛද්‍ය සිසුවෙකු සිය නිවස තුළ පාඩම් කළ කාමරය

කළමනාකරණ පීඨයේ ශිෂ්‍යත්ලාභී දියණියක් දිවි ගෙවන, සුනාමි ව්‍යසනයට හසු වූ නිවසේ කොටසක්

වාලුකාවට දිය ඕදන් ...

සීත් සිරි සිරි තුහින පල් වැනී
කැකුළු මල් පෙති අතර ඉහිරෙන්
එන්ඩ හරු රැස් මුදු කිනැති
එකත්තර සැලුනයි , සැනුම පෙති ...

සුසුදු පෙන කැටි නගන දිය සුලි
සැඩුම රළ පෙළ ජීවිතය වැනී
රැඳුරු තාරා කිළල් ගඟහැර
ගලන කල සොදුරැයි , දිය දහර ...

රෑ අහස් තුස දිලෙන තරු කැල
මන වැදි සඳරේණු අසිරින්
සිසි සිරුණ රැද දිලෙන තරු දැන
සිතුවිලි තැලුලි , සඳ වෙල ...

සිත්න පෙනු දිය දහ කරන සද
නොදැනීම පැනේ පතරෙන් පෙත් පුනී
එලිය දැනුමට හඩනා සිත් ඇත
දෙසිදු තුළු සුවලිපෙකි , ජ ගණ ...

ගත්තම් වැද ගිය රළ කතර වැනී
ඒා සිතත් දිය පොයා ලැගුන්
වාලුකාවට දිය ඕදන් වියා
සහෙන් ලැද පසතොයේ , පැහැයෙකි ...

සමර සැද හිතාදර සිසුවිය
[redacted]
ශිෂ්‍යත්ව අංක 1022

[illegible]

වෛද්‍ය ශිෂ්‍යත්ව - S/TJ/1150 (උපුටාගත් කොටසකි)

තුති පැසසුම්

මා පිය අනුස්මරණ මුල් තැනට ගෙන
සාමය සමාදානය නිති සිතට ගෙන
භීතිය පීඩනය මනසින් පිටට පැන
මා පිය පදනම ය මගෙ හදවතට පන

සැනසුම ළඟා කරදෙන මේ පදනමට
අප හැම දෙනම ගුණ ගරුකව සතුට පිට
බුදු දම පෙරට ගෙන යනවිට දම් මඟට
අද මම පැමිණියෙමි ගුණ පිරි යහමගට

ගුණයෙන් පිරුණ මව් පිය සැම එකතුවෙලා
ධනයෙන් සරණ අත්විය සිත් සනසවලා
භවයෙන් ලැබුන කරුමය වූ පව් දුරලා
සමිඳුන් කරන සේවය සැම අගය කළා

නායක සමිඳු ගෙනදුන් මේ පියවරට
බාධක නොසිඳු වීමෙන් යයි පෙරමුණට
රාගික අවිදු අඳුරෙන් සැම මිදීමට
නාමික දිළිඳු ළමයින් යයි යහමඟට

අභියෝගයට අත දෙන්නට සිටින පිරිස්
සහයෝගයට ඇත මුළුලොව ඉතා උසස්
අප වැනි අයට ජයමාවත කරන සකස්
සීතා මැතිනියට කවියෙන් කරම් පසස්

[redacted] (M/AN/904)

මා ජීවිතයේ කවිය ඔබම විය

සීලය, සමාධිය, ප්‍රඥාව,
තාරුණ්‍යයේ හැඟුම සමග මුහු කර
නවමු වූ මාවතකට මඟ හසර පහදමි...
න්....
දැකින හැම නෙතට, රැස් විහිදුවා ලන
නීල මාණික්‍යයක් වූ,
ගුණදහමින් සිත පුරවා,
ණය නොවී ලෝකයට,
තිසරණ සරණින් ජීවිතය දිනන්නට ...
ලස්සන මාවතක් විවර කර දුන්, මා ජීවිතයේ
කවිය ඔබම විය, මැතිණියනි !

ගරු සීතා නන්දනී ගුණතිලක මැතිණියනි ;
ඔබතුමියට නිදුක් නිරෝගී වාසනාවන්ත දිවියකට ආසිරි පතමි !
ශිෂ්‍යත්ව අංක (C/RN/1019)

තවමත් අපට මහපොළ ශිෂ්‍යත්වය වත් ලබා දී නොමැත. එහෙත් අපට මාපිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමෙන් ලැබෙන ශිෂ්‍යත්වය නොවරදවාම ලැබෙයි. මා මේ මාසයේ සරසවියේ වියදම් පියවාගත්තේ ඔබතුමියගේ පදනම මගින් පිරිනමන ලබන ශිෂ්‍යත්වයෙනි බව හැඟීමකින් යුතුව සඳහන් කරමි. අප කන බත්පතක් පවා මිලදී ගත්තේ ඒ ශිෂ්‍යත්වයෙන් ලැබුනු මුදලෙනි. ඒ කන බත් ඇටයක් බත් ඇටයක් පාසා ඔබතුමිය ඇතුළු පදනමේ සැමදෙනාටම පින් සිදුවේවා!

කුසගින්න නිවාලන බත් ඇටයක් ඇටයක් පාසා, මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමට පින් දෙන සරසවි සිසුවෙක් .... (A/DR/935)

කළණ මිතුදමක ස්වර්ණමය පුරුක්
THE GOLDEN LINKS OF FRIENDSHIP

කල්‍යාණ මිත්‍ර සම්පත්තිය වූ කලී සාර්ථක ජීවිතයකට බලපාන මාහැඟි භූමිකාවකි. සසර සයුරේ අතරමංවී සිටින අප සැමගේ කල්‍යාණ මිත්‍රයා නම් අන් කවරෙකුවත් නොව, යායුතු මග හෙළිකර දුන් අප තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේමය. එය අවබෝධ කරගත්තේ නම් උන්වහන්සේ විසින් දේශනාකර වදාළ අති උතුම් නිර්මල ශ්‍රී සද්ධර්මයට ප්‍රායෝගිකව ම අප ළඟාවනවා ඇත. ජීවමාන බුදුරජාණන් වහන්සේ දැකිය හැකි වන්නේ එවිටය. එම ශ්‍රී සද්ධර්මය වසර 2600 ක් පුරා සුරැකිව ආරක්ෂා කරගැනීමට ඇප කැප වෙමින් සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මහා මෙහෙවරක් සිදු කරනු ලබන උතුම් සංඝරත්නය වෙත නැඹුරු වනවා මිස උපන් සත්වයාට වෙන කාගේ හවිහරණක් ද ? ජීවිත අභියෝග ජයගැනීමට අවශ්‍ය වාතාවරණය නිතැතින්ම සකස් වන අයුරු අත්දැකීමට නම් අප කල්‍යාණ මිත්‍රයන් සේ සැලකිය යුත්තේ අති උතුම් සංඝරත්නයම ය. සද්ධර්මය ඇසීමට පවා එවන් සත්පුරුෂ ඇසුරකින් ලැබෙනුයේ මාහැඟි අවස්ථාවකි.

චරං චේ නාධිගච්ජෙය්‍ය - සෙය්‍යං සදිස මත්ත නො
එක චරියං දළ්හං කයිරා - නත්ථි බාලො සහායතා

(ධම්මපදය - බාල වග්ග)

If a person does not get a companion who is better or equal (in virtue), he should resolve to live alone; without making companionship with the lowly.

කල්‍යාණ මිතුරෙකු ලෙසට, ගුණ ධර්ම අතින් තමාට වඩා උසස් හෝ සම හෝ කෙනෙකු සොයා ගත නොහැක්කේ නම් තනිව හැසිරීමේ අදහස දැඩි කරගතයුතු බවත්, අන්ධ බාලයින් සමග එක්වීම නුසුදුසු බවත් මෙයින් කියවේ.

කරුණා මෛත්‍රියෙන් යුතුව යහපත් වූ කාය කර්ම, වචී කර්ම, මනෝ කර්ම ආදියෙහි නිරත සත්පුරුෂයන් සුවසේ වෙසෙමින් අන් අයටද ආර්ය මාර්ගය විවෘත කරදීමට වෙර දරයි. එවැනි කල්‍යාණ මිතුරෙකු හඳුනාගැනීමට ද යම් පමණක හෝ ප්‍රඥාවක් තිබිය යුතුය.

ඔවදෙය්‍යානු සාසෙය්‍ය ... අසබ්භාච නි වාරයේ
සතන්හි සො පියො හෝති ... අසතන්හොති අප්පියෝ

The wise man that advices and instructs the others and also refrains them from awful deeds is sought by good men but detestable by the evil beings.

නුවණැති සත්පුරුෂ තෙම යමෙකු යහමගට ගැන්මේ අරමුණින් වරද නිසි අයුරු දැක යා යුතු මග පෙන්වමින් අවවාද අනුශාසනා කරයි. අකුසලයෙන් වළක්වයි. එසේ කරන්නවුන් කළණ මිතුරු ඇසුරක් ලැබීමට පින් ඇත්තවුන් හට ප්‍රිය මනාපය. අසත්පුරුෂයන් ට අප්‍රිය වේ. අමනාප වේ.

මිනිසත් බවේ අගය නොදැන සසරේ වල්මත් වූවන් සේ අන්ධානුකරණයෙන් යුතුව බටහිර සංස්කෘතියට ආවඩමින් සිටින නාමික සිංහල බෞද්ධ ජනතාව අතරින් සුළු පිරිසකට හෝ ආර්ය මාර්ගය විවර කරදීම ට දරන්නාවූ වෙහෙස උඩුගම් බලා පිහිනීමකි. එහෙත් කල්‍යාණ මිතුරු ඇසුර ලබන්නාවූ සත් පුරුෂ සුපින්වතුන්, බුදුරජාණන් වහන්සේ ප්‍රතිපත්තියෙන් පිදීමට සාර්ථක ශිෂ්‍යත්ව පදනමක් වටා අද සිසුයෙන් ඒකරාශි වී ඇත. දරිද්‍රතාවෙන් පීඩිත ශ්‍රී ලාංකික සිසු දරුවන් ගුණ නැණ බෙලෙන් පිරි පුරවැසියන් බවට පත් කරන්නාවූ අපගේ කලණ මිතුරු කැල, මිය පරලොව ගිය සිය දෙමාපියන් එළදායි ලෙසින් වාර්ෂිකව සිහිපත් කිරීමට මෙම අවස්ථාව ග්‍රහණය කරගනිමින් නිරාමිස සතුටක් ලබයි. එවන් සුපින්වතුන්ගේ නාමයන් විශ්වයට මුදාහැරීමේ දී එහි දෝංකාරයෙන් පවා හදවත් සුවපත් කෙරෙයි. ඒ සදහම් සිසිලේ බලය යි.

කළණ මිතුරන් එක්ව වාර්ෂිකව පවත්වනු ලබන මෙම ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයේ වඩාත්ම එලදායි

අරමුණ වනුයේ අනුශාසක ස්වාමීන් වහන්සේගේ ඉතාමත් හරවත් කාලෝචිත දේශනයයි. එමගින් තරුණ සිසු හදවත් තුළ දෝංකාර දෙමින් පතිතවන සුවිශේෂී අධ්‍යාත්මික ශක්තියක් නිර්මාණය වෙයි.

ශිෂ්‍යත්ව ප්‍රදනෝත්සවයේ දී අනුග්‍රාහක භවතුන්ගේ පින්බර දෝතින්ම ශිෂ්‍යත්වලාභීන් වෙත අදාළ සහතිකපත්, තිළිණ ග්‍රන්ථ සහ ලිපිද්‍රව්‍ය ප්‍රදනය කෙරෙයි. දිවයිනේ ඈත පිටිසරබද දුෂ්කර පළාත්වල සිට පැමිණෙන ශිෂ්‍යත්වලාභී දරුවා සහ අනුග්‍රාහක සුපින්වතුන් අන්‍යොන්‍ය වශයෙන් නෙත් ගැටෙන මෙම සංවේදී මොහොත දෙපාර්ශවය වෙත ලබාදීමට මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම දරන්නා වූ වෑයම සුළුපටු නොවනු ඇත. එහෙත් එය සදා නොමියන සැනසුම්දායක සිහිවටනයකි.

අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රි ලක්ෂණය ට අනුව කුමන මොහොතක හෝ නාම රූප දෙක වෙන්ව යනු ඇත. එහෙත් නිරාමිස සුවයෙන් ඔද වැඩී සිටින සුපින්වත් අනුග්‍රාහක භවතුන්ගේ පහත සඳහන් ශ්‍රේෂ්ඨ නාමයන් සදාකල්හිම විශ්ව තලය සුවඳවත් කරයි.

අනුග්‍රාහක භවතුන්ගේ දෙමාපියන් ද පහන් වූ සිතැතිව ශිෂ්‍යත්ව ප්‍රදානය කළ දා ....

පූජනීය ආචාර්ය මිරිස්සේ ධම්මික හිමිපාණන්ගේ දයාබර මෑණියන් වූ ඒ. ජයසිංහ මැතිනියගේ පින්බර දෝතින් 2002 වසරේ ශිෂ්‍යත්වලාභී දරුවෙකු වෙත ශිෂ්‍යත්වය පිරිනැමුණු සුපසන් මොහොත...... බත්තරමුල්ල සිරි සදහම් සෙනසුනේදී.......

අධ්‍යක්ෂිකා සීතා ගුණතිලක මැතිනියගේ දයාබර පියාණන් වූ විශ්‍රාමලත් විදුහල්පති විජයසේන කිරිවත්තුඩුව මැතිතුමාගේ පින්බර දෝතින්, 2002 වසරේ ශිෂ්‍යත්වලාභී දැරියක් වෙත අදාළ සහතිකපත පිරිනැමුණු සුපසන් මොහොත..........

දස මාසේ උරේ කත්වා - පෝසේසි වුද්ධි කාරනං
ආයු දීඝං වස්සසතං - මාතු පාදං නමා මහං

I worship the feet of my mother, wishing a long life of hundred years for protecting me within her womb for 10 months and for bringing me up well.

දස මසක් කුස තුළ හොවාගෙන මා ආරක්ෂා කරමින් පෝෂණය කළා වූ මාගේ මෑණියනි, සියක් වසරක් ආයු සම්පත්තිය ප්‍රර්ථනා කරමින් මම ඔබගේ දෙපා නමදිමි.

වුද්ධිකාරෝ ආලිංගිත්වා - චුම්බිත්වා පිය පුත්තකං
රාජ මජ්ඣං සුපතිට්ඨං - පිතු පාදං නමා මහං

I worship the feet of my father, who kissed me cuddled me and also placed me among kings with my welfare at heart

මාගේ සැපතම හදේ රඳවාගෙන, පිය සෙනෙහසින් සිප වැලඳ ගනිමින් මා ශ්‍රේෂ්ඨයින් අතර තැබුවා වූ පියාණෙනි, මම ඔබගේ දෙපා නමදිමි.

THE STABLE LINKS OF FRIENDSHIP
කළණ මිතුදමෙහි සවිබල පුරුක්

Ven Dr Mirisse Dhammika
Mrs Cynthiya Amarasingha
Mr Leslie Samarajeewa
Mr Wimal Witharana
Mrs Shirani Perera
Dr Bandula Abeysundara
Miss Samantha Abeysingha
Miss Thilanka Galappaththi
Mr Mayithri Perera
Mr Shehan Perera
Mrs Saumya Jayinudeen
Mr Upali Gunarathna
Mrs Kumudini Palliyaguru
Mrs Indrani Galappaththi
Mr Laknath & Mala gunawardena
Miss Meela Gunawardena
Mr &Mrs Renuka & Dan Peiris
Mrs Indira Hewabandula
Mrs Subhadra Gunawardena
Mrs Dhammika Ekanayaka
Mr Bernard Weerasingha
Mrs Kumudu Hettiarachchi
Miss Arosha Wickramarachchi
Mr Sena Ranasingha
Mrs Deepthi Athukorala
Mrs Chandra Stocks
Miss Lisa,Mayuri,Harshani Wijeratna
Mrs Mayuri perera
Mr & Mrs Demuni/Shamini Jayasinha
Miss Lukshani Jayasingha
Mrs Sunila I Madanayaka
Mr & Mrs Kapila & Shyama Perera
Miss Samanthi Samarasekara
Mr Shantha Gunawardena
Mr Sarath Samarasekara
Mrs Amarawathie Gunawardena
Mrs Wasantha Wijesooriya
Mr L A D Palitha
Mr Saman Samarasekara
Miss Warunika Galappaththi
Dr Sandeva Goonetilleke
Mr Palitha Palliyaguru
Mr Tom Fernando
Mrs Swineetha Thisera
Mrs Elsie Perera
Mr&Mrs Upul/ Deepthi Athukorala
Mr&Mrs Chandralal/Shiromi Samarakoon
Mr&Mrs Champika/Dhammika Hettiarachchi
Mr&Mrs Cyril/Manel Weerathunga
Mr&Mrs Saman/Nilmini Wijewardena
Mr Venus Perera
Mr Asoka Weerabaddana
Mr Senaka Fonseka
Dr Mala Fernando
Mr Sudu Watagodakumbura
Dr Mahendra Wijesingha
Mr Warren Smith
Mrs Bhadrani Perera
Miss Pavithra Thushari Lokuheeraluge
Mr&Mrs Dan/Renuka Peiris
Mr&Mrs Nimal/Chithra Rajapaksha
Mr Nandana Perera
Mr& Mrs Leslie/Padma Samarajeewa
Mr&Mrs Thilak/Geetha Jayasooriya
Mr Gamini Dissanayaka
Mr Janaka Perera
Mrs Wimala Packir
Mr Thilakasiri & Ranjith Samaraweera
Misses Vajira Bleth/Lanchani Gunawardena
Misses Harshani Bandaranayaka/Lanchani Gunawardena
Mrs Lalani Wijesena
Mr Lakshman Perera
Mrs Manel Perera
Mr Saman Perera
Mr Sanjeewa Perera
Mr Cyril Weerathunga
Mr Kapila Perera
Mrs Shyama Perera
Mr Laknath Gunawardena
Mr Saman Wijewardena
Miss Shanika Gunawardena
Mr Gamini Senarath
Mrs Nuragi Perera
Mr Gayan Abeysundara
Mr Lal Samarakoon
" Sasnaka Tharuna Pirisa"

Mr & Mrs Lucky & Manel Perera
Mr&Mrs Bernad/Feroza Weerasinha
Mrs Mallika Jayasekara
Mr&Mrs Palitha/Kumuduni Palliyaguru
Mr&Mrs Kapila/Shyama Perera
Mr&Mrs Bandula&Lalitha Abeysundara
Mr Udaya Anakage
Thompson Fernando
Dr Vajira Samarasooriya
Miss Renuka Nelumdeniya
Miss Gayathrika Kiriwattuduwa
Mrs Chithrani Kiriwattuduwa
Mr Demuni Jayasingha
Mr K.D. Dias
Mr Jayantha Arachchige
Mr&Mrs Gamini/Devika Senarath
Mr Bandu Imbulgoda
Mrs Nalani Dissanayaka
Miss Mala Dissanayaka
Mr W A D Sarath Kumara
Mr R D Dias
Mr Saliya Kulatunga
Mr Nimal Rajapaksha
Mr Sunil Ranasingha
Mr Anil Fernando
Mr Asanka Perera
Mr Navin Abeysundara
Dr Gamini Randeni
Mr Chanaka Samarajeewa
Miss Thanuji Darshika
Mrs P Wijenayaka
Miss Mala& Nalani Dissanayake
Mrs Indira Dissanayaka
Mrs Dharmawathie Munasingha
Mr Sunanda Dissanayaka
Mr Dilshan N Peiris
Mr Krishan Goonetilleke
Mrs Sissie Peiris
Miss Thamali Perera
Mrs S Basnayaka
Mrs Uchini Goonetilleke
Mr M D H Herath
Mrs S Niriella
Mr Rajakaruna Doluweera
Mrs Ranganee Goonetilleke
Mr N A pradeep Rangana
Mr Kavindu Gayanath amarasingha

Mr Wimal Vitharana
Mrs Samanthi Samarasekara
Mr& Mrs Mano/Niroshani Jayasekara
Miss Bhashini Palliyaguru
Mrs Meela Gunawardena
Mr Sarath Jayawardena
Mr Asanga Perera
Mrs Dhammika Samarajeewa
Mr Suwimal Karunarathna
Mrs Mallika Dodangollegama
Mrs Nirmalee Kiriwattuduwa
Mrs Shamini Jayasingha
Mr Chandima Panditha
Miss Namal Abeysundara
Mr Siva Sathasivam
Mrs Indra Madanayaka
Mrs Indira Kasthurirathna
Mr Jayath Udara Perera
Mr N M P B Nawarathna
Mrs C N D Silva
Mr&Mrs Beumal/Erasha Fernando
Mr Hirantha Hettiarachchi
Mr&Mrs Piya/Menique Nawarathna
Mr Gamini Senarath
Mrs Nuragi Perera
Mr Gayan Abeysundara
Mr Lal Samarakoon
Mrs K Seetha Goonetilleke
Mr Nimal Goonetilleke
Miss Sajini Piyumanthi
Mrs Shamani Jayasingha
Mr Demuni Jayasingha
Mr Upul Senevirathna
Mr&Mrs Tilak &Geetha Jayasooriya
Mr Janaka Ruwanpura
Mrs Mala Gunawardena
Dr Upul Athukorala
Dr Amitha Bar-Sholoma
Mr Nalin Imbulgoda
Mr Dushan Thalagala
Mrs Rupa Gunarathna
Mrs Uthpala Goonetilleke
Mrs H L Fernando
Mr Chandimal De Silva
D: of Census & Statistics
Miss Thilini Rajapaksha
Miss Nipuni Rajapaksha

Justice Nimal Dissanayaka
Miss S P De S Muthukumarana
Mr K W Upasena
Mr A D Palitha Perera
Mrs Chandanie Gamage
Miss Jayamalie Shashikala
Mrs Shirani Dias
Dr Soma Kulathunga
Mr W A B Gunasingha
Mrs Ranjanie Gamage
Mr Nimal Goonewardena
Mrs Shyamalie Manadeniya
Mrs Wasantha senaweera
Mrs Prabha Kumari Jayathilaka
Mrs Radha kuruppu
Mrs Dias & Mrs Fernando
Mrs Gayani Udawatta
Mrs Nandanie Vithana
Mrs Upendra Keerthithilaka
Mrs Anula Wijesooriya
Dr Prageeth Dissanayaka
Mrs Mala Chandanie
Mrs Kamala Udawatta
Miss Nethmini Gamage
Mrs Kumudu Perera
Mr Karunacandra Goonetilleke
Mr Udaya Kuruppuarachchi
P M S F
3-Transferred from 2010
Mrs P K Abeyrathna
Miss Thamali Perera
Mr N R Palliyaguru
Miss Dinushi & Dinusha Bandara
Mrs Padmini Bandara
Mr Lalith Gamage
Mr Thiral Abeyrathna
Mrs Shermila Wijethunga
Mrs K Wickramasingha
Mrs H S Dissanayaka
Mrs Kusuma Hettiarachchi
Mrs W M J S Wijesingha
Mrs Mallika P Galagedara
Miss Nayani Dayarathna
Mrs Chithrani Nanayakkara
Mrs Sunethra Hettiarachchi
Mr Kumudumal Hettiarachchi
Alberta Buddhist Vihara
Dr Neville Hewage
Mrs Darshani Nanayakkara
Mr&Mrs Dennis Thissera
O I D A
Miss Gayani Hewabandula
Miss Ruwani Hewabandula
Mrs Gothami Arachchige
Mr&Mrs Chandu/Sumith Peiris
Dr Gunadasa Ankumbura
Mrs Dilrukshi Anakage
S L C S F
Mr Sarath Kiriwattuduwa
Mr S M Dassanayaka
Mr Deepal Peiris
Mrs Priyadarshani De Silva
Prof: H M N Bandara
Lect: Dhammika Bandara
Mr Dimuth Gamage
Miss Wathsala De Silva
Mr Sudath Weerasingha
Mrs Hemanganie Samarakkody
Mr Gihan Weerasekara
Mr S Wickramasingha
Mr Herbet P Wijethunga
Dr Nandanie Amarasingha
Mrs Champa Rathnasekara
Mrs Daya Kotuwella
***Miss Himasha Rukshani

Co-ordinating Office

De Silva
Mrs Sujatha Karunarathna
Mr Kosala Gayan Samarathunga
Mr Lalith Peiris
2012- Mrs R A M N Jayatissa
Mrs R B Kariyawasam
Mr Arjuna Edirisingha
Mrs Nandanie Jayasingha
Mr &Mrs Pathiravitana
Miss Manohari Dharmadasa
Mr Gemunu Wijesundara

Those who contributed for the gifts

Ven: Thalpathwewa Saddatissa Thero
Mrs K Weerakkody
Mrs Thamara Aramadura
Mrs Gunaseeli Jayasoma
Mrs Kusum Hewapathirana

Mrs S Colombage
Mrs Priyanga Handunhewa
Mr & Mrs Mahindarathana
Miss Madusha & Asha
Mr Shan



APPRECIATION

People who worked
Under the prevailing Regime
Say "Good Bye"
To the place of work
When they grow older
With the intention of
Living with peace and harmony
Relaxing ……..
In their adolescence.

But ---------------the "LADY" whom I know
For decades -------------------- quite contrast

Instead of relaxing being calm & quiet
On her retirement,
……..Takes the best use
of this span of life
Fulfilling a great service
To the entire masses

The immeasurable capabilities she posseses
The knowledge she crowned...........

Gives her a pride of place
And ……..
Shows by **own example** the way to pay honour
respect and gratitude
Towards the parents
who guide us and mould us

And ………
The helping hand given to
The differently able and poverty stricken
Under graduates
When they came from
Everywhere in the country……..

It's a marvellous Job done by her

Through

PARENTS MEMORIAL SCHOLARSHIP FOUNDATION

Your dedication is so expeditious.
Your guidance is so great.
Your extreme assistance is unbeatable

This goes with endeavor and endurance
For the upliftment of those who need.

No words to explain
The responsibilities and duties
Specially you render….
Donating what they need.

These would be blessings.
For you to reach " Nibbana"
To compete " Sansara ", Avoiding
All the barricades of life
Realizing , **" Four Noble Truth"**
Due to your "Merits"
You gain and earn…

Wish you a healthy long life

To fulfill your hopes and expectations

With the blessings of the Noble Triple Gem !!!

Mrs R A M N Jayatissa (Sponsor)
Rtd: English Teacher

පරෝපකාරය වෙනුවෙන් ------- මෙත් සිතින් ප්‍රාර්ථනා

සිසු දරු දැරියනට දිරියක් ගෙන   දෙමිනී
අසරණ මව් පියන් හට සවියක්   වෙමිනී
දාහතරක් වසර තුළ නිති   වෙහෙසෙමිනී
ඔබ කළ මෙහෙය අගයන්නෙමි හැකි   ලෙසිනී

නිරතුරු සිනහවක් මුවඟට නඟා   ගෙන
කාගෙත් සිත් සතුටු කරවන රස   බසින
දරු දැරියනගෙ සිහිනය හද දරා   ගෙන
ඔබගේ වෙහෙස අද ඇත ඵල දරා   ගෙන

යුතුකම ලෙසින් මවකගේ තම දරු   වෙතට
යහ මඟ පෙන්වමින් සොඳ හෙට   දවසකට
මේ දරු දැරියනගෙ දිවි නිසි   පිළිවෙලට
සකසන අයුරු දැක පිරුණා කඳුළු   කැට

නෙක කම් කටොළු විඳ සරසවි වරම්   ගෙන
බාධක මැඩලමින් ජීවිත ගමන   යන
පිරෙනා කඳුළු පිස ගත සිත   සනසවන
මව්තුම් ඔබයි මේ දරු වෙත   සවියවන

ඔබෙ සිහිනයයි මේ දරුවන්   සැනසීම
දිරි දී ඔවුන් හොඳ මිනිසුන්   කරවීම
සිරිලක් පොළව මත ගුණ දම්   වැපිරීම
දරුවනි, එයයි හෙට ඔබ සතු   වගකීම

හෙට දිනේ මේ පුතුන් නව ලොවක්   තනාවී
ඒ දිනේ ඔබේ ගුණ ඔවුන් හද   තියේවී
ඔබ දෙසූ දහම් පද දිවි පුරා   රකීවී
සියළු දෙවි රැකවරණ ඔබ වෙතට   ලැබේවී !

සිසුනගෙ දිරිය නිසි ලෙස ඇගයුමට   අරන්
සවියක් වෙමින් සරසවි මඟ කිරුළු   දරන්
ගුණවත් දරු කැලක් සිරිලක් මවට   මවන්
ඔබ නිති දිනේවා ! .. තෙරුවන පිහිට   අරන්

පබැඳුම - අනුග්‍රාහක මල්ලිකා ගලගෙදර මැතිනිය වෙනුවෙන්.. ..
සිය මෑණියන් වූ සුපින්වත් සුමනා වීරසේකර මාතාව විසිනි.

BIRDS OF FEATHER FLOCK TOGETHER

ආදි ආදී කරපු පව්කම් නැවත නැවතත් සිදු නොවන්නට
සැදී පැහැදී කරන්නට පින් තවත් අපහට උදාවන්නට
ජාති ජාතිත් අධම දුර්ජන පිරිස අප වෙත ළං නොවන්නට
සාධු !!! සාධු පතමු ගෞතම සසුනෙදි ම අප එතෙර වන්නට

දනන් අසරණ සොයා ගනිමින් පිහිට වන්නේ කැප වෙමින්
ගණන් නොගෙනම දිරිය ගත්නෙමු සියළු බාධක මැඩළමින්
සවන් යොමුකර දුගී සැමටම පිහිට වන්නට එක ලෙසින්
වදන් ගලපා යොමු කළේ අප උතුම් සඟ රුවනය නිතින්

පෙරත් පුරමින් පාරමී දම් ලෙසින් අප හා එක් වුනාදෝ
අදත් අසරණ සිසුන් වෙනුවෙන් දෑත් දිගු කරමින් නොවේදෝ
හදක් වැළපෙන විටදී පිං බර ඔබට එහි රිද්මය දැනේදෝ
ඇතත් මුදලක් දීම සඳහා හිතක් නැති අය කොහේ යයිදෝ

කෙනෙකු බෑ බෑ කියයි නම් බැරි, බවම ඔහු පසු ලුහු බඳින්නේ
අයෙකු නෑ නෑ කියයි නම් නැති, බව ම ඔහු පසු හඹා එන්නේ
යමෙකු කරනා පිනක් වත් දැක හදවතින්වත් සතුටු වන්නේ
නොමැති දන අද කොහේ යන්නද අන්ධ බාලව අර අඳින්නේ

තවත් සමහරු අනුන් කරනා දෙයක් දැක ගුණ මකාලනවා
කලක් කළ සේවය ද වැඩියැ යි ගුණය පහතට හෙළාලනවා
නොවක් පැසසුම් හලා එනවිට නුරුස්නා අය දැවී යනවා
පසක් නොකළ ද මුවඟ කැඩපත හදේ ඡායා විහිදුවනවා

ලකුණ්ඨක හද්දිය කථාවෙන් අදහසක්වත් හිතට අරගෙන
අහිංසක සිසුවනට කරනා සේවයක් බව සිත දරාගෙන
වදන් මුවඟට ගලා ආ මුත් දෙතොල් මත දී නෙත් අයාගෙන
රුවන් ලෙස දක්නා අයත් ඇත සාධු හඬදී පින් ලබාගෙන

භවත් ගෞතම බුදු පියාගේ පිළිවෙතයි මේ පුද ලබන්නේ
නමක් ගන්නට නොවේ යායුතු මාවතෙයි මේ පා නඟන්නේ
ටිකක් වත් පින් පෙරදී ලද අය මෙකී මාවතටම ඇදෙන්නේ
තවත් කොපමණ එක් වූවත් අප ඉහළටයි මේ පියාඹන්නේ

අනුග්‍රාහක බී නවරත්න
විශ්‍රාමික අධ්‍යක්ෂ (අධ්‍යාපන)

නිතින් මේ දිය බිඳක් පමණකි ....

කළණ මිතුරන් ලෙසට දකිමින් සංඝ රත්නය සරණ සේවා
නිමල දහමින් ඔබේ හද ගැබ නිරන්තරයෙන් පිරී යේවා
නගන මැසිවිලි දුගී දරුවෝ හදේ රිද්මයට ම දැනේවා
නුවන පියවී යන්ට පෙර සැම, නුවණ යොමුකර පිහිට වේවා !

විසල් මැදුරේ සිටින විට නැත මෙවන් දරුවන් පෙනී යන්නේ
කුසල් කර අද මෙලෙස සම්පත් ලැබුව මුත් නැත අරන් යන්නේ
සිසිල් දිය පොද බිඳක් ඉසින ට පිනක් නැතිනම් කිමද වන්නේ
මගක් ඇතිමුත් අන්ධ නම් එහි කවර ලෙසකින් පා නගන්නේ

බොරුව වඝද්වා ක්‍රෝධ සිතුවිලිවලින් පිරිපුන් දනන් මැද්දේ
අරුමයක් නැත හෙළා ලන්නට දරන තැත නම් නැතුව සද්දේ
සරුව ඇති එල දරණ ගහටයි ගලින් ගල නිති එවන ලද්දේ
තරුව පහළට හෙළනු රිසියෙන් බාලයින් පහතට යි ඇද්දේ

කුමක් වුව සත්පුරුෂ ඇත්තෝ දිවා රෑ නෙත් දෙක අයාගෙන
මගක් සොයමින් ඉදියි දක්නට සිටින දරුවන් දුක බදාගෙන
හදක් සසලව ඉකි බිඳින විට මවක් මෙන් දුක හිත දරාගෙන
දිනක් වසරක් නොවේ සැමකල් අතක් දෙයි නිවනම පතාගෙන

යමක් ඇති අය අත් හරින්නේ හදක් පුරවාලන සිතින්
රටක් ජය ටැඹ කරා ගෙනයන පරපුරට ඒ සවි නිතින්
සැකක් නොමැතිව යමක් කීමට බියක් නැත පිරිසිදු සිතින්
තිහක් හයසිය දරුවො අද ජය ලබති මේ සේවය මතින්

පුරා වසරක් දෙකක් නොව දාහතර ගතවිය සන්තොසින්
දරා අපමණ වෙහෙසකින් ඉටු කළේ සේවය සම ලෙසින්
ලබා ගන්නට නොවේ නිලතල කීර්තිය බැබළෙන සිතින්
ජරාවට පත් වෙමින් අවසන නොයන්නට මය හිස් අතින්

මවා පෑමක් නොවේ සේවය දිගින් දිගටම බැබළුණාවේ
බලා මේ දෙස ඇතැම් උදවිය මවිතයට වූව පත්වුණාවේ
හලා සන්තක යෙන් යමක් අද තිබේ නම් නොව මංමුළා වේ
සලා පත් සැන සෙමින් ඒ අය ඉහළටම ඉගිලී ගියාවේ

බුදුන් දෙසූ බණ සෑම කල්හිම එකම ලෙස රැව්පිළිදිදී
දුකින් එතෙරට යන්න මඟ ඇත යා යුතුය තනි තනිව පැහැදී
යොදුන් ගණනින් සසර ගමනේ කෙළවරක් නම් නොමැත ලැබදී
නිතින් මේ දිය බිඳක් පමණකි සසර සයුරකි තිබෙන නොසිඳී

සියලු දානයන් දිනන උතුම් ධර්ම දානය

අප තථාගත බුදුරජාණන් වහන්සේ දේශනාකර වදාළ පරිදි අට මහා කුසල් වලින් එකක්වන ධර්ම ග්‍රන්ථ සම්පාදනය මහත් ඵල මහානිංශංස ලැබෙන්නාවූ කුසල කර්මයකි. තාක්‍ෂණ දියුණුව රටක සංවර්ධනයට විවිධ අංශයන්ගෙන් මාහැඟි දායකත්වයක් සපයන නමුත් අධ්‍යාත්මික වශයෙන් මිනිසා පරිහානියට ඇද දැමීමට එය ම සමත්වන බව නොරහසකි. පුද්ගලයෙකුගේ දෛනික සදාචාර පැවැත්ම සඳහා ඉවහල්වන සාරධර්ම පවා සීඝ්‍ර සෝදා පාළුවකට ලක්වී ඇති මොහොතක එය රැකගැනීමට දරන්නා වූ වෙහෙස උඩුගම්බලා පිහිනීමකි. එහෙත් ප්‍රඥාවන්ත ජනසමාජයේ ක්‍ෂණික අවධානය ඒ සඳහා යොමුවිය යුතුම අවධියක සිටින අප මහා සංඝ රත්නය ඒ සඳහා ලබා දෙන්නා වූ මාර්ගෝපදේශකත්වය අති විශිෂ්ඨය.

අවම වශයෙන් ශ්‍රී ලංකාව පුරා විහිදී සිටින දරිද්‍රතාවෙන් පීඩිත එහෙත් ඉගෙනීමෙහි දක්‍ෂ දරු පිරිසක් වාර්ෂිකව තෝරා මෙම සමාජ ව්‍යසනයෙන් එම අතළොස්සක් පමණ වූ දරු පිරිසවත් බේරාගැනීමට අප විසින් දරන්නා වූ වෑයම යම් පමණකට හෝ මල්ඵල දරා තිබීම මහත් භාග්‍යයකි.

ජීවිතය තුළ ලබන්නා වූ විවිධාකාර අත්දැකීම් තේමා කරගනිමින් රචනා කෙරෙන නවකථා, කෙටිකථා කියවීමේදී එම චරිතාංගය උකහාගන්නා පාඨකයා තුළ ද, සමාජයේ අධම චරිත වලට පවා පණදෙන ටෙලි නාට්‍ය නරඹන ප්‍රේක්‍ෂකයා තුළද, දැල්වී යන්නේ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයට පවා මහත් බලපෑමක් ඇති කරන ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය, පළිගැනීම සහ විකෘති කාමාශාවන් වැනි දෛනික ජීවිත දෙදරායන දරුණු සිතුවිලි විනා සුපසන් වාතාවරණයක් ගොඩනැගීමට හේතුවන ආදරය, දයාව, කරුණාව, මෛත්‍රිය වැනි සදාචාරාත්මක හැඟුම් නොවන්නේම ය.

තරුණ දූ පුතුන්ගේ හදවත් තුළ පිබිදී එන නිර්මාණ කෞශල්‍යයන් හා චින්තනයන් ධනාත්මක සුභවාදී අරමුණු කරා යොමු කරවීම, කාලීන අවශ්‍යතාවක් බව පෙන්වාදෙමින් ලේඛන කුසලතාවන් දහම් මඟට යොමු කරවීමට සංඝ රත්නය දරන්නා වූ වෑයම අගය කළ යුතුය ම. ඒ සඳහා ආදර්ශයෙන් මඟ පෙන්වමින් ලබාදෙන්නා වූ කාලීන අනුශාසකත්වය මත, ශිෂ්‍යත්වලාභී දරුවන් වෙත තිළිණ කිරීමේ මූලික අරමුණෙන් රචිත සදහම් ග්‍රන්ථ පෙළකි.

දෛනික ජීවිතයට මහත් සේ ඉවහල්වන සෞභාග්‍යය උදාකරවන **තෙරුවන් සරණ යාම, මා පිය නැමදීම**, දෙමාපිය වැඩිහිටි සීලාදී උතුමන්ට ගරු සැලකිලි දැක්වීම ආදී ඉතා පහසුවෙන් තම ජීවිතය තුළ ප්‍රගුණ කරගත හැකි ආකල්පමය සංවර්ධනයක් සඳහා හේතුවන **"මා පිය ගුණ සමර"**, **"සාධු දැක්ම - The Excellent View "දරිද්‍රතාව හඹායයි"**, **"සුවදායක මාවතක් - A Blissful Path"**, **ප්‍රීතිමත් ජීවිතයකට මඟ"** නම් වූ මෙම ග්‍රන්ථයන්හි අන්තර්ගත ශ්‍රේෂ්ඨ ගාථාරත්නයන් පාලි, සිංහල සහ ඉංග්‍රීසි භාෂා අනුසාරයෙන් ඉදිරිපත්කර තිබීම ඉංග්‍රීසි භාෂාව ද ඉගෙනීමට රුචිකත්වයක් දරණ තරුණ දරුවන්ගේ මහත් ඇගයීමට ලක්ව ඇත.

මෙම සියළුම ග්‍රන්ථ සිසු දරුවන් වෙත තිළිණ කිරීමට පෙර, ප්‍රථම පිටපත අප තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ උතුම් බුදු පදවිය ලැබූවා වූ දඹදිව් තලයේ දී බුදු අමා මෑණියන් වහන්සේ වෙත බැතිබරව පිදෙයි. අනතුරුව මහා සංඝ රත්නය වෙත ද ගෞරවාභිමානයෙන් යුතුව පිදෙන මෙම ග්‍රන්ථ, ශ්‍රී ලංකාවේ මූලික පුරවැසියන් වෙත ද පිළිගැන්වීමෙන් පසු ශිෂ්‍යත්වලාභී දරුවන් වෙත තිළිණ කරනු ලබයි.

සබ්බ දානං ධම්ම දානං ජිනාති - සබ්බ රසං ධම්ම රසො ජිනාති
සබ්බ රතිං ධම්ම රතී ජිනාති - තණ්හක්ඛයෝ සබ්බ දුක්ඛං ජිනාති

The gift of Dhamma excels all other gifts. The fiavours of Dhamma excels all other flavours.. The pleasure of Dhamma excels all other pleasures. Extinction of craving conquers all pain.

ධර්ම දානය සියළු දානය දිනයි.
ධර්ම රසය සියළු රසය දිනයි.
ධර්ම ප්‍රීතිය සියළු ප්‍රීතිය දිනයි.
රහත් ඵලය සියළු දුක් නිවයි,
(ධම්ම පදය තණ්හා වග්ග)

සම්පාදිත ග්‍රන්ථ ජම්බුද්වීපයේදී උතුම් පුදසුනට.. .. ..

ශිෂ්‍යත්වලාභීන් වෙත තිළිණ කිරීම සඳහා රචනා කෙරෙන සදහම් ග්‍රන්ථ

"සාධු දැක්ම - The Excellent View" නැමති ග්‍රන්ථය දඹදිව කුසිනාරාවේ පිරිනිවන් මඤ්චකයේ දී බුදුරජාණන්වහන්සේට බැතිබරව පිදූ පින්බර මොහොත



දරිද්‍රතාව හඹායයි නමැති ග්‍රන්ථය දඹදිව ඉසිපතන මිගදායේ දී බුදුරජාණන්වහන්සේට බැතිබරව පිදූ පින්බර මොහොත ..

දරිද්‍රතාව හඹායයි නමැති ග්‍රන්ථය මහරගම තරුණ සේවා ශ්‍රවණාගාරයේ දී මහා සංඝ රත්නය වෙත පිදූ පින්බර මොහොත ... ..

සම්පාදිත ග්‍රන්ථ මව් බිමේ ජ්‍යෙෂ්ඨ පුරවැසියනට .. .. ..



සුවදායක මාවතක් - A Blissful Path නමැති ග්‍රන්ථය ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය දි.මු. ජයරත්න මැතිතුමා වෙත පිළිගැන්වුණ මොහොත.. ..

ග්‍රන්ථ එළිදැක්වීම සහ ශිෂ්‍යත්ව ලාභීන්හට තිළිණ කිරීම.

ජාති ආගම් ආදී කිසිදු භේදයකින් තොරව තෝරාගනු ලබන සරසවි වරම් ලද ශිෂ්‍යත්වලාභී දරු දැරියන් වෙත සාරධර්ම සම්පිණ්ඩිත ග්‍රන්ථ ප්‍රදානය කරනු ලැබූ මොහොත..

සරසවි වරම් ලද ශිෂ්‍යත්වලාභී දරු දැරියන් .. .. තිළිණ ලද සාර ගර්භ ග්‍රන්ථ දෙස සභණික අවධානය යොමු කරමින් ..



තිළිණ ග්‍රන්ථයන්හි නිසි ඵල ලබමින් අප්‍රමාදීව, වඩාත්ම යහපත් සේ ප්‍රතිචාර දැක්වූ ශිෂ්‍යත්වලාභීන් වෙත ප්‍රදානය කෙරෙන විශේෂ මුදල් තිළිණය, ශිෂ්‍යත්ව පදනම් කාර්යාලය තුළ දී අධ්‍යක්ෂතුමිය අතින් ලබාගන්නා ජයග්‍රාහී සරසවි සිසුවෙක්..

Glimps of Awarding Ceremonies

ස්වකීය වාරය පැමිණෙන තුරු ශිෂ්‍යත්ව පදනම් පරිශ්‍රය තුළ සන්සුන් ව අසුන් ගෙන සිටින ශිෂ්‍යත්වලාභී දරුවෝ.. .. ..

පහත මාලයේ සිට විද්‍යුත් තිරයෙන් ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය නරඹන ශිෂ්‍යත්වලාභී දරුවන්ගේ දෙමාපියන් .. ..

දිවා ආහාරයට අමතරව ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය අතරතුරදී පැවැත්වෙන සැදෑ භෝජන සංග්‍රහය භුක්ති විඳිමින්.. ...

අදාළ සහතික, සාරධර්ම සම්පිණ්ඩිත මුද්‍රිත ග්‍රන්ථ, ලිපිද්‍රව්‍ය සහ මුදල් තිළිණ ලබාග ැනීමෙන් අනතුරුව ශිෂ්‍යත්වලාභී සරසවි සිසුවෙකු සභාව අමතයි.

යාවජීව අනුග්‍රාහක සුපින්වත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු නිමල් දිසානායක මැතිතුමා විශේෂ ආරාධිත දේශනය පවත්වමින්.. ..

සුපින්වත් යාව ජීව අනුග්‍රාහක විශ්‍රාමික කෘෂිකර්ම උපදේශක රාජකරුණා දොළුවීර මැතිතුමා සුපසන් හදින් යුතුව උත්සව සභාව අමතමින්

සරසවි වරම් ලද, උපතින්ම කායික අශක්නුතාවෙන් යුත් ශිෂ්‍යත්වලාභී දරුවෙකුගේ දයාබර පියෙක්.. .. තම චිත්ත සන්තානයේ උපන් අනුවේදනීය සිතිවිලි පුණ්‍යානුමෝදනා පෙරදැරිව වදනින් එළි දක්වමින් අනුග්‍රාහක භවතුන්ගේ නෙතට සතුටු කඳුලක් එක් කළ මොහොතක් .. ..

දීප ව්‍යාප්ත මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමේ වාර්ෂික ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය සඳහා සංඝගත දක්ෂිණාවකින් පසු වෙන්කර තැබෙන, පෞද්ගලික නිවසේ උඩුමහල් අලින්දය

උත්තුංග මෙහෙවර සත්පුරුෂ ඇසින්

පුණ්‍යානුමෝදනාවයි !

සමාජය පුරා ගින්නක් සේ පැතිරී යන දිළිඳුකම පිටු දැකීමේ අරමුණින් ඔබතුමිය විසින් ආරම්භ කරන ලද උතුම් සත්පුරුෂ වැඩ සටහනෙහි විස්තර ඇතුළත් ''දරිද්‍රතාව භඹායයි'' නමැති කෘතිය අප ප්‍රදේශයේ පදිංචි ඒ.එච්. වසන්ත [redacted] ([redacted], [redacted], ඌව පැල්වත්ත) පුතණුවන් අතින් අප විහාරස්ථානයට ඔබතුමියගේ නමින් පරිත්‍යාග කෙරිණි. මම එය එක හුස්මට කියවා හමාර කොට මේ ලිපිය ලියන්නට පටන් ගතිමි.

පින්වත් මහත්මියනි, දේශයේ අසරණ දූ පුතුන් වෙනුවෙන් ඔබතුමිය මේ කරන ලද සේවාවන් පිළිබඳව යළි යළිත් වර්ණනා කළ යුතු නැතැයි මම සිතමි. මේ කරගෙන යනු ලබන වැඩ පිළිවෙල බෝධි සත්ව ප්‍රතිපදාවක් ම බව පමණක් ප්‍රකාශ කරනු කැමැත්තෙමි. ඔබතුමිය වැනි සත් පුරුෂයින්ගේ කටයුතු ගැන පුරාතන භාරතීය පඬිවරුන් පවසා ඇත්තේ මෙසේය.

පරෝපකාරාය ඵලන්ති වෘක්ෂං　-　පරෝපකාරාය වහන්ති නද්‍යං
පරෝපකාරාය දුහන්ති ගාවං　-　පරෝපකාරාර්ථ මිදං ශරීරං ... ...　යනුවෙනි.

පරෝපකාරය පිණිසම වෘක්ෂයෝ ඵල දරන්නාහ. පරෝපකාරය පිණිසම ගංගාවෝ ගලා බසින්නාහ. එපමණක්ද නොව දෙනුන්ට කිරි එරෙන්නේද පරෝපකාරය සඳහාය. සත්පුරුෂයන්ගේ ශරීරය ද පවතින්නේ පරෝපකාරය සඳහාමය.

පින්වත් මහත්මියනි, ඔබ වැනි අය ලොව උපදින්නේත්, ඔබ වැන්නන්ට ආයුරාරෝග්‍ය ශ්‍රී සම්පත් සැලසෙන්නේත් පරෝපකාරය පිණිසම ය. කුකුරම්පොළ වැනි ඈත පිටිසර ගම්මානවල වසන්ත [redacted] වැනි දුප්පත් අසරණ දරුවන්ගේ පිනටම ය.

පින්වත් මහත්මියනි, ඉදිරියේ යම් දවසක ඔබතුමිය හමුවී වචන කිහිපයක් කථා බහ කිරීමට මම බලාපොරොත්තුවෙන් සිටිමි. පින් කරන්නන් දැක බලා සතුටු වීමෙන් අපටද පත්තිදානමය පුණ්‍ය කර්මය සාක්ෂාත්වන හෙයිනි.

එක්තරා ස්වාමින් වහන්සේ නමක් විසින් රචිත, විශාරද ගුණදාස කපුගේ මහතා විසින් ගැයෙන පහත සඳහන් ගී ඛණ්ඩයෙන් මේ ලිපිය අවසන් කරමි.

දුගී දෑතට අත් වැලක් වී　-　දිරිය සවි බල නොහැගුවේ නම්
ඔබේ නාමෙන් කුමට සත්සර　-　රාව නංවා හිඳිමි ගොළු වී මම්

පින්වත් මහත්මියනි, ඔබතුමියගේ දරුවනුත්, ඔබතුමියට අනුග්‍රහ දක්වන අයත්, ඔබට උදව් උපකාර කරන අයත් නිදුක් ව නිරෝගීව බොහෝකල් වෙසේවා ! යි මෙත් සිතින් ප්‍රාර්ථනා කරමි. තෙරුවන් සරණයි !!!

විහාරාධිපති, ගෝනදෙණියේ විමලජෝති හිමි
කකුළුවා විහාරය,
කුකුරම්පොළ,
ඌව පැල්වත්ත.

උපහාර පුෂ්ප

1. සරසවි මග ලැබීමට ඉහළම බූ ර
වැර සවි වඩනු හැම වසරක් අත නැ ර
මුරදෙවි ගුණතිලක ගුරුමව වෙත දූ ර
කර කවි පබැඳුමක් පුදදෙමි උපහා ර

2. පසුකල ගුරු සේවයෙන් ලත් අත්දැක ම
මුසුකළ නිසා මෙත් කරුණා ගුණයට ම
සිසුනට මවක් වී ලබනට නැණ දිනු ම
උසුලන මහබරට නයගැති වෙයි රට ම

3. වෙද ඉව්සේරු නීතිය වැනි ඉහළ තැනි නි
කෙද ලන පිරිස් බොහොමයි කළ උදව්මනි නි
අද ඒ සැමෙම කළ ගුණ සමරමින් සිත් නි
පුද දෙනු මෙනේ බව පමුළ මැව් බැති නි

4. විදි ලෙස ඉහළ තෝරාගත් දරු කැළ ට
අවිටන යුරු දෙමින් අධාරය දීග ට
බදිමින් සියළු හදවත් බැස යන මග ට
ඉදිරියටත් ලැබේවා! ශක්තිය හොඳ ට

5. උරුමය රටේ හඳුනාගෙන නිසි ලෙස ක
ගරුමය මෙහෙය සමරා ගණනක දස ක
ගරු මව් තුමිය වෙත සීතා ගුණතිල ක
තෙරුවන දෙවි පිහිට පතමෙමි හැම විට ක.

මෙයට, රුහුණු කවි කලා ප්‍රසාදිනී වලියපුල්ලේ ආර්. පියසේනා ගුණතිලක.

ආර්. පියසේනා ගුණතිලක

අසරණ දරුවන්ගේ නැණැස පෑදීමේ පුණ්‍ය කර්මයට දායක වීමේ ආනිසංස

මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම 14 වසරක සිය අනභිභවනීය සමාජ මෙහෙවර සැමරීම සඳහා පළකරනු ලබන සඟරාවට ශිෂ්‍යත්ව දායකයින් වෙනුවෙන් ලිපියක් ඉදිරිපත් කිරීමට අවකාශය සලසා දෙන ලද එම පදනමේ ගරු සභාපතිතුමිය සහ කාර්ය මණ්ඩලයට ප්‍රථමයෙන්ම ස්තූතිය පුදකරමි.

ඉගෙනීමට සහජ හැකියාව ඇතත් ඒ සඳහා වූ අවකාශය අහේතුවක් කරනකොට ගෙන ඇහිරී යන දරුවන් බොහෝ සිටිත්, දරිද්‍රතාව ඉගෙනීමට බාධක වන ප්‍රධාන හේතුවක් ලෙස ගිණිය හැකි අතර, එවැනි දරුවන්ගේ නැණැස පෑදීමට උපකාරී වීම අරමුණු කොටගත් මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම පරිත්‍යාග ශීලීන් රැසක් සංවිධානය කොට දරුවන්ට උපකාරී වීම ඉතා උසස් පුණ්‍ය කර්මයක් බව සිහිපත් කළ යුතුය.

බොහෝ දෙනා තුළ අනුනට උපකාරීවීමේ පරාර්ථකාමී චේතනාව ඇතත් වර්තමාන කාර්යය බහුල ජීවන රටාව හේතු කොට ගෙන අනුනට උපකාර කිරීමේ අවස්ථා සොයා යෑම අපහසු වේ. ධනය උපයනුයේ කාර්යය බහුල අයයි. එහෙත් එම කාර්ය බහුලතාව ම පුණ්‍ය කටයුතුවල නිරතවීමේ අවස්ථාව වළක්වන ස්වභාවයක් ඇත. පරිත්‍යාගශීලී හදවත් ඇති උතුම් පුද්ගලයින්ට විශ්වාසනීය ලෙස තම පරිත්‍යාග අසරණ දරුවන්ගේ නැණැස පෑදීම සඳහා ම යොමු කරන ආයතනයක් හමු වූ විට ඔවුන් නොමසුරුව දායක වීමට ඉදිරිපත් වේ. **මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම** එවැනි පිංවතුන්ට පූර්ණ විශ්වාසය සහිතව දායක විය හැකි තෝතැන්නකි. ඒ පිළිබඳව එම සංවිධානයේ ගරු සභාපතිතුමියට සහ කාර්ය මණ්ඩලයට හදපත්ලෙන්ම ස්තූතිවන්ත වෙමි. පරිත්‍යාගශීලී අදහස් දරණ පිංවතුනට ඒ සඳහා වන අවස්ථාව සලසා දීමෙන් අප්‍රමාණ වූ කුසල් සම්භාරයකට දෙපාර්ශවයම යොමුවන බව අවශ්‍යයෙන්ම මෙහිලා සඳහන් කළ යුතුය.

මෙලොව වසන බහුතරයක් තුළ තෘෂ්ණාව තදබල ලෙස පවතී. එනිසා දුකින් බර දීර්ඝ වූ සංසාර ගමනක යෙදීමට අපට සිදු වී ඇත. නිවන් මාර්ගයට සෘජුවම අවතීර්ණ වී සිටිනුයේ ඉතාමත් සුළු පිරිසකි. බොහෝ අය තුළ නිවන සාක්ෂාත් කරගැනීමේ අදහස ජනිතව ඇතත් නිවන් මාර්ගයේ ගමන් කිරීමට ඔවුනට අවකාශ නැත. එනිසා සසර උපදිනතාක් කල් දුගතිවල නොවැටී, ආලෝකයෙන් අලෝකයට යන්නා වූ ධර්මානුකූල ජීවිත ගත කිරීමට අවශ්‍ය ඥාන ශක්තිය ලැබේවා!යි ප්‍රාර්ථනා කොට අසරණ දරුවන්ගේ නැණැස පෑදීමට ඉදිරිපත්වන සෑම දෙනාටම මෙම ලැබී ඇති අවස්ථාව දුර්ලභවූත්, සසරට වාසනාවන්තවූත් අවස්ථාවක් බව මෙහි ලා සඳහන් කරමි. ශිෂ්‍යාධාර වැඩ සටහන හරහා දරුවන්ගේ භෞතික විද්‍යා ඥානය පමණක් නොව ඔවුන්ගේ අධ්‍යාත්මය ගොඩ නැංවීමේ වැඩ සටහනක් ද මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම මගින් ක්‍රියාත්මක කරන බැවින් එම මාහැඟි පුණ්‍යකර්මයේ ආනිශංස එයට දායක වන සියළු දෙනාටම නොමදව ලැබෙනු ඇත.

ඉගෙනීමට හැකියාව ඇති මෙම දරුවන්ට ඉගෙනීමේ අවස්ථාව අහිමි වුවහොත් ඔවුන්ගේ අනාගතය අසාර්ථ වීමට බොහෝ සෙයින් ඉඩ ඇති අතර, තමාට ලැබිය යුතු අවස්ථාව දරිද්‍රතාව හේතු කොට ගෙන අහිමි වී යෑම පිළිබඳව ඔවුන් ජීවිත කාලය පුරාම පශ්චාත්තාප වනු ඇත. සමහරවිට එය සමාජ වෛරයක් දක්වා වර්ධනය වීමට ඉඩ ඇත. එබැවින් දරිද්‍රතාවෙන් පෙළෙන දරුවන්ට ඉගෙනීමට අත දීම විශාල සමාජ සේවයක් වන අතර එම දරුවා පුරවැසියෙකු වශයෙන් රට දැයට ඉටු කරන සෑම මෙහෙවරක් පාසාම පරිත්‍යාගශීලීන්ට සතුටු විය හැකිවනු ඇත.

බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මය අනුව මේ ලෝකයේ අපට දරුවෙක්, පියෙක්, මවක්, ඥාතියෙකු නොවූ ජීවියෙක් සොයා ගැනීම අපහසුය. එසේ නම් අපි උදව් කරන්නේ පෙර භවයකදී අපටම දරුවන් වූ අයට බව දාරක ප්‍රේමයෙන් සිහිපත් කළ යුතුය. මෙම භවයේ සිටින තමාගේම දරුවන්ට මෙන් මෙම දුප්පත් දරුවන්ට ද උදව් කිරීමේ හදවතක් යමෙකුට ගොඩ නැඟිය හැකි නම් ඒ තැනැත්තා ඒකාන්තයෙන්ම නිවන් මඟට පිවිස ඇති බව තහවුරු කළ හැකිය. ජීවිතයේ සැඳෑ සමයට එළඹෙන බොහෝ දෙනාගේ ලෞකික ආශාවන් තුනීවේ. එවැනි අවස්ථාවට එළඹෙන අපට සතුටු විය හැක්කේ ජීවත් වූ කාලය තුළ අප විසින් ඉටු කරන ලද යහපත් සමාජ සේවාවන්, පරාර්ථකාමී සංග්‍රහ, ඉටුකළ යුතුකම් ආදිය මෙනෙහි කරමින්ය. එවැනි මහළු අවධියකදී අසරණ දරුවන්ගේ අධ්‍යාපනයට අතදී දීප්තිමත් අනාගතයක් උදාකරදීමේ සත්කාර්යය නිරතුරුව අප ප්‍රීති ප්‍රමෝදයට පත්කරන මහඟු පුණ්‍ය කර්මයක් වන බව නිසැකය. එවැනි අයගේ මතු භවය ස්ථිර වශයෙන්ම යහපත් වනු ඇත. ඔබ සැමට තෙරුවන් සරණයි.

අනුග්‍රාහක රාජකරුණා දොළුවීර
(විශ්‍රාමලත් කෘෂිකර්ම - උපදේශක)

චිරං ජයතු !

වෛද්‍යවරියක ලෙස කටයුතු කරමින් සුවහසක් රෝගීන් හට සහනයක් වෙමින් රටට දැයට සේවයක් කිරීමේ තිර අදිටන මා තුළ පැවතියේ පාසල් වියේ පටන්මයි. එම සිහිනය යථාර්ථයක් බවට පත්කර ගැනීමට හැකිවීම පිළිබඳව මා තුළ ඇත්තේ නිහතමානී ආඩම්බරයකි; ආත්ම තෘප්තියකි. එම සිහිනය සැබෑවක් කරගනු වස් පාසලෙන් මව් පිය නෑදෑ හිතමිතුරන්ගෙන් පමණක් නොව තවත් බොහෝ සද් ගුණවතුන්ගෙන් පිටිවහලක් ලැබුන බව කිව යුතුමය.මේ ජීවිත ගමනේදී මට බොහෝ සෙයින් අත්වැලක් වූ එබඳු සද් පුරුෂයන් පිළිබඳව ස්තූති පූර්වකව ස්මරණයක යෙදීමෙන් හෝ කෘතඥතාව දක්වන්නට ලැබීම මා විසින් ලද භාග්‍යයක් බැව් පැවසිය යුතුමය.

"නඳන ගුණ සුවඳ යුතු උතුමෝ මහත......
නොගෙන කිසි කරුණු සත සුවපත් කෙරෙත"

කිසිදු ලාභ ප්‍රයෝජනයක් නොලබමින් සත්වයාහට සෙත සලසන උතුමන් පිළිබඳව සුභාෂිත කතුවරයා පැවසුවේ එපරිද්දෙනි. වත්මන් සමාජය තුළින් අල්පයක් වූ එබඳු උතුමන් නිහඬව එවැනි සමාජ සද්කාර්යයන් හි නිමග්නව හිඳින බව බොහෝ දෙනෙකු නොදන්නා, එහෙත් දත යුතු කරුණකි.

සාමාන්‍ය පෙළ විභාගයෙන් සියලුම විෂයයන්ට විශිෂ්ට සමාර්ථ ලබාගැනීම හේතුවෙන් බොහෝ තරඟකාරීත්වයක් මධ්‍යයේ ''**ශ්‍රී ලංකා කැනඩා ශිෂ්‍යත්ව පදනම**'' යටතේ ශිෂ්‍යත්වයක් ලබාගැනීමට තරම් මම භාග්‍යවන්ත වීමි. ආර්ථික අපහසුතා මගහැර ගනිමින් සාර්ථකව අධ්‍යාපනය හැදෑරීමට ඉන් අවකාශ ලද අතරම ජාත්‍යන්තර වශයෙන් වටිනාකමක් යුතු ශිෂ්‍යත්ව ලාභිනියක වීම ම ප්‍රථමයෙන්ම මාගේ මානසිකත්වය ධනාත්මක කිරීමට රුකුලක් විය. හුදෙක් මුදල් ලබාදීමේ ක්‍රමවේදයෙන් අත්මිදී නිරන්තරවම ශිෂ්‍යත්ව ලාභීන්ගේ අධ්‍යාපනය පිළිබඳව. වාර විභාග ලකුණු ආදිය ලිපි මාර්ගයෙන් සොයා බලමින් ක්‍රියාකාරී ලෙස කටයුතු කිරීම නිසා එදා සිසුන් ලෙස අප තුළ පැවතියේ ගෞරවනීය හැඟීම් සමුදායකි.

වර්තමානයේ බොහෝ විට දක්නට ලැබෙන්නේ හුදෙක් ලාභය ප්‍රසිද්ධිය උදෙසා දියත් වන සමාජ ව්‍යාපාරයන් වුවද ''**ශ්‍රී ලංකා කැනඩා ශිෂ්‍යත්ව පදනම**'' අද '' **මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම**'' ඔස්සේ දියත් වූ එම ශිෂ්‍යත්ව ව්‍යාපෘතියේ මුඛ්‍ය ම පරමාර්ථය වූයේ ජාති ආගම් භේද නොසලකමින් දැයේ දරුවන්ගේ නැණැස පුබුදු කරලීමයි. රටේ සමස්ථ දරු පරපුරේම අනාගතය පැහැදිලි මාවතකට ප්‍රවේශ කරලීමයි. ආර්ථික අපහසුතා ඇති දරු දැරියන් තෝරා ගනිමින්, යහපත් ලෙස බාධාවකින් තොරව අධ්‍යාපනය හැදෑරීමට අවශ්‍ය කායික මානසික වටපිටාව ගොඩනගා ගැනීමට මින් ලැබුණේ නොමඳ අත්වැලකි. යෝධ ශක්තියකි. හුදෙක් මූල්‍යමය වටිනාකමටත් වඩා ශිෂ්‍යත්ව ලාභීන් ලෙස අප ගැනම නිහතමානී ආඩම්බරයක් ජනිතව තිබුණි. එහෙයින් පෙරටත් වඩා උනන්දුවෙන් හා උත්සාහයෙන් තවදුරටත් අධ්‍යාපන කාර්යයන්හි නිරත වෙමින් වඩා දීප්තිමත් සිසුවියක් වීමට ඇවැසි මානසික ශක්තිය නිරුත්සාහික ව මාහට ලැබුණි. පොත්පත්, ලිපිද්‍රව්‍ය, අමතර පන්ති ගාස්තු ආදී සියලුම භෞතික අවශ්‍යතා සපුරා ගැනීමට හැකියාව ලැබීම මා හට පමණක් නොව දෙමව්පියන්ට ද නොමඳ අස්වැසිල්ලක් ම වූ බව නොරහසකි.

ශිෂ්‍යත්ව පදනමත් ශිෂ්‍යත්ව ලාභීන් ලෙස අපත් අතර පැවතියේ දැඩි විශ්වාසනීය සබඳතාවකි. පහනින් පහන් සිය ගණනක් දැල්වුවද ඒ පහන් සිලෙහි අලු බිඳකුදු අඩු නොවී පෙරටත් වඩා ප්‍රභාවත් ව දැල්වේ. එපරිද්දෙන් ම මුලදී සාමාන්‍යපෙළ උසස් ලෙස සමතුන්ට ලබා දුන් එම ශිෂ්‍යත්වය වර්තමානයේ සරසවි වරම් ලබන දරුවනට ප්‍රදානය කිරීමට කටයුතු සැලසීම දැයේ දරුවන්ගේ වාසනාවකි. මා පිය ගුණ සිහිකරමින් පසන් චේතනාවෙන් ලබාදෙන එම උතුම් දානයේ කොටස් කරුවෙකු වීම පිළිබඳව මා තුළ ඇත්තේ අපරිමිත සතුටකි. කිසිදු ලාභ අපේක්ෂාවක් නොපතමින් වසර ගණනාවක් මුළුල්ලේ සුවහසක් ලාංකේය සිසු දරු දැරියන්ගේ නැණැස පුබුදුවාලීමට ''**මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම**'' මේ දරනා උත්සාහය චිරාත් කාලයක් පැවතීමට ඇවැසි ශක්තිය ධෛර්ය නොමඳව ලැබේවා ! යි මම ඉතසිතින් ප්‍රාර්ථනා කරමි.

එමෙන්ම එදා පාසල් ශිෂ්‍යාවක, ශිෂ්‍යත්ව ධාරණීයක ලෙස මා මින් ලැබූ ජීවිත පරිත්‍යාගය, සැබෑ ජීවන පන්නරය ම සර්වාකාලීන අත්දැකීමක් ලෙසින් තව තවත් දැයේ දරුවනට ළඟා වේවා ! යි යන්න මගේ පරම පැතුමයි. අද, මා ද බොහෝ සවිමත් බැවින්, බොහෝ නැණවත් බැවින් ඊට බැතිබර දෑතක් දිගු කරන්නට මට ද කාලය පැමිණ ඇත.

ජාතියේ පිනෙන් පහල වූ දයාබර අනේපිඬු සිටුවරුන්ගේ, විශාඛාවන්ගේ මේ මහා නැණ තව තවත් පහන් දැසින් දැන් දකිමි. පෙරුම් දම් පුරන බුද්ධ ශ්‍රාවක මිරිස්සේ ධම්මික ස්වාමීන් වහන්සේගේ පුරෝගාමීත්වයෙන් සිදුවන අපරිමිත මහා මෙහෙවරත් .... දහසක් කම්කටොලු මැද සියලු කටයුතු නොපාරිහෙලා ඉටු කෙරෙන පින්වත් දෑත් හිමි දයාබර සීතා ගුණතිලක මෑණියන්ගේ අමිල මෙහෙවරත් .... වදනින් කියා නිමකළ නොහැකි වුවද මෙසේ සනිටුහන් කරමින්, ඉතසිතින් පතමි;

චිරං ජයතු !

වෛද්‍ය [redacted]
(1999 වසර ශිෂ්‍යත්වධාරිනි)

මහද තැන්පත් වූ නොමියෙන සිහිවටනයක්

2011 - ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය දී 2008

ප්‍රථම වර අපහසුතා නොවන ආත්මදැනීමක් ඔබව දැනගන්නට ලැබීමද, ඔබගේ නිවසට පැමිණීමට ලැබීමද ඉමහත් සතුටට හේතු විය. චාම් නමුත් මහා අලංකාර උත්සවයක් වූ එය එතැනට පැමිණි කාගේත් පැසසුමට ලක් වූ බව නොඅනුමානය.

එම භූමියට පය තැබූ මොහොතේ සිට කුසගින්න නිවූ සත්කාරශීලිය, වතුර බෝතලය ඇතුළු සියළුම පහසුකම් සපයා දෙමින් සියලුම කටයුතු ක්‍රමවත්ව හා සංවිධානාත්මකව සූදානම් කර තිබූ ආකාරය ඔබ ඇතුළු පිරිස මේ කටයුත්ත කෙරෙහි වූ කැපවීම මොනවට කියා පෑවේය.

උත්සවයේ මා හට සංවේදීතම මොහොත වූයේ තම ශිෂ්‍යත්ව ප්‍රදානය කරන මොහොතේ [illegible], [illegible] හා [illegible] අප [illegible] උරුම [illegible] ඒ [illegible] උත්සාහයෙන් ජීවිතය ජයගෙන ඇති ආකාරය දෙනෙතට කඳුළු නැංවීය. සැබෑවින්ම මට එදා ඔවුන් දුක්කාරයා ඇති සිතුණි ය. ඔබ කරනා මේ උතුම් කර්මය ඔවුන්ගේ ජීවිතය ආලෝකමත් කරනු ඇත. එසේම තව තවත් ඉදිරියට යාමට ඔවුනට ශක්තිය හා ධෛර්යයක් වනු ඇත. ඒ අතර මා හටද වදන් ස්වල්පයක් පැවසීමට ඉඩ සැළසීම පිළිබඳ ස්තූතිවන්ත විය යුතුය. ඉතාමත් පිරිසක් මැද නොපැකිලව කථාවක් කිරීමට හැකිවූයේ මාගේ පාසල් කාලයේ ගුරු දෙමාපියන්ගේ මග පෙන්වීම මෙන්ම අද ඔබගේ ආශිර්වාදය නිසාවෙනි.

ගුරු මෑණියනි, ඔබ එදා පැවසූ එක් වැකියක් මාගේ දෙකන් සිදුරු කරගෙන අභ්‍යන්තරයටම ඇතුළුවී කිසිදාක අමතක නොවන ලෙස හදවතේ තැන්පත් වුණි.

"ගෙවී ගිය වසර කිහිපය දෙස හැරී බලන විට මට මහාම සතුටක් දැනෙනවා. ඇත්තෙන්ම මට සිතෙනවා මා ළඟ ඉතුරු, මා දුන් දේ පමණක්ය කියා"

කෙනෙකු තමන් සතු දෙයක් තව කෙනෙකුට දෙන විට තමන්ට තිබූ දෙයින් කොටසක් අඩුවන බව දැනීම සාමාන්‍යය. එහෙත් දීමෙන් තමන් ළඟ දෙයක් එකතු වන බව දකින්නට තරම් උසස් මානසිකත්වයක් ඇති අය තවත් ලොව්ම නම් [illegible] ඇත. එය මාගේ ජීවිතයට මහා මාර්ගෝපදේශනයක් විය.

අවසානයේ ඔබ ලබාදුන් රු. 5000 ක මුදල් තෑග්ග හා ඔබ [illegible] ඇති සියලුම තෑගි භාණ්ඩ වලට හද පිරි ස්තූතිය පිදකර සිටිමි (මේ ලියන පෑන ද කොළ ද ඔබගේම ඒවා වේ) එසේම සුපුරුදු සෙනෙහසින් [illegible] ඔබ ඇමතීමට [illegible] මේ [illegible] ඔබ සැමට [illegible]

වෛද්‍ය ශිෂ්‍යා M/WK/810

බුද්ධියට රජ කිරුළු......

දුප්පත්කම වෙලාගත් බුද්ධියට රජ කිරුළු පැළඳ වූ......
අපේ උත්තරීතර මව්තුමිය ඔබයි.

ගොහොරු මඩ වගුරේ පිපෙන්නට වෙර දරන සුදු නෙළුම් වූ අපව මුකුලිත කළ හිරු කිරණ ඔබය.... අප දිව මඩලට. සිලි සිලි හඬින් පිරිත් පැන් වැස්සෙන් නහවා අපේ සුදු නෙළුම් පෙති සුසිනිඳු කළ පිනි බිංදුව ඔබයි..... අපේ සිත් මඩලට. සුමුදු මඳ පවනින් පවන් සලා මුකුලිත මල් සුගන්දය ලෝ සුපතල කරමින් ලොව සනහාලන සුගන්දයක් කළ දහම් මඳ පවන නුඹයි.... අප හට.

ඉදින් මව්තුමනි.... වදන් වැල් නොමැත මා හට මෙතෙක් යැයි පවසන්න ඔබේ ගුණ වරුණාව. දස මසක් කුසා දරා, ලේ කිරි කර පොවා අපව හැදූ වැඩූ මගේ ආදරණීය අම්මා මතු බුදු වේවා ! යි යන පින්බර සිතින් ඔබටත් දෑත් එකතු කර නමස්කාර කරමි මාගේ හද මහිමයෙන්ම.....................

දනිමි මා ඔබේ සුසුම් .... ඔබේ හද ගැස්ම .... ඔබේ සුවඳ .... ඒ අපව ජීවත් කළ අපට මග හසර පෑදූ අමා සුවඳය. කටු මැටි බිත්ති අතර සිරවී දහසක් සිහින මාලිගා පොදි බැඳන් උත්තරීතර අරමුණක් කරා පිය මං කරන දුප්පත් අහිංසක දෙමාපියන්ගේ අප වන් දරුවන්ගේ ජීවිතයේ අනාගතයට පිය මනින්නට දෑස් පෑදූ දයාබර ගුරුතුමිය ඔබයි..... සත්තකින්ම.

සුවබර කවියකි, ආනන්දනීය ගීතයකි. ඔබේ දැවැන්ත උපකාරයේ මතකය... දිවිය තිබෙන තුරාවට අපේ හද ගැස්මත් සමගින් එය බැඳී රැව් පිළිරැව් දේවි සදහටම.

වසර ගණනාවක් මා හට දයාබර මවක් වූ සීතා ගුණතිලක මැතිනියත්, අපව දහමින් පෝෂණය කළ අතිගරු පූජ්‍ය ධම්මික ස්වාමීන් වහන්සේත්, මා හට මුල්ම ශිෂ්‍යත්ව පුද කළ ලාල් සමරකෝන් මැතිතුමාත් මගේ ගෞරවාන්විත භක්තියට, පූජනීය කෘතඥතා මහිමයට පිරිනැමේවි... මගේ හද පතුලෙන්ම.

පෙර පාසල් වියේ සිටම ප්‍රාර්ථනා කළ වෙද දුරුවෙකු වීමේ උත්තරීතර අරමුණට පණ පෙවූ ඔබ සැමට මා සදා ණය ගැතිය.

පාසල් වියේ සිටම විශ්වවිද්‍යාල භූමියේදීත් මා පසු පස හඹා විත් මට යෝධ ශක්තියක් වූ ඔබට මාගේ ප්‍රණාමය ..... ගෞරවය ...... පුද කරමි. ඔබේ ගුණ සුවඳ තවමත් අපේ සිත් තුළ රැව් පිළිරැව් දෙමින් අපට අනාගතයට මං සලසාවි.

ඉදින් ඒ මහිමයේ ගුණ වරුණාව...... උත්තරීතර සුවය........ වදන් වැල්වලට නගන්නට මා හට වදන් නොමැත. එතරම්ම අපරිමිතය. අප්‍රමාණය. නමුදු ලැබුණ පුංචි ඇසිල්ලක, පාඩම් වැඩ අතරේ, මධ්‍යම රාත්‍රියේ වදන් පෙලක් ගලපමි, මා මෙසේ.... ඒ අනාගතයේ දස දහසක් සිතුවිලි උතුම් ප්‍රාර්ථනා පොදි බැඳගෙන උත්තරීතර අරමුණු කරා පියමං කිරීමට සැරසෙන මගේම ශ්‍රී ලංකා මාතාවගේ අනාගත දරු පරපුරේ ආදරණීය නංගිලාට මල්ලිලාට... පවසන්නට, අපේ මව්තුමියගේ සුවඳ... පතන්නට ඔබටත් ලැබෙන්නට ඒ සෙවන.

අනාගතයේ සදාකාලයටම නොනිමෙන පහනක් වේවා! අපේ ශිෂ්‍යත්ව පදනම, වදනින් තෙපලමි මා ...... සීතා ගුණතිලක මැතිණිය ..... ඔබ මා හැඳින මගේ ස්වරය හැඳුනූ ආදරණීය මවක් විය. මා වෙනුවෙන් වැය කළ ඔබේ උතුම් කාලය, ශ්‍රමය, ධනය, ලබන්නා වූ පුණ්‍ය මහිමය ..... ඔබට දාන පාරමිතාවක්ම වේවා! යි ඉත සිතින් පතමි.

මේ මහා සාගරයේ නැගෙන රළ තරම් ..... මහ පොළොවට ඇදී වැටෙන වැහි බිඳු තරම් ...... පිපෙන මල් තරම් ..... ශිෂ්‍යත්ව පදනම් මව්තුමියනි, ඔබට ශක්තිය, ධෛර්යය, වාසනාව ලැබේවා ! ..... චිරාත් කාලයක් ..... මේ ලෝ තලයේ දිලෙමින් ලෝකයාටම උතුම් වාසනාව ලබාදේවා !

මා නවතමි මේ වදනින් ''අනාගතයේ මා සුවපත් කරනා රෝගීන්ගේ සුවබර සිත් වලින් නැගෙනා වූ සෑම සුවබර සුසුම් පොදකම පුණ්‍ය මහිමය ඔබ සැමටත් ලැබේවා!''

ස්තුතියි.

වෛද්‍ය [redacted] (M/WK/665)

A/DR/935

සියක් වසරකට සරිලන මෙහෙවරක්. ඉකුත් තුදුස් වසරක අනුස්මරණීය මෙහෙවරට තුති පුදමි.

මාවිල අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම තුදුස් වසරක ස්වර්ණමය අතීතයකට හිමිකම් කියන්නේය. තුදුස් වසරක අනුස්මරණීය මෙහෙවර සියක් වසරක මෙහෙවරක් හා සමානයැයි පැවසීම අතිශයෝක්තියක් නොවේ. ලක්දිව දසත විසිරී සිටින ආර්ථික දුෂ්කරතාවලින් පෙළෙන සරසවි සිසුවියකට දිරිදීම මාවිල අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමේ ඒකම අභිලාෂයයි. සරසවි සිසුසිසුවියන්ගේ අනාගත සුබ සිහින සැබෑ කරගැනීමට දෙනු ලබන ඒ දිරිය යුග යුග ගණනාක් නොනැසී පවතින ආශිර්වාදයක් බව කිවයුතුය. මාවිල අනුස්මරණ පදනමේ තුදුස් වසරක අනාගතය මෙහෙවර විදහාදක්වන මෙවන් ලිපියක් ලියන්නට ලැබීම ඒම භාග්‍යයක් බව කිවයුතුය. සරසවි සිසුවකු ලෙසින් මාවිල අනුස්මරණ පදනමෙන් මා ලැබූ ආලෝකය මගේ ජීවිතයට සදාතනිකවම ආලෝකයක් එක්කළ බව කිවයුතුය.

කලා, වාණිජ, විද්‍යා, නීති ආදී කිසිදු විෂය භේදයකින් මෙන්ම ජාති ආගම් භේදයකින්ද තොරව සරසවි සිසු දරු දැරියන් සියකට මෙම පදනමෙන් ශිෂ්‍යත්ව පිරිනමා ඇත්තේය. තෝරාගත් සිසු පිරිසට වසරක් පුරා මූල්‍යාධාර ලබාදෙයි. එසේම මූල්‍යාධාර ලබාදීමෙන් පමණක් සෑහීමට පත්නොවී දරුවන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනය වැඩිදියුණු කරලීමටද දායකවීම විශේෂයෙන් සඳහන් කළයුතුය. මාවිල අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමෙන් ශිෂ්‍යත්ව ආධාර ලබන දරුවා තමන්ගේ යහගුණදම් ද එකලෙස වඩවා ගනු ලබන්නේය. මම එය අත්දැකීමෙන් අවබෝධ කොට ඇත්තෙමි.

මාවිල අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමේ ගරු අධ්‍යක්ෂතුමිය වන සීතා ගුණතිලක නම් යශෝධරාවන් දිරිය මාතාව ඉන්දුකීලය සේ නොසැලී සිටිමින් තම ජීවිතයම මේ පදනම වෙනුවෙන් කැප කරන්නීය. එමෙන්ම මාවිල අනුස්මරණ පදනම හා නිරතුරුවම අත්වැල් බැඳගෙන සිටින දරුවනට මූල්‍යාධාර සපයන ශ්‍රද්ධාවන්ත මහත්ම මහත්මීන්ද එතුමියට ලබාදෙනුයේ අප්‍රමාණ ශක්තියක්. මිරිස්වෙල් එම්මිත හිමියන් ඇතුළු අතිගෞරවනීය යතිවරයාණන් වහන්සේලාගෙන් පදනමට ලැබෙන ආශිර්වාදය

01

සීතා ගුණතිලක මහත්මිය ඇතුළු පදනමේ සැමදෙනාටම ලබා දෙනු ලබන පෝෂණ ශක්තියක්ම බව කිවයුතුය. ලොවේ දීන දයාබරව කොතින් කවුදත් නොහඳුනා ජනතාව බලාව වෙසෙන පුද්ගලයක දෙව්දේවතාවුන් වැනි ජනතාව මෙලොව සිටිනා අපට හොඳම ආශිර්වාදය මාපිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම බව කිවයුතුය.

නොයෙකුත් අසරණ පිරිසට පුරා වසරක් මුළුල්ලේ මූල්‍යාධාර ලබාදෙනුයේ කිසිදු ප්‍රමාදයකින් තොරව බව කිවයුතුය. ශිෂ්‍යත්ව ප්‍රදානයද සිදුකරනු ලබන්නේ ගෞරව බහුමාන පෙරදැරිවමය. එහිදී සිසුන්ගේ පාසල් ඇඳුම් වලට අවශ්‍ය පොත්පත ලබාදෙයි. සීතා ගුණතිලක මැතිනියගේ විශිෂ්ට ලේඛන ශක්‍යතාව පෙන්වමින් දරුවන්ගේ පාසල් බොහෝවිට චතුර්විධ රචනා කළ පොතපත එයට කදිම සාක්ෂියක්. ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයේදී දරුවනට ප්‍රායෝගික උපදෙස් ලබාදෙනු ලබන අතර සිසු දරුවනට හරවත් දේශනයක් පවත්වන්නටද ගුණගාන උපකාර දී තිබීම ආලෝකවත් බව ගෞරවයෙන් සඳහන් කරමි.

ශිෂ්‍යත්ව පදනමේ කාර්යභාරය එතැනින් නිමාවට පත්නොවෙයි. සිසුදරුවන් එයින් ඔබ්බට ගොස් තමන්ගේ අනුග්‍රාහක මහත්ම මහත්මීන් වෙත ස්වකීය කෘතවේදී ස්තූතිය පළකරමින් ලිපියක් ලියා අනුග්‍රාහකතුමිය වෙත යැවිය යුතුය. කෘතගුණ දැනීම අමතක කරන සමාජයට එය කදිම ආදර්ශයක්. කිසිදු ප්‍රතිලාභයක් අරමුණු කොටගෙන නොව දරුවන්ගේ යහපත අරමුණු කොට මෙම මූල්‍යාධාර පිරිනැමීම සිදුකරන්නේ අපූර්ව වූ මානුෂීයත්වයකින් හෙබිවෙගෙනය. එවන් උත්තම උත්තමාවන්ට තමන්ගේ හැකියා නැගෙන කෘතවේදීත්වයේ ගෞරව ආචාරය පුද කිරීම සිදුකළ යුත්තේ උදාර කටයුත්තක්. කලට වේලාවට ආවර්ජනය කිරීම, නිවැරදිව ලිපියක් ලියන්නට පුරුදු වීම, ආචාරශීලී දක්ෂතාව වර්ධනය කරගන්නට උපකාර වීම ආදී ඒ කිසි නොහැකි ප්‍රතිලාභ රැසක් අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම තුළ ගිලෝහිව ජනිතව බව ප්‍රකාශයෙන් දක්වනු ඇත්තෙමි.

ඒ සඳහා සිසුවකු ලෙසින් මා ලද අපූර්ව වූ අවස්ථාව මම නිරන්තරව මාපිය අනුස්මරණ පදනමට සිහිකර ගෞරව කරමි. මාපිය අනුස්මරණ පදනම තවත් දීර්ඝ කාලයක් පවතීවා! පදනමේ සැමදෙනාටම දීර්ඝායුෂ ලැබේවා! තෙරුවන් සරණයි!

([redacted] දෙවන වසර, ශාස්ත්‍ර පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය)

(2)

A/DR/935

ශිෂ්‍යත්ව අංක A/DR/935

E/SG/918

දුගී දරුවන්ගේ නැණපහන දැල්වූයේ ඔබයි.

තවමත් සංවර්ධනය වෙමින් පවතින අප රටේ ජීවත්වන දුගී දුප්පත් ළමුන්ගේ අධ්‍යාපන පිපාසය සංසිඳුවීමට සඳහන් අධ්‍යාපනයට ද නොහැකි වූ පසුබිමක ආර්ථිකයෙන් බැට වැදී, ආධාරයක් බලාපොරොත්තුව සිටි මා හට ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනමේ දායකත්වය ලැබීම මහත් භාග්‍යයකි.

ශිෂ්‍යත්ව අරමුදලක් යනු මූල්‍යමය ආධාරයට පමණක් සීමාවූ ක්‍රියාවලියක් යැයි සිතා සිටි මා ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනම තුළින් සැබෑ ශිෂ්‍යත්වයක් යනු මූල්‍යමය ආධාරයෙන් නොනැවතී නිරන්තර වර්ධනයට මඟපෙන්වන වඩා ක්‍රමානුකූල පිළිවෙතක් බව දැනගත්තෙමි. තම දරුවන්ගේ අධ්‍යාත්මය මෙන්ම සමාජමය සංකල්පයද වර්ධනය කිරීමෙහිලා දායකත්වය ලබාදෙමින්, සෑම ශිෂ්‍යයාවන්ට අවශ්‍යවන අවවාද අනුශාසනා ද නිතැතින් ලබාදෙමින් ශිෂ්‍යත්වලාභියකු දක්ෂ සිසුවෙකු පමණක් නොව සමාජීය හැසිරීම්වලින් යුත් පරිපූර්ණ මිනිසකු ද විය යුතු බව අවධාරණය කරමින් නිතැතින් සිසුන් දැනුවත් කරමින්ද, මඟපෙන්වමින්ද ඉතා ක්‍රමානුකූල ආදර්ශයක් සැපයීමට නිතැතින් වෙර දරන ශිෂ්‍යත්ව පදනමක ශිෂ්‍යත්වලාභියකු වීම මගේ ජීවිතයේ මා ලද උතුම් භාග්‍යයකැයි සිතමි.

ආගම් භේද කිසිත් නොතකා, දක්ෂයාට දායකත්වය ලබාදිය යුතුයි යන උත්තරීතර න්‍යාය මූලිකරගනිමින් ප්‍රදානය කළ ශිෂ්‍යත්වයෙන් නිසි විටෙක ඉස්ලාම් දහම අදහන මාගේ අධ්‍යාපනයට කිසිදු ප්‍රශ්නයක් නොවන අයුරින් ද, සෑම විට ඔබගේ පහසුව ඉතා උසස් ලෙස සලකා ක්‍රමානුකූලව හා පිළිවෙලට සංවිධානය කළ උත්සවයන්ද කිසිදු අමතක කළ නොහැක. එමෙන්ම දරිද්‍රතාවය යනු බාධකයක් නොව අභියෝගයක් යන්න පසක් කරලූ පොත්පත් මෙන්ම ළමාවියන්ට සැලකිල්ලේ උතුම් ගුණ ධර්මය ගෙනහැර දක්වන පොත්පත් ද, සැබෑ පුරවැසියෙකු හා මනුෂ්‍යයකුගේ ජීවන චරිතය කෙසේ විය යුතුයිද යන්න ගෙනහැර දක්වන පොත්පත්ද ප්‍රදානය කර අප දැනුවත් කිරීමට ඔබ කළ උත්සාහය ද පසසමි.

ආචාර්ය යන්නෙන් ශිල්ප අභ්‍යාසලාභ සේවාව පමණක් නොව සමාජයට සැබෑ ලෙස සේවය කිරීමට සුදුසු මිනිසෙකු කිරීමේ පරමාර්ථයෙන් සෑම සිසුවෙකු වෙනම සුවිශේෂී අවධානය දක්වමින් ආර්ථික, සමාජීය මෙන්ම මානසික යන සියලු අයුරෙන් සිසුවා නොවැටිය යුතුයි යන්න එන්මා කරගනිමින් කාලෝචිත පරිදි අවවාද අනුශාසනා මෙන්ම දායකත්වය ලබාදෙමින් ද නිතැතින් ඇගයීම් හා විභාග ලකුණු පිළිබඳ වාර්තා ලබාගනිමින් ගුරුවරුන්ගේ ප්‍රවර්තනය මෙන්ම පාසල් පැමිණීමේ ප්‍රතිශතය යනාදිය පිළිබඳ නිරතුරු අවධානය යොමු කරමින් අප දරුවන් හට ඔබගේ සේවය තවත් බොහෝ සිසුන්ගේ දිවිය අලංකාර කිරීමට දායක වේ යැයි සිතමි.

ගුරු භාරකරුවකු ඔබගේ ජීවිතයේ අප වෙනුවෙන් කාලය වැය කරමින් අපගේ ලිපිවලට උත්තර දක්වමින්ද, අපට වැරදී ගිය තැන්, අනතුරු වූ විට මඟ හරිමින් අපගේ ප්‍රශ්නයන් හදා, ගුරු ගුවන්ලිමන්ගේ එක ම ප්‍රතිචාර පෙනෙන සේ දක්වමින් ඔබ අපගේ ජීවිතය ආලෝකමත් කළා මෙන්ම නැවත අපුරින් පිළියෙල කරගනු ලැබුවේ කෙසේද යන්න ගුරු සියුම් රේඛා තුළින් පෙනෙන දැක්ම ආකාරය ගුරු ප්‍රශංසනීයය.

ඔබගේ ශිෂ්‍යත්ව පදනමේ එනම් මා.පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමේ සහ ශ්‍රී ලංකා කැනඩා ශිෂ්‍යත්ව පදනමේ ශිෂ්‍යත්වලාභී සිසුවෙකු වශයෙන් මා ලද ආර්ථික ශක්තිය මගේ අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කරගැනීමට මෙන්ම මාගේ මල්ලීගේ අධ්‍යාපන කටයුතු සඳහා උපකාර කිරීමට ද දායක විය. එතුළින් මා මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු පීඨයට ද, මගේ මල්ලී කැළණිය විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පීඨයට ද ඇතුළත්වීමට භාග්‍යය හිමි කරගත්තෙමු. එයට අමතරව දරිද්‍රතාවය යන්න බාධකයක් නොව අභියෝගයක් බව ගුරු පැහැදිලි අවබෝධයක් ලැබීමට ද, සමාජයට සැබෑ සේවයක් කිරීම අපගේ ඉලක්ක වගන්තියක් බව අවබෝධ කරගැනීමට මෙන්ම සෑම ක්‍රියාවක් පිළිවෙලට කිරීමේ වැදගත්කම මෙන්ම එමගින් ලැබෙන පහසුව අත්විඳීමට ද ඉගෙන ගැනීමට ඔබ ශිෂ්‍යත්ව පදනම මා හට දායක විය.

ඔබ කළ සේවයට මගේ දිවිය ඇති තෙක් ණය පිරීමට මා බැඳී සිටිමි. සැමදා දෙව් ජීවිත ලැබී මා වැනි ජීවත්වන වෙර දරන බොහෝ මල් කැකුළු වලට පිහිට කරන්නට එන්නට ඔබ ශිෂ්‍යත්ව පදනමේ සංවිධායක මෙන්ම දායක සැමට හැකි වේවායි පතමි.

[illegible]

A / LH / 1008



වාලුකාවට දිය බිඳක්

ශිෂ්‍යත්ව ප්‍රදානයේ සිට අපගේ මුදල් වාරිකය ලැබෙන තුරාවට වෙනත් කිසිම සංවිධානයක නුදුට විශේෂයෙන් රැසක් මා ග්‍රහණය කර ගතිමි. අඟ හිඟ කම් පිරුණු දිවියක සිහින ගිලිහී යද්දී සවිමත් දැතක වාරුව ලදිමි. ඒ ලද සහාය කීමට හැක්කේ මා වැන්නෙකුට හැර වෙන කවරෙකුට ද?

ශිෂ්‍යත්ව අංක C / SM / 1022

[illegible]

[illegible]

[illegible]

[illegible]

[illegible]

[illegible]

[illegible]

තිළිණ ග්‍රන්ථයන්හි ඵලදායීතාව පාඨක ඇසින්



A/MP/1006



මීට පෙර මා යොමු කළ ලිපි මගින් මාගේ පවුලේ පසුබිම පිළි-
බඳව දැනුවත් කරනු ලැබූ අතර එම පසුබිම මාගේ උසස් අධ්‍යාප-
න කටයුතුවලට යම් බාධාකාරී වේ දැයි බියක් තබනු ඇතැයි
යන බිය මා සිත තුළ නිරන්තරයෙන් ගැවසී පැවතිණි. ඒ
අනුව ඔබ තුමියගේ මූලිකත්වයෙන් මා හට කරමින් පවතින මෙම
මහත් වූ උපකාරය එම සෘණාත්මක සිතුවිලි වලින් මා සිත ගලවා
ගැනීමට සමත් වීම තුළින් මට සැනසීමට පත් වුණෙමි.

ඔබ තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය විසින් මා වැනි දුකස්
ගානන් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නව ආකාරයට උදවු කරමින්, මෙන් ම
නැවත් සාරධර්ම මතිතය කරමින් යහපත් පුරවැසියන් ලෙස
සමාජයට ඇතුළත් කිරීමට ගන්නා උත්සහාය ඉතාම ප්‍රශංසනී-
යයි. ඒ පිළිබඳව සැබුවින් කල්පනා කර බැලූ විට බලවත් ධර්ම
දානයක් බව හැගේ. ඒ සඳහා ඔබ තුමිය විසින් ලබා දුන් "මා
පිය ගුණ සමර" නම් විශිෂ්ඨ චරිතය කාගේ පසුබිසරම පුළල්
මාවතක් සදන බව අවිවාදයෙන් පැහැදිලි කරුණකි. මාගේ
හැකියාව තැබියාව මා මෙම මාර්ගයේම ගමන් කරන්නට හැකි
හැගෙන අතර එම මාවත තුළ තවදුරටත් ප්‍රකට්ඨනය
කිරීමට සමත් මෙම හැදෑමිහිර කාණය මා වෙත (මා මෙන්ම අන්
අය වෙත ද) ලැබීමට හේතු වූ ඒ විශිෂ්ඨ චරිතය වන් ගුරු
දිවංගත විශාමලත් විදුහල්පති සාමවිනිසුරු විජේසේන කිරිවත්-
තුඩුව මැතිතුමාට නිවන සැනසීම පුණ්‍යානුමෝදනා කරන්නේ
එතුමා තුළ බෝධියකින් ලබාගත් නිවන් සුව ලබා ගැනීමට
හැකි වේවායි යන පැතුමෙනි.

E/SG/820

[illegible]

ශිෂ්‍යත්ව අංක A/DR/1007

[illegible]

ශිෂ්‍යත්ව අංක A / WK / 1114

[illegible]

[redacted]

C/SM/1022

[illegible]

[illegible]

කරුණා සෙනේ ආසිරි කිරි සමව පුන්

[illegible]

ආසයි මවුනි බය අත්වැල අල්ලන්න

[illegible]

[redacted] 522

[illegible]

[redacted]

A/MP/1006

හැරී බැලිම් අා මඟ.....

A/AN /IIIO

හැරී බැලිම් අා මඟ

හන්තානේ හන්ද හාවේ
හිතේ තිබූ අංගනාවන්
සිඳුහියා රොන් පැහුල
හමු වූ බාධක අභියෝගකම් මැද.....
දැනගත්ති අහමු රලින
මිනිසත් කම අගයා
රැදිදේවතාවුන් වැනි
මා එය අනුස්මරණ විදහට ගැන.....
ගැළපුනෙයි මා ද ලිව් රෙදින්
හිතේ තිබූ දුක් ගිනි මැද
ලැබුණා සිහිනයන් සිනාට
ඔබ ඇමු තිලමු ලියනයෙන්ම.....
දුර කළු සිරසවිය
මාගේ රොන් අහිමුව බව
තිබක් විය මට
සදනා සිම.....
උදාවිය ත් ජීන්බර දිනය
ඔබගේ සුන්දර මුහුණ
අඟ කෙස් රැඳිරයේ
සීමානා වූ......
සිතුවිලි දැනුම් දෙමි
අද මා නාන්හාන
අසල . රේරාදෙකි
විදු බිමේ
ශිෂ්‍යාවක්,
අභාග්‍යකාර ශිෂ්‍යයාවකි......
කළං වූ මේ උපකාරයට
ස්තුතිය් දිගත් වරක් ඔබ
සිතමට , මැතීයකු ඔබට .
දිවෙදා සම්ඳු එහිටයි !!!

අනුග්‍රාහක භවතුන්ගේ දෘෂ්ටි කෝණයට අනුව

ලෞකික ජීවිත හා බැඳෙන සැපය

ලෞකික ජීවිතයේ අප කවුරුත් සැප කැමැත්තෝ වෙමු. එහෙත් සැප යැයි සිතා රාගාදී අරමුණු කෙරෙහි ඇළෙන්නන් තුළින් නිරතුරුවම සතුට පලායයි. ඇලීම් ගැටීම් වලින් තොරව සමාජ සම්මත ආකාරයට, තම සීමාවන් හැඳිනගෙන ගිහි ජීවිතය තුළ පසිඳුරන් පිනවීම බුදුදහමේ ප්‍රතික්ෂේප කර නැත.

එහෙත් කෙලෙස් වලින් ආතුර ව, වෛර සහගතව, ක්‍රෝධයෙන් පසුවන අන්ධබාල පෘථග්ජනයින් ඇතැම් අවස්ථා වලදී මිනිසත් බවේ සීමාවන් අභිභවා යයි. ප්‍රඥාවන්තයින් ප්‍රතික්ෂේප කරන චරිත ලක්ෂණ අඩංගු රූප රාමු නරඹමින් ඒවා අනුකරණය කිරීමට මහත් වෙහෙසක් දරයි. තමා කවරෙක්දැයි යන්න පවා අමතකවෙයි. ඉතා අපහසුවෙන් ගොඩනගාගත් ස්වාමිත්වයේ, පිතෘත්වයේ ගෞරවය පවා කෙලෙස ගනියි. තම අභිමතාර්ථයන් ඉටු කරගැනීමට බාධාවක් සේ පෙනෙන අය කෙරෙහි වෛර සිත් උපදවා ගනියි. මෙම වෛරය, ක්‍රෝධය වර්ධනය වූයේ නම් භවයෙන් භවයට බද්ධ වෛරයක් සේ පසුපස පැමිණේ.

මිනිසත් බවේ නිසි ඵල ලබන ප්‍රඥාවන්තයින් මෙම භවයේ දී ම එවන් කර්ම අහෝසි කරගැනීමට වෙර දරයි. ජීවිතයේ සෑම ප්‍රශ්නයකටම පාහේ ධර්මානුකූල විසඳුම් ලබාදෙන ධම්ම පදය නම් වූ ග්‍රන්ථ රත්නයේ සුඛ වග්ගයේ එන පහත සඳහන් ගාථා රත්නයන්, ලෞකික ජීවිතයේ පමණක් නොව දෙලොවටම සැප පිණිසම හේතු වේ.

සුසුඛං වත ජීවාම - වේරිනෙසු අවේරිනො
වේරිනෙසු මනුස්සෙසු - විහරාම අවේරිනො

Let us live happily without hate among the hateful; among the hateful men let us live without hate.

වෛර සහිතව ජීවත්වන මිනිසුන් අතරෙහි අපි වෛර රහිතව ඒකාන්තයෙන්ම සුවසේ ජීවත් වෙමු. අපි වෛරී මිනිසුන් මැද අවෛරීව වෙසෙමු.

සුසුඛං වත ජීවාම - ආතුරෙසු අනාතුරා
ආතුරෙසු මනුස්සෙසු - විහරාම අනාතුරා

Let us live happily free from illness among those sickly. Among those sickly men, let us live free from illness.

කෙලෙස් වලින් ආතුර ව ලෙඩ වී ජීවත්වන මිනිසුන් අතරේ අපි කෙලෙස් වලින් අනාතුරව, ලෙඩ නොවී ඒකාත්තයෙන්ම ඉතා සුවසේ ජීවත් වෙමු. අපි ආතුර වූ මිනිසුන් මැද අනාතුරව වෙසෙමු.

සුසුඛං වත ජීවාම - උස්සුකෙසු අනුස්සුකා
උස්සුකෙසු මනුස්සෙසු - විහරාම අනුස්සුකා

Let us live happily without longing for sensual pleasure among those who seek sensual pleasure; let us be free among such men.

කම් සැප සෙවීමෙහි උත්සාහවත් වූ මිනිසුන් අතුරෙහි, අපි එබඳු උත්සාහයක් නැතිව ඒකාන්තයෙන්ම ඉතා සුවසේ ජීවත් වෙමු. අපි උත්සුක වූ මිනිසුන් මැද අනුත්සුක ව වෙසෙමු.

සුසුඛං වත ජීවාම - යෙසං නො නත්ථි කිංචනං
පීතිභක්ඛා භවිස්සාම - දෙවා ආභස්සරා යථා

Not afflicted with passion happily do we live. Happy are we like the gods of the Radiant Realm.

යම් කෙනෙකුට රාගාදී වූ කිසිම පළිබෝධයක් නැද්ද, එබඳු වූ අපි ඒකාන්තයෙන්ම ඉතා සුවසේ ජීවත් වෙමු. අපි ආභස්සර බඹ ලොවේ දෙවියන් හෙවත් බ්‍රහ්මයන් සේ සමවත් සුවෙන් ඇතිවන ප්‍රීතිය වළඳන්නෝ වෙමු.

මෙලෙසින් බලන කළ සතුට යනු තමා විසින්ම ඇතිකර ගත යුත්තකි. කිසිවෙකුට ඇති කිරීමට හෝ නැති කිරීමට නොහැක. ඊර්ෂ්‍යා, වෛරය, ක්‍රෝධය ආදිය සිතේ ඇත්තාගේ හද තුළ සතුට නොරැඳෙයි. ධර්මය ඖෂධයකි. ධර්මයට වඩ වඩාත් සමීප වනවිට සිතේ සතුට වැඩිවෙයි. එය කිසිවෙකුට වැළැක්විය නොහැක.

භෞතික ඉලක්ක හඹා යන්නාට **"ඈත"** යන සීමාව නොමැති හෙයින් ඒවා පිළිබඳ සිහින මවයි. කුමන අයුරින් හෝ ඉලක්ක සපුරා ගැනීමට වෙර දරයි. සිත, කය, වචනය තිදොරින් ම අකුසල් රැස්කරයි.

ඒ අතර ප්‍රඥාවන්තයින් සැඩ පහර කපාගෙන උඩුගම් බලා යයි. ආයාසයෙන් කුසල් වඩවයි. රාග, ද්වේෂ මෝහ දුරු කරයි. සෑම මතයකට ම ඇහුම්කන් දෙයි. ප්‍රඥාව අඩු අන්ධ බාලයින් දෙස සානුකම්පිතව බලයි. ඊර්ෂ්‍යාව, ක්‍රෝධය බැහැර කරයි. බුද්ධියට වටිනාකමක් දෙයි. සීල, සමාධි, ප්‍රඥා ඔස්සේ කුසල් වඩවයි. එම ශිලාචාර පැවැත්ම අන් අයගේ ගෞරවයට පාත්‍ර වෙයි. අශීලාචාර තැනැත්තා නිවසේ සාමාජිකයන්ගේ පවා ගැරහීමට පාත්‍ර වෙයි. අප්‍රසාදයට ලක්වෙයි.

නපරේසං විලෝමානි - නපරේසං කතා කතං
අත්ථනාව සුදන්තේන - කතානි අකතානිච

තමා කළ නොකළ දේ ගැන පමණක් සිතන්න. අන් අය කළ නොකළ දේ පිළිබඳව නොසොයන්න.

අකුසලය නිරායාසයෙන් උපදියි. ගඟ ගලා බසින පැත්තට ගලා යන්නාක් මෙනි. එහෙත් කුසලය ආයාසයෙන් උපදවා ගත යුතුය. මෛත්‍රිය ද ආයාසයෙන් පුරුදු පුහුණු කරගත යුතුය. ඒ සඳහා වීර්යය අවශ්‍යමය. නූපන් කුසල් ඉපදවීමට, උපන් කුසල් වැඩි දියුණු කරගැනීමට, නූපන් අකුසල් නොඉපදවීමට, උපන් කුසල් වැඩි දියුණු කරගැනීමට, උපන් අකුසල් ප්‍රහීණ කිරීමට අප වෙර දැරිය යුතුයි.

අනුන් කළ කී දෙය ගැන සොයමින් නොසිට තමන් පිළිබඳව මෙසේ වීර්ය වඩන්නෝ තම දිවිය සොඳුරු බවට පත් කර ගනියි. චිත්ත ඒකාග්‍රතාව ඇතිවේ. සීල, සමාධි, ප්‍රඥා වැඩෙයි. ප්‍රසාද ජනක බව මුහුණෙන් දිස්වෙයි. නිරතුරුවම සිත සතුටින් ගත කරයි. සොඳුරු මරණයකි. උත්පත්තිය ද එසේම වනු ඇත.

(අනුග්‍රාහක සුපින්වත් රූපා ගුණරත්න ගුරු මාතාව විසිනි)

මෛත්‍රිය

මෛත්‍රිය යනු කුමක්ද ? එහි ගුණාංග කෙබඳු ද ? එහි ප්‍රභේද මොනවාද ? මෛත්‍රිය දයාව යනුවෙන් බුදුන් වහන්සේ දේශනා කර ඇති දෙය අපට ඒ පිළිබඳව ඇති සාමාන්‍ය දැනුමට වඩා වෙනස් වූවක් ද ? මෛත්‍රිය තේරුම් ගැනීමේ පළමු පියවර කුමක්ද ? මෛත්‍රිය ගැන කථා කිරීමට හෝ ලිවීමට පෙර මෙවැනි ප්‍රශ්න ඇති වේ.

ආදරය යන වචනය අපගේ එදිනෙද වාග් මාලාවේ පවතින නිතරම භාවිතා කරන අවශ්‍යම වචනයකි. අපි ඒ ගැන කථා කරමු, කියවමු, ලියමු. අපි බොහෝ දෙනෙක් ආදාරය යනු ජීවිතයේ අවශ්‍යම අංගයක් ලෙස කල්පනා කරමු. "ආදරය අති ශෝභන දෙයකි". "සැබෑ ආදරය යනු කිසිදා සමාවන්න යැයි කීමට සිදු නොවන තත්වයකි." යනාදී කියමන් ද "ආදරය කරන්න - යුද්ධයට පිටුපාන්න" යනාදී ආදර්ශ පාඨයන්ද අප අතර පවතී.

අප කථා කිරීමට බලාපොරොත්තු වන මෛත්‍රියේ හෝ දයාවේ සැබෑ ස්වාභාවය ගැන අර්ථ දැක්වීමකින් මෙම ලිපිය ඇරඹීම යෝග්‍යය. **එය සැබවින්ම අන් අය කෙරෙහි ඔවුන්ගේ යහපත අපේක්ෂා කරමින් ඇතිකරගන්නා වූ උණුසුම් කාරුණික හැඟීමකි. එය මෘදුය. මොලොක්ය, පරාර්ථකාමිය, පෙරළා කිසිවක් බලාපොරොත්තු නොවන එම හැඟීම අති උදාරය,** ආගම්, ජාති, ස්ත්‍රී පුරුෂ භාවය ආදිය ඉක්මවා යන විශ්වයේ ජීවත්වන සියළුම ජීවින් එනම් ක්‍ෘමීන්, මත්ස්‍යයින්, සිව්පාවුන් සහ අදෘශ්‍යමාන ජීවින් කරා ද පැතිර යන්නකි.

මෙය කිසිසේත්ම කිසියම් පුද්ගලයෙකු කෙරෙහි ඇතිවන්නා වූ රාගය මුල්කරගත් ආකර්ෂණයක් නම් නොවේ. මෙහි කිසිදු ලිංගික ආකර්ෂණයක් ද නැත. ඉඳුරන් පිනවීමේ අවශ්‍යතාවක්ද නොපවතී. සත්‍ය වශයෙන්ම ආදරවන්තයින් අතරත්, ස්වාමියා සහ බිරිඳ අතරත් ආදරයක් පවතී. ඔවුන්ගේ සබඳතාවයන්හි පවා ආරක්ෂාවක් පිළිබඳ හැඟීමක් සහ මෘදු භාවයක්ද පවතී. නමුත් එය පොරොන්දු ගිවිසුම් වලින් තොර වූ දෙයක් නොවේ. එය ප්‍රබල කායික සහ මානසික ආකර්ෂණයකි. එක් පාර්ශවයක් අනිත් පාර්ශවයේ සතුට උදෙසා ක්‍රියා නොකිරීමෙන් මෙවැනි බැඳීමක් බිඳීයාමට වුවද අවකාශ තිබේ. අප මෙහිදී කථාකරන්නේ එවැනි පොරොන්දුවලින් බැඳුණ සීමාසහිත සහ ආත්මගත ප්‍රේමයක් ගැන නොව විප්ලවීය වෙනසක් සහිත, උදාර, පුද්ගල කේන්ද්‍රිය හැඟීමෙන් තොර සියළු දේ ඉක්මවා යන දයාවක් ගැනයි. එනම් පොරොන්දුවලට ගැති ආශාවන් සහ අවශ්‍යතාවන් උදෙසා තවකෙනෙකු මත රඳාපවතින ආදරය යන හැඟීම, අප මෙහිදී සාකච්ඡාවට භාජනය කෙරෙන දයාවට ඉඳුරාම වෙනස් බවයි.

කෙසේවෙතත් පොරොන්දු ගිවිසුම්වලට යටත්ව සහ කාමාශාව පදනම් කරගෙන වූවද, ආදරවන්තයින් අතරත් ස්වාමි භාර්යා අතරත් මෘදු රැකවරණය පිළිබඳ හැඟීමක් සහිත ප්‍රේමයක් පවතින බව ද සැබෑය. ආදරවන්තයිනට සහ අඹු සැමියන්ට සැබෑ දයාබර ප්‍රේමය යනු කුමක්දැයි හඳුනාගැනීමටත්, දියුණු කරගැනීමටත්, මෛත්‍රිය යනු කුමක්දැයි පැහැදිලිව තේරුම් කරගැනීමෙන් හැකිවනු ඇත. සමහරවිට, අවසානයේ දී ඔවුන්හට කරුණාව, දයාව ගැන සතුටට පත්වීමටත්, එය දියුණු කරගැනීමටත් අවස්ථාවක් ලැබී සැනසීමෙන් යුතුව සියළුම බාධක, සීමාවන්, කොන්දේසි ඉක්මවා යාමටත් හැකියාව උදාවනු ඇත.

එබැවින් අප මෙහිදී අවධානය යොමුකරන **මෛත්‍රිය සහ කරුණාව** නම් අන් අයගේ සුභසිද්ධියේදී අප තුළ ඇතිවන මහත් ප්‍රීතියයි. එය ස්වාර්ථයක් පමණක් නොසළකන, ප්‍රති උපකාර වශයෙන් අඩුතරමින් ප්‍රශංසාවක් හෝ කෘතඥතාවක් හෝ බලාපොරොත්තු නොවන උදාර හැඟීමකි. එය හුදෙක් දීමක් මිස ගැනීමක් නොවේ. සතුටින් දිදුලන අන් අයගේ ඇස් හෝ මුහුණු දැකීමෙන් අප ද සොම්නස් සහගත වෙමු. කරුණාව දයාව වෙනුවෙන් කටයුතු කර ඒ වෙනුවෙන් ලබන ප්‍රමාණවත් සහ ප්‍රයෝජනවත් ත්‍යාගයකි. එය, එවැනි දයාවක් ඇති සිත අන් අය වෙනුවෙන් පතන්නේ යහපතක්මය. සතුටක්මය. සියළු දුක් වේදනාවන්ගෙන් ඈත්වීමක්ම ය.

මේ අයුරින් සලකා බැලීමේදී සාම්ප්‍රදායිකව පැවත එන බෞද්ධ පාඨ වන **"සියළු සත්වයෝ නිදුක් වෙත්වා ! උවදුරු නැත්තෝ වෙත්වා ! මානසික දුක් නැත්තෝ වෙත්වා ! කායික දුක් නැත්තෝ වෙත්වා ! සොම්නස් වෙත්වා ! යන්න ඉතා වැදගත් වේ".**

බුදුන් වහන්සේගේ ජීවිතයද කරුණාවේ සහ දයාවේ ප්‍රතිමූර්තියකි. එයට හේතුව උන්වහන්සේ තමාට ගතකළ හැකිව තිබූ සුඛෝපභෝගී ජීවිතය අතහැර දුක නැතිකරන මාර්ගය සොයාගනුවස් සියළු සත්වයන් කෙරෙහි මෛත්‍රියෙන් සහ කරුණාවෙන් කරන ලද කැපකිරීමයි. එම මාර්ගය සොයාගැනීමෙන් පසුව ද ඉන් නොනැවතී උන් වහන්සේ සියළු ලෝක සත්වයා හට ම විමුක්තියේ රසය ලබාගැනීමට ත්, සිත පිරිසිදු කරගැනීමෙන් මෙම ජීවිතයේදීම නිවන් සැප ළඟාකරගැනීම උදෙසාත් එය බෙදා දුන්හ. එසේම උන්වහන්සේ තම ශ්‍රාවකයන් වහන්සේ අමතා දේශනා කළේ, සියළු ජනයාගේ හිත සුව පිණිස චාරිකාවේ යෙදී තම ධර්මය

ප්‍රචාරය කරහරින ලෙසය. උන්වහන්සේද, බුද්ධත්වයෙන් පසුව, වයස 80 දී පිරිනිවන්පාන තුරුම, වසර 45 ක් පුරා ශ්‍රේෂ්ඨ ගුරු උතුමෙක් බව පසක් කරමින්, ආදර්ශ සම්පන්නව, වෙහෙස නොබලා මුළු ඉන්දියාව පුරාම චාරිකාවේ යෙදෙමින් විවිධ සමාජ තලයන්හි මිනිසුන්ට දහම් දෙසුහ.

නිරතුරුවම මෛත්‍රිය පතුරුවන ලෙස බුදුන් වහන්සේ තම ශ්‍රාවක සංඝයා උනන්දු කළහ. ඈතට දිවෙන පුළුල්ව පැතිරෙන සීමා නැති මෛත්‍රී සිතක් මුළු ලෝකයටම පතුරුවන ලෙසද, වදාළහ. ඇවිදිමින් සිටිය ද, හිඳගෙන සිටිය ද, සිටගෙන හෝ වැතිරී සිටිය ද සියළු සත්වයා වෙත මෛත්‍රී සහගත සිතුවිලි පතුරුවා හැරීමට උන්වහන්සේ තම ශ්‍රාවක සංඝයා උනන්දු කළහ. උන්වහන්සේගේ ඉගැන්වීම් තුළ වෛරයේ හෝ ක්‍රෝධයේ ලේෂ මාත්‍රයකටවත් ඉඩක් නැත. සැබවින්ම එවැනි දයාවක් හැම අතින්ම උසස්ය. උත්තරීතරය. කිසිවක් අපේක්ෂා නොකරමින් පූර්ණ වශයෙන් මුළු හදවතින්ම දයාව දැක්වීම ලෙහෙසි පහසු කර්තව්‍යයක් ද නොවේ. ඇත්ත වශයෙන්ම, බුදුන් වහන්සේ තරමටම, සියළු සත්වයන් ආවරණය කෙරෙන, මෛත්‍රියක් ඇතිකර ගැනීම අතිශයින්ම දුෂ්කරය. එය දැවෙන තැවෙන ආදරයක් නොව නිවීමක් සහ සැනසීමක් ඇති කරවන ප්‍රඥාවෙන් සහ උපේක්ෂාවෙන් යුක්ත මෙත් සිතකි. සියලු පාපයන්ගෙන් මිදුන පවිත්‍රත්වයෙකි.

මෛත්‍රී භාවනාව සහ විපස්සනා භාවනාව පුහුණු වන කල්හි එවැනි කරුණාවක් සහ දයාවක් වගාකර ගැනීමට සිතිවිලි ඇතිවනු ඇත. මෛමත්‍රී භාවනාව යනු වෛරයට සහ ක්‍රෝධයට එරෙහිව භාවිතා කළහැකි හොඳම ආයුධයයි. එසේම විපස්සනා භාවනාව පුහුණු වීමේදී අප සියළු දෙනාම සංසාරයේ එකට දුක් විඳින පිරිසක් බව අවබෝධ වීමෙන් මෛත්‍රී සිතුවිලි අප තුළ පහළවෙයි.

මෛත්‍රී වඩන්නාට ලැබෙන්නා වූ ආනිසංශ 11 කි.

1. ඔහු සුවසේ නිදයි.
2. පද්මයක් පිබිදෙන්නාක්මෙන් නින්දෙන් අවදිවෙයි.
3. භයානක සිහින නොදකී.
4. මිනිසුන්ට ප්‍රිය පුද්ගලයෙකු වෙයි.
5. දෙවියන්ට ප්‍රිය වෙයි.
6. දෙවිවරු ආරක්‍ෂා කරයි.
7. ගින්නෙන් විෂෙන් සහ ආයුධ වලින් ඔහුට අනතුරක් සිදු නොවෙයි
8. සිත පහසුවෙන් සමාධියට පත්වෙයි.
9. මුහුණ පැහැපත් වෙයි.
10. නුමුළාව කළුරිය කරයි.
11. මෙම භවයේදීම රහත්ඵලයට පත් නොවුනහොත් බ්‍රහ්ම ලෝකයේ උපදී.

මෙත් සිතක පැතුම

මම සොම්නස් වෙත්වා ! මාගේ සතුට ආරක්‍ෂාකරගෙන වෛරයෙන් තොරව ජීවත්වීමට මා හට හැකියාව ලැබේවා ! ජීවත්වන සියළු සත්වයෝ දුර්වල වූවද, ශක්තිමත් වුවද, කුඩා හෝ විශාල වූවද, පෙනෙන හෝ නොපෙනෙන වූවද, ළඟින් හෝ දුරින් සිටිය ද ඉපදී සිටින හෝ ඉපදීමට නියමින වූවද, ඔවුහු සියළු දෙනාම ප්‍රීතිමත් ලෙසින් වෙසෙත්වා !

කිසිවෙක් වෛරයෙන් හෝ ක්‍රෝධයෙන් අන් අයට අයහපතක් නොකරත්වා ! කිසිවෙක් කිසිවෙකුටත් මුළා නොකරත්වා ! රළු පරුෂ වචන ද නොකියත්වා ! මවක් තම දිවි නොතකා තම එකම දරුවා විපතින් රැකගන්නේ යම් සේ ද එපරිද්දෙන්ම මම ද සීමා මායිම් නොමැති දයාවක් මුළු ලොව පුරාත් ඉහළටත් මා වටාත් සීමාවකට යටත් නොවී සියළු සතුන් කෙරෙහි ද කරුණාව මෛත්‍රිය දක්වමි. එබඳු අනන්ත වූ යහපතක් සියළු ලෝ වැසියන් කෙරෙහි ලැබේවායි ද මම පතමි.

සිටගෙන සිටියත් ඇවිදිමින් සිටියත් ඉඳගෙන සිටියත් වැතිරී සිටියත්, වැඩ කරන වේලාවන් හී දීත් ලෝකයා කෙරෙහි පවතින උත්තරීතර දයාව පිළිබඳ වූ මාගේ සිතිවිලි මම ආදරයෙන් රැක ගනිමි.

මේ අනුව යමින් නිශ්ඵල සාකච්ඡා සහ වාද විවාදයන් මඟ හැර ප්‍රඥා සම්පන්නව ධාර්මික මඟ යමින් ඉඳුරන් පිනවීමේ ආශාව ද දමනය කර ගනිමින් මම නැවත උත්පත්තියක්ද නො පතමි. සියළුම දුක් විඳින සත්වයෝ නිර්වාණය සාක්ෂාත් කරගැනීම සඳහා තම තමන්ගේ මඟ සකස්කර ගනිත්වා ! සියළුම සත්වයෝ මහළුවිය ලෙඩ රෝග සහ මරණය නමැති අන්තරායන්ගෙන් මිදෙත්වා ! සියළුම සත්වයෝ දුකින් නිදහස් වෙත්වා !

(මෙම ලිපියෙහි අඩංගු කරුණු පූජ්‍ය විසුද්ධාචාර හිමියන්ගේ දහම් ග්‍රන්ථයකින් උපුටා ගන්නා ලදි).
(අනුග්‍රාහක සුපින්වත් ශ්‍රියන්ගනී දිසානායක මහත්මිය විසිනි).

බෞද්ධ දර්ශනය හා යුතුකම

යහපත් දෙයට "හොඳ" යයි කීමේ වරදක් නැත. අගය කළයුතු දේ ඇගයීම බුදු ගුණයකි. එසේනම් අපි කවුරුත් **"මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම"** ගෙනයන උතුම් සත්කාර්යය, මුළු හදවතින්ම අගනා කාර්යයක් ඉටුකරන මා හැඟි සංවිධානයක් බැවින් එහි සේවය අගයමු.

මනුෂ්‍යයන් අතර මෙතෙක් ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම මනුෂ්‍යයා බුදුරජාණන් වහන්සේය. උන් වහන්සේ මනුෂ්‍යත්වය ඉක්මවන තරමට කරුණාවෙන්, මෛත්‍රියෙන්, ප්‍රඥාවෙන්, සීලයෙන්, ගුණයෙන් උසස් වූ ආශ්චර්යමත් පුද්ගලයෙකි. උන් වහන්සේ තවත් මනුෂ්‍යයෙකුට, දෙවියයෙකුට, බ්‍රහ්මයෙකුට හෝ ඝාන්දර්වයෙකුට සමකල නොහැකි බව අංගුත්තර නිකායේ චතුත්ථ නිපාතයේ ද්‍රෝණී බමුණාට බුදුරදුන් කළ ප්‍රකාශයෙන් ම පැහැදිලි වෙයි. පන්සාලිස් වසක් මුළුල්ලේ ලෝක සත්වයා වෙත දේශනා කරන ලද ධර්මයෙන් පමණක් නොව උන්වහන්සේගේ ප්‍රායෝගික ක්‍රියාවලිය පිළිබඳ විමසීමෙන් ද මේ බැව් මනාව ප්‍රත්‍යක්ෂ වේ. මෛත්‍රී - කරුණා ගුණවලින් හෙබියා වූ තිලෝගුරු අමාමෑණී බුදුපියාණන්, හැම විටකම දුක් විඳින සත්වයා ඉන් මුදවා ගැනීම සිය පරමාර්ථය කොට සලකමින් ක්‍රියා කළ බව සමස්ථ බුද්ධ චරිතයම කරුණු ගෙන හැර දක්වයි.

සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක කාලයක් මුළුල්ලේ දස පාරමිදම් පුරා බුද්ධත්වය ලබාගත් බෝසතාණන් වහන්සේ ශ්‍රේෂ්ඨතම මනුෂ්‍යයෙකු ලෙස ලෝකයාගේ ප්‍රණාමයට බඳුන්වනුයේ, උන්වහන්සේ තුළ පමණක් දක්නට ලැබෙන සුවිශේෂී ගුණ සමුදායක් හේතුවෙනි. කරුණාව, මෛත්‍රිය, දයාව, පරෝපකාරය, ඉවසීම, සාමානාත්මතාව, යථාවාදී තථාකාරී බව, අනුන් ගුණ ඇගයුම, සුදුසුස්සාට සුදුසුතැන දීම, සත්‍යවාදී බව, වීර්යය, අධිෂ්ඨානය, කැපවීම කාලයෙන් නිසිප්‍රයෝජන ගැනීම ආදී වූ දහසකුත් ගුණවලින් හෙබියා වූ උන්වහන්සේ, මිනිසුනට පමණක් නොව නොමිනිසුන්, දෙවියන්, තිරිසන් සතුන්, යකුන් ආදී වූ සකල ලෝවැසියාගේ සසර ගමන නවතාලීමට පමණක් නොව, මෙලොව ජීවිත ආලෝකමත් කරන්නට මෙන්ම පරලොව සැපවත් කරන්නට පිහිට වූ සේක. උන්වහන්සේ දේශනාකර වදාළ ශ්‍රී සද්ධර්මය වසර දෙදහස් පන්සිය ගණනක් මුළුල්ලේ නොනැසී පවත්නේත්, උන්වහන්සේගේ ගුණ වර්ණනා කරන්නේත්, ඒ අනුව තම ජීවිත හැඩගස්වා ගැනීමට ලෝ වැසියා වෙර දරන්නේත් එහෙයිනි.

බුද්ධභාෂිත දේශනාවල අරමුණ නිවන් දැකීමයි. පරම වූ සැපත නිවනයි. සංසාරික වශයෙන් කෙතෙක් සැප ඇතත්, ඒ සියල්ල අනිත්‍යයි. එහෙත් නිත්‍ය වූ සැපය වන නිවන සොයා යන මඟ බුදු දහම පෙන්වා දෙයි. එමග යන, ඒ අරමුණ ඔස්සේ පිය නගන, පුද්ගල සමූහය, බෞද්ධ සමාජයයි. භික්‍ෂු - භික්‍ෂුණී, උපාසක - උපාසිකා යන සිව් පිරිසකින් එය සමන්විත වෙයි. මොවුන් අතර පවතින සම්බන්ධතා යහපත්ය. හොඳය. මොවුන් යුතුකම් සහ වගකීම් හඳුනාගත් පිරිසකි. මේවා බෞද්ධ සමාජයක දක්නට ලැබෙන පොදු ලක්‍ෂණයි.

පුද්ගලයන් සමූහයකින් සුසැදී සමාජය, විවිධ අදහස්වලින්, විවිධ ක්‍රියාකාරකම්වලින් විවිධ පරමාර්ථයන්ගෙන් හා විවිධ ප්‍රපඤ්චයන්ගෙන් යුක්තය. සීමිත සම්පත් අසීමිත උවමනා කෙරේ බෙදී යාමේදී පුද්ගලාන්තර ගැටුම් ඇතිවේ. ගැටුම්වලින් තොරවීම උදෙසා සාමූහික බව සහ අන්‍යෝන්‍ය සබඳතාව අවශ්‍යමය. මේ හේතුවෙන් ස්ත්‍රී - පුරුෂ භාවයන් බිහි වී එමගින් අඹු - සැමි, දූ - දරු සබඳතා බිහිවේ. ඒ වටා ඥාති - මිත්‍ර, පාලක - පාලිත, ගිහි - පැවිදි වැනි සබඳතා ගොඩනැගේ.

මේ අනුව සමාජය, පුද්ගලයා මුල්කරගෙන ගොඩනැගෙන බව පැහැදිලිය. සමාජය තුළ පුද්ගල ජීවිත සුරක්‍ෂිත වීමට අවශ්‍යවන දර්ශනයත්, සදාචාරයත් බුද්ධ දේශනාවන්හි අන්තර්ගතව ඇත. ගිහි විනය ලෙසින් හඳුන්වනු ලබන සිඟාලෝවාද සූත්‍රය මේ සඳහා හොඳම දේශනයකි. එම සූත්‍රයට අනුව, මව් - පියවරුන්, ගුරුවරුන්, අඹු දරුවන්, මිත්‍රයින්, දාසයන් හා කම්කරුවන්, පැවිදි පිරිස් ආදී වශයෙන් අනිවාර්ය සබඳතා රටාවක් ඇති බව පෙනේ. මව්පිය - දූ දරු සබඳතා, ගුරු - ශිෂ්‍ය සබඳතාව, ස්වාමි - භාර්යා සබඳතාව, මිතුරු සබඳතාව, ස්වාමි - සේවක සබඳතාව, ගිහි - පැවිදි සබඳතාව යන මේ සබඳතා පැවැත්වීමේදී අන්‍යෝන්‍ය යුතුකම් සහ වගකීම් රාශියක් ඇති බවත්, මේවා ඉටුකිරීමෙන් සදාචාරවත්, ශිෂ්ඨ සම්පන්න, දියුණු සමාජයක් ගොඩනගා ගත හැකි බවත් බෞද්ධ දර්ශනය හෙළි කරයි. මේ නිසාම අන්‍යෝන්‍ය සුරක්‍ෂිතභාවය රැකේ. පුද්ගලාභිවෘද්ධිය ඇතිවේ. සුඛිත මුදිත වේ. මෙලොව පරලොව සුගතිය ළඟා වෙයි. විවිධ ගුණාංග සමාජය තුළ ගොඩනැඟීමෙන්, අනොන්‍ය සුහදතාව, හිතවත්කම් වැඩී වර්ධනය වී ආර්ථික මෙන්ම සමාජමය වශයෙන් ද අභිවෘද්ධිය ළඟා වෙයි. මේ පිළිබඳ වඩ වඩාත් තොරතුරු, ව්‍යග්ඝපජ්ජ, පරාභව, වසල, මංගල, ධම්මික, වෙළුද්වාර, අනණ, තමොතම, පරායන සූත්‍ර වලින් උගත හැකිය.

යහපත්, ගුණගරුක, දැහැමි සමාජයක් ගොඩනගා ගැනීමට නම්, මිනිස් සිත තුළ මෙත්තා - කරුණා - මුදිතා - උපේක්‍ෂා යන ගුණ දම් ජනිත විය යුතුය. කයින් - වචනයෙන් සහ සිතින් යහපත් දෙයක්ම සිදුවිය

යුතුය. දෙලොව දියුණුවට හේතු වන කරුණු රැසක් මංගල සූත්‍රයේ ඇතුළත්ය. පරාභව සූත්‍රයේ ඇතුළත් වනුයේ දෙලොවම පරිහානියට හේතුවන කරුණුය. වෙළුද්වාර සූත්‍රයෙන් ගුණගරුක ජීවිතය සමාජ ප්‍රගතියට හේතුවන අයුරු පෙන්වා දෙයි. සාලෙය්‍යක සූත්‍රයේදී හා අම්ලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ ධර්ම චර්යා සම චර්යාවන්හි යෙදීමෙන් යහපත් සමාජයක් ගොඩනඟා ගන්නා ආකාරය පෙන්වා දෙයි. ගිහි ධර්ම, සත්පුරුෂ ධර්ම, කුසලක්‍රියා, පුණ්‍යක්‍රියා, සමචර්යා, ධර්ම චර්යා ආදිය සමාජ ධර්ම ලෙස එහි දැක්වේ. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයෙන් ධර්මානුකූලව ජීවත් වෙමින් දෙලොව ජයගන්නා හැටි පැහැදිලි වෙයි. ගිහියා විසින් ධනය නිෂ්පාදනය කරන හැටි, ධනය සංරක්ෂණය කරන හැටි, සමාජ සබඳතා රැක ගන්නා හැටි, සමබර දිවියක් ගොඩනඟා ගන්නා ආකාරය එහි සඳහන්ය. ශ්‍රමය සහ ශිල්පීය ඥානය මෙහෙයවා උපයාගත් ධනයෙන් කළ යුතු යුතුකම් පත්තකම්ම සූත්‍රයේ දැක්වේ. තමන් සුඛිත මුදිතව, තමා අවට සිටින මව් - පිය, අඹු - දරු, ඥාති - මිත්‍රාදීන්ට සැලකීම, තම ධනය ගින්නෙන්, දියෙන්, සොරසතුරන්ගෙන් රැක ගැනීම, ආගන්තුක සංග්‍රහය, මහණ බමුණන්ට සංග්‍රහ කිරීම, මියගිය ඇත්තන්ට පින් අනුමෝදන් කිරීම, ආදිය පිළිබඳ විස්තර හා සුඛිත මුදිත ජීවිතයකට මඟ ගැන විස්තර එහි ඇතුළත්ය. අණන සූත්‍රයේ ගිහියකු විඳිය යුතු සැප හතරක් ගැන කියවේ. පඨම අපුත්තක සූත්‍රයෙහි දැහැමින් උපයා ගත් ධනය සමාජ සුභසිද්ධිය උදෙසා යෙදිය යුතු බව සඳහන් වේ. එබඳු පුද්ගලයා සිහිල් පිරිසිදු ජලයෙන් යුක්ත වූ පොකුණකට සමාන බව කියවේ. මොලොවට ජනිත වූ මනුෂ්‍යයා තමන් විසින් තමාගේ අර්ථ සිද්ධිය සලසා ගතයුතු අතරම, සිය යුතුකම් මැනවින් ඉටුකිරීමට උත්සාහ කළයුතු බව බුද්ධ දේශනාවයි. එවැනි පුද්ගලයින් සමාජයේ ගරු බුහුමනට ලක් වේ. ප්‍රිය මනාප වෙයි. වැඳුම් පිදුම් ලබයි. දෙලොවම සතුටට පත්වෙයි.

අංගුත්තර නිකායේ අනාථ පිණ්ඩික සූත්‍රයෙහි ධනය උපයාගතයුතු ආකාරයත්, ප්‍රයෝජනයට ගත යුතු ආකාරයත් සඳහන් වේ. මෙහි චතුර්විධ ප්‍රීතිය ලැබීම ගැන පැහැදිලි කෙරේ. අත්ථි සුඛ, හෙවත් ආර්ථික සම්පත්තිය ළඟාකර ගැනීම, සාධාරණව හා දැහැමි මාර්ගයෙන් කළ යුතුය. අන් අයට හිරි හැරයක් නොවන ලෙසින් මී මැස්සා මල නොතලා පැණි ගන්නා ලෙස රැස් කළ යුතු බව එහි දැක්වේ. උපයාගත් ධනය තමන්ගේත්, තම පවුලේත්, ඥාති මිත්‍රාදීන් ගේත් පරිභෝජනයට ගෙන කුසල් ක්‍රියා උදෙසාත් වියදම් කිරීම භෝග සුඛය ලෙස දැක්වේ. ණය නොවී සිටින පුද්ගලයාට ඉන් එහා සතුටක් නැත. එය අණන සුඛය යි. වැරදි ක්‍රියාවලින් වැළකී සිටීමෙන් ලබන ප්‍රීතිය, සැපය, සැනසුම අනවජ්ජ සුඛය නම් වේ.

මේ ආකාරයට බලන විට බෞද්ධ ඉගැන්වීම් වනුයේ, යහපත්, දැහැමි, ගුණ ගරුක, පරිත්‍යාගශීලී, පරෝපකාරී ජීවිතයක් ගොඩනඟා ගැනීම, නියම බෞද්ධයෙකුගේ වගකීම බවයි. යුතුකම බවයි. මෙම යුතුකම් ඉටුකිරීම තුළින් අසීමිත සතුටක් ළඟා වෙයි. ළඟා වූ සතුට වඩ වඩාත් වර්ධනය වෙයි. නැතහොත් කුසල් රැස්වෙයි. කුසල් වඩ වඩාත් වැඩි දියුණු වෙයි. යුතුකම් ඉටු කිරීම මනුෂ්‍යත්වය ලැබූ සැමගේම වගකීමකි. එය සමාජ යහපත සිදුකරන්නක් වීම අනිවාර්ය වේ. "මානව සංහතියේ යහපත ඇතිවීම, හොඳය" යන්න ආචාර විද්‍යාවේ ද මූලික සිද්ධාන්තයකි. පිළිගැනීමයකි. බෞද්ධ දර්ශනයේ ද යෝජිත යහපත් මාර්ගය එයයි.

යමෙකු විසින් සිදුකරනු ලබන කායික, වාචසික, මානසික ක්‍රියා තමන්ටත් හිතකරනම්, එය ඉටුකළයුතු මානව යුතුකමකි. බෞද්ධ දර්ශනයට අනුව එය කුසලයකි. මෙම ක්‍රියා තම බුද්ධිය මෙහෙයවීමෙන් (හෘදසාක්ෂියට අනුව) ද, උගතුන්ගෙන් අසා දැනගෙන (ලෝක දෘෂ්ඨිය අනුව) ද, ධර්මයට අනුව ඊට ගැළපෙන අයුරින් ද කළ යුතු වේ. ඒ සියල්ල කළ යුත්තේ, තමා උපමාවට ගෙන බව වෙළුද්වාර සූත්‍රයේ "අත්තානං උපමංකත්වා" යන පාඨයෙන් ප්‍රකාශිතය. ස්වාර්ථය මෙන්ම පරාර්ථය උදෙසා ද කටයුතු කිරීම උචිත බව බුද්ධ දේශනාවයි. ඒ අනුව යමින්, යම් කෙනෙක් පරාර්ථ චර්යාවේ යෙදේනම්, ඒ තැනැත්තාට මෙලොවත් පරලොවත් සතුට, සැනසීම ලැබී අවසානයේ "නිවන් සැප" ළඟාකර ගැනීමේ භාග්‍ය උදාවන්නේය.

"යමක් කොට පසුතැවෙන්නට නොවේද ? යමක විපාකය ප්‍රීතියෙන් හා සොම්නසින් යුක්තව විඳිය හැකිද ? එබඳු දේ කිරීම යහපත්ය." යනු බුද්ධ දේශනාවයි.

තංච කම්මං කතං සාධු - යංකත්වා නානු තප්පති
යස්ස පතීතො සුමනො - විපාකං පටි සේවති

යහපත් දෙයට "හොඳ" යයි කීමේ වරදක් නැත. අගය කළයුතු දේ ඇගයීම බුදු ගුණයකි. එසේනම්, අපි කවුරුත් "මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම" ගෙනයන උතුම් සත්කාර්යය මුළු හදවතින්ම අගනා කාර්යයක් ඉටුකරන මා හැඟි සංවිධානයක් බැවින් එහි සේවය අගයමු. එහි බර කරට ගෙන, මූලිකව ක්‍රියා කරන සීතා නන්දනී ගුණතිලක ගුරු මාතාව, දරු සෙනෙහසින් ඔද වැඩී ගිය උතුම් මවකි. අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ උසස් අධ්‍යාපනය උදෙසා එම පදනම පිරිනමන ද්‍රව්‍යමය හා මූල්‍යමය පරිත්‍යාග මිල කළ නොහැකි තරම්ය. ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනම මගින් ආරම්භ කරන ලද ශිෂ්‍යාධාර වැඩපිළිවෙල, තවදුරටත්

පුළුල් කරමින්, දිළිඳු පවුල්වලට සහනාධාර බෙදාදීම, ශ්‍රව්‍ය - දෘෂ්‍ය ආබාධිත වූවන්ට උපකරණ බෙදාදීම, අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට පොත්පත් - ඇඳුම් පැළඳුම් - ආහාර පාන ආදිය බෙදාදීම වැනි පින් වැඩෙන, යසස් වඩන, කුසල් රැස්වන පින්කම් **මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම** මගින් කර ගෙන යෑම ප්‍රශංසනීය ය. මෙවැනි හපන්කම් කිරීමට ඉඩ ලැබෙන්නේ අතළොස්සකට පමණි. එම අවස්ථාව උදාකරගෙන විවිධ පරිත්‍යාග ශීලීන්ගේ ද ආධාරෝපකාර ගෙන, තම කාලය, ශ්‍රමය, ධනය වැය කරමින් ගෙන යන මෙම පරෝපකාර සේවාව ඉදිරියටත් සාර්ථකව කරගෙන යෑමට එම ශිෂ්‍යාධාර පදනමට ශක්තිය, ධෛර්යය සහ වාසනාව තව තවත් වැඩි දියුණු වේවායි ද ප්‍රාර්ථනා කරමු.

"සබ්බේ සත්තා භවන්තු සුඛි තත්ථා"

රුවන් ඩී අරත්තනගේ
බුදුසරණ පත්‍රයේ හිටපු ප්‍රධාන කර්තෘ,
(දිවයිනටම සාම විනිසුරු)

විකාශිත විශේෂ ව්‍යාපෘති
The Expanded Special Projects.

සතුටු කඳුළින් ගමක් තෙත් වෙයි.

දිළිඳු පවුල්වලට සහනාධාර බෙදාදීමේ ව්‍යාපෘතිය ද ක්‍රියාවට නංවමින් කඨෝර වූ වියළි කාලගුණික තත්වයන් හමුවේ දැඩි පීඩනයට පත් අසරණ ජනතාව සොයා ගියෙමු. අප තථාගත සම්බුදුරජාණන් වහන්සේ අසරණ ජනතාවට පිහිටවීම සඳහා ගම් නියම් ගම් සැරිසරා පා ගමනින් වැඩම කළ සේක. උන්වහන්සේගේ අනුගාමික අප මහා සංඝරත්නය ප්‍රතිපත්ති පූජාවනට නිසි මග පෙන්වමින් සත්පුරුෂ පරිත්‍යාගශීලීන් යහමගට යොමු කරයි.

ක්‍රමවත් ලෙසින් මෙවන් ව්‍යාපෘතියක් දියත් කිරීමේදී ද පැන නගිනා සම්බාධක අපමණය. සුදුසු ගම්වැසියන් පිරිසක් සොයා ගැනීමේ පටන් සහනාධාර පුඟද්ජයන් බෙදාදීම දක්වා වූ කාර්යභාරය ඉතා විධිමත් වූයෙන් සියළුම අනුග්‍රාහක භවතුන් ලැබුවා වූ නිරාමිස සතුට අපරිමිත ය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇලයාපත්තුව අංක 288 ග්‍රාමසේවා වසමට අයිති, මහා ඇහැටුවැව තුලානේ ඉහළ ඔයාමඩුව නම් වූ ගම්මානය මෙම පරිත්‍යාග සඳහා තෝරා ගැනිණි. එය කුඩා ඇහැටුවැව, පානක්කා වැව, කුඩා වැලි වැව සහ ඇත්පැටියාව යන අති දුෂ්කර වූ කුඩා ගම්වලින් සැදුම්ලත් දිළිඳු ගම්මානයකි. එහි වූයේ පවුල් ඒකක 63 කි. පවුලේ සාමාජික සංඛ්‍යාව, ඔවුන්ගේ වයස් සීමාවන් සහ ස්ත්‍රී පුරුෂ භාවයද සැලකිල්ලට ගනිමින් ඇඳුම්පැළඳුම්, වියළි ආහාර ද්‍රව්‍ය, අභ්‍යාස පොත් පෑන් පැන්සල් ආදිය මෙන්ම මූල්‍යමය ආධාර ද සපයමින්, සිදු කළා වූ එම සහන සේවාව වෙනුවෙන් ගම්වැසියෝ ප්‍රතිචාර දැක්වූයේ ඔවුන්ගේ සංවේදී හදවත් තුළින් අව්‍යාජව පැන නැගී දෙනෙතින් රූරා හැලුණු උණු කඳුළු කැට ඇඳිවතින් පිස දමමිනි.

ස්වාමීන්හන්සේ නමක් කිසිදිනක එම ග්‍රාමයට වැඩම කර නොතිබුණි. සැතපුම් පහකට පමණ ඔබ්බෙන් කුඩා පන්සලක් විය. එහි එක් ස්වාමීන්වහන්සේ නමක් පමණක් වැඩ සිටිය ද කිසිදු පහසුකමක් දක්නට නොතිබිණි. අවම වශයෙන් දානය ද නිසි පරිදි නොලබන උන්වහන්සේගේ සංඝාවාසය පවා ඉතා අබලන්ව පැවතුණි. එම ස්ථානයට ද ළඟා වූ අප විසින් උන්වහන්සේ වෙත ද සහනාධාර පිරිනැමුණි.

ගහ කොළ පවා වියළී ගිය අති දුෂ්කර පරිසරක, දින ගණන් සති ගනන් කුසට නිසි අහරක් නොලබා, හෙට දිනයක් ගැන සුන්වූ බලාපොරොත්තු ඇතිව දිවි ගෙවන එම අසරණ ජනතාවට එදින දෙව්ලොවක් මැවුණා සේ විය.

සහනාධාර රැගෙන අනුරාධපුරයට ළඟා වීමෙන් අනතුරුව, අනුරාධපුර ප්‍රාදේශීය ලේකම්තුමිය අනුශාසක ස්වාමීන්වහන්සේ බැහැ දැකීම පිණිස අප නවාතැන් පහසුකම් සපයාගත් වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සංචාරක බංගලාවට පැමිණි අවස්ථාව ... (1999 ජුනි 29)

සහනාධාර බෙදාදීම සඳහා ග්‍රාමසේවක මහතා විසින් සූදානම් කර තිබූ සෙවණ සහිත එළිමහන් භූමි කොටස.

ඉහළ ඔයාමඩුව ගම්මානයට ප්‍රථම වරට වැඩම කරවනු ලැබූ උතුම් මහා සඟ රුවන විසින්, ගම්වාසීන් සැවොම තිසරණ සහිත පංචශීලයෙහි පිහිට වූ මොහොත.

ලේඛනගත තොරතුරුවලට අනුව ගෘහමූලිකන් අතට සහනාධාර බෙදාදුන් අයුරු ...

පූජ්‍යපාද මිරිස්සේ ධම්මික ස්වාමීන්වහන්සේට වැඳ නමස්කාර කොට තම දරු පවුල සඳහා වූ සහනාධාර පුදානයක් ලබා ගන්නා අසරණ ගෘහ මූලික පියෙක් ...



සහනාධාර පුදානයක් හදපිරි සතුටින් දෝතට ලබාගන්නා, පිය සෙනෙහස අහිමි අසරණ දරු පවුලක ගෘහ මූලික මවක් ...

පූජ්‍යපාද තල්පත්වැව සද්ධාතිස්ස ස්වාමීන්වහන්සේට වැඳ නමස්කාර කොට තම දරු පවුල සඳහා වූ සහනාධාර පුදානයක් ලබා ගන්නා අසරණ පියෙක් ...

දුෂ්කර පාසල්වලට නවෝදයක්

දයාබර. ගුණබර. අම්මා කෙනකු නිරතුරුවම තම දරුවා පිළිබඳව අනාගත සිහින දකිමින් දරුවා නිසි මගට යොමු කිරීම සඳහා කැප වෙයි. ස්ථානෝචිත ප්‍රඥාව, අප්‍රමාදී බව. වීර්යය සහ අධිෂ්ඨානය වැනි ගුණාංග අභිමතාර්ථ සාධනය සඳහා මාහැඟි දායකත්වයක් සපයයි. සිය දහස් ගණනකට මවක් බඳු පාසල් මාතාව ස්වකීය දරු පරපුර වෙනුවෙන් එලෙසින්ම කැපවන්නේ නම් එම දරුවන් ද සමෘද්ධියේ ජය කෙහෙළි නංවමින් මුලු මහත් සමාජම සුවඳවත් කරයි. එවන් දරු පිරිසක් බිහි කරවනු වස් පාසලක ප්‍රධාන භූමිකාව විදුහල්පති සතුවීම ස්වාභාවික ය.

තම පාසලෙහි අඩුපාඩු දෙස නිරතුරුවම අවදියෙන් සිටින විදුහල්පතිවරුන්, රජයෙන් ම සියල්ල සම්පූර්ණ වනතුරු බලා නොසිටියි. යහපත් චේතනාවෙන් යුතුව පාසලට ආධාරයක් ලබාගත හැකි කුමන හෝ සංවිධානයක් වේ නම් ඒ පිළිබඳව සොයා බලයි. සියලුම දරුවන් තම දරුවන් සේ සලකන, පාසල තම ප්‍රාණ වායුව සේ සලකන, පාසලේ උන්නතිය වෙනුවෙන් මහත් සේ ඇප කැපවීමෙන් කටයුතු කරන, විදුහල්පතිවරු අද විරල වුවද වත්මන් සමාජයේ නැත්තේ නොවේ. බෝසත් දරුවන් සමාජයට දායාද කිරීමට ඉතාමත් නිහඬව, විමසිලිමත්ව. දූරදර්ශීව කටයුතු කරන විදුහල්පතිවරුන් ලක් මාතාවට ආශිර්වාදයකි.

එවන් විදුහල්පතිවරු සිව් දෙනෙකු තම පාසලෙහි උන්නතිය පිළිබඳව මවන්නා වූ සිහින යථාර්ථයක් බවට පත්කරවීම සඳහා දයකත්වයක් ලබාදීමට ගතවූ තුදුස් වසර තුළ අපි භාග්‍ය සම්පන්න වීමු. පාසලක මූලික අත්‍යාවශ්‍ය අංගයක් වන පුස්තකාලයක ඇති අඩුව සපුරාගත නොහැකිව කවරකුගේ හෝ පිහිටක් අපේක්ෂාවෙන් සිටින විදුහල්පතිවරු, නිරතුරුවම ප්‍රසිද්ධ ජනමාධ්‍ය කෙරෙහි ද අවධානය යොමු කරමින් ලද හැකි අවස්ථා පිළිබඳව විමසිලිමත් වෙති. **දුෂ්කර පාසල්වලට පුස්තකාල පොත් ලබාදීමේ ව්‍යාපෘතිය** ද ක්‍රියාවට නැංවීමේ අරමුණෙන් අප විසින් පළකරනු ලැබූ පුවත්පත් දැන්වීම කෙරෙහි විදුහල්පතිවරු ගණනාවකගේ ම අවධානය යොමුවී තිබුණි. ලැබුනාවූ ඉල්ලුම්පත් සංඛ්‍යාව සියයකට ආසන්න විය. ඒ සා විශාල සංඛ්‍යාවකගේ බලාපොරොත්තු ඉටු කිරීමට අප සතු සම්පත් ප්‍රමාණවත් නොවුන ද, සම්බුදු වදනට අනුව යම් පමණකින් හෝ ඔවුන්ගේ බලාපොරොත්තු ඉටුකිරීමේ අරමුණෙන්, අප ගෞරවණීය අනුශාසක ස්වාමීන්වහන්සේගේ අධීක්ෂණය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දිවයිනේ අති දුෂ්කර ප්‍රදේශයන්හි සම්පත් අවම පාසල් හතරක් තෝරා ගන්නා ලදී. පරිත්‍යාගශීලී අනුග්‍රාහක කල්‍යාණ මිතුරන්ගෙන් පුස්තකාල පොත් සඳහා ලැබුනා වූ ප්‍රතිපාදන, උපරිම පොත් සංඛ්‍යාවක් සඳහා පමණක් ම වැය කරමින්, ප්‍රවාහන කටයුතු ද අප සතුව තිබූ පුද්ගලික සම්පත් යොදාගනිමින් සාර්ථක ලෙස නිමා කර ගත්තෙමු.

එම පාසල්වල අවශ්‍යතාවයන්ට සරිලන පරිදි විදුහල්පතිවරුන්ගෙන් ම ලබාගත්තා වූ ග්‍රන්ථ නාමාවලියන්ට අනුව එක් පාසලකට ග්‍රන්ථ **330** බැගින් මිලයට ගෙන නොයෙකුත් සම්බාධක මැද කුඩා මෝටර් රථයකින් දින ගණන් වැය කරමින් සැතපුම් ගණන් දුර ගෙවා සිදු කරනු ලැබූ මෙම උත්තරීතර පරිත්‍යාගය තුළින් ලද එලදායිතාව, පරිත්‍යාගශීලී හදවත් තුළ ජනිත කරවනු ලැබුවේ නිරාමිස සතුටක් හා බැඳි නොමියෙන සිහිවටනයකි.

තෝරාගනු ලැබූ පාසල්වල විදුහල්පතිවරුන් විසින් කරනුලැබූ අමතර ඉල්ලීම් කෙරෙහි ද සුභවාදී ලෙසින් ප්‍රතිචාර දැක්වූ අනුශාසක ස්වාමීන් වහන්සේ විසින් එක් පාසලකට පරිගණක යන්ත්‍රයක් ද, තවත් පාසලක දරිද්‍රතාවෙන් පීඩිත දක්ෂ සිසු දරුවන් තිදෙනෙකු වෙනුවෙන් ස්ථාවර තැන්පතු ද අනිකුත් පාසල් දෙකට පුස්තකාල පොත්වලට අමතරව පෑන්, පැන්සල්, අභ්‍යාස පොත් වැනි ලිපිද්‍රව්‍ය ද පරිත්‍යාග කිරීමට තීරණය කරන ලදී.

බදුල්ල, කෑගල්ල, හම්බන්තොට සහ අනුරාධපුර යන දිස්ත්‍රික්ක වලින් තෝරාගනු ලැබූ මෙම පාසල්වල දහසක් දුෂ්කරතා මැද ඉගෙනුම ලබන සිසු දරුවන්ට එදා පරිගණකය සිහිනයක්ව පැවතුණි. අනුරාධපුර, පිහිඹියගොල්ලෑව, අඹගහවැව විද්‍යාලය ඇතුළු පාසල් කිහිපයකටම **ලිපිද්‍රව්‍ය සහ පුස්තකාල සඳහා ග්‍රන්ථ 330 බැගින් තිළිණ කෙරිණි.**

බදුල්ල හාලිඇළ උඩුවර මහා විද්‍යාලයට 2001 වසරේදී පුස්තකාල පොත් සහ පරිගණක පරිත්‍යාගය සිදුකළ දා ....

විදුහල්පතිනිය විසින් බුලත් හුරුල්ලක් පුදා අනුශාසක ස්වාමින්වහන්සේ පිළිගැනීමෙන් අනතුරුව සිසු දරුවන්ගේ පිළිගැනීමේ ගීතයට ප්‍රතිචාර දක්වමින් ......

විද්‍යාලයීය ශිෂ්‍ය නායිකාව වෙත පුස්තකාල පොත් පරිත්‍යාග කරමින්..........

විද්‍යාලයීය ජ්‍යෙෂ්ඨ අංශ භාර ගුරු පියාණන් වෙත පරිගණක පරිත්‍යාග කරමින් ....

විද්‍යාලයීය නියෝජ්‍ය විදුහල්පතිතුමා ස්තුති කතාව පවත්වමින් ...

කෑගල්ල අරුග්ගම්මන මහා විද්‍යාලයට 2001 වසරේදී පුස්තකාල පොත් පරිත්‍යාගය සිදුකළ දා .... (සිසුන් තිදෙනෙකු වෙනුවෙන් රුපියල් 3000 ස්ථාවර තැන්පතු ද ඇරඹුණ අතර ස්වේච්ඡා ගුරු මහත්මියකගේ සේවය ද ඇගයිණි).

සියලුම පුස්කාල පොත් ප්‍රවාහනය සඳහා යොදාගත්, අධ්‍යක්ෂතුමියගේ පවුලේ පුද්ගලික කුඩා මෝටර් රථය ..... කෑගල්ල අරුග්ගම්මන මහා විද්‍යාලයට ළඟා වූ දා ....

අරුගම්මන මහා විද්‍යාලයීය ශිෂ්‍යයින් සංස්කෘතික වටිනාකමින් යුත් රංගන කුසලතා එළිදක්වමින් පිළිගැනීමෙන් අනතුරුව..... පුස්තකාල පොත් පරිත්‍යාගය ඇරඹුණ වගයි.

කෑගල්ල අරුගම්මන මහා විද්‍යාලයීය ආචාර්ය මණ්ඩලය.... ශිෂ්‍යත්ව පදනමේ අනුශාසක ස්වාමීන්වහන්සේ සහ අධ්‍යක්ෂතුමිය සමග ඡායා රූපයකට මුහුණ දෙමින් ... (2001 ජුනි 11)

හම්බන්තොට ගොඩවානාගොඩ මහා විද්‍යාලයට 2001 වසරේදී පුස්තකාල පොත් පරිත්‍යාගය සිදුකළ දා ....

පුස්තකාල පොත් පුරවාගත් පුද්ගලික කුඩා මෝටර් රථය ...... හම්බන්තොට ගොඩවානාගොඩ මහා විද්‍යාලයට ළඟා වූ දා ......

ගොඩවානාගොඩ විදුහලේ විදුහල්පතිතුමා සමග මොහොතක පිළිසඳරක් ......

පුස්තකාල පොත් ප්‍රදානයට මොහොතකට පෙර අනුශාසක ස්වාමීන්වහන්සේ අරමුණු පැහැදිලි කරමින් ....

ආචාර්ය මණ්ඩලයේ ගුරු පියෙක් විද්‍යාලයීය කෘතඥතාව පලකරයි.

ආබාධිත සරණ සේවය ...

ව්‍යාප්ත වීගෙන යන සහන සේවාවන්ගේ මීළඟ ඉලක්කය වූයේ අසරණ ජනතාවයි. අත් පාවල ඇති වටිනාකම නිසි අයුරින් අවබෝධ වන්නේ අත් පා නැති වූ විටය. පෙර පිනැතිව ශරීර අඟෝපාංගයන් නිසි ලෙස ලබා උපන් මිනිසා ඒවා අනිසි ලෙස නපුරට යොදන්නේ එහි අගය නොදන්නා කමින්ම ය. කර්මානුරූපව ඇතැම්හු උපතින්ම අත් පා අහිමිව උපදී. ඇතැමුන්හට ජීවිත කාලය තුළදී අඟ පසඟ අහිමි වී යයි. අංග විකලත්වයකින් තොරව මෙවන් බුද්ධෝත්පාද කාලයක මනුෂ්‍යත්වයක් ලැබීම කෙතරම් ශ්‍රේෂ්ඨද ?

සම්පත් ඇත්තෝ සම්පත් නැත්තන්ට උදව් උපකාර කළ යුතුමය. එම සම්පත් ගලනය ආර්ථික වශයෙන් මෙන්ම භෞතික, ශාරීරික සහ අධ්‍යාත්මික වශයෙන් විය හැක. අත් පා ඇත්තෝ අත් පා නැත්තන්ට පිහිට නොවන්නේ නම් ඒ අත් පා වලින් ඇති ඵලය කුමක්ද ? ඇස් කන් නැත්තන්ගේ දුක් වේදනාව ඇස් කන් ඇත්තන්ට නොදැනේ නම් ඒ අංගෝපාංගයන්ගේ ඇති ඵලය කුමක්ද ?

ස්වභාව ධර්මය විසින් යමෙක් වෙත යම් සම්පතක් උරුම කර දී ඇත්තේ එය තුදෙක් ස්වයං පරිභෝජනය සඳහා ම නොවේ. පොදු යහපත වෙනුවෙන් ද යොමු කළ යුතුමය. කුමන සම්පතක් ලැබුවේ වුවද සියල්ල ත්‍රිලක්ෂණයට යටත්ය. අටලෝ දහම කාහටත් පොදුය. අද ඇති දෙපා හෙට අහිමි විය හැක. ඒ සියල්ල යථාපරිදි අවබෝධ කරගත් සිදුහත් කුමරා උපභෝග, පරිභෝග, භවබෝග ආදී සියලු සැප සම්පත් වලින් ආඪ්‍ය ව සිටියද, ඒ කාමභෝගී ජීවිතය තුළ ලද හැකි සියලු ලෞකික සැප අත් හැර දමා සමස්ථ ලෝක සත්වයා කෙරෙහි පතළ වූ මහා කරුණාවෙන් යුතුව සය අවුරුද්දක් පුරා කෙතරම් දුක් වින්දේද යන්න විචාර බුද්ධියකින් යුතුව සිදුහත් චරිතය දෙස නෙත් යොමු කරන්නෙකුට මනාව අවබෝධ වනු ඇත. එම ශ්‍රේෂ්ඨ ජීවිතය තුළ ගැබ්ව ඇති උදාර ආදර්ශයන්ගෙන් බිඳක්වත් අප ලද මේ මිනිස් භවය තුළදී අප තුළ පුරුදු පුහුණු කරවීමට සිතක් පහළ නොවන්නේනම් එය කෙතරම් අභාග්‍යක් ද ? සියලු සම්පත් අතහැර දැමීමට තරම් පෘථග්ජන අප අධ්‍යාත්මික වශයෙන් ශක්තිමත් නැත. එහෙත් අවම වශයෙන් සම්පත් පරිභෝජනය කිසියම් සීමාවකට යටත් කොට කරුණාව, දයාව, මෛත්‍රියෙන් යුතුව මොහොතකට හෝ දුක් කඳුලකට සැනසුම් සුවයක් දිය හැකි නම් එතුළින් අප්‍රමාණ සැනසීමක් ලැබෙනු ඇත.

තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති
යස්ස පතීතෝ සුමනො - විපාකං පටිසෙවති

(බුදුන් වහන්සේ .. ධම්මපදය)

(යමක් කොට පසුතැවෙන්නට නොවේද, යමක විපාකය ප්‍රීතියෙන් සහ සොම්නසින් යුක්තව විඳිය හැකිද, එබඳු පුණ්‍ය කර්ම කිරීම යහපත්ය).

That deed is well done after doing which there is no repentance and the consequence of which can be borne with satisfaction and pleasure.

ආබාධිත අසරණ ජනතාව කෙරෙහි අවධානය යොමුකරන සත්පුරුෂයින් මෙය අත්දකිනු ඇත. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ අවබෝධයෙන් සරණ යන්නෙකුට මෙම ශ්‍රී සද්ධර්මයේ සත්‍යය අත්දැකිය හැක. එහෙත් එය ප්‍රඥාවට සාපේක්ෂ ය.

"පඤ්ඤවන්තො අයං ධම්මෝ නායං ධම්මෝ දුප්පඤ්ඤස්ස"

යනුවෙන් අංගුත්තර නිකායේ බුදු වදනින් පෙන්වා දී ඇති පරිදි මෙම ධර්ම ය ප්‍රඥාවන්තයින්ට විනා අන්ධ බාලයින්ට නොවේ. බුදු දහමේ ගැබ්ව ඇත්තේ ආශ්චර්යමත් සංසිද්ධීන්ම ය.

සමාජ සත්කාරයන් අතරට ආබාධිත සරණ සේවයද එක් කරමින් ආරම්භක පරිත්‍යාගය දියත් කළෙමු. අංශභාග රෝගයට ගොදුරුව දෙපා අප්‍රාණික වූ හෝ දෙපා අහිමි වූ හෝ ආර්ථික අපහසුතාවන්ගෙන් පීඩිත කාන්තාවක් සඳහා සියලුම අංගෝපාංගයන්ගෙන් යුත් රෝදපුටුවක් මෙම පරිත්‍යාගය සඳහා වූයෙන්, සුදුස්සෙකු තෝරාගැනීමේ ක්‍රියාපටිපාටියට එළඹුණි. පුවත්පත් මගින් ඒ සඳහා ද විවෘතව ඉල්ලුම් පත් කැඳවූ අතර, දිවයිනේ නන් දෙසින් ලැබුනාවූ ඉල්ලුම් පත් සංඛ්‍යාව සියයකට ආසන්න විය. සියල්ලෙහිම ආර්ථික පසුබිම අදාළ ග්‍රාම නිලධාරී මගින් අනුමත වී තිබුණි. එහෙත් සත්‍යතාව වඩාත් තහවුරු කරගැනීම සඳහා ප්‍රදේශයේ විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේගේ නිර්දේශය අපේක්ෂා කිරීමේ ප්‍රතිඵලයක් ලෙසින් ඉතාමත් සාර්ථක ලෙස මෙම රෝද පුටුව පරිත්‍යාගය සඳහා සුදුසු අයෙකු තෝරා ගතිමු. සියලු කරුණුවල සත්‍යතාව වඩාත්

තහවුරු කරගැනීම පිණිස දරිද්‍රතාව හඹා ගියෙමු.

ඇය උපතින්ම අත් පා කොර වූ මැදි වියේ මව් තුමියකි. මුළු ජීවිත කාලයම අනුන්ට බරක් වෙමින්, ආර්ථික පීඩාවන් මැද, ජීවත්වීම සඳහා ආවරණයවූ කාමරයක් පවා නොමැතිව කල්ගෙවූ ඇයට, අඩුතරමින් පොහොය දිනයටවත් පන්සලට යාමට නොහැකි වූ බව ප්‍රකාශ කරන්නට වූයේ මහත් සංවේගයෙනි. එහෙත් ඇය දිරිය මවකි. වැස්සකටවත් පාසලකට ගොඩවී නැතැයි කියන ඇය කාව්‍ය නිර්මාණයෙහි දස්කම් පෙන්වූවා ය. එහෙත් අකුරු ලිවීමට පන්හිඳ ඇඟිලි අතරේ රැඳවීමට ඇයට නොහැක. අකුරු හඳුනාගෙන ඇත්තේ ඉවත දමන පත්තර කැබලි එකතුකර තබාගෙන වදනින් වදන කවරකුගෙන් හෝ අසා දැන ගෙනය. ඇය විසින් හිටිවන නිර්මාණය කරන කවි ඥාති මිණිබිරියක් ලවා ලියවා අප විසින් කරනලද පරිත්‍යාගයනට සිය කාව්‍යමය නිර්මාණයකින් ස්තූති කිරීමට ද ඇය අමතක නොකළාය.

දුක්ඛිත ලෙස දිවි ගෙවූව ද දිරිය මවක් වූ ඇය පොත් කියවීමෙහි මහත් රුචිකත්වයක් දක්වයි. අප විසින් සම්පාදිත **"මා පිය ගුණ සමර"** නම් වූ ශ්‍රේෂ්ඨ පියතුමකුගේ චරිතාපදානය, ඇය හමුවට ගිය පළමු දිනයේදීම අප විසින් ඇයට පරිත්‍යාග කෙරිණි. එය එක හුස්මට කියවා අවසන් කළ බව ප්‍රකාශ කළ ඇය, එවන් පියතුමකුගේ දියණියක් විසින් තමා වෙත පරිත්‍යාග කෙරෙන රෝද පුටුවට හිමිකම් කීමට තරම් ඇය භාග්‍ය සම්පන්න වීම පිළිබඳව සතුට ප්‍රකාශ කළාය. රෝද පුටු පරිත්‍යාගය අවසන් වන තුරුම **"මා පිය ගුණ සමර"** නම් වූ එම ශ්‍රේෂ්ඨ ග්‍රන්ථය ඇගේ ඇඟිලි තුඩු අතර රැඳී තිබෙනු අපි දුටුවෙමු. සංසාර සාගරයෙන් එතෙර වීමට ඇති එකම මඟ ශ්‍රී සද්ධර්මය බව ඇයට අවබෝධ වී තිබුණෙන්, ඇයගේ මූලික අරමුණ වූයේ තෙල්, මල්, පහන්, රැගෙන එදින ම සැදෑ සමයේ රෝදපුටුවෙන් පන්සල වෙත යාමයි.

මෙම පරිත්‍යාගය ද වඩාත් විධිමත් ලෙසින් සිදුකිරීමට සියලු පියවර ගත්තෙමු. හෝමාගම ප්‍රාදේශීය ලේකම්තුමා දැනුවත් කිරීමෙන් අනතුරුව, සිද්දමුල්ල ග්‍රාමසේවා නිලධාරි මගින් පරිත්‍යාගය සිදුකරන ස්ථානයේ අවශ්‍ය පසුබිම සැකසුණි. අනතුරුව **සිද්දමුල්ල ශ්‍රී සංඝාරාම පුරාණ විහාරාධිපති කිරුළපනේ සෝමානන්ද අනුනායක හිමිපාණන්** සහ අප ගෞරවණීය **අනුශාසක ධූරන්ධර ආචාර්ය මිරිස්සේ ධම්මික ස්වාමීන්වහන්සේ** එම ස්ථානයට වැඩම කරවා සෙත් පිරිත් සජ්ඣායනා මධ්‍යයේ පරිත්‍යාගය සිදු කෙරිණි. නමින් රොසලින් නෝනා නම් වූ එම ආබාධිත මව්තුමිය වෙත රෝද පුටුවට අමතරව වියළි ආහාර ද්‍රව්‍ය මෙන්ම මුදල් ද පරිත්‍යාග කරමින් ලැබුවා වූ පුණ්‍ය සම්භාරය, **අභාවප්‍රාප්ත විශ්‍රාමලත් විදුහල්පතිනි ලෝරා පෙරේරා හෙට්ටිආරච්චි මැතිනිය** වෙත අනුමෝදන් කරවන්නට වූයේ, මෙම පරිත්‍යාගයේ පූර්ණ දයකත්වය එතුමියගේ දියණිය විසින්ම දැරූ හෙයිනි.

හිසට නැත නිසි සෙවණ වැස්සට -
ගලා යයි දිය කඳක් ගේ මැද

ජනෙල් දොරවල් විවර මීස නැත
වසා තබනට පියන් නිසි ලෙද
යහන ඇති මුත් එයද අබලන්
කොට්ට මෙට්ට ද නොමැත ඇය ලඳ
නිවස දක්නට රූපරාමුව
පමණි ඇත්තේ අප විසින් ලද

මෙලෙසින් අසරණ වූ මවක් තම මව් මෙන් දැකිය හැකිනම්, අසරණ වූ පියෙක් තම පියා මෙන් දැකිය හැකිනම් මුළු ලොවම සුවපත් නොවන්නේද? ගෞරවණීය ස්වාමීන්වහන්සේගේ අනුශාසනා හමුවේ දෙනෙතින් ගලා හැලෙන්නට වූ කඳුළු කැට මගින් සංකේතවත් වූයේ දරිද්‍රතාව හඹා යමින් අප ලද තෘප්තියයි ඉතා අර්ථවත් ලෙස සකස් කර තිබූ පුණ්‍යානුමෝදනාත්මක කාව්‍යමය ස්තූති පත්‍රය ඥාති මිනිබිරියක් විසින් ප්‍රකාශයට පත්කරවීමෙන් අනතුරුව ඇයගේ කුසලතාවන් සහ ධෛර්ය පිළිබඳව අපි වඩාත් පැහැදුනෙමු. එහි ප්‍රතිඵලයක් ලෙසින් ඇයගේ දෙවන ඉල්ලීම කෙරෙහිද යහපත් ලෙස ප්‍රතිචාර දක්වමින් සිය අබලන් වූ නිවසේ දිරාගිය වහළය අලුත්වැඩියා කිරීම පිණිස ප්‍රමාණවත් දැව තොගයක් ද පරිත්‍යාග කළෙමු.

ධර්මය තුළින් සැනසීමට මෙවන් අපමණ අවස්ථා සමාජයේ ඇත, එහෙත් මෙම භවය සුරඟන ලොවක් යැයි සිතා ලෞකික සැප සම්පත් පසුපස හඹා යන, රාගාදී කෙලෙස් වර්ධනය කෙරෙන රූපරාමු, ටෙලිනාට්‍ය වැනිදේ නරඹමින් කාලය විනාශ කර දමන, අත්තනෝමතික ව පසිඳුරන් පිනවීමේ දීන රුචිකත්වයන් ගෙන්

වියරු වැටී ඇති, මිනිස් ගුණ සුවඳ නොහඳුනන අන්ධබාලයින්ගේ දර්ශන පථයට මෙම සජීවී දර්ශන හසු නොවනු ඇත.

ආබාධිත වුවද, අසාධාරණ ලෙස උපයන සල්ලාලයින්ගේ සම්පත් වලින් සහන ලැබීමට තරම් ඔවුන් අභාග්‍යසම්පන්න වී නැත. ඔවුන් හසුවන්නේ පෙර පින් ඇති සත්පුරුෂ ජනතාවගේ අවධානයට පමණක් බව අපට ප්‍රත්‍යක්ෂ විය.

රෝද පුටුවක් ගැන සිහින මවමින් අසරණව දිවි ගෙවන ආබාධිත මව් තුමියක් ... දොර ජනෙල් පියන් පවා නැති අබලන් නිවසක සිය කාමරය තුළ ගතකරන ජීවිතය කැමරා ඇසින්

10

වණි 2006 ක්වූ ජූලි මය

රෝද පුටුවක් දෙන්න සූදානම්

අංශභාග රෝගයට ගොදුරුව දෙපා අප්‍රාණික වූ හෝ දෙපා අහිමි වූ, ආර්ථික අපහසුතාවන්ගෙන් පීඩිත වැඩිහිටි කාන්තාවක් සඳහා සියලුම අංගෝපාංගයන්ගෙන් සමන්විත රෝද පුටුවක් පරිත්‍යාග කිරීමට ඇත. පවුලේ සියලුම තොරතුරු, ග්‍රාමසේවක මඟින් සත්‍ය බවට සහතික කර ප්‍රදේශයේ විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේගේ නිර්දේශය ද ඇතිව ශ්‍රී ලංකා සම-බන්ධීකරණ ලේකම් - සීතා ගුණතිලක, ශ්‍රී ලංකා කැනඩා මිත්‍රත්ව පදනම, 392/2, පෙරේරා මාවත, කොටුවේගොඩ, රාජගිරිය යන ලිපිනයට යොමු කරන්න.

පරිත්‍යාගය සිදු කිරීමට සූදානමින්.... ආබාධිත මව්තුමිය දිවි ගෙවන නිවහනට මහා සංඝ රත්නය වැඩම කල මොහොත

කොළොම්පුර

2006 ඔක්තෝබර් මස 31 වැනිදා අඟහරුවාදා

ශ්‍රී ලංකා-කැනඩා මිත්‍රත්ව පදනමෙන් රෝද පුටුවක්

දෙපා වාරු නැති ආබාධිත මව රෝද පුටුව මත ඔසවා තබා, දෙපා පුටුව මත පිහිට වූ අයුරු.........

"මා පිය ගුණසමර" ග්‍රන්ථය ද අතැතිව මහත් වූ භක්තියෙන් යුතුව සෙත් පිරිත් ශ්‍රවණය කිරීමට සූදානමින්.

උතුම් ත්‍රිවිධ රත්නයේ ආශිර්වාද ලැබූ ආබාධිත මව් තුමිය, තමා විසින් නිර්මිත කාව්‍ය සංග්‍රහයකින් සිය කෘතඥතාව පළ කරවූ අයුරු....

මානව දයාවෙන් පිරි සතුට

ආබාධිත අසරණ අයෙකුට පිහිට වීමේ චේතනාවෙන් මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම් පරිශ්‍රය වෙත පියනැගූ සත්පුරුෂ ගුරු මාතාවක් කාර්යාලය තුළ වූ ඡායාරූප දෙස නෙත් යොමු කරන්නට වූයේ පහන් වූ සිතිනි. අනතුරුව තම චිත්ත සන්තානයේ උපන් අරමුණු ඉටුකරගැනීම සඳහා විමසිලිමත් වූවාය. තමාට ද රෝද පුටුවක් පරිත්‍යාග කිරීමේ සුපසන් චේතනාවක් පහළ වී ඇති බවත් ඒ සඳහා අවස්ථාවක් ලබා දිය හැකි නම් එය මහත් සේ අගය කරන බවත් ප්‍රකාශ කෙරිණි.

2010 වසර ''**මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම**'' මගින් තෝරාගනු ලැබූ කායික අශක්නුතාවෙන් යුත් සරසවි සිසුවෙකු පිළිබඳ ව අපගේ මතකය අවදි වන්නට විය. ශිෂ්‍යත්වය බලපවත්වන කාලසීමාව ඉකුත් වී තිබුණ ද, නිරතුරුවම කෘතඥාව පළකරමින් ශිෂ්‍යත්ව පදනම සමග සම්බන්ධ වූ ඔහු විසින් විශ්ව විද්‍යාලය තුළදී පරිහරණය කරනු ලබන රෝද පුටුවේ අබලන් තත්වය පිළිබඳව අප වෙත වාර්තාකර තිබුණි. එම අවශ්‍යතාව අප්‍රමාදීව ඉටුකරදීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කෙරිණි.

පරිත්‍යාගයට සිතක් පහළවීමත් සමග ඒ සඳහා සුදුසු පුද්ගලයෙකු සහ අවස්ථාවක් උදා වූයේද බලාපොරොත්තු නොවූ අයුරෙනි. දෙපාර්ශ්වයේම පෙර පින් මතු වූ වා සේ දැනුණි. පරිත්‍යාග කිරීමටත් පරිත්‍යාග ලැබීමටත් සුදුස්සන් "**මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම**'' ඉදිරියේ විය. බුදුරජාණන් වහන්සේගේ අවසන් වදන ද සිහිපත් විණි. අප්‍රමාදීව එම පරිත්‍යාගය සඳහා අපි යුහුසුළු වූවෙමු.

දෙපාර්ශවයේ ම නිසි දැනුවත් කිරීම් වලින් පසු කිලෝමීටර් 200 ක පමණ දුර ගෙවාගෙන, අප අනුශාසක ස්වාමින්වහන්සේ ද සමගින් මෙම උත්තරීතර පරිත්‍යාගය සඳහා පිටත්වීමු. මාතර දිස්ත්‍රික්කයේ, නරවැල්පිට කටුඉඹුල්ගහහේන නම් වූ ඉතා දුෂ්කර, ගමනාගමන පහසුකම් කිසිවක් නැති මෙම ප්‍රදේශයේ සිට උපතින්ම ආබාධිත දරුවෙකු සරසවි වරම් ලබන තෙක් අපමණ වූ බාධක මැදින් තම ජීවිත ගමන සාර්ථක කරගැනීමට දරා ඇති වෙහෙස අවබෝධ කරගැනීමට අප කිසිවකුට වදන් අවශ්‍ය නොවීය. දෛවයෙන් උරුම වූ දෙය සතුටින් භාරගෙන යායුතු ඉලක්කය කරා සිය පුතණුවන් මෙහෙයවීමට එම අහිංසක දෙමාපියන් මුළු ජීවිත කාලය පුරාම මහත් වූ වෑයමක යෙදෙයි. ඔවුන්ගේ දිරිමත් බව සෞභාග්‍යයේ සංකේතය වනු ඇත.

සෙත් පිරිත් සජ්ඣායනය සඳහා වැඩම කොට වදාළ මහා සංඝ රත්නයට දවල් දානය ද පූජා කළ ඔවුන් අප සැම වෙත දිවා ආහාරය ද සූදානම් කර තිබුණේ ඉමහත් ගෞරවයෙනි. රෝද පුටුවට අමතරව වියළි ආහාර ද්‍රව්‍ය ඇඳුම් පැළඳුම් සහ පොත් පත් වැනි දෑ ද පරිත්‍යාග කරමින් අප ද ලැබුවේ ඉමහත් සතුටකි. මහා සංඝ රත්නය වෙත පූජා කරනු ලැබූ සියලුම පිරිකර ද ආබාධිත පුතණුවන් වෙත පරිත්‍යාග කිරීමට තරම් වැඩම කොට වදාළ මහා සංඝ රත්නය කාරුණික වූයෙන් එදින ඔවුන්ගේ හදවත් සතුටින් පිරී ඉතිරී යන්ට විය. ඒ වන විට ශිෂ්‍යත්ව කාලසීමාව අවසන්ව තිබූ නමුත් විශ්ව විද්‍යාල අධ්‍යාපනයේ දෙවන වසර සඳහා ද එම ශිෂ්‍යත්වය දීර්ඝ කිරීමට එම මොහොතේම අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළහ.

උෂාන් පුතණුවන් තම මව පියා සහ නැගණියන් දෙදෙනෙකු සමග ජීවත්වන කටුඉඹුල්ගහහේන පිහිටි නිවස, සහ වැඩම කොට වදාළ මහා සංඝ රත්නයට දන් පිළිගැන්වීමට සූදානම් වන උෂාන් පුතුගේ පියාණන් ....

මහා සංඝ රත්නය විසින්, තමන්වහන්සේ වෙත පිරිනමනු ලැබූ සියලු පිරිකර, පරිත්‍යාගලාභී උෂාන් පුතු වෙතම පිළිගැන්වුණ මොහොත ...... (සිය මෑණියන් සහ නැගණියක් ද ඉදිරියෙන් අසුන් ගෙන සිටියි)

වැඩමකොට වදාළ මහ සංඝ රත්නය විසින් සිදුකරනු ලැබූ සෙත් පිරිත් සජ්ඣායනයෙන් පසු, මාපිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමේ අනුශාසක, කොළඹ ඩී.එස්. සේනානායක විද්‍යාලයේ ධර්ම ආචාර්ය ශාස්ත්‍රපති තල්පත්වැව සද්ධාතිස්ස ස්වාමීන්වහන්සේ, උෂාන් පුතුගේ උසස් අධ්‍යාපනය සහ කායික, මානසික සුවය පතා සෙත් පිරිතේ ආනුභාවය උෂාන් පුතු වෙත යොමුකළ මොහොත......

පරිත්‍යාග කටයුතු සියල්ල නිම වීමෙන් පසු නිරාමිස සුවයෙන් පසුවන පරිත්‍යාගශීලී අනුග්‍රාහක හවතුන් සහ සුපසන් හදින් යුත්, පරිත්‍යාගලාභී උෂාන් පුතණුවන් මව, පියා සහ සොහොයුරියක් සමග ....

මනාව දයාවෙන් පිරිපුන් සතුට භුක්ති විඳින, බොරැල්ල රත්නාවලී බාලිකා මහා විද්‍යාලයේ විශ්‍රාමික ආචාරිණී; මෙම පරිත්‍යාගය සඳහා පූර්ණ අනුග්‍රාහකත්වය දැරූ සුපින්වත් රංජනී කාරියවසම් ගුරු මෑණියන් සහ නවතම රෝද පුටුවක් ලැබීමට භාග්‍ය සම්පන්න වූ මාතර නරවැල්පිට පදිංචි, රුහුණු සරසවියේ දෙවන වසර ශිෂ්‍ය උෂාන් ඉන්දික පුතණුවන්.. .. ..

දිවියට අත්වැලක්

වාරු නැතිමුත් දෙපා
ඇවිද යන්නට සිතුසේ
ඔබ සතු ගුණ නුවන - විරියද දහිරියද
පසසමුය අප නිතින්
සිහිවේය සැම විටම - අහිංසක සිනා රැල්
දැනුනිද පුතුනි, නුඹ හට
අප හදවත රැඳි
මව් සෙනෙහෙ - පිය සෙනෙහෙ - සොයුරු පෙම.......
දුරු කතර ගෙවාගෙන
නුඹ වෙතට පැමිණියේ
දිවියට අත්වැලක් - දිරිය සවියද සමග
මව්පියන් වන්ට ඇති - සොහොයුරන් වන්ට ඇති
පෙර භවයන්හිදී..........
මහා කරුණා ගුණැති - මෙතින් පිරි හදක් ඇති
බුදු හිමි තිලෝගුරු
සරණ වන්නට සත හට
වැඩියේ දෙපයින්ම - ගෙවා මග බෝ ඈත.............
නිරතුරුවම අපද - කරමු යහපත් දෙයම
නොවේමයි සැප පතා - දෙව් බඹ මිනුලොව
එතෙරවන්නට භවකතර
බුදුසසුනේදීම ගෞතම..

2011.11.20

ගාල්ල ලබුදුවේ ගෙදර වත්තෙහි විසූ
එල්.බී. කාරියවසම් පියාණන් වහන්සේට සහ
එලන් මෙරායා නානායක්කාර මැණියන් වහන්සේට
පිං පිණිස
අතුරුගිරිය, පොරේ පදිංචි
මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමේ අනුග්‍රාහක
රංජනී කාරියවසම් දියණිය විසින්
2011 නොවැම්බර් 11 දින මෙම රෝද පුටුව පරිත්‍යාග කරන ලදී.

ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී



අචින්ති තම්පි භවති - චින්ති තම්පි විනස්සති

සිතූ දේ නොම වෙයි - නොසිතූ දෙයම වෙයි

ශ්‍රී සද්ධර්මයේ සත්‍යතාව මනාව අවබෝධ කළ යුතුය. උපන් සෑම සත්වයෙකුයටම මරණය නියත වූ ධර්මතාවකි. අප නැවතී සිටින්නේ තාවකාලික නැවතුම් පොළකය. මරණය අපට අවශ්‍ය පරිදි සිදු නොවේ.

උපතද එසේමය.
දරිද්‍රතාවේ සෝ සුසුම් මැද උපත ලබා ජීවිතාභියෝග මැදින් සරසවියට පිවිස ජීවතාලෝකය දැකීමට වෙර දරණ මල් කැකුළු දහස් ගණනකි. දිය බිඳක් ඉස ගුණ දහමින් පෝෂණය කරමු. එවිට ඔවුන් කිසි දිනක සමාජයට වෛර නොකරනු ඇත.

නියත වූ මරණය

මෙලොව උපන් සෑම සත්වයෙක්ම ස්වකීය උප්පත්තියත් සමග නියත වශයෙන්ම රැගෙන එන්නා වූ ධර්මතාව මරණයයි. මෙයට උගත්, නූගත්, දුප්පත්, පොහොසත් වශයෙන් වර්ගීකරණයක් නැත. ළාබාල, තරුණ, මහළු ආදී වශයෙන් වයස් සීමාවක්ද නැත. නිවස ද, මහ මග ද ආදී වශයෙන් ස්ථානයක් ද නැත. කල් ඇතිව දැනගත හැක්කේ තමා කරා ''මරණය'' එන බව පමණි. එසේ නම් අප එය භාර ගැනීමට සූදානම් විය යුතුමයි. කුමන හේතුවක් නිසා හෝ කල්දැමීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ නොහැක. මෙම මොහොතට නිර්භයව මුහුණ දීමට උසස් මනසක් ඇති මිනිසා අසමත් වන්නේ නම්, එය ලැබුවා වූ මිනිසත් බවට නිගාවකි.

බුදු දහමේ පෙන්වා දෙන පරිදි මරණය, ආයුක්ෂය, කර්මක්ෂය, උභයක්ෂය, උපච්ඡේදක යනුවෙන් සිව් වැදෑරුම්ය. උපතකට හේතුවන ආපෝ, තේජෝ, වායෝ, පඨවි, අවකාශ යන ධාතුවලින් සැදුම්ලත් පංචමහාභූතයන්, ප්‍රාණය නිරුද්ධ වීමත් සමග නැවත අවකාශයට එක් වෙයි. මිනිසා විසින් රැස්කරගන්නා කුසල් අකුසල්වලට සාපේක්ෂව ඊළඟ භවය නිර්මාණය වෙයි.

සියලු සංස්කාර ධර්මයෝ අනිත්‍ය බවත් සසර දුකින් මිදීම පිණිස අප්‍රමාදීව කුසල් රැස් කරගයුතු බවත්, බුදුරාජාණන් වහන්සේ ලෝ සතුන් වෙත පතළ වූ මහා කරුණාවෙන් යුතුව පිරිනිවන් මංචකයේ සිට අවසන් බුද්ධ වචනය ලෙසින් ද දේශනා කර වදාළහ.

''හන්දදානි භික්ඛවේ අමන්තයාමි වෝ වයධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදේථ''

එහෙත් ලැබුවා වූ මිනිස් භවය තුළ ජීවිතය ඵලදායී ලෙසින් පවත්වා ගන්නෝ අල්පය. අසීමිත ලෙස පංචේන්ද්‍රියන් පිනවමින්, ඡන්ද ද්වේෂ භය මෝහ නම් වූ සතර අගතීන්හි අගතිගාමී වෙමින්, මමත්වයෙන් වියරු වැටී, අඳුරේ සිටින්නෙකු යමක් සෙවීමට ඉබාගාතයේ අතපත ගන්නාක් මෙන් අරමුණකින් තොරව, මිනිසත් බවේ ශ්‍රේෂ්ඨත්වය නොදැන සල්ලාල ජීවිත ගතකරන්නෝ අද සමාජයේ බොහෝය. ඔවුන් සතුව අද ධන බලය, නිල බලය, පිරිස් බලය, තිබුණද මරණය ඉදිරියේදී ඒ කිසිදු බලයක් නැත. අන්ත අසරණ බවට පත්වන ඔවුන් සතුව බාහිර බලයක් තබා චිත්ත ශක්තියක්වත් අවසන් මොහොතේ ඉතිරිව නැත. එවන් අය මරණය ඉදිරියේ තැතිගන්නා බව ධර්මයේ සඳහන්ය.

එම අවසන් මොහොතේදී කළ කී සියල්ල සිහිපත් වෙයි. එදා සමනල ලොවක් හිඳ රුපියල් සත පස්සේ හති දමමින් දුවපු හැටි ! මෙලොවට බිහිකළ දෙමාපියන්ගේ නාමයෙන්වත් අසරණයෙකුගේ කුසගින්නටවත් පිනිට නොවූ හැටි ! අසරණ සිසු දරුවන් වෙනුවෙන් සත් භාවයෙන් ඉටකරනු ලබන සේවය පවා මන්දගාමී කිරීමට වෙර දරපු හැටි ! නිල බලයෙන් හිස උදුම්මා ගෙන තමා ද දානපතියෙකු යැයි ලොවට හඬනඟා කියමින් අසරණ සිසු දරුවනට බොරු පොරොන්දු දෙමින් ඔවුන් අපේක්ෂා භංගත්වයට පත් කළ හැටි ! පංච සීලයවත් රැකගත නොහැකි වුවද වසද්වනික ලෙස නිලතල රැකගත් සැටි ! වෛවර්ණ රූපරාමු එකින් එක වේගයෙන් භ්‍රමණය වෙමින් පුළුල් තිරයේ දෘශ්‍යමාන වෙයි. පෙර පිනට මිනිස් භවයක් ලැබුවද, ...අනෝ !!!.......... මා රැස් කරගත්තේ මොනවාද ? මා දැන් යන්නේ කොයිබටද ? හද තුළ විශාල බියකි. තැතිගැන්මකි. ගතට සවියක් නැත. හිතට සවියක් නැත. සතුව පලාගොස්ය. සිහි මුළා වනු විනා කාගේ හවිහරණක්ද ?

"සුඛංච න විනා ධම්මං .... ධර්මයෙන් තොර සැපතක් නැත."

No happiness - without Dhamma

එහෙත් මෙම උතුම් ධර්මය ප්‍රඥාවන්තයින්ට විනා නුවණ නැත්තන්ට නොවන බව බුදුරජාණන්වහන්සේ දේශනා කොට ඇත.

"පඤ්ඤවන්තස්සායං ධම්මො .... නායං ධම්මො දුප්පඤ්ඤස්ස"

ප්‍රඥාවන්තයා චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය මන නම් වූ ෂඩ් ආයතනයන්ගේ පාලනය තමා අතට ගෙන ඒවායේ වින්දනයන්ට සීමාවන් පනවා ගනිමින් දස පුණ්‍ය ක්‍රියාවන්හි නිරත වෙයි. ධර්මය තම ජීවිතය තුළ ප්‍රායෝගීකරණය කරයි. අසරණ ජනතාවගේ ජීවිත සුවපත් කිරීමට නොමසුරු දායකත්වයක් සපයයි. හිසට වහලක්, ගතට නිසි අහරක් පවා නොමැතිව දහසකුත් පීඩා කරදර මැදින් ඉගෙනීමට වෙර දරණ, අනාගත ලොවේ පුදින්නට වෙර දරන මල් කැකුළු වලට සුපසන් චේතනාවෙන් යුතුව පැන් බිඳක්වත් ඉසීමට නිරතුරුවම

වෙර දරයි. ඔවුන්ගේ අවසන් මොහොත ධර්මයට අනුව ඒකාන්ත වශයෙන්ම සුවපත්ය.

ශිෂ්‍යත්වලාභී එක්තරා දරුවෙකුගේ සත්‍ය කතා පුවත මෙසේය. 2004 වසරේ අ.පො.ස (උසස් පෙළ) සඳහා වූ ශිෂ්‍යත්වයක්, අංක 0425 යටතේ මෙම ආයතනයෙන් ලබාගැනීමට ඔහු භාග්‍ය සම්පන්න විය. නමින් සෞම්‍ය කුමාර නම් වූ ඔහු දරිද්‍රතාවෙන් පීඩිතව, එක් ආහාර වේලකින් දිවි රැකගනිමින්, සැතපුම් ගණන් දෙපයින් දුර කතර ගෙවා පාසල වෙත පිය නඟා, සත්පුරුෂයින්ගේ ආධාර උපකාර ඇතිව **කළුතර දිස්ත්‍රික් කුසලතාව ද හිමිකර ගනිමින් වෛද්‍ය විද්‍යාලයට සුදුසුකම් ලැබුවේය.** රැටියල, ඉමලකන්ද නම් වූ දුෂ්කර ප්‍රදේශයක ජීවත් වූ ඔහු පාසල් යාමට බස් රථයකට ගොඩවීම පිණිස සැතපුම් තුනහමාරක් පමණ ගමන් කළ යුතුව තිබුණි. කහට උගුරකින් සහ තම්බාගත් බතල අලයකින් උදේ වේල පිරිමහ ගත් ඔහු දැඩි දුෂ්කරතා මැදින් උසස් පෙළ කඩඉම ජයගත්තේ රබර් කිරි කැපීමෙන් සහ කුලීවැඩ කරමින් තමා පෝෂණය කළ දෙමාපියනට සැනසුම් සුසුමක් හෙළීමට අවස්ථාවක් සලසමිනි. ඔහු වෛද්‍ය විද්‍යාලයේ අධ්‍යාපනය ඇරඹුවේද, දහසකුත් අපේක්ෂාවන් පොදිබැඳ ගෙනය.

"අචින්තිතම්පි භවති .... චින්තිතම්පි විනස්සති"
(සිතූ දේ නොම වෙයි .... නොසිතූ දෙයම වෙයි)

ඒ බුද්ධ වචනයයි.

ඔහු මහ මග අවසන් ගමන් යතැයි සිතුවෝ කවරහුද ? බස් රථයක පාපුරුවේ ගමන් කළ සම වයසේ තරුණ ජීවිත තුනක් බිලිගත් එම ඛේදවාචකය පිළිබඳව මුළු මහත් සමාජයම කම්පා විය. තම දෑතේ සවියෙන් නිදි වර්ජිතව කුලීවැඩ කරමින් දෙනෙත් සේ ඇති දැඩි කරගත්තා වූ තම එකම දරු සම්පත මෙලෙසින් අනපේක්ෂිත ලෙස තමන් හැරදා යතැයි මොහොතකටවත් ඒ අසරණ දෙමාපියන් සිතුවේ නැත. මේ ධර්මයේ සත්‍යයයි.

මිනිසාගේ පරම යුතුකම පරාර්ථ චර්යාවේ යෙදෙමින් මිනිසාට සේවය කිරීම බව සම්මා සම්බුදුරජාණන් වහන්සේ ලොවට පෙන්වා දුන්නේ ආදර්ශයෙන්මය.

දරිද්‍රතාවෙන් පීඩිත වූවද, ඉගෙනීමෙහි දක්ෂතා ඇති දූ පුතුන් මේ මව්බිමෙහි අනන්තය. සමාජය සුවඳවත් කරන යහගුණවලින් පිරිපුන්, ගුණ නුවණින් බබළන දීප්තිමත් පරපුරක් මව් බිමට දායාද කිරීමේ පරම පවිත්‍ර චේතනාවෙන් පිරිපුන් සුපින්වත් සත්පුරුෂයන් ද මෙහි නැත්තේ නොවේ. **නියත වූ මරණය** උපත සමගින් ම අපට උරුම වී ඇත. එය සිත්හි දරා ගෙන අප්‍රමාදීව පරාර්ථ චර්යාවේ යෙදෙමින් පිහිට අවශ්‍ය කවරෙකුට හෝ සරණ වන්නෝ එම කුසලය මතම සුවසේ ජීවත් වෙයි.

අප්පමාදෝ අමත පදං .... පමාදෝ මච්චුනෝ පදං
අප්පමත්තා නම් යන්ති ...... යේපමත්තා යථාමතා

Heedfulness leads to immortality. Heedlessness leads to death. The heedful are immortal. The heedless, though living are like the dead.

තුන් ලෝකයම සැනසූ බුදුරජාණන්වහන්සේ සත්වයාගේ සංසාර දුක අවබෝධ කරගැනීම සඳහා සියලු යස ඉසුරු සැප සම්පත් අත් හැර දමා ආර්ය පර්යේෂණයේ යෙදුණ සේක. මනුෂ්‍යත්වයේ නාමයෙන් දුප්පත් දරුවකුගේ කඳුලක් වෙනුවෙන් පිහිට වීමට තරම්වත් සිතක් පහළ නොවන්නේ නම් එය කෙතරම් අභාග්‍යයක්ද ?

"දීම" යුද්ධයක් බඳු බවත්, දීම සඳහා සිතක් පහල කරගැනීම, පරිත්‍යාගය හෙවත් අතහැරීම සහ දීමෙන් පසු හිත හදාගැනීම යන අදියර 3 කඩු ගිලීමකට වඩා අපහසු බවත් ධර්මයේ සඳහන්ය. දීම හෙවත් පරිත්‍යාගයට ද පෙර පින් තිබිය යුතුයි. ඇතමුන් සතුව යමක් ඇතත් දීමට සිතක් නැත. ඇතැමෙකුට සිතක් ඇතත් දීමට යමක් තමා සතුව නැත. ඇතමෙකු පරිත්‍යාගයක් කළ ද සිත හදාගත නොහැක. කරනු ලැබූ පරිත්‍යාගය තමාට සිදු වූ පාඩුවක් සේ දකිමින් පසු තැවෙයි. ඒ පෙර පින් නැති බවයි.

උපන් සත්වයා පසුපස මරණය ලුහුබැඳ එයි. තරුණ ජීවිත පවා මෙලෙසින් බිලිවෙයි. පංචස්කන්ධය ත්‍රිලක්ෂණයට යටත් ය. මෙම ඉරණම කාහටත් පොදුය. අප මේ නැවතී සිටින්නේ තාවකාලික නැවතුම් පොළක ය. මෙතනට කිසිවෙකු ගෙන ආ දෙයක් නැත. මෙතනින් කිසිවෙකු ගෙන යන දෙයක් ද නැත.

දරිද්‍රතාවෙන් පීඩිත වුවද අපේක්ෂා සහගතව ධෛර්ය සම්පන්නව පාසල් අධ්‍යාපනයේ නිසි ඵල ලබා සරසවි වරම් ලද තවත් ශිෂ්‍යත්වලාභී දරුවෙකුගේ සැබෑ තතු මෙසේය.

ඔහු කුසලතා පූර්ණ ශිෂ්‍යයෙකි. නොමැලිව අවශ්‍ය අවස්ථාවේදී ඉදිරියට එයි. සෘජුව අදහස් ප්‍රකාශ කරයි. 2009 දී මා පිය අනුස්මරණ ශිෂ්‍යත්වයක් ලබාගැනීමට භාග්‍ය සම්පන්න වූ ඔහු අනපේක්ෂිත ලෙස දිවියෙන් සමුගනු ඇතැයි සිතුවෝ කවරහුද ? විශ්වීය ධර්මතාවට එරෙහි විය හැක්කෙක් ලොව නැත.

ඔහුගේ අවසන් කටයුතු සිදු කළ දා අප අධ්‍යක්ෂ මණ්ඩලයේ කිහිප දෙනෙක් එයට සහභාගි විණි. ශිෂ්‍යත්වලාභී දරුවන්ගේ කටුක ජීවන පියවි නෙතට නිරතුරුවම ගෝචර කරගන්නා මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම ඉදිරියටත් මෙම පරාර්ථචර්යා වේ යෙදෙනු ඇත. ඒ අසරණ දරුවන්ගේ සැබෑ ජීවිතවල සංවේදී හඬ හදවත් සසල කරවන හෙයිනි.

කටු මැටි ගසන ලද බිත්තිවලින් සමන්විත, නිස ඉද්දර පොල්තෙල් පහන දැල්වීමට පවා අවකාශ නොමැති කුඩා ආලින්දයකින් යුත්, ඉසුරු දිවි ගෙවූ කළුතර දිස්ත්‍රික්කයේ දොඩන්ගොඩ පිහිටි නිවස

දිවිය කවදා කොතැන කෙලෙසින් ගෙවී යයි දැයි නොමැත　　　දන්නේ
සවිය ගත බල සුපිරි ජීවිත ධනය සමඟින් දමා　　　යන්නේ
දිරිය දරුවන් සෝ සුසුම් මැද නැගී සිටිනට විරිය　　　ගන්නේ
එඩිය පාමින් මෙලද භවයේදි පිහිට වන්නට වරම්　　　දෙන්නේ

අනුග්‍රාහක කුසුමා හෙට්ටිආරච්චි මැනියගේ පින්බර දෝතින් ශිෂ්‍යත්වය ලබාගනිමින්

තම චිත්ත සන්තානයේ ඇති වූ සතුට මත ඉසුරු සිය කෘතඥතාව පුදකරමින්....

සිය නිවසේ කුඩා ආලින්දය තුළ තැන්පත් කර තිබූ ඉසුරුගේ දේහය... ශිෂ්‍යත්වය ලැබූ දා ගත් ඡායාරූපය නිසල දේහයේ සුරත අසල....

ඉසුරුගේ දේහයට අවසන් ගෞරව දක්වන ශිෂ්‍යත්ව පදනමේ භාණ්ඩාගාරික මහතා... ඉසුරුගේ පියා සහ නැගණිය ද දේහය අසල...

ඉසුරුගේ දේහයට අවසන් ගෞරව දැක් වූ මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමේ අධ්‍යක්ෂ තුමිය... ඉසුරුගේ ඡායාරූපය දේහය මත තැන්පත් කිරීමට සූදානමින්....

ඉසුරුගේ දෙමාපියන් වෙත අවසන් කටයුතු සඳහා මුදලින් ආධාර කළ අධ්‍යක්ෂ තුමිය ශිෂ්‍යත්වයේ ඉදිරි වාරික සිය නැගණිය ගේ ඉගෙනීම සඳහා අනුගත කරන බව දන්වමින්....

අනුපමේය කර්තව්‍යයකින් අප ලද ප්‍රතිඵල
Acquried advantages of the supreme task

පෘථග්ජන මිනිසා මෙම වාණිජ ලෝකයේ ප්‍රතිලාභ අපේක්ෂාවෙන් සිදුකරනු ලබන ආයෝජනයන් විවිධය, පොළිය, වට්ටම්, ඉතිරිය, ලාභය (interest, commission, balance, profit) යනාදිය පිළිබඳව දක්වන්නේ සුවිශේෂී අවධානයකි. වැඩි වැඩියෙන් ප්‍රතිලාභ ලැබෙන ආයෝජනයන් සෙවීමට ගන්නා වූ උත්සාහය ද සුළු පටු නොවේ.

සමාජයේ ප්‍රමුඛ පෙළේ පවතින දේශීය මෙන්ම විදේශීය සුපිරි ආයතනයන්ගේ නාමයන් ගාම්භීර ලෙස උච්චාරණය කරමින් තම තමා ඒවායේ කොටස් (Shares) සඳහා ආයෝජනය කර ඇති බව උද්දාමයෙන් ප්‍රකාශ කරන අතර ඇතමුන් සමාජයේ ඉහළපෙළේ තමා වැජඹෙන වා යැයි සිතා එය හුවා දැක්වීමට ගන්නා වෑයම ද මාහැඟිය. මේ පෘතග්ජන ස්වභාවයයි.

වාණිජ ලෝකයේ සිදුකරනු ලබන මෙවන් ආයෝජන හමුවේ මිනිසා අසීමිත ලෙස ලෞකික සැපත අපේක්‍ෂා කරයි. සිහින ලොවක සැරිසරයි. ලබන්නාවූ ප්‍රතිලාභය නැවත නැවතත් ආයෝජනය කරමින් **"ඇත"** යන සීමාවකින් තොරව අසීමිත ලෙස ආසාවන් පසුපස දුවයි. හොඳින් හෝ නරකින් පස් ඉඳුරන් පිනවීමට සැලසුම් සකස් කරයි. සිහින ලොවක ජීවත්වන මොවුන් ඇස්, කන්, නාසා, දිව, සිරුර පිනවීමට සියල්ල කැප කරයි. මුදලින් කළ නොහැක්කක් නැතැයි සිතා මමත්වය හුවා දක්වමින් අන් අය හෙළා දකියි.

සියල්ල ත්‍රි ලක්ෂණය ට යටත් වූ මෙලොව සිදුකරනු ලැබූ ආයෝජනය පිළිබඳව ද තැබූවා වූ විශ්වාසය යම්හෙයකින් සිඳී බිඳී ගියේනම් ඔවුන් වියරු වැටෙයි. නීතියේ පිහිට පතයි. මිනිස් ඝාතනවලට පවා පසුබිම සකස් වෙයි. **තරහව, වෛරය, ද්වේෂය, ක්‍රෝධය** හදවත් වෙළාගනියි. දෛනික ජීවිතයේ සැලසුම් ව්‍යාකූල වී යයි. කළයුතු දෙය නොකළයුතු දෙය අතරේ අතරමංවූවන් සේය. ඉතිරිව ඇත්තේ **අසහනය, ආතතිය, දුක සහ වේදනාව** පමණි. සොයාගිය සතුට එහි නැත.

ඒ ලෞකික සුඛ විහරණය සඳහා පමණක් සිදුකරනු ලබන ආයෝජනයන්හි ස්වභාවයයි. එහෙත් **මෛත්‍රිය, කරුණාව, දයාව, ඉවසීම** වැනි මුදලට ගත නොහැකි අමිල සම්පත් ආයෝජනය කිරීමෙන් ලද හැකි ප්‍රතිලාභය ලෞකික මෙන්ම ලෝකෝත්තර සුවයක් ගෙන දෙයි. මෙය අත්දැකිය හැක්කේ ප්‍රඥාවට සාපේක්ෂව විනා **මුදලට, ධනයට, බලයට, නිලයට සාපේක්ෂව නොවේ.**

බුදු දහමේ **"සැපත"** යන සංකල්පය දෙවදෑරුම්ය. ලෝකෝත්තර වශයෙන් ගත්විට පරම සැපත නිවනයි. එය ඉඳුරන් පිනවා ලබාන්නා වූ සැපතක් නොවේ. මිනිස් හදවත් තුළ කෙලෙස් ගිනි නිවීම නිසා ඇති වන සුඛය යි. එය සංසිඳීමේ සුවය යි. එය ලොව ඇති උත්තම සැපය යි. **"නිබ්බානං පරමං සුඛං"** මෙය **උපසම සුඛය හෙවත් නිරාමිස සැපය** යනුවෙන් ද හැඳින්වේ.

බුදු දහමේ දැක්වෙන මෙම සැපත පුහුදුන් චින්තනයට හසු නොවන බවත්, ප්‍රඥාව වඩවා දහම් සයුරේ ගැඹුරට යාමේදී මෙම සැපත විෂය වන බවත් ධර්මයේ පෙන්වා දෙයි. පුහුදුන් චින්තනයට ගෝචර වන ලෞකික සැපය විඳීම ගිහියනට නුසුදුසු බවක් මෙයින් ගම්‍ය නොවේ. ගිහියන්ගේ කාමභෝගී ජීවිතය බුද්ධ දේශනයේ කිසිම තැනක ප්‍රතික්ෂේප කර නැත. එහෙත් එය සදාචාරාත්මකව, අන්තයට නොගොස් විඳින ආකාරය පෙන්වා දී ඇත. සතර අගතීන්හි අන්තගාමී වන්නා සතුව කොපමණ **ධනය, බලය හා නිලතල** තිබුණ ද ඔහු මෝහාන්ධකාරයෙන් වැසී සිටින දිළින්දෙකි. එවැන්නන්ට ප්‍රඥාවන්තයින්ගේ අනුකම්පාව හිමිවිය යුතුම යි.

ඔව දෙයියානුසාසෙ ය්‍ය - අසබ්භා ච නිවාරයේ
කතං හි සො පියො හොති - අසතං හොති අප්පියො (ධ.ප. පණ්ඩිත වග්ග)

The wise man will advise, instruct and dissuade others from evil, such a man will be sought by good men and rejected the bad.

පණ්ඩිතයා (කළ්‍යාණ මිත්‍රයා) අනුන්ට අවවාද කරයි. අනුශාසනා කරයි. අනුන් කුසලයෙහි යොදවයි. අසභ්‍ය දෙයින් අකුසලයෙන් වළක්වයි. එසේ කරන තැනැත්තා සත්පුරුෂයන්ට ප්‍රිය වේ. අසත්පුරුෂයන්ට අප්‍රිය වේ.

අත්‍යන්තිකර ආශාවන් පසුපස හඹායන ඔවුන් ඡන්දයෙන් අගතිගාමී වෙයි. අභිමතය පරිදි රස විඳීමට, සමාජ සම්මත ශිෂ්ටසම්පන්න න්‍යාය ධර්මයන්ගෙන් බාධා පැමිණෙන විට ද්වේශය හටගනී. කෙලෙස් ගින්නෙන් **අතුර ව** සිටින මොවුන් සත්පුරුෂයින්ගේ අවවාදය ප්‍රතික්ෂේප කරයි. තමා කරන කියන සිතන සියලු දේ නිවැරදි බවට සාධාරණීකරණය කරමින් හුවා දක්වන මොවුන් සතුව ඇත්තේ ප්‍රඥාවන්තයින් විසින් ප්‍රතිකෂේප කරන වදන් වැළකි. ප්‍රඥාවන්තයන්ගේ අවවාද නොරුස්සන මොවුන් ඒ සත්පුරුෂයන් කෙරෙහි වෛර බඳියි. ඔවුන්ගේ ගුණ මකමින් තමා සුදනෙක් යැයි සමාජයට පෙන්වීමට වෙර දරයි. එහෙත් දරන්නාවූ තැන හමුවේ අසරණ වන මොවුන් වරද පෙන්වන සත්පුරුෂයන් කෙරෙහි ක්‍රෝධ සිතින් යුතුව පළිගැනීමට වෙර දරයි.

මෙවන් දූෂිත වූ සිතිවිලි නිතර සිහි කරමින් බද්ධ වෛරයක් දක්වා වර්ධනය කරගන්නා ඇතැම් අන්ධබාලයින් වත්මන් සමාජයේ දැකිය හැකිය. ජීවිතයේ අවසන් භාගයේදී සිහිපත් කරගැනීමට තමා කල කී යහපත් දේ ලියා තබනවා වෙනුවට මොවුන් ඉදිරි භවයට ගෙන යාම සඳහා තම කුරිරු හදවතේ ජනිත වී ඇති **රාගය, ද්වේශය, මෝහය,** මතින් පැනනැගුණු **තරහව, වෛරය, ක්‍රෝධය** සහ **ගුණමකුකම්** වැනි දෑ පිළිබඳව සටහන් තබාගනී. එයම සිහිපත් කරමින් පීඩා විඳින මොවුන්ගේ හදවතේ ප්‍රතිරූපය මුව කමලෙන් දිස්වන හෙයින් ඔවුන් හඳුනාගැනීම ද අපහසු නොවේ. සිත සුවපත් නැති මොවුන්ගේ ගත ද සුවපත් නැත. විශේෂඥ වෛද්‍යවරු පසුපස හඹාගිය ද සුවයක් නැත. තම සිත පාලනය කර නොගත්තේ වී නම් ගත කෙලෙසින් පාලනය කරන්නද ? ස්වාභාවික ශරීරකෘත්‍යන් පවා පාලනය කරගත නොහැකිව පීඩාවට පත්වුව ද යායුතු මග ඔවුන් නොදකී. ක්‍රෝධය සිත්හි තිබෙනා තුරු ඔවුන් යහපත සහ ධර්මය දකින්නේ නැත.

(කුද්ධෝ අත්ථං නජානාති කුද්ධෝ ධම්මං න පස්සති)
Kuddho athtam na janati - kuddho dhammam na passathi

සිත්හි ක්‍රෝධය තිබෙන තාක් ධර්මය දැකිය නොහැක.......... කෙතරම් අභාග්‍යයක්ද ?

ආහාරයේ වුව පමණ නොදැන රස නහර පිනවීම නිසා ඔවුන්ගේ දරුවන් පවා ඇතැම් විට අධි පෝෂණයෙන් පීඩා විඳියි. නොඑසේ නම් හඳුනාගත නොහැකි රෝගාබාධයන් ගෙන් පීඩා විඳියි. ත්‍රිවිධ රත්නයේ අනන්ත මහා ගුණ බෙලෙන් චිත්ත ශක්තියෙන් බොහෝ දුරට සුව කරගත් හැකි තත්වයන්, ඒ පිළිබඳව විශ්වාසයක් නොමැතිකම නිසාත්, ආර්ථික ශක්තිය නිසා ඇති වූ මානය නිසාත්, පුහුදුන් සමාජයේ පිළිගැනීම් නිසාත් බටහිර වෛද්‍ය ක්‍රමයට නතු කොට දින ගණන් සති ගණන් පුද්ගලික රෝහල්වල තම කාලය. ධනය, ශ්‍රමය කැප කරයි.

සොයාගිය සැපත. සතුට, එහි ද නැත.

ආයෝජනයෙන් ලද ප්‍රතිලාභ	-	**රුපියල් සත .... රුපියල් සත .... රුපියල් සත**
හඹා ගියේ	-	**පස්කම් සැප....... පස්කම් සැප.......පස්කම් සැප**

අසීමිත ලෙස වස්තු කාමයට ගොදුරු වූ විට ප්‍රතිෂ්ඨාවක් නැති අගාධයකට ඇද වැටෙයි. තෘෂ්ණාව තුළින් නිතරම සිදුවන්නේ පුද්ගලයාට අනර්ථයක් විනා යහපතක් නොවේ. එහෙත් අත්හැරීම හෙවත් පරිත්‍යාගය තුළින් ඇතිවන්නේ පුදුම සැනසීමකි. අන් අයගේ යහපත වෙනුවෙන් මෛත්‍රී සහගත සිතින් තමා සතු යමක් අත් හැරීමේදී ඇතිවන සතුට අසීමිතය. මෙත් සිත් වැඩීමේ ප්‍රතිඵලයක් ලෙසින් මෙත්තානිසංස සූත්‍රයේ පෙන්වා දෙන ආනිශංස එකොළහෙන් දහයක්ම දෛනිකව අත්දැකිය හැක.

තසිණා ය පුරක්ඛතා - පරිසප්පන්ති සසොව බන්ධිතො
සංයෝජන සංග සත්තා - දුක්ඛමුපෙන්ති පුනප්පුනං චිරාය (ධ.ප තණ්හා වග්ග)

Folks engrossed in craving crawl about in fear like ensnared hare. Cought in the grip of fetters they come to grief continuously for a long time.

තණ්හාව විසින් පිරිවරන ලද ප්‍රජාවෝ මලපුඩු වෙන් බැඳුණු සාවා මෙන් හැපේ. හෙවත් බියෙන් ගැහේ. දස සංයෝජනවලින් හා රාගාදී සත් සංයෝගවලින් ද බැඳුණෝ නැවත නැවතත් දුකට පැමිණේ.

කොපමණ ආර්ථිකය ශක්තිමත් වුවද ඉඳුරන් පිනවීම සදාචාරාත්මක ලෙස සීමාවකට යටත්කොට ඉතිරිය

පරාර්ථ සේවය සඳහා ආයෝජනය කිරීමට තරම් කෙනෙකු තුළ ශක්තිමත් චින්තනයක් ගොඩ නැගුණේ නම් එය ඉතා ශ්‍රේෂ්ඨය. සැප පිණිසම වන්නේය.

සිත තුළ දයාව, කරුණාව, මෛත්‍රිය ජනිත වන ආකාරයේ එවන් ආයෝජනයක් කිරීමට හැකි ශක්තිමත් මානසිකත්වයක් ගොඩ නගා ගැනීමට පෙර පින් මගින් ලැබෙන්නා වූ බලපෑම් ද ඉමහත්ය.

තමා සතුව උතුරා යන සම්පත් තිබුණද, යමක් අන් අයකුගේ සුභ සිද්ධිය වෙනුවෙන් දීමට හෙවත් තම සන්තකයෙන් මුදාහැරීමට "සිහිම" පවා මුවහත් කඩුවක් ගිලින්නාක් වැනි වූ අසීරු කාර්යයක් බව බෞද්ධ ඉතිහාසයේ පෙන්වයි. පරිත්‍යාග කිරීම හෙවත් "අත්හැරීම" ඊටත් වඩා අපහසු බවත්, දීමෙන් පසු "හිත හදාගැනීම" ඒ සියල්ලටම වඩා අපහසු බවත් ධර්මයේ සඳහන්ය.

ආයෝජනය යන්න වාණිජමය රුපියලට පමණක් සීමා වූවක් නොවේ. කාලයෙන් එක් තත්පරයක්, ශ්‍රමයෙන් එක් දහඩිය බිඳක් ප්‍රඥාවට සාපේක්ෂව එක් යහගුණයක් අපට ආයෝජනය කළ හැකි නම් එයින් ලද හැකි ඵල විපුලය.

එවන් ආයෝජනයක් කිරීම සඳහා මුලික සිතුවිල්ල පහළ වූ මොහොතේ සිට ලබන්නාවූ සතුට ..... ආයෝජනය කිරීමේදී ලබන සතුට..... පසුවිපරමක් තුළින් ලැබීමට හැකි සතුට වදනින් ප්‍රකාශ කළ නොහැක. රුපියල් ශතවලට අනුව මිලියන 12.25 ක් සමාජ සුභ සිද්ධිය වෙනුවෙන් ගතවූ තුදුස් වසර තුළ අප විසින් ආයෝජනය කෙරිණි. **එය සමාජ සංශෝධනයක් සඳහා කරනු ලැබූ ස්ථිරසාර ආයෝජනයකි.** කිසිම ආකාරයේ මූල්‍යමය ප්‍රතිලාභ එහි නැත. එහෙත් ආයෝජකයින් විසින් ලබන්නාවූ අධ්‍යාත්මික ප්‍රතිලාභ අසීමිතය.

එම අරමුණ මල්ඵල ගැන්වීමට වැය කළ ශ්‍රම දායකත්වය දහඩිය බිඳු වලින් ගණනය කළහොත් ගංගාවකි. කැප කළ කාලය ගණනය කළහොත් පූර්ණ කාලීනව වසර 14 කි. එනම් සෑම තත්පරයක්ම වැය කර ඇත්තේ අපගේ මව් බිමෙහි උපන් දරිද්‍රතාවෙන් පීඩිත ඉගෙනීමෙහි දක්ෂ දරුවන්ගේත්, දරිද්‍රතාවෙන් පීඩිතව ඇති දුෂ්කර ගම් දනව්වල දිවි ගෙවන අසරණ මිනිස් ප්‍රජාවේත්, දරිද්‍රතාවෙන් පීඩිත අංග විකල කායික, දෘශ්‍ය, සහ ශ්‍රව්‍ය ආබාධිත ජනතාවගේත් සුබ විහරණය වෙනුවෙනි. අනාගත ලොව ජයගන්නා තරුණ දූ පුතුන් වෙත තිළිණ කිරීම සඳහා කෙරෙන ග්‍රන්ථ සම්පාදනය වෙනුවෙන් ද රාත්‍රිය පහන්වන තුරු නිදි වර්ජිතව සිටියද සිතට හෝ ගතට කිසිදු වෙහෙසක් නැත. හද තුළ පිරී ඉතිරී ඇත්තේ සතුටයි.

යො සහස් සං සහස්සෙන ... සංගාමේ මානුසෙ ජිනෙ
එකං ච ජෙය්‍ය අත්තානං .... සවේ සංගාම ජුත්තමො (ධ.ප. සහස්ස වග්ග)

Conquest of self is nobler than conquering thousands of men in a battle field. Such a man who triumphs over himself is the greatest of conquerors.

යමෙකු යුද්ධයකදී මිනිසුන් ලක්ෂයක් දිනුවත් තමාගේ එකම ආත්මය දිනාගැනීම, එයට වඩා උසස්ය. ඔහු හෙවත් ස්වකීය ආත්මය දිනාගන්නා පුද්ගලයා සෙසු දිනුම්කරුවන්ට වඩා උසස්ය.

කිසියම් ව්‍යාපෘතියක සාර්ථක ප්‍රතිඵල ලැබීමට නම් එය මනා කළමනාකරණයකින් යුතුව දියත් කළ යුතුය. එලෙසින් සැලසුම් කිරීම සඳහා දිවා රෑ නොවෙහෙසුණේ නම් අද මෙවන් කෘතියක් ඔබ අතට පත් නොවන්නට තිබුණි. ඉමහත් කැපවීමකින් යුතුව දියත් කරනු ලැබූ සියලුම ව්‍යාපෘති අද මල්ඵල දරමින් සමාජය සුවඳවත් කරද්දී, එම සුවඳ අප හෙළන සෑම සුසුම් පොදකම දැවටී දැවටී හදවත් සුවපත් කරයි. සිතට දැනෙන්නා වූ සිසිල, සහනය, සතුට, රුපියල් සත ඉක්මවා බොහෝ ඈතට විහිදී ඇත. එම සතුට බාහිර බලවේගයක් මගින් කවරෙකුට හෝ පැහැර ගත් හැක්කක් නොවේ. සුනාමිය වැනි ස්වාභාවික ව්‍යසනයකින් විනාශ කළ හැක්කක් ද නොවේ. **සදාකාලික සැපතක් කරා යොමු වන නිර්මල සතුටකි** ......

අධ්‍යාත්මික වශයෙන් ලබන මෙම සතුට ට රුපියල් සතවලින් වටිනාකමක් දිය හැක්කෙක් නැත. කිසිම සෘජු හෝ ගුප්ත ක්‍රියාමාර්ග වලින් සුණුවිසුණු කර දැමීමට ද නොහැක. එසේ වීමට ප්‍රබල හේතුවක් තිබේ. එනම් මෙවන් සතුටක් භුක්ති විඳින්නා වටා විශාල ශක්තිමත් ප්‍රාකාරයක් ගොඩනැගී තිබීමයි. එයට මූලද්‍රව්‍ය සපයා ඇත්තේ ජීවත් වන සමාජය විසින්මය. ඵල ඇති රුකකට ගල් පහරවල් ස්වභාවිකය. එවනු ලැබූ සියළුම ගල් බොරළු, පෙරළා පහර නොදී එක්රැස් කර ගතිමි. ඒ අපගේ ගරු අනුශාසක හිමිපාණන්ගෙන් ලැබූ උපදෙස්වලට හිස නමමිනි. යමෙකු විසින් කරන කියන දෙය ඔහුට මිස අපට නොවන බවත් තම තමා වපුරා ගන්නා දෙයෙහි අස්වැන්න ඒ අයම නෙලා ගන්නා බවත් නිතර සිහිපත් කළ උන්වහන්සේ විසින් ප්‍රති ප්‍රහාර

වළක්වන ලදී. උන්වහන්සේගේ දූරදර්ශී චින්තනයට මම නමස්කාර කරමි. සත්පුරුෂ කල්‍යාණමිත්‍ර ඇසුරෙහි නිසිඑල ලදිමි. සද්භාවයන් ඉටකරනු ලබන ප්‍රජා සේවාවන් පහත හෙලීමට දමනු ලැබූ තොණ්ඩුද අනන්තය. ඒ සියල්ලද එක් කොට, ඒවායේ ගැට එකින් එක ලෙහා ගනිමින් ප්‍රාකාරයේ අත්තිවාරම් කැපීම සඳහා ලණු ඇදීමට යොදා ගතිමි.

අටලෝ දහමට අනුව ලද කීර්ති ප්‍රශංසා ද නැත්තේ නොවේ. උපේක්ෂා සහගතව හද තුළ ගබඩා කර ගනිමින් එය ද ඉදි කරනු ලැබූ ප්‍රාකාරයේ නඩත්තුව සඳහාම ආයෝජනය කළෙමි. ලබන්නා වූ ප්‍රතිලාභය කිසිම ධනස්කන්දයකට උරුම නොවන, නිරතුරුවම තමා පසුපස හඹා එන අනුගාමී ප්‍රතිලාභයකි. එය **සුවිශාල ධන ආයෝජනයකින් ලැබෙන්නා වූ මූල්‍යමය ප්‍රතිලාභ පරයා යන, කිසිකලෙක විනාශ මුඛය කරා නොයන, සතුරාට පැහැර ගත නොහැකි, සනාතනික චිත්ත ශක්තියකින් පරිපූර්ණ විශ්මයජනක මා හැඟි ප්‍රතිලාභයකි.** විශ්විය සත්‍ය මත පදනම් වූ මෙම ප්‍රතිලාභය තුළ අභියෝග ජය ගැනීමේ පුදුම ශක්තියක් අන්තර්ගත ය. **නෑ.... බෑ.....** යන වදන් හදවතින් පලා ගොස්ය. **ඊර්ෂ්‍යාවෙන්, වෛරයෙන්, ක්‍රෝධයෙන්, ගුණමකු බවින්, වියරු වැටී ධර්මය දැකීමට නොහැකිව කෙලෙස් ගින්නෙන් දැවී දැවී අසහනයෙන් අඳුර කරා දිව යන අන්ධබාලයනට පවා මෛත්‍රී සහගතව සම්මා දිට්ඨිය පහළ වේවා ! යි. පැතීමට තරම් හදවත් සුපසන් ය. සිසිල්ය.** කිසිඳු බලයකට උරුම නොවන අධ්‍යාත්මික සංහිඳියාවකි. සිතට මෙන්ම කයට දැනෙනුයේ විශාල සුවපහසුවකි. සතුටකි. සැහැල්ලුවකි. **එහෙත් නැත්නාට ඇති වූ විට සෑදෙන රෝගාබාධයන් මෙම ප්‍රතිලාභීන් හට නොවැළඳෙන හෙයින් පුහුදුන් ජනයාගේ ප්‍රකෘති ඇසින් දැකීමට තරම් කිසිඳු විශේෂත්වයක් මෙහි නැත.**

ධර්මයේ සඳහන් පරිදි ගිහි ජීවිතයට අදාල සැප හතරකි. ජීවත්වීමට තරම් ප්‍රමාණවත් ආර්ථික මට්ටමක පැවතීම **"අත්ථි සුඛය"** යි. ඒ පිළිබඳව මා නිහතමානීව සතුටට පත්වන්නේ දෙමාපියන්ට සහ ගුරුවරුන්ට පින් දෙමිනි. පරාර්ථ චර්යාවේ යෙදීම ද ඇතුළුව පරිභෝජනය සඳහා ප්‍රමාණවත් සම්පත් සතුවීම **"භෝග සුඛය"** යි. එයටද පෙර පින් ලදිමි. කිසිම පුද්ගලයෙකුට, කිසිම ආයතනයකට හෝ කිසිම බැංකුවකට එක් ශතයකින් හෝ ණය නොමැති බව දැනෙන විට දැනෙනා **"අණන සුඛය"** මා වෙත උරුමය. 25 වසරක රාජ්‍ය සේවයක් සහ තුදුස් වසරක උත්තුංග සමාජ මෙහෙවරක් තුළින්, ගුණ නුවණින් සපිරි ලොවටම වැඩදායි දරුවන් දහස් ගණනක් සමාජයට බිහිකරමින්, දරිද්‍රතාවෙන් පීඩිත අසරණ ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් දීර්ඝ කාලීනව සිදු කරනු ලැබූ ආයෝජනය තුළින් නිසි ප්‍රතිලාභ ලදිමි. එවන් ප්‍රතිලාභයක් සිහිපත් කරමින් ලද හැකි මානසික සුවය **"අනවජ්ජ සුඛය"** යි.

ශ්‍රී සද්ධර්මයේ පෙන්වා දෙන මෙම උතුම් සැප 4 සියලුම අනුග්‍රාහක භවතුන් ද, අද හදවත් උතුරා යන සුපසන් හැඟුමෙන් යුතුව නිහතමානීව භුක්ති විඳිනු ඇත. ඒ ඔවුන් ආයෂී ධනයෙන් ආඪ්‍ය වී ඇති හෙයිනි.

ආරෝග්‍යා පරමාලාභා...... ස්නතුට්ඨි පරමං ධන ං
විශ්වාසා පරමා ඥාති .... නිබ්බානං පරමං සුඛං

Health excels all gains. Contentment cxcels all wealth. Trustworthiness is the best relative. Nibbana is the highest happiness.

ජීවිත ගමනේ හැම සැනසිල්ලක් ම ලබා මෙම ගෞතම බුද්ධ ශාසනය තුළදීම පරම රමණීය අති උතුම් නිර්වාණ සම්පත්තිය සාක්ෂාත් කරගැනීමට, සත්භාවයෙන් ම ඉටු කරනු ලැබූ මේ සියලුම සේවාවන්ගෙන් ජනිත වන කුසල් සම්භාරය පාරමිතාවක් ම වේවා ! යි මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම, සුපසන් හදින් යුතුව ප්‍රාර්ථනා කරයි.

විමුක්ති සුවයක් කරා දිවෙන මෙම නිරාමිස සතුටෙහි ඇති සිසිලස පාඨක ඔබ සැමගේ හදවත් දැනේවා !

කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක

ප්‍රාර්ථනා

ASPIRATIONS

ඉමිනා පුඤ්ඤ කම්මේන - මා මේ බාල සමාගමෝ
සතං සමාගමෝ හෝතු - යාව නිබ්බාන පත්තියා

By all these meritorious deeds
May I never join with the foolish
May I always join with the wise,
Until the time I attain Nibbana

සිදුකරනු ලැබූ මෙම පුණ්‍ය කර්මයේ හේතුවෙන් නිවන් දක්නා තෙක්
අසත්පුරුෂ ඇසුරක් නොවී සත්පුරුෂ සේවනයක් ම වේවා !

මෙම ග්‍රන්ථයට තේමා වූ පරාර්ථ සේවය තුළින් මා ලද පාරිශුද්ධ වූ චිත්ත සන්තුෂ්ටිය
ශාන්ත සුවය, මරණ මඤ්චකයේ දී සිතට දැනේවා !

අති උතුම් ත්‍රිවිධ රත්නය වෙත බැති සිතින් පිදෙන

"තුදුස් වසරක් සහන් එළියක්"
නම් වූ මෙම ග්‍රන්ථය

සම්පාදනය කිරීමෙන්, මුද්‍රණය කරවා බෙදාහැරීමෙන් පහළවන උතුම් ධර්ම දානමය පින
පාඨක ඔබ සැම දෙනාටම අනුමෝදන් කරමි.

අනුමෝදන් වේවා !!!

සමාජ සංශෝධනයක් සඳහා මෙවන් වූ තිරසාර ආයෝජනයක් කිරීමට අවශ්‍ය
මූලික ස්ථාවරය සකසමින් නිබඳ ශක්තිය හා ධෛර්යය ද උරුම කරදී මිය පරලොව ගිය

විදුහල්පතිනි ලෝරා හෙට්ටිආරච්චි; දයාබර මව්තුමියටත්,
විදුහල්පති විජයසේන කිරිවත්තුඩුව; දයාබර පියතුමාටත්,

සංසාර ගමන සුවපත් කරගැනීමට සහ
අප්‍රමාදව චතුරාර්ය සත්‍ය අවබෝධ කරගැනීම පිණිස
මේ පින් අනුමෝදන් කරමි.

අනුමෝදන් වේවා !!!

සමාජයට ඵලදායී පුරවැසියකු බිහිකිරීමේ ශ්‍රේෂ්ඨ කාර්යභාරය මැනවින් ඉටුකර
දිවියෙන් සමුගෙන සිටින දයාබර ගුරු මෑණිවරුන් සහ පියවරුන්ටත්,
ප්‍රඥා කිරණ මගින් උතුරා යන ආලෝක ධාරාවන් හමුවේ, ජාතියක්, ජරාවක්,
දුකක්, නැති අති සුන්දරවූත්, පරම රමණීය වූත් නිර්වාන ධර්මය ම
අවබෝධ කරගැනීමට මේ පින් හේතු වේවා ! වාසනා වේවා !

ඉදම්මේ පුඤ්ඤං - ආසවක්ඛය වහංහෝතු
සබ්බ දුක්ඛා - පමුඤ්චතු

සියලුම සත්වයෝ නිවන් දකින්වා !
සාධු ! සාධු !! සාධු !!!

සුබා මත්තෙය්‍යතා ලොකෙ
-අථෝ පෙත්තෙය්‍යතා සුබා
සුබා සාමඤ්ඤතා ලොකෙ
-අථෝ බ්‍රහ්මඤ්ඤතා සුබා

-බුදුරජාණන් වහන්සේ-

Tending to Mother & Father is great contentment.Tending to Bhikkus & Noble ones is also great contentment.

දස මාසේ උරේ කත්වා - පෝසේසි වුද්ධි කාරනං

ආයු දීඝං වස්සසතං - මාතු පාදං නමා මහං

I worship the feet of my mother, wishing a long life of hundred years for protecting me within her womb for ten months and for bringing me up well.

වුද්ධිකාරෝ ආලිංගිත්වා - චුම්බිත්වා පිය පුත්තකං

රාජ මජ්ඣෙං සුපතිට්ඨං - පිතු පාදං නමා මහං

I worship the feet of my father, who kissed & cuddled me and also placed me among kings with my welfare at heart.

සම්බුදු දහම තුල ගැබ්ව ඇති අමිල සාරධර්ම පරිපෝෂණයක් තරුණ හදවත් තුළට ලබා දීම සඳහා නිරන්තර ව්‍යායමක යෙදෙන **"මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම"** සිය අභිමතාර්ථ සාධනය සඳහා ක්‍රියාත්මක කරන්නා වූ නිහඬ ක්‍රමවේදයන් අතර ග්‍රන්ථ රචනය මා හැඟි භූමිකාවක් නිර්මාණය කරයි. ශ්‍රී ලංකාවේ අඩු ආදායම් ලාභී පවුල් වලින් වාර්ෂිකව තෝරාගනු ලබන ඉගෙනීමෙහි දක්ෂ සිසුන් පිරිසකට විශ්ව විද්‍යාල අධ්‍යාපනයේ පළමු වසර තුළදී මාසිකව ශිෂ්‍යාධාර පිරිනමමින්, ඔවුන් වෙත සදහම් ග්‍රන්ථ ද සම්පාදනය කරමින් **තිළිණ කරනු ලබයි**. ජාත්‍යන්තර භාෂාව (ඉංග්‍රීසි) ඉගෙනීමට තරුණ පරපුර මහත් රුචිකත්වයක් දක්වන හෙයින් එය ද පාදක කොට ගනිමින් මෙම ග්‍රන්ථ ගද්‍ය සහ පද්‍ය කොටස් ඇතුළුව සම්පාදනය කෙරෙන අතර අවබෝධයට පහසු වනසේ ඇතැම් පාලි ගාථා පාඨයන්හි අර්ථය සරල ඉංග්‍රීසි බසින් ද මුද්‍රිතය. ඉදිරි පරම්පරාවට දායාද කළයුතු උතුම් ගුණ ධර්ම ආකර්ශණීය සිතුවමක් ලෙසින් නිර්මාණය කර අර්ථාන්විතව තරුණ හදවත් තුල පතිත කරවීම අපගේ අරමුණයි.

මා පිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනම
392/2, කොටුවේගොඩ, රාජගිරිය,
(0112877950)

මෙම ග්‍රන්ථයෙහි අන්තර්ගත පාලි ගාථාවන්හි ඉංග්‍රීසි පරිවර්තනය, මාපිය අනුස්මරණ ශිෂ්‍යත්ව පදනමේ අධ්‍යක්ෂිකා, කොළඹ බී. එස්. සේනානායක විද්‍යාලයේ සේවයෙන් විශ්‍රාම ලත් ප්‍රවීණ ඉංග්‍රීසි ආචාර්ණී කිරිවත්තුඩුවගේ සීතා නන්දනී ගුණතිලක මැතිනිය විසිනි.

ISBN 978-955-50082-4-2